
කොවිඩ් ව්‍යාප්තිය





# දිනමිණ

The Dinamina | 1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත | தினமின






ශ්‍රී බුධ වර්ෂ 2564ක් වූ අධි වප් පුර තියවක ලත් සඳු දින | කාණ්ඩය 111 | පත්‍රය 261 | පිටු 36 | මිල රු.30 | web: www.dinamina.lk | ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පුවත් පතකි | 2020 ඔක්තෝබර් 19 සඳුදා




# පාස්කු දා ප්‍රහාරයේ අබිරහස් ළඟදීම හෙළි කරනවා

සුභාෂිණී සේනානායක

පාස්කු ඉරුදින එල්ල වූ ත්‍රස්ත ප්‍රහාරය පිටුපස අභිරහස් හේතු පවතින බවත් එම ප්‍රහාර සම්බන්ධයෙන් ඇති රහසිගත සහ අතිශය රහසිගත හේතු ඉදිරියේදී කොමිසම හමුවේ හෙළිදරව් කරන බවත් හිටපු පොලිස්පති පූජිත් ජයසුන්දර මහතා පෙරේදා (17) පාස්කු කොමිසම හමුවේ කීවේය.

ප්‍රහාරය සම්බන්ධයෙන් වන තොරතුරු සැඟවීමක් වුණාද සඟවා තැබීමක් සිදු කළාද යන්න ප්‍රශ්නයක් බව කොමිසම හමුවේ කියා සිටි ඒ මහතා තමා ප්‍රහාරය පිළිබඳ දැනුම්වත්ව සිට එය මඟහැරීමක් සිදු නොකළ බව ද කොමිසම හමුවේ කියා සිටියේය.

පොලීසියේ දුර්වලතාවක් මැද මෙම ප්‍රහාරය සිදු වුණා කියන එක පිළිගන්නේ නැහැ. අවාසනාවන්ත සිදුවීමක් වූ බව ඇත්ත. පොලීසියේ නිලධාරීන් සියලු දෙනා මහන්සි වී වැඩ කළා. මහන්සි වී ගත් ක්‍රියාමාර්ග, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ගත් ජයග්‍රහණ, අත්අඩංගුවට ගත් අවස්ථාවන් අපමණයි. පොලිස් නිලධාරීන් බොහෝ දුෂ්කරතා මැද පැහැදිලිවම රාජකාරි සිදු කළා. එය ප්‍රමාණයක් වුණේ නැහැ ප්‍රහාරය වළක්වගන්න. ඒකට හේතු තිබෙනවා. අභිරහස් හේතු. උදව් කළ පුද්ගලයන් අනෙක් පැත්තට ගත් හැටි, දේශපාලනය, මුදල්, විදේශ මුදල්, ඔත්තුකරුවන් අය අනෙක් පැත්ත ගහපුවා, සිදු කළ පරීක්ෂණ අනෙක් පැත්ත ගහපු හැටි කාරණා ගොඩක් තියෙනවා. මේ හැම කාරණයක්ම සලකා බලන්න ඕන. රහසිගත සහ අතිශය රහස්‍ය කාරණා තිබෙනවා. ඉදිරියේදී මේවා කොමිසම හමුවේ හෙළි කරන බවද හිටපු පොලිස්පතිවරයා කොමිසම හමුවේ කියා සිටියේය.

මට පොලිස්පති ලෙස වගකීමක් තිබෙනවා. මම දන්නේ නෑ කියලා කොයි වෙලාවෙවත් කියන්නේ නැහැ. නොකර පැහැරහැරියේ නැහැ. උපරිම පියවර ගත්තා.

පොලිස් නිලධාරීන් බොහෝ දුෂ්කරතා මැද්දේ රාජකාරී කටයුතු සිදු-කළ ද ප්‍රහාරය වළක්වා ගැනීමට එය ප්‍රමාණවත් නොවූ බව කියා සිටි හිටපු පොලිස්පතිවරයා මෙම අවාසනාවන්ත සිදුවීමෙන් පසුව හුදෙක් පොලිස්පතිවරයා පමණක් මෙයට වගකිව යුතුයි කියලා නිගමනයක් තිබෙනවා, ඒ අනුවයි ප්‍රශ්න ඇසීම සිදු වන්නේ යැයිද කොමිසම හමුවේ කීවේය.

පාස්කු ඉරුදින එල්ල වූ ත්‍රස්ත ප්‍රහාරය පොලීසියේ දුර්වලතාවක් හේතුවෙන් සිදු වූයේ දැයි කොමිසම යොමුකළ ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් පෙරේදා (17) පූජිත් ජයසුන්දර මහතා මේ බව සඳහන් කළේය.

# ගම්පහ පවුල් 72,345කට 5000 දීමනාව හෙට සිට

## ආණ්ඩුව තීරණය කරයි

ධනුෂ්ක ගොඩකුඹුර, මහින්ද අලුත්ගෙදර

නිරෝධායන ඇඳිරි නීතිය පනවා ඇති ගම්පහ දිස්ත්‍රික්කයේ මිනුවන්ගොඩ, දිවුලපිටිය සහ වේයන්ගොඩ පොලිස් බල ප්‍රදේශවල අඩු ආදායම්ලාභී පවුල් 72,345කට රුපියල් පන්දහසේ දීමනාව හෙට (20) සිට ලබාදීමට රජය තීරණය කර තිබේ.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ, අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ සහ ආර්ථික පුනර්ජීවනය සහ දරිද්‍රතාව තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්ය සාධක බළකායේ සභාපති බැසිල් රාජපක්ෂ මහත්වරුන්ගේ මැදිහත්වීම මත මුදල් අමාත්‍යාංශය මේ සඳහා රුපියල් කෝටි 40ක් වෙන් කර තිබෙන බව සංචාරක අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා දිනමිණට පැවසීය.

පිට 06

# බැසිල්ට චෝදනා නැඟෙන පරිදි ප්‍රකාශයක් දෙන්නැයි FCIDය බලපෑම් කළා

## සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ හිටපු සභාපති භාෂ්වර ගුණරත්න

රෝෂන් තුෂාර

හිටපු අමාත්‍ය බැසිල් රාජපක්ෂ මහතාට චෝදනා ගොනු කළ හැකි වන පරිදි ප්‍රකාශයක් කරදෙන්නැයි කියමින් FCIDය පොලිස් මූල්‍ය අපරාධ කොට්ඨාසය තමාට බලපෑම් කළ බව සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ හිටපු සභාපති භාෂ්වර ගුණරත්න මහතා දේශපාලන පළි ගැනීම් විමර්ශන ජනාධිපති කොමිසම හමුවේ සාක්ෂි දෙමින් පසුගියදා (16) පැවසීය.

පිට 06

# පළාත් සභා ඡන්දය පවත්වන්න මැතිවරණ කොමිෂන් සභාවෙන් ජනපතිට ලිපියක්

අනුර ප්‍රේමලාල්

පළාත් සභා මැතිවරණය දැනටමත් ප්‍රමාද වී ඇති බැවින් එය පැවැත්වීමට කටයුතු යොදන ලෙස මැතිවරණ කොමිෂන් සභාව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා වෙත ලිපියක් යවමින් ඉල්ලීමක් කර තිබේ.

පිට 06

# ඇවන්ගාඩ් සිද්ධියට කෙසේ හෝ ගෝඨාභයට නඩු පවරන්න කියා දිල්රුක්ෂි බලපෑම් කළා

## ප්‍රධාන පොලිස් පරීක්ෂක තිස්ස පිලපිටිය

රෝෂන් තුෂාර

ඇවන්ගාඩ් සිද්ධිය සම්බන්ධයෙන් ගෝඨාභය රාජපක්ෂ මහතා ඇතුළු පිරිසට එරෙහිව කෙසේ හෝ නඩු පවරන ලෙසට අල්ලස් දූෂණ විමර්ශන කොමිසමේ හිටපු අධ්‍යක්ෂ දිල්රුක්ෂි ඩයස් වික්‍රමසිංහ මහත්මිය තමන් ඇතුළු නිලධාරීන්ට බලපෑම් කළ බව ප්‍රධාන පොලිස් පරීක්ෂක තිස්ස පිලපිටිය මහතා දේශපාලන පළි ගැනීම් විමර්ශන කොමිසම හමුවේ සාක්ෂි දෙමින් පැවසීය.

පිට 06

# බ්‍රැන්ඩික්ස් පොකුරේ මූලය සොයා විමර්ශන කරනවා

## යුද හමුදාපති

නුවන් කොඩිකාර

මිනුවන්ගොඩ බ්‍රැන්ඩික්ස් කොවිඩ් පොකුර ආරම්භ වූයේ කෙසේදැයි තහවුරු කර ගැනීම සඳහා විමර්ශන කිහිපයක් ක්‍රියාත්මක කර තිබෙන බව යුද හමුදාපති ලුතිතන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා පවසයි.

පිට 06

# විදේශගත ශ්‍රී ලාංකිකයන්ට ඡන්ද අයිතිය ලැබෙන පරිදි නීති සංශෝධනය කරන්න තේරීම් කාරක සභාවක්



ධනුෂ්ක ගොඩකුඹුර

විදේශගත ශ්‍රී ලාංකේය පුරවැසියන් හට ඡන්ද අයිතිය ලැබෙන සේ මැතිවරණ නීති සංශෝධනය කිරීමට තේරීම් කාරක සභාවක් යෝජනා කරන බව අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා ප්‍රකාශ කළේය.

මැතිවරණ කොමිෂන් සභාවේ උපාය මාර්ගික සැලසුම් පිළිබඳ අරලියගහ මන්දිරයේදී පසුගියදා (16) පැවැති සාකච්ඡාවකට එක් වෙමින් අග්‍රාමාත්‍යවරයා මේ බව පැවසීය.

පිට 06

# එජාප ජාතික ලැයිස්තු මන්ත්‍රී ධුරයට සුදුස්සකු ළඟදීම පත් කරනවා



ශිරෝමි අබයසිංහ

එක්සත් ජාතික පක්ෂයේ ජාතික ලැයිස්තු මන්ත්‍රීධුරය සඳහා පක්ෂයේ එකඟතාව මත ඉතා ඉක්මනින් සුදුස්සකු පත් කරන බව පක්ෂයේ නායක හිටපු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා පවසයි.

පිට 06

# නැති බලයක් ආරෝපණය කර ගත්තේ පූජිත් නොවේ

"නැති බලයක් ආරෝපණය කරගෙන පූජිත් FCIDය පිහිටුවුවා, ජනපති කොමිසම හමුවේ රනිල් පිළිගනී" යනුවෙන් පසුගිය 17 වැනිදා 'දිනමිණ'

පිට 06

# මතුගම ගම් 3ක් හුදෙකලා කරයි

රක්ෂණ ශ්‍රියන්ත

මතුගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඕවිටිගල, බදුගම සහ බදුගම නව ජනපදය ගම්මාන හුදෙකලා ගම්මාන ලෙස නම් කර ඇති

පිට 06

# මම නාමල් කුමාරව දන්නෙවත් නෑ

## මෛත්‍රී ජනපති කොමිසමට කියයි

සුභාෂිණී සේනානායක

නාමල් කුමාර යන අය දන්නේවත්, දැකලාවත් නැති බවත් ඔහු සම්බන්ධයෙන් ආරක්ෂක මණ්ඩලයේ කිසිදා කතා කර නැති බවත් හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා පෙරේදා (17) පාස්කු කොමිසම හමුවේ කියා සිටියේය.

පිට 06

# විස්සට එරෙහි සමගි ජන බලවේගයේ වැඩසටහන් යළි සක්‍රිය කිරීමට යයි

ශිවන්ති ප්‍රනාන්දු

කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් 20 වැනි සංශෝධනයට එරෙහිව සීමාසහිතව ක්‍රියාත්මක කළ සිය වැඩසටහන් මාලාව යළි සක්‍රිය කිරීමට සමගි ජන බලවේගය පියවර ගෙන තිබේ.

කොවිඩ් 19 වසංගතය පැතිරීම ඉහළ ගොස් තිබියදී වුවද 20 වැනි සංශෝධනය සම්මත කරගැනීම සඳහා ආණ්ඩුව ගන්නා උත්සාහයේ වෙනසක් නොවීම හේතුවෙන් නව ව්‍යවස්ථා

පිට 06

# අත්අඩංගුවට පත් අයකු මියයෑම

## පූගොඩ පොලිසියේ සැරයන්වරයෙක් අත්අඩංගුවට

රක්ෂණ ශ්‍රියන්ත

පසුගියදා පූගොඩ මණ්ඩාවල ප්‍රදේශයේදී පොලීසිය විසින් අත්අඩංගුවට ගෙන රෝහල්ගත කළ තරුණයකු මියයෑමේ සිද්ධිය සම්බන්ධයෙන් පූගොඩ පොලිස් ස්ථානයට අනුයුක්ත පොලිස් සැරයන්වරයකුද අත්අඩංගුවට ගෙන ඇති බව පොලිස් මාධ්‍ය ප්‍රකාශක නියෝජ්‍ය පොලිස්පති අජිත් රෝහණ මහතා පැවසීය.

පිට 06

# පාප් වහන්සේගේ නිවස්නයේ අයකුට කොරෝනා

## පිරිසක් නිරෝධායනයට

බුද්ධි කරුණාරත්න

අති උතුම් ශුද්ධෝත්තම ෆ්‍රැන්සිස් පාප් වහන්සේ ජීවත් වන නිවස්නයේ පුද්ගලයකුට කොරෝනා වයිරසය ආසාදනය වීම නිසා මේ වන විට නිරෝධායනයට යොමු කර ඇතැයි වතිකානය පෙරේදා (17) නිවේදනය කර තිබේ.

පිට 06

# 20 ගැන ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව හෙට කථානායකට

ස්වර්ණා විජේකෝන්

විසි වැනි ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතා විසින් හෙට (20) පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නියමිත වේ.

20 වැනි ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණ

පිට 06



# හෙට තීන්දුව ලැබෙන තෙක් බදියුදීන් අත්අඩංගුවට ගන්න එපා

## මහජන කොංග්‍රසයේ නියෝජ්‍ය නායක ජ්‍යෙෂ්ඨ නීතිඥ එන්. එම්. සහීඩ් ඉල්ලයි

බුද්ධි කරුණාරත්න

රිෂාඩ් බදියුදීන් අත්අඩංගුවට ගැනීමෙන් වළක්වන ලෙස ඉල්ලමින් ගොනු කළ නඩුවේ තීන්දුව හෙට (20) ලබාදෙන බැවින් එයට හිස නමා ඔහු අත්අඩංගුවට ගැනීමෙන් වළකින ලෙස ඉල්ලා සිටින බව මහජන කොංග්‍රසයේ නියෝජ්‍ය නායක ජ්‍යේෂ්ඨ නීතිඥ එන්. එම්. සහීඩ් පැවසීය. ඒ මහතා ඒ බව ප්‍රකාශ කළේ වැල්ලවත්ත සුපුන් ගොඩනැගිල්ලේ පිහිටි පක්ෂ කාර්යාලයේ පැවැති මාධ්‍ය සාකච්ඡාවකට සහභාගී වෙමිනි.

පිට 06

# පුත්තලමේ මන්ත්‍රීවරයකු හොර පොල් කැඩිල්ලක

## මන්ත්‍රීවරයා චෝදනාව ප්‍රතික්ෂේප කරයි

ප්‍රසාද් පූර්ණමාල් - පුත්තලම දිසා සමූහ

පුත්තලම දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු රජයට අයත් ඉඩමක් වසර හතරක කාලයක සිට බලහත්කාරයෙන් අල්ලා ගනිමින් භුක්ති විඳින බව කියමින් නාත්තන්ඩිය ප්‍රදේශවාසීන් පිරිසක් ඊයේ (18) දහවල් එම ඉඩම ඉදිරිපිටට පැමිණ විරෝධතාවක නිරත විණි.

පිට 06

# සීමාවාසික වෛද්‍ය නිලධාරීන් 1117කට නව පත්වීම්

සන්ධ්‍යා කරුණාරත්න

සීමාවාසික වෛද්‍ය නිලධාරීන් 1117කට නව පත්වීම් ප්‍රදානයට රජය තීරණය කරයි.

පත්වීම්ලාභීන් සියලු දෙනා හෙට (20) සේවයට වාර්තා කිරීම අනිවාර්ය බව සෞඛ්‍ය අමාත්‍යාංශය දැනුම් දෙයි.

පත්වීම්ලාභීන්ගේ නාම ලේඛනය පසුගියදා (17) සිට සෞඛ්‍ය අමාත්‍යාංශයේ www.health.gov.lk වෙබ් අඩවියේ සඳහන් වේ.

පිට 06




# කොවිඩ් මර්දනයට පරිපූරක හා අතුරු වෛද්‍ය වෘත්තිකයන් දක්වන සහයෝගය ඇගැයේ

කොවිඩ්-19 පාලනයට හා මැඩ පැවැත්වීමට උරදෙන සෞඛ්‍ය කාර්ය මණ්ඩල ආරක්ෂා කර ගත යුතු බව සෞඛ්‍ය අමාත්‍ය පවිත්‍රා වන්නිආරච්චි මහත්මිය සෞඛ්‍ය අමාත්‍යාංශයේ දී පෙරේදා (17) පැවැති සාකච්ඡාවකදී පැවැසීය.

පරිපුරක හා අතුරු වෛද්‍ය සේවා වෘත්තීය සමිති නායකයන් සහ නියෝජිතයන් සමග පැවැති මෙම සාකච්ඡාවේ දී කොවිඩ් -19පාලනය හා මැඩපැවැත්වීමේ වැඩපිළිවෙළට පරිපූරක හා අතුරු වෛද්‍ය සේවා වෘත්තිකයන් විසින් ලබා දෙන සහාය අගය කරන බව ඇමැතිවරිය ප්‍රකාශ කළාය.



ඉදිරියටත් එම වැඩපිළිවෙළ සඳහා සහයෝගය ලබාදෙන ලෙස ඉල්ලා ඇය මෙහිදී ඉල්ලීමක් කළාය. පරිපූරක හා අතුරු වෛද්‍ය සේවා වෘත්තිකයන් ක්ෂේත්‍රයේ දී මුහුණපාන ගැටලුවලට කඩිනම් විසදුම් ලබාදෙන ලෙස සෞඛ්‍ය ලේකම් මේජර් ජනරාල් වෛද්‍ය සංජීව මුණසිංහ මහතා සහ වැඩ බලන සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විශේෂඥ වෛද්‍ය එස්. ශ්‍රිධරන් මහතා ඇතුළු නිලධාරීන්ට ඇමැතිවරිය මෙහිදී උපදෙස් දුන්නාය.

සෞඛ්‍ය ආයතනවල, ක්ෂේත්‍රවල සේවය කරන සෞඛ්‍ය කාර්ය මණ්ඩල ආරක්ෂා කර ගැනීම සෞඛ්‍ය අංශවල වගකීමක් බවත්, සෘජුව ආසාදිත යැයි සැකරන පුද්ගලයන් සමග නිතරයෙන් කටයුතු කරනු ලබන සෞඛ්‍ය කාර්ය මණ්ඩල ද පීසීආර් පරීක්ෂණ සඳහා යොමු කිරීමේ අවශ්‍යතාවය ඇති බවත් ඇය පැවැසුවාය.

මෙම අවස්ථාවට සෞඛ්‍ය ලේකම් මේජර් ජනරාල් වෛද්‍ය සංජීව මුණසිංහ මහතා, වැඩ බලන සෞඛ්‍යසේවා අධ්‍යක්ෂ ජනරාල් විශේෂඥ වෛද්‍ය-එස්. ශ්‍රිධරන් මහතා, අතිරේක ලේකම්වරුන් ඇතුළු සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිලධාරීහු එක්ව සිටියහ.

## රාජ්‍ය ඇමැති පියල් නිශාන්ත කෝට්ටේ ඉසුරු විද්‍යාලයේ නිරීක්ෂණයක



**සිතාරා සේනානි**

කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය ඇමැති පියල් නිශාන්ත මහතා කෝට්ටේ ඉසුරු විද්‍යාලය පසුගියදා නිරීක්ෂණය කළේය. ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ විශේෂ අවධානයට ලක්ව ඇති මෙම විද්‍යාලය පිළිබඳ රාජ්‍ය අමාත්‍යවරයා දැනුම්වත් කිරීමෙන් අනතුරුව ඒ මහතා එම විද්‍යාලයේ කටයුතු නිරීක්ෂණය කිරීමට පියවර ගෙන තිබුණි.

මෙම විදුහලේ සංවර්ධන වැඩ කටයුතු රැසක් ආරම්භ කර අතරමග නවතා දමා ඇති අතර, එම ව්‍යාපෘති අධීක්ෂණය කර කඩිනමින් නැවත ආරම්භ කිරීමට මෙහිදී සාකච්ඡා විය. අක්කර 8ක වපසරියකින් යුත් මෙම විදුහලේ ක්‍රීඩා පිටිය, පිහිනුම් තටාකය ඇතුළු යටිතල පහසුකම් සංවර්ධනය කර නගරයේ අනෙකුත් විදුහල්වලට ඇති තරගකාරී බව ඉවත් කිරීමට අපේක්ෂා කරන බවත්, ප්‍රදේශයේ පාසල් ළමයින් සඳහා ගුණාත්මකභාවයෙන් යුතු අධ්‍යාපනයක් ලබා දීමට අදහස් කරන බවත් රාජ්‍ය ඇමැති පියල් නිශාන්ත මහතා එහිදී පැවසීය.

# ආයෝජන මණ්ඩල කර්මාන්ත ශාලාවල පීසීආර් 15000කට වඩා සිදු කරති

## අපනයන ආදායම් රැකගැනීම සෞඛ්‍යාරක්ෂිතව

**නුවන් කොඩිකාර**

කොවිඩ් දෙවන රැල්ල ආරම්භ වීමෙන් පසු ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ ඇති කර්මාන්ත ශාලාවල පමණක් පසුගිය දින කිහිපය තුළදී පීසීආර් පරීක්ෂණ 15000කට වැඩි ප්‍රමාණයක් සිදුකර අවසන් බව ගුවන්තොටුපළ හා ආයෝජන කලාප සංවර්ධන රාජ්‍ය ඇමැති ඩී වී චානක මහතා පවසයි.

මෙහිදී ආයෝජන කලාප තුළ දසදහස ඉක්මවමින්ද ඉන් පිටත පන්දහස ඉක්මවමින්ද සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශයන්ට අනුව සෑම කම්හලක්ම ආවරණය වන පරිදි සේවකයන්ගේ පීසීආර් පරීක්ෂණ සිදු කිරීමට පියවර ගෙන ඇතැයි හෙතෙම පැවැසීය.

සේවක සුරක්ෂිතභාවය පවත්වාගෙන යෑමටත් නිෂ්පාදන ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වාගෙන යෑමටත් තම අමාත්‍යාංශයේ පූර්ණ අවධානය යොමුව ඇතැයි මාධ්‍ය වෙත අදහස් දක්වමින් ඒ මහතා කීවේය.

## කොවිඩ්-19 දෙවන රැල්ල පාලනයට පියවර

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මාස කිහිපයකටම පෙර සිටම මෙවැනි අවදානම් තත්ත්වයක් ඇති වුවහොත් ඊට මුහුණ දීමට සූදානම් වූ බවද රාජ්‍ය ඇමැතිවරයා පැවැසීය.

සෞඛ්‍ය අමාත්‍යාංශය, සෞඛ්‍ය පරීක්ෂාණායතනය, මහජන සෞඛ්‍ය නිලධාරීන් හා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් එක් කරගනිමින් සෑම ආයෝජන කලාපයකම සෞඛ්‍ය ආරක්ෂිත වැඩ සටහන් ක්‍රියාත්මක කළ බව හෙතෙම පවසයි.

කොවිඩ් අවදානමෙන් රට මුදා ගන්නවා මෙන්ම ආර්ථිකය සතුරු දායකව පවත්වාගෙන යෑමටත් තම අමාත්‍යාංශය කැප වන බව පවසන රාජ්‍ය ඇමැතිවරයා අපනයන ආදායම ඉහළ නංවා ගැනීම තම අපේක්ෂාව බවද කියා සිටියේය.

රාජ්‍ය ඇමැතිවරයා මෙසේද වැඩිදුරටත් පැවසීය.

කර්මාන්තශාලාවල මානව සම්පත් කළමණාකරුවන්ට සියලු සේවකයන්ගේ ජීවදත්ත යාවත්කාලීන කරන ලෙස දැනුම් දී තිබිණි. එසේම කම්හල් තුළ කුඩා කණ්ඩායම් වශයෙන් වැඩකිරීම, සෞඛ්‍ය ආරක්ෂිත පිළිවෙත් අනුගමනය කිරීම, කලාපයෙන් බැහැරව සිටින අවස්ථාවේ සෞඛ්‍ය ආරක්ෂිතව කටයුතු කිරීම වැනි අංශයන් පිළිබඳව නියාමනයන් හා දැනුවත් කිරීම් මෙම වැඩසටහන් හරහා සිදුකළා. 2019 වසරේ මෙරට මුළු අපනයන ආදායම ඩොලර් බිලියන 11.8ක්. ඉන් 70%ක් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ ඇති කර්මාන්තශාලාවලින් සිදුකළ අපනයන්ය. කර්මාන්තශාලා 1800ට වැඩි ප්‍රමාණයක් මෙම අපනයන නිෂ්පාදනයන්ට දායක වේ. එම ආයතන තුළ ලක්ෂ 5ට වැඩි ශ්‍රම බලකායක් සේවය කරනවා. පවතින අර්බුදය හමුවේ වුවද පසුගිය මාස තුන තුළ මසකට ඩොලර් බිලියන 1ට වැඩි අපනයන ආදායමක් ඉපයීමට අපට හැකි වුණා. එය රටක් ලෙස අප ලැබූ ජයග්‍රහණයක්. අනෙක් රට වල ඇණවුම් පවා මෙරටට ලැබුණා. ලෝකයේ පවතින මෙම අර්බුද අවස්ථාව තුළ අප රටට වාසි අත් කරගත හැකි ලෙස උපායශීලී විය යුතුයි.

## එජාප නිර්මාතෘ ඩී. එස්. සේනානායක 136 ජන්ම දින සැමරුම

එක්සත් ජාතික පක්ෂයේ නිර්මාතෘ දිවංගත ඩී. එස් සේනානායක ශ්‍රීමතාණන්ගේ 136 වන ජන්ම දින සැමරුම් උත්සවය වෙනුවෙන් විශේෂ පුෂ්පෝපහාර වැඩසටහනක් හෙට (20) වන දා උදෑසන 7.00 ට කොල්ලුපිටිය ශ්‍රී ධර්මකීර්ත්‍යාරාමය විහාරස්ථානයේදී (පොල්වත්ත පන්සල) පැවැත්වීමට සැලසුම් කර තිබේ.

එක්සත් ජාතික පක්ෂය නියෝජ්‍ය නායක රුවන් විජයවර්ධන මහතාගේ මුලිකත්වයෙන් පැවැත්වෙන මෙම උත්සවය, පවතින කොරෝනා අවදානම හේතුවෙන් සීමිත පිරිසකගේ සහභාගීත්වයෙන් ඉතා චාම් අයුරින් පැවැත්වීමට නියමිතය.

1948 වසරේ පෙබරවාරි 04 වනදා මෙරටට නිදහස දිනාගත් උත්සවයෙන් අනතුරුව එදිනම කොල්ලුපිටිය ශ්‍රී ධර්මකීර්ත්‍යාරාමය විහාරස්ථානයට පැමිණ ඇති ඩී.එස් සේනානායක ශ්‍රීමතාණන් එහි අඹ පැළයක් රෝපණය කර තිබෙන්නේ නිදහස් දිනය සිහිවීම පිණිසයි. එම අඹ වෘක්ෂය විහාරස්ථාන භූමියෙහි අදත් පවතී.

පුෂ්පෝපහාර වැඩසටහන සිදුකිරීමට නියමිතව ඇත්තේ එම වෘක්ෂය ඉදිරිපිට නිර්මාණය කර ඇති ඩී එස් සේනානායක ශ්‍රීමතාණන්ගේ ප්‍රතිමාව සඳහායි.

වර්ෂ 1884 ඔක්තෝබර් මස 20 වැනිදා මෙලොව එළිය දුටු ඩී එස් සේනානායක ශ්‍රීමතාණන් මෙරටට නිදහස දිනා දීම සඳහා පුරෝගාමී මෙහෙවරක් ඉටු කළේ ය. 1947 දී 1952 දක්වා ශ්‍රී ලංකාවේ ප්‍රථම අග්‍රාමාත්‍ය ධූරය ද හෙබවූ ඩී. එස් සේනානායක ශ්‍රීමතාණන් ගල්ඔය වැනි යෝධ කෘෂිකාර්මික ව්‍යාපෘති නිර්මාණය කරමින් මෙරට ස්වයංපෝෂිත කිරීම වෙනුවෙන් ඉටු කළ කාර්ය භාරය සුළු පටු නොවේ.

SINCE 1978 42nd OBSERVER MOBITEL SCHOOL CRICKETER OF THE YEAR 2020
Recognizing talent, inspiring greatness.
Sri Lanka Telecom Mobitel ඔබ සමගයි. සැමදා.

### 42 වන ඔබ්සවර් - මොබිටෙල් වඩාත් ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව - 2020

ඔබේ ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයාට / ක්‍රීඩිකාවට මනාපය පළ කර ඔහුව / ඇයව වසරේ ඔබ්සවර් - මොබිටෙල් වඩාත් ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව කිරුළ දක්වා රැගෙන යන්න.

☐ **වඩාත්ම ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා 2020**

ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමය මගින් පවත්වනු ලබන 2019/2020 වයස අවු. 19 න් පහළ "පළමු, දෙවන සහ තෙවන කාණ්ඩ" අන්තර් පාඨශාලයීය තරඟාවලීන්හි දී තරග වදින ක්‍රිකට් ක්‍රීඩකයින්, මනාප ලැබීමට සුදුසු වේ.

☐ **වඩාත් ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩිකාව 2020**

ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමය මගින් පවත්වනු ලබන 2019/20 වයස අවු. 19 න් පහළ "සමස්ත ලංකා අංශයේ" අන්තර් පාඨශාලයීය තරඟාවලීන්හි දී තරග වදින ක්‍රිකට් ක්‍රීඩිකාවන් මනාප ලැබීමට සුදුසු වේ.

ඔබේ ක්‍රීඩකයා : ..................

අංශය: පළමු කාණ්ඩය ☐ දෙවන කාණ්ඩය ☐ තෙවන කාණ්ඩය ☐

සමස්ත ලංකා ක්‍රීඩිකාව: ..................

**(එක් කූපනයක් එක් ක්‍රීඩකයෙකුට / ක්‍රීඩිකාවකට පමණක් වලංගු වේ)**

පාසල : ..................

ඔබේ නම : ..................

ලිපිනය : ..................

ජංගම දුරකථන අංකය : ..................

SUNDAY OBSERVER

**vote.schoolcricketer.lk වෙත පිවිසීමෙන්ද ඔබගේ මනාපය ප්‍රකාශ කළ හැක.**

**කූපන්පත් එවා සතිපතා ත්‍යාග දිනාගන්න.**

**ප්‍රථම ත්‍යාගය** : Mobitel 4G Wi-Fi router **දෙවන ත්‍යාගය** : රු. 2,500/-
**තෙවන ත්‍යාගය** : රු. 1,500/- **හතරවන ත්‍යාගය** : රු. 1,000/-

42 වන ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව නම් කිරීමේ තරඟාවලිය දැන් ආරම්භ කර ඇත. සම්පූර්ණ කරනලද ඉහත කූපනය ක්‍රීඩා සංස්කාරක, සන්ඩේ ඔබ්සවර්, ලේක්හවුස්, කොළඹ 10 වෙත තැපැල් කරන්න.

**කොන්දේසි :**

1) එක් කූපනයක් එක් ක්‍රීඩකයෙකුට / ක්‍රීඩිකාවකට පමණක් වලංගු වේ.
2) ලේක්හවුස් හෝ මොබිටෙල් ආයතනයේ සේවක / සේවිකාවන්ගේ දූ දරුවන්ට තරගයට සහභාගි විය නොහැක.
3) ජයග්‍රහණය කරනු ලබන අයට මුදල් / කුසලාන හා සහතිකපත් හිමි වේ. සෑම කූපනයකම එක් ක්‍රීඩකයෙකු පමණක් නම් කළ හැකි අතර, එය එක් තරඟ වාරයක් සඳහා පමණක් වලංගු වේ. තරඟාවලියේ අවසාන තීරණය සන්ඩේ ඔබ්සවර් ක්‍රීඩා සංස්කාරක සතු වේ.

**දිනය** 2020-10-24 **අංකය** 33

UNLIMITED YouTube HD quality up to 25GB*
මාසෙටම රු. 249+බදු #170# අමතන්න
4G Sri Lanka Telecom Mobitel

# සාතිශය සංවේගය



## ආර්.එම්.එම්.එන්. රත්නායක මිය

(පොතුහැර ශාඛාව)

සමගි මාවත, වදුරාගල, කුරුණෑගල නිවසේ පදිංචිව සිටි

**ආර්.එම්.එම්.එන්. රත්නායක මහත්මියගේ**

හදිසි අභාවය පිළිබඳව

*ආයතනික කළමනාකාරීත්වය ඇතුළු කාර්ය මණ්ඩලයේ සාතිශය සංවේගය මෙයින් පළකර සිටිමු.*

අවසන් කටයුතු 2020 ඔක්තෝබර් මස 17 වන දින සවස 5.00 ට මල්කඩුවාව සුසාන භූමියේදී සිදු කෙරිණි.

**නිවන් සැප ලැබේවා!**

ලංකා බැංකුව

BOC ලංකා බැංකුව இலங்கை வங்கி

## ශ්‍රී ලාංකික සම්භවයක් ඇති වනුෂී වෝල්ටර් නවසීලන්ත මැතිසබයට

**මහින්ද අලුත්ගෙදර**

නවසීලන්තයේ උන්මාදය ලෙස සැලකෙන ජසින්ඩා ආර්ඩන් අගමැතිවරියගේ කම්කරු පක්ෂය නියෝජනය කරමින් මෙරට සම්භවයක් ඇති කාන්තාවක වන වනුෂි වෝල්ටර් මහත්මියට නවසීලන්ත පාර්ලිමේන්තුව නියෝජනය කිරීමට අවස්ථාව හිමි වී තිබේ.

නවසීලන්තයේ වයඹ දිග ඕක්ලන්ඩ්හි ඉහළ වරාය ප්‍රදේශය ජයගනිමින් මෙලෙස ඇයට පාර්ලිමේන්තු වරම් හිමිව තිබෙන අතර ජාතික අපේක්ෂකයකු ලෙස මෙම මැතිවරණයට ඉදිරිපත් වූ හිටපු තාක්ෂණික විධායක ප්‍රධානියෙකු මෙන්ම හැමිල්ටන්හි ක්‍රිකට් ක්‍රීඩකයෙකු වූ ජේක් බෙසන්ට් පරාජය කරමින් වනුෂි මහත්මිය මෙලෙස නවසීලන්ත පාර්ලිමේන්තුවේ අසුනක් දිනාගෙන තිබේ.

## කටුනායක කම්හල් දෙකක් වැසීමට අවධානය

**ටී.කේ.ජී. කපිල**

කටුනායක නිදහස් වෙළෙඳ කලාපය තුළ කොරෝනා ආසාදිත සේවකයන් වාර්තා වන ශීඝ්‍රතාවය අනුව ඉදිරි දින වලදී රෝගය පාලනය කිරීම සඳහා මෙම කලාපය තුළ ඇති ඇගලුම් කර්මාන්තශාලා දෙකක් තාවකාලිකව වසා දැමීමට සෞඛ්‍ය අමාත්‍යතුමියගේ අවධානයට යොමු කළ බව ගම්පහ දිස්ත්‍රික් ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෛද්‍ය මිගාර ඇපා මහතා පැවැසීය.

එසේම මෙම කොරෝනා වයිරසය කටුනායක ප්‍රදේශය පුරා පැතිර යෑමට එම ප්‍රදේශයේ ඇති නේවාසිකාගාරවල ඇති සනීපාරක්ෂක පහසුකම් ප්‍රමාණවත් නොවීමද එක් ප්‍රධාන හේතුවක් බවට තොරතුරු අනාවරණය වී ඇති බව ද වෛද්‍ය මිගාර ඇපා මහතා පැවැසීය.

මෙම නේවාසිකාගාර තුළ නේවාසිකව 100ක් 150ක් පමණ සේවිකාවන් සිටියද, ඔවුන්ට සනීපාරක්ෂක කටයුතු සඳහා වැසිකිළි ඇත්තේ 3ක් හෝ 4ක් වීම මෙයට නිදසුනක් බවද සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා පැවැසීය .

## කුවේටයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සුරක්ෂා නිවහනේ
# රඳවා සිටින සේවිකාවන් 160න් වැඩි පිරිසකට කොවිඩ්

**මහින්ද අලුත්ගෙදර**

කුවේට්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ පිහිටි සුරක්ෂා නිවහන සඳහා ශ්‍රී ලාංකික ගෘහ සේවිකාවන් බාර ගැනීම තාවකාලිකව නතර කිරීමට තීරණය කර තිබේ.

එම ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ නිලධාරීන් පිරිසකට සහ සුරක්ෂා නිවහනේ දීර්ඝ කාලයක් තිස්සේ රැඳී සිටින ගෘහ සේවිකාවන් 160 දෙනාගෙන් බහුතරයකට නව කොරෝනා වෛරසය ආසාදනය වීම හේතුවෙන් මේ පියවර ගෙන තිබෙන බව ශ්‍රී ලංකා තානාපති කාර්යාලය පවසයි.

ඒ අනුව මෙම අවස්ථාව වනවිට සුරක්ෂා නිවහනේ ඉඩකඩ ප්‍රමාණවත් නොවන බැවින් පැමිණෙන ගෘහ සේවිකාවන් සඳහා නවාතැන් පහසුකම් සැපයීමේ ගැටලුවක් මතුව ඇති බැවින් මින් ඉදිරියට කිසිදු ගෘහ සේවිකාවක් සුරක්ෂා නිවහනට භාර නොගැනීමට තීරණය කර ඇත.

මේ හේතුවෙන් තම සේවා ස්ථානවල යම් ගැටලුවක් මතු වුවහොත් තානාපති කාර්යාලයට පැමිණීමෙන් වළකින ලෙසත්, තානාපති කාර්යාලය අමතා හෝ විදේශ සේවා නියුක්ති කාර්යාංශය හරහා තම පැමිණිල්ල ඉදිරිපත් කර විසඳා ගැනීමට කටයුතු කරන ලෙසත් කුවේට්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය, එරට සේවයේ නිරත ශ්‍රී ලාංකික ගෘහ සේවිකාවන්ට දැනුම් දී තිබේ.

මේ අතර වසා දැමුණු තානාපති කාර්යාලය හදිසි මහජන සේවා සැපයීම සඳහා පමණක් ඊයේ (18) දිනයේ සිට අර්ධ වශයෙන් විවෘත කිරීමට පියවර ගන්නා ලද බවද කුවේට්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය පවසයි.

## මිනුවන්ගොඩ කොවිඩ් පොකුර
# දේදුගල තරුණියක් මාලඹේ රෝහලට

**බුලත්කොහුපිටිය සමූහ**

බුලත්කොහුපිටිය දේදුගල ප්‍රදේශයේ පදිංචි මිනුවන්ගොඩ බ්‍රැන්ඩික්ස් ආයතනයේ සේවය කළ තරුණියට කොරෝනා රෝගය වැළඳී ඇති බවට මෙම මස 16 වන දින තහවුරු වූ අතර එදිනම ඇය මාලඹේ නෙවිල් ප්‍රනාන්දු රෝහල වෙත ප්‍රතිකාර සඳහා යවා තිබේ. මෙම තරුණිය මෙම මස 2 වන දින මිනුවන්ගොඩ සිට දේදුගල ප්‍රදේශයට බස් රථවලින් පැමිණ ඇති අතර මෙම මස 5 වන දින තරුණියත් ඇගේ මාපියන් හා සහෝදරියත් ස්වංයං නිරෝධායනයට යොමු කර තිබිණි.මේ අතරතුර යුද හමුදාව විසින් ඇය කොග්ගල පිහිටි යුද හමුදා නිරෝධායන මධ්‍යස්ථානයක් වෙත 11 වන දින ගෙන ගොස් පි.සීආර් පරික්ෂණය සදහා ලක් කර ඇත. එහි දී සිදු කරන ලද පී සී ආර් පරික්ෂණයේදී ඇයට කොවිඩ් රෝගය වැළඳී ඇති බවට තහවුරු වී තිබෙයි.

## ජනපතිගෙන් උදවු අරන් දෙන බව කියමින්
# අල්ලස් ගන්න හැදූ 2ක් කොටු වෙති

**සීගිරිය විශේෂ**

ජනාධිපති ආරක්ෂක අංශයේ සහකාර පොලිස් අධිකාරිවරයකු බව පවසමින් පුද්ගලයකුගෙන් රුපියල් ලක්ෂ 15ක කප්පම් මුදලක් ලබා ගැනීම සඳහා සූදානම් වූ පුද්ගලයන් දෙදෙනෙකු දඹුල්ල පොලීසිය මගින් 17 දින පස්වරුවේ අත්අඩංගුවට ගෙන තිබේ.

මෙසේ අත්අඩංගුවට ගෙන ඇත්තේ දඹුල්ල ජයමාවත ප්‍රදේශයේ සහ කපුවත්ත ප්‍රදේශයේ පදිංචිකරුවන් දෙදෙනෙකු බව පොලීසිය කියයි.

කපුවත්ත ප්‍රදේශයේ ව්‍යාපාරිකයකුට අයත් පෞද්ගලික ඉඩමක පැවැති ආරවුලක් විසඳා දීම සඳහා ජනාධිපතිවරයා හරහා එය කඩිනමින් විසඳීමට රුපියල් ලක්ෂ 15 ක මුදලක් මෙම පුද්ගලයා ඉල්ලා ඇති බව පොලීසිය කියයි.

එමෙන්ම ජංගම දුරකථනය හරහා ලබාගත් සියලු ඇමතුම් පටිගත කර ගත් ඉඩම් හිමියා මේ බව දඹුල්ල මූලස්ථාන පොලිස් පරීක්ෂක එදිරිසිංහ මහතාට දැනුම් දී තිබේ .ඒ අනුව වහාම ක්‍රියාත්මක වූ මූලස්ථාන පොලිස් පරීක්ෂකවරයා අපරාධ අංශයේ මෙන්ම බුද්ධි අංශ නිලධාරීන් කණ්ඩායමක් සූක්ෂම ලෙස යොදවා කප්පම් මුදල වන රුපියල් ලක්ෂ 15 ක මුදල ලබා ගැනීම සඳහා අවස්ථාව දිනය ස්ථානය වෙන්කරගෙන තිබිණි. ඒ අනුව දඹුල්ල යාපාගම ප්‍රදේශයේ පාළු ස්ථානයක මෙම මුදල ලබා ගැනීමට සූදානම් ව සිටියදී පොලිසිය මෙම පුද්ගලයන් දෙදෙනා අත්අඩංගුවට ගෙන තිබේ.

මෙම සැකකරුවන්ගේ ජංගම දුරකතනවලින් ඇමතුම් ලැබෙන විට පොලිස් ස්ථානය දුරස්ථ පාලක කථන හඬ ඇසීමට සලස්වමින් මෙම පුද්ගලයා බිය ගන්වා ඇති බවද හඬ පට වල සඳහන් බව පොලීසිය කියයි.

මෙම සැකකරුවන් ගේ දුරකථන වල පටිගත කර ඇති හඩපට පරික්ෂා කොට තවත් පුද්ගලයන්ට මේ ආකාරයේ මුදල් ලබාගෙන ඇත්දැයි පරික්ෂා කරන බව පොලිසිය කියයි .

දඹුල්ල මූලස්ථාන පොලිස් පරීක්ෂක .එදිරිසිංහ මහතා අපරාධ අංශයේ ස්ථානාධිපති උප පොලිස් පරීක්ෂක බිලිව් .එම්. කේ. එස්. වන්නිනායක යන මහත්වරුන් ඇතුළු කණ්ඩායමක් සිද්ධිය සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වන අතර සැකකරුවන් දෙදෙනා 18 දින දඹුල්ල මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතව තිබිණි.

# කැස්බෑවුන් මරා මස් කරමින් සිටි තොඩුවාවේ ධීවරයෝ මාරවිල උසාවියට



**මිහිර විජේසේකර - මාරවිල සමූහ**

මාරවිල පොලිස් වසමට අයත් තොඩුවාව වෙරළ තීරයේදී විශාල ප්‍රමාණයේ කැස්බෑවන් දෙදෙනෙකු මස් පිණිස සකස් කරමින් සිටි ධීවරයන් තුන්දෙනෙකු මාරවිල පොලිසියේ නිලධාරීන් විසින් අත් අඩංගුවට ගෙන තිබේ.

පසුගිය 17 දින දහවල් මෙම අත්අඩංගුවට ගැනීම සිදුවිය. මෙසේ අත්අඩංගුවට ගෙන තිබුනේ තොඩුවාව ප්‍රදේශයේ ධීවරයන් තිදෙනෙකුය.

එදින උදෑසන ධීවර කටයුතු සදහා තොඩුවාව වෙරළින් මුහුදු ගොස් ආපසු ගොඩ බිමට එන විට කැස්බැවන් දෙදෙනා දැලට පිටලි සිටියදී රැගෙන ආ බව ධීවරයෝ පවසති .

මරණ ලද කැස්බෑවන් දෙදෙනා අතර බිත්තර දැම්මට ආසන්නයේ සිටි ගැහැනු සතෙකු සිටි බව පොලීසිය සඳහන් කරයි.

එසේ රහසේ රැගෙන ආ කැස්බැවන් දෙදෙනා තොඩුවාව වෙරළ තීරයේ කිසිවකු සැක නොසිතන අයුරින් රහසිගතව මස් කරමින් අලෙවි කිරීමට සූදානම් කරමින් සිටියදී මෙම අත් අඩංගුවට ගැනීම සිදුවිය. සැකකාර ධීවරයින් මාරවිල අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතව තිබිණි.

## ශ්‍රීකාන්තගේ ප්‍රිදූපත




# දෝතළුඔය කැලෑවකින් ලක්ෂ දෙකක මත්පැන් අල්ලයි

**නිමල් රාජපක්ෂ**

මාවනැල්ල දෝතළුඔය වත්ත ප්‍රදේශයේ කැලෑ පෙදෙසක ඉතා රහසිගතව පවත්වාගෙන ගිය නීතිවිරෝධී මත්පැන් නිෂ්පාදනාගාර දෙකක් වටලා රුපියල් ලක්ෂ දෙකක් වටිනා මත්පැන් තොගයක් සමගින් සැකකරුවන් තිදෙනකු කෑගල්ල සුරාබදු නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන ඇත. අත්අඩංගුවට ගත් මත්පැන් තොගයේ කසිප්පු මිලිලීටර් 8550 ක්, නීති විරෝධී ලෙස සාදන ලද අරක්කු මිලි ලීටර් 360,000 ක්, කසිප්පු පෙරීම සඳහා යොදා ගන්නා දගරයක්, බැරල් 2ක් හා තවත් උපකරණ රැසක් තිබූ බව සුරාබදු මාධ්‍ය ප්‍රකාශක ,සුරාබදු කොමසාරිස් කපිල කුමාරසිංහ මහතා පවසයි.

## ගමිකාව්‍ය

| | |
|---|---|
| සෝද ගන්නට හැකිය හිතමින් පැටවිලා ඇති වැරදි | තට්ටු |
| වරද නිවරද නොපිළිගන්නා පිරිස් කවදත් දමයි | වෙට්ටු |
| නීතියේ දෙවඟනත් එක්කල තබන්නට හැකි නමුත් | ඔට්ටු |
| වැරදි කරුවන් කවද හරි කොයිතැනදි හරි වෙනවමයි | මට්ටු |



ගසමන් සොහා

## ඇ නැ ත්ත



| | |
|---|---|
| තරගෙට වගේ පෙන්නාගෙන තම | හෙලුව |
| කරළියෙ දිග හැරේ යහපාලන | නළුව |
| අවටින් නැඟෙන විට බඩු මිල වැහි | කළුව |
| අපි කලකිරී සිටිනෙමු! නිහඬව | ගොළුව |
| එක පැත්තකින් එයි කෝවිඩ් ගිනි | දැල්ල |
| පූජක පිලෙන් විස්සට එයි | ගෙරවිල්ල |
| හරි මඟ යා යුතුයි නවතා | රැවටිල්ල |
| කවදා අපට අත් වේවිද? | සැනසිල්ල |

රටේමුල්ලේ මුදන්නායක

## එක් දින සේවාවෙන් ජාතික හැඳුනුම්පත් ලබා ගැනීමට
# ඉල්ලුම්පත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට භාර දෙන්න

**නිමල් රාජපක්ෂ**

එක්දින සේවාව යටතේ ජාතික හැඳුනුම්පත් ලබා ගැනීමට වෙලාවන් වෙන් කර ගත් ඉල්ලුම් කරුවන් සිය ඉල්ලුම්පත අතේ තබා ගන්නේ නැතිව නොපමාව ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත බාර දෙන ලෙස පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තුමේන්තුව පවසයි.

එසේ කිරීමෙන් ජාතික හැඳුනුම්පත් කඩිනමින් සකස් කර නොමිලයේම අදාල පුද්ගලයා වෙත යොමු කිරීමට පියවර ගන්නා බව පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තුමේන්තුවේ කොමසාරිස් ජනරාල් ව්‍යානි ගුණතිලක මහතා පවසයි.

කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් හෙට (19) සිට 23 වැනි දින දක්වා පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තුමේන්තුව මහජනතාව වෙනුවෙන් විවෘත නොවුවත් අදාළ සතිය තුළ දිනකට 600කට එක් දින සේවාවට යොමු වීම සඳහා වෙලාවන් හා දිනයන් ලබා දී තිබේ. ඒ අනුව අදාළ සතියට තුළ ඉල්ලුම් පත් තුන්දහසක් පමණ එකතු වන බැවින් ජනතාවට අපහසුතාවකින් තොරව හැඳුනුම්පත් ලබා දීමේ අරමුණින් තමන් සතු ඉල්ලුම් පත කඩිනමින් ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ඇති හැඳුනුම්පත් ශාඛාව වෙත බාර දෙන්න .එවිට එක් දින සේවාව යටතේ කිසිදු ගාස්තුවකින් තොරව ජාතික හැඳුනුම්පත් කඩිනමින් සකස්කර අදාළ ඉල්ලුම් කරු වෙත ලියාපදිංචි තැපෑලෙන් ලබාදිමට පියවර ගැණේ.

එසේ නොමැතිව ලබන 26 වැනි දින සිය කාර්යාලය විවෘත කලවිට සිය ඉල්ලුම්පත් රැගෙනවිත් බාර දිමට තබා ගත හොත් යළිත් විශාල තදබදයක් සිය කාර්යාලයේ ඇතිවිමට ඉඩ කඩ තිබෙනු ඇත. කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ ජනතාව එක්රැස් වීමකින් තොරව සිය රාජකාරි ඉටුකර දිමේ අරමුණ අතිව පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තුමේන්තුව මෙම පියවර ඇත.

මීට අමතරව විභාග සම්මුඛ පරීක්ෂණ කටයුතු හා විදෙස් ගමන් බලපත් ලබා ගැනීම වැනි හදිසි හා අත්‍යවශ්‍ය කටයුතු සදහා ජාතික හැඳුනුම්පත කඩිනමින් ලබා ගැනිමට අවශ්‍ය ඉල්ලුම් කරුවන්ට තම හදිසි අවශ්‍යතාව 0115 226 126, 0115 226 100, 0115 226 115, 0115 226 150 යන දුරකතන අංක ඔස්සේ දෙපාර්තුමේන්තුවට දැනුම් දීමෙන් පසු ඉල්ලුම් පත සදහා කඩිනමින් ජාතික හැදුනුම්පත නිකුත් කිරීමට විශේෂ වැඩ පිළිවෙලක් ආරම්භ කොට ඇතැයිද ව්‍යානි ගුණතිලක මහතා වැඩි දුරටත් පැවසුවේය.

## උසස් පෙළ සිසුවියකට උත්තර ලියන්න
# උදවු කළ ශාලා පරීක්ෂක අත්අඩංගුවට

**ඉංගිරිය මධ්‍යම සමූහ - ප්‍රියදර්ශනී කහවල**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) ඉංජිනේරු තාක්ෂණවේදයට අදාළ ප්‍රශ්න පත්‍රය සඳහා පිළිතුරු ලිවීමට සිසුවියකට වංචනික ලෙස උපකාර කළ විභාග ශාලා පරීක්ෂකවරයකු අත්අඩංගුවට ගත් බව වාද්දුව පොලීසිය කියයි. (16)

වාද්දුව මධ්‍ය මහා විද්‍යාලයේ විභාග ශාලාවේදී සැකකාර විභාග ශාලා පරීක්ෂකවරයා එම සිසුවිය අසල ගැවසෙමින් පිළිතුරු ලිවීම සඳහා ඇයට උදව් කරන අයුරු එම ශාලාවේ විභාග ශාලාධිපතිනියගේ අවධානයට ලක් වීමෙන් අනතුරුව මේ පිළිබඳව පොලිසියට පැමිණිලි කර තිබේ.

අත්අඩංගුවට ගත් සැකකාර ගුරුවරයා පාණදුර ප්‍රදේශයේ පාසලක සේවය කරන, 43 හැවිරිදි වාද්දුව මැලෑගම පදිංචිකරුවෙකි.

අදාළ සිද්ධිය සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා දැනුම්වත් කිරීමට විභාග ශාලාධිපතිනිය පියවර ගෙන ඇතැයි පොලිසිය කියයි. සැකකරු පානදුර මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිත අතර, වාද්දුව පොලීසිය වැඩිදුර පරීක්ෂණ පවත්වයි.

# මරදානේදී බසයක් ගිනි අරන්



**රක්ෂණ ශ්‍රියන්ත**

මරදාන ආමර් වීදියේ බාබර් වීදිය ප්‍රදේශයේ ඊයේ (18) උදේ 7.00ට පමණ පෞද්ගලික බස් රථයක් ගිනිගෙන හානියට පත්ව තිබේ.

බස් රථය ගිනි ගැනීමෙන් පසු කොළඹ ගිනි නිවීම් ඒකකයට එය දන්වා ඇති ඔවුන් එම ස්ථානයට යන විටද බස් රථයට ගින්නෙන් විශාල ලෙස දැවී ගොස් තිබිණි.

කොළඹ ගිනි නිවීම් ඒකකය විසින් ගින්න සම්පූර්ණයෙන් නිවා දමා ඇති අතර ගින්න හේතුවෙන් කිසිවකුට හානියක් වී නැත.

ගින්නට හේතුව බැටරිවල හටගත් දෝෂයක් විය හැකි බව කොළඹ ගිනි නිවීම් ඒකකයේ හෙට්ටියාවත්ත අනු ඒකකයේ අංශ භාර නිලධාරී කේ.කේ. පී.ආර්. නානායක්කාර මහතා පැවසීය.

## උදයංග වීරතුංගගේ ගමන් බලපත්‍රය තහනම් කිරීමට අගමැතිවරයා ලෙස මා නියෝගයක් දුන්නේ නෑ
### හිටපු අගමැති රනිල් වික්‍රමසිංහ

**රෝෂන් තුෂාර**

හිටපු රුසියානු තානාපති උදයංග වීරතුංග මහතා සම්බන්ධයෙන් කැබිනට් මණ්ඩලයේදී සාකච්ඡා කෙරුණ බවත් ඒ මහතාගේ විදේශ ගමන් බලපත්‍රය තහනම් කිරීමට තමන් අගමැතිවරයා ලෙස කිසිදු නියෝගයක් ලබා නොදුන් බවත් හිටපු අගමැති රනිල් වික්‍රමසිංහ මහතා දේශපාලන පළි ගැනීම් විමර්ශනය කිරීමේ ජනාධිපති කොමිසම හමුවේ සාක්ෂි දෙමින් පසුගිය 16දා පැවැසීය.

උදයංග වීරතුංග මහතාගේ විදේශ ගමන් බලපත්‍රය තහනම් කිරීමට එෆ්සීඅයිඩී.යට තමන් නියෝග ලබා දුන්නේ යැයි මාධ්‍ය වාර්තා පළ වන්නේ නම් එය නිවැරදි නොවන බවත් හෙතෙම අවධාරණය කළේය.

2006 වසරේ ශ්‍රී ලංකා රජය සිදු කළ මිග් යානා ගනුදෙනුව සම්බන්ධයෙන් බොරු සාක්ෂි මත නඩු පවරා දේශපාලන පළිගැනීමක් සිදු කළේ යැයි පවසමින් උදයංග වීරතුංග මහතා විසින් ගොනු කර තිබූ පැමිණිල්ලේ වගඋත්තරකරුවෙකු ලෙස සාක්ෂි දෙමින් හිටපු අගමැතිවරයා එසේ පැවැසීය.

හිටපු අගමැතිවරයා - 2006 මිග් ප්‍රහාරක යානා ගනුදෙනුව පිළිබඳව මම දැනුවත්. 2013 යහපාලන රජය පත්වීමෙන් පසුව එෆ්.සී.අයි.ඩී.ය ඊට විමර්ශනයක් කළ බවත් දන්නවා. කොටුව මහේස්ත්‍රාත් අධිකරණය හමුවේ නඩු පැවරීමකුත් කළා. උදයංග මහතාගේ විදේශ ගමන් බලපත්‍රය අත්හිටුවන ලෙස එෆ්සීඅයිඩී. ය අධිකරණයෙන් ඉල්ලීමක් කර තිබුණා.

නීතිඥවරයා - උදයංග වීරතුංග මහතාගේ විදේශ ගමන් බලපත්‍රය අත්හිටුවන ලෙසට ඔබ එෆ්.සී.අයි.ඩී. යට දැනුම් දුන්නද?

හිටපු අගමැතිවරයා - ඒ ගැන අපි කැබිනට් මණ්ඩලයේදී සාකච්ඡා කළා. සාමාන්‍යයෙන් අධිකරණයට එන්නෙ නැති අයෙකුට එරෙහිව නියෝග ලබා ගැනීම සාමාන්‍යයි. වර්තමානයේ රිෂාඩ් බදියුදීන් මහතාට එරෙහිව ද එවැනි නියෝග ලබා ගෙන තිබෙනවා.

මෙහිදී දූෂණ විරෝධී කමිටුව සම්බන්ධයෙන් ද අගමැතිවරයාගෙන් සාක්ෂි ලබා ගැනීමට නියමිතව තිබූ අතර, හිටපු අගමැතිවරයා මීට ඉහතදී ලබාදුන් සාක්ෂි ඊට අදාළ කර ගන්නා ලෙස ඉල්ලා සිටියේය.

# ආරක්ෂක ලේකම් ලෙස මා පත් කර ඇති බව දැනගත්තේ පත් වීම් ලිපිය අතට දුන් විටයි
### හිටපු ආරක්ෂක ලේකම්

**සුභාෂිණී සේනානායක**

තමාට පත්වීම් ලිපිය ලැබෙන තෙක් මෙරට ආරක්ෂක ලේකම්වරයා ලෙස තමා පත් කර ඇතැයි දැනුවත් වී නොසිටි බව හිටපු ආරක්ෂක ලේකම් හේමසිරි ප්‍රනාන්දු මහතා පාස්කු කොමිසම හමුවේ කියා සිටියේය.

2018 ඔක්තෝබර් මාසේ තිස් වැනිදා තමයි මාව ආරක්ෂක ලේකම් වරයා විදිහට පත් කළේ, මේ තනතුර මම කිසිසේත් බලාපොරොත්තු වුණු හෝ ඉල්ලා සිටි තනතුරක් නොවෙයි, මම ඒ වෙද්දී ආයෝජන මණ්ඩලයේ සභාපති, ඊට දින කිහිපයකට පෙර සිට ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානී විදිහටත් මම කටයුතු කළා යැයිද ඒ මහතා කොමිසම හමුවේ කීවේය.

ආරක්ෂක ලේකම් තනතුරේ ඉතා හොඳින් වැඩ කටයුතු කරමින් සිටින අවස්ථාවේ නාලන්ද විදුහලේ රණවිරුවන් ගැන කට කතාවක් නිසා හිටපු ජනාධිපතිවරයා තමන් සමග අමනාපයක් ඇති කරගත් බවත් යම් පිරිසක් මැදිහත් වෙලා තමන් සහ ජනාධිපතිවරයා අතර තිබුණු සම්බන්ධය හිතාමතාම නැති කරන්න උත්සාහ ගත් බවත් හේමසිරි ප්‍රනාන්දු මහතා කොමිසම හමුවේ කියා සිටියේය.

පසුගිදා (14)රාත්‍රියේ හිටපු ආරක්ෂක ලේකම් හේමසිරි ප්‍රනාන්දු මහතා කොමිසම හමුවේ සාක්ෂි ලබාදුන් අවස්ථාවේ ඔහු මේ බව කියා සිටියේය.

ආරක්ෂක ලේකම් විදිහට යම් තරමක සතුටින් වැඩ කළා. නමුත් මම බලාපොරොත්තුවෙන් හිටිය මේ තනතුරේ ඉතා හොඳින් වැඩ කටයුතු කරන්න මට හැකි වෙයි කියලා. නමුත් යම් පිරිසක් මැදිහත් වෙලා මා සහ ජනාධිපතිවරයා අතර තිබුණු සම්බන්ධය හිතාමතාම නැති කරන්න උත්සාහ කළා.ඉන්පසුව හදිසි අවස්ථාවකට හෝ ජනාධිපතිවරයා මුණ ගැසීමට තිබුණු අවස්ථාව මට අහිමි වුණා මොකද ඔහු දේශපාලන අර්බුදයකට ඒ අවස්ථාවේ මුහුණ දීලා සිටියේ. නමුත් ජනාධිපතිවරයාම අත්සන් කළ යුතු ලිපි තිබුණ නිසා මම ගිහිල්ලා කොහොම හරි අත්සන ලබාගෙන ආවා. ජනාධිපතිවරයාත් මාත් අතර විරසකය පටන් ගත්තේ 2019 ජනවාරි මාසේ කොළඹ නාලන්දේන් බිහි වුණු පළවෙනි ආරක්ෂක ලේකම්වරයා විදිහට මං වෙනුවෙන් පවත්වපු උපහාර උලෙළකදි මං කළ කතාවක් පදනම් කරගෙන.

මම එතනදි කිව්වා, රණවිරු කියන වචනය ලංකාව ඉතාම වැරදි විදිහට භාවිතා වෙනවා, රණවිරුවෙක් වෙන්න නම් එයාට රණවිරු පදක්කමක් එයාගෙ නමින් ගැසට් වෙන්න ඕනේ, යුද්ධයකට සහභාගී වුණු හැමෝම රණ විරුවො නෙවෙයි. අඩුම තරමේ මේ කතා කරන මමත් නාවික හමුදාව හිටියේ කෙනෙක් වුණත් මම වත් රණවිරුවෙක් නෙවෙයි, කියලා. කිසිදු රණවිරුවෙකුට ආණ්ඩුවෙන් ලයිසන් දීලා නැහැ කිසිදු පුද්ගලයෙක් පැහැරගන්න. අපේ පැත්තේ යුද අපරාධ වුණා නම් ඒ වගේ දහගුණයක් අනිත් පැත්තෙන් යුද අපරාධ වුණා කියලා.

මම මෙ ප්‍රකාශය කළාට පසුව හිටපු ජනාධිපතිවරයා මට කතා කරලා දැඩි ලෙස දෝෂාරෝපණය කළා. ජනාධිපතිවරයාගේ දේශපාලන ඉදිරිය මම සම්පූර්ණයෙන්ම විනාශ කළා කියලා එතුමා මට චෝදනා කළා. මං ගැන තීරණයක් ගන්නා බවත් එතුමා එවෙලාවේ මට කිව්වා. මේ ගැන ජනාධිපතිතුමාට කියලා ජාතිවාදී දේශපාලකයො කීප දෙනෙකු ජනපති සහ මා අතර විරසකයක් නිර්මාණය කළා.ජනාධිපතිවරයා සහ ආරක්ෂක ලේකම් වරයා වු මා අතර අන්‍යෝන්‍ය විශ්වාසයක් නොමැති වීම හමුවේ ඉතා අවාසනාවන්ත තත්ත්වයක් නිර්මාණය වුණා.

දිනමිණ
The Dinamina
1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත
35, ඩී. ආර්. විජයවර්ධන මාවත,
ලේක්හවුස්, කොළඹ.
දුරකතන - 2429429, 2331181, 2421181
ෆැක්ස් - 2429240
(කර්තෘ මණ්ඩලයට පමණයි)
2449069 (පොදු)
ඊ මේල් - editor.dinamina@lakehouse.lk
දැන්වීම් කළමනාකරු - 2429341
2020 ඔක්තෝබර් 19 සඳුදා

# නිරෝධායනයට ගරහන්න එපා!

රජයේ නිරෝධායන වැඩසටහන් උපහාසයට, අපහාසයට හා ගර්හාවට ලක් කරන කූට වැඩපිළිවෙළක් ඇති බව පෙනී යයි. සමාජ මාධ්‍ය විසින් සමාජගත කරන ඇතැම් වාර්තාවලින් ඒ බව සනාථ වෙයි. එක්තරා වාර්තාවකට අනුව නිරෝධායන මධ්‍යස්ථානයකදී ආහාරය සඳහා අමු කරවල දී ඇත. එහිම සඳහන් වන අන්දමට නිරෝධායනය සඳහා රැගෙන යැමේදී පුද්ගලයන්ට සූදානම් වීමට ඉඩක් ලබා දී නැත. වාර්තාවට අනුව තත්පරයකින් සූදානම් වන්නැ'යි නිලධාරීන් කියා ඇත. මෙය කිසිසේත්ම සිදු විය නොහැකි දෙයකි. හමුදාපතිවරයා මේ සම්බන්ධයෙන් සොයා බැලීමක් සිදු කර ඇති අතර, කිසිදු තැනකදී එවැන්නක් සිදු වී නැති බවට අවධාරණය කරයි.

කොවිඩ් වසංගත තත්ත්වය යටතේ ශ්‍රී ලංකාව මහජනයා වෙනුවෙන් ඉටු කරන කාර්යභාරය ලෝක සෞඛ්‍ය සංවිධානයේ ඇගයීමට ලක් වී ඇත. විශේෂයෙන් මෙහිලා හමුදාව ඉටු කරන කාර්යභාරය කාගේත් අවධානයට ලක් වී ඇත. වසංගත ව්‍යාප්තිය පාලනය කිරීමේදී හමුදාවේ කාර්යභාරය තීරණාත්මක වෙයි. නිරෝධායන මධ්‍යස්ථාන වෙතින් පිට වී යන පුද්ගලයෝ හමුදා නිලධාරීන්ට දණ ගසා වඳිති. සමහරු කවි ගායනා කොට ඔවුන්ට සුබ පතති. තව සමහරු හමුදා නිලධාරීන් දෙවියන්ට සමානයැයි කියා සිටිති. ශ්‍රී ලංකාවේ ඇත්තේ මානුෂීය හමුදාවකි. මිනිසුන්ගේ දුක - කඳුළ - සුසුම ඔවුන්ට හොඳින් දැනෙයි. මෙතෙක් කිසිදු නිරෝධායන මධ්‍යස්ථානයකින් ඇත්ත විවේචනයක් ඉදිරිපත් වී නැත.

කොවිඩ් වසංගතයට මුහුණදීම සඳහා සාමූහිකව ක්‍රියා කළ යුතු බව ප්‍රකාශයට පත් වී ඇත. එහි අදහස වන්නේ සෑම සමාජ කණ්ඩායමක්ම තම වගකීම් හා යුතුකම් ගැන අවබෝධයකින් ක්‍රියා කළ යුතු බවය. එහෙත් ශ්‍රී ලංකාවේ ඇතැම් සමාජ කණ්ඩායම් තම වගකීම් හා යුතුකම් ඉටු කරන්නේ නැත. ඒ ගැන හැඟීමක් පවා නැති බව ද පෙනී ගොස් තිබේ. රජය මුල සිටම දූරදර්ශී සැලැසුමකට අනුව අභියෝගයට මුහුණ දෙමින් සිටී. වසංගත ව්‍යාප්තිය වැළැක්වීම, දෛනික ජීවිතය යථා තත්ත්වයට ගැනීම හා ආර්ථික ක්‍රියාවලිය සක්‍රිය කිරීම අතින් ජයග්‍රහණ වාර්තා කරන්නට ද රජය සමත් විය. එහෙත් ඇතැම් පාර්ශ්වවල වගකීම් විරහිත හැසිරීම් නිසා යළිත් කොවිඩ් අවදානම උත්සන්න වන්නට පටන්ගෙන තිබේ.

විවෘත සමාජය වෙතින් ආසාදිතයන් හමු වීම මුළුමනින්ම නැවතී තිබිණි. එය පැවැතියේ සුළු කාලයක් පමණි. සමාජයේ බහුතරය කොවිඩ් නොසලකා හැර ක්‍රියා කළ බැවින් ගැටලුවේ මුල් අවස්ථාව වෙත යළිත් ඇදවැටී තිබේ. මේ සම්බන්ධයෙන් රජය ගෙන ඇති එක් පියවරක් වන්නේ කොවිඩ් සෞඛ්‍ය උපදේශනය නීතිගත කිරීමය. ඒ අනුව නිසි සෞඛ්‍ය ප්‍රතිපත්ති අනුගමනය නොකරන පුද්ගලයන් අත්අඩංගුවට ගැනීමට ද, දඬුවම් පැමිණවීමට ද සිදු වනු ඇත. මේ පියවර ගෙන ඇත්තේ ද මහජන සුබ සිද්ධිය සඳහාය. වසරේ මුල් කාර්තුවේ ජනතාව සෞඛ්‍ය උපදේශන අනුව ජන ජීවිතය හැඩගස්වා ගත්තේ වුව දෙවන කාර්තුව වන විට සියල්ල අත්හැර තිබිණි. එහෙත් දැන් කොවිඩ් සමග සෙල්ලම් කිරීමට ඉඩක් නැත. ඒ බව කවුරුත් වටහාගත යුතුව තිබේ.

මේ වසංගත සමයේ සමාජ මාධ්‍යවල හැසිරීම කිසිසේත් අනුමත කළ නොහැකිය. රජය මේ සම්බන්ධයෙන් විවිධ මාර්ගෝපදේශන සපයා තිබුණ ද අසත්‍ය තොරතුරු ළැව් ගිනි සේ පැතිර යයි. නිරෝධායනයට එරෙහි මඩ ප්‍රචාරයක් මීට පෙර ද දක්නට ලැබිණි. එය මැකී ගියේ නිරෝධායන මධ්‍යස්ථාන වෙතින් පුද්ගලයන් නික්මී යන්නට පටන් ගත් තැන සිටය. මේ වන විට පනස් දහසකට වැඩි පිරිසක් නිරෝධායනයට ලක් කර ඇත. ඒ සඳහා බරපතළ වියදමක් සේම බරපතළ පරිශ්‍රමයක් ද දැරීමට රජයට සිදු වී ඇත. නිරෝධායන ක්‍රියාවලිය වසංගත පාලනයේදී අංක එකට එයි. එය අවුල් වුව හොත් කොවිඩ් පාලනය මුළුමනින්ම අඩාළ වෙයි.

නිරෝධායන වැඩපිළිවෙළ විධිමත් ක්‍රියාවලියකි. එය සැකසී ඇත්තේ සෞඛ්‍ය අංශවල උපදේශනය මතය. කිසියම් නිවෙසකින් හෝ මධ්‍යස්ථානයකින් හෝ නිරෝධායනය සඳහා පුද්ගලයන් රැගෙන යන්නේ පූර්ව දැනුම් දීමකින් පසුවය. පැය ගණනකට පෙර දුරකතනය ඔස්සේ එම පණිවිඩය ලබා දෙයි. නිරෝධායනයට ඇතුළත් දින ගණනට අවශ්‍ය ඇඳුම් හා වෙනත් දේවල් සකස් කර ගැනීමට පැය ගණනක් හොඳටම ප්‍රමාණවත්ය. නිරෝධායනයට එකතු වන පුද්ගලයන්ගේ නිවාස හා වෙනත් දේපොළ සුරක්ෂිත කිරීමට අවශ්‍ය පියවර ද ගනු ලැබේ. නිවෙසක ඇති කරන සුරතල් සතුන් ගැන පවා සොයා බලන ප්‍රතිපත්තියක් නිරෝධායන වැඩසටහනට ඇතුළත්ය. මේවා පිළිබඳ ඇත්ත සමාජ මාධ්‍යවල පළ වන්නේ නැත.

නිරෝධායන මධ්‍යස්ථාන හා සංචරණ සීමා පනවා ඇති ප්‍රදේශ ගැන නිරන්තරයෙන් සොයා බලන ජාලයක් රජයට තිබේ. සෞඛ්‍ය අංශ, ආරක්ෂක හමුදා පොලීසිය පමණක් නොව රාජ්‍ය පාලනයට සම්බන්ධ ආයතන ද ඊට එකතු කරගෙන තිබේ. ග්‍රාමසේවක මහත්වරුන් පමණක් නොව; ප්‍රාදේශීය ලේකම් කාර්යාල ද, පළාත් පාලන ආයතන ද මේ ජාලයට සම්බන්ධය. කිසිවකුටත් ස්වකීය වගකීම්වලින් බැහැර වීමේ හැකියාවක් නැත. මෙබඳු පසුබිමක නිරෝධායන මධ්‍යස්ථානවල සේවා කඩා වැටෙන්නට ඉඩක් නැත. ආරක්ෂක අංශවලට අමානුෂික ලෙස ක්‍රියා කරන්නට ඉඩක් ද නැත. කොවිඩ් වැළැක්වීමේ කාර්ය සාධන කමිටුව වරින් වර රැස් වී කටයුතු සමාලෝචනය කරයි.

විශේෂඥයන්ගේ මතයට අනුව ශ්‍රී ලංකාව පසු වන්නේ සුබදායක තැනකය. බරපතළ තත්ත්වයක් ඇති වීමට පෙර කොවිඩ් පාලනය කර ගැනීමේ ඉඩ ප්‍රස්තාව තවම ශ්‍රී ලංකාවට ඇති බව ඔවුන්ගේ අදහසය. මේ තත්ත්වය යටතේ නිරෝධායනය පසුගාමී වුව හොත් සමස්ත ක්‍රියාවලිය අඩපණ වීමට ඉඩ තිබේ. සමාජ මාධ්‍ය පතුරවන බොරුවලට අනුව මහජනයා ක්‍රියා කිරීමට පටන් ගත හොත් සිදු වන්නේ බලවත් විනාශයකි. මේ විනාශය ඇති වීමට පෙර සමාජ මාධ්‍ය යම් පාලනයකට නතු කළ යුතුය. අවම වශයෙන් අතේ පැළ වෙන බොරු ප්‍රචාරය කරන කිහිප දෙනකු හෝ සිරගත කළ යුතුය. එය වගකීමකි.

දිල්රුගෙ සීවිද

කොරෝනත් හැංගිලයි නැටුවේ නටපු තරමක් නැටුම් ඔක්කොම
බදියුදීනුත් ඒක ආදර්ශයට ගෙන වගෙ පෙනෙයි බැලුවම
තෝරලා අර ගන්නවා නම් මේ දවස්වල හොඳම සෙල්ලම
ජනප්‍රිය ක්‍රීඩාව විදිහට දැන් තියෙන්නේ හැංගි මුත්තම



# කොවිඩ් සමඟ ජීවත් වන්නේ කොහොමද?



ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුදන්ත ලියනගේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උප කුලපති

මේ මොහොතේ ශ්‍රී ලංකාවේ පමණක් නොව ලෝකය පුරා කොවිඩ් 19 ගෝලීය වසංගතයක් පැතිරෙමින් තිබේ. මෙය ලෝකයට බටහිර වෛද්‍ය විද්‍යාවට අභියෝගාත්මක සංසිද්ධියක් මතු කළ රෝගයක් වී යැයි පැවසුවද වරදක් නැත. එසේ කියනුයේ ඕනෑම වසංගතයකට විද්‍යාත්මකව පරීක්ෂණ පවත්වා ඖෂධ සොයා ගැනීමට බටහිර විද්‍යාව සමත් වුවත් කොවිඩ් 19 වසංගතයට තවමත් ප්‍රතිකාරයක් සොයා ගැනීමට අපොහොසත් වී තිබීමයි.

පුරාතනයේ අප රටේ පමණක් නොව ලොව පුරා වයිරස් රෝග පැතිර ගිය අවස්ථා තිබේ. පැපොල, සරම්ප, කම්මුල්ගාය වැනි රෝග වැලඳුණ විට ඒවාට දෙයියන්ගේ ලෙඩ ලෙස සලකා නිරෝධායනය වීමට අතීතයේ අප රටේ විසුවෝ හුරුවී සිටියහ. එය අදටත් එසේ එම රෝග සම්බන්ධයෙන් ක්‍රියාත්මක වේ. එනිසා රෝග වලට බියෙන් පැන යෑම වෙනුවට නිරෝධායනය වීම අපට අමුතුවෙන් කිව යුතු දෙයක් නොවේ. ඒ නිසා මේ වන විට මතුව තිබෙන කොවිඩ් 19 ගෝලීය වසංගතය හමුවේ ඉන් මිදීමට දින 14ක් නිරෝධායනය වීම වැනි ආශ්‍රිතයින් අනුගමනය කරන ක්‍රියා පිළිවෙත අප ද ක්‍රියාවට නැංවිය යුතුය.

## විද්‍යාත්මක පරීක්ෂා

කොවිඩ් 19 රෝගයෙහි ඇති සුවිශේෂත්වය වන්නේ එය එක් වරක් වැලඳුණ අයකුට පවා නැවත වතාවක් දෙවතාවක් වැලඳීමට ඇති ඉඩකඩයි. අප මුලින් කතා කළ දෙයියන්ගේ ලෙඩ වැනි වයිරස් රෝග එක් අයකුට ජීවිත කාලයටම වැලඳෙනුයේ එක් වරකි. ඒ නිසා ලෝක සෞඛ්‍ය සංවිධානය පවා මෙම කොරෝනා රෝගය මැඬලීමට එන්නතක් සොයා ගැනීමේදී තවදුරටත් විද්‍යාත්මක පරීක්ෂණ සිදු කරමින් කල් ගනිමින් සිටී. ඒ මන්ද මෙය පෙර රෝග මෙන් නොව ඊට හාත්පසින්ම වෙනස් ආකාරයකට ක්‍රියාත්මක වන බැවිනි. ශ්‍රී ලංකාවේ අප මේ අවස්ථාවේ මෙම රෝගය පාලනය කිරීමට අනුගමනය කරන සෞඛ්‍ය සහ රෝගය වැළැක්වීම නිවාරණයට ගන්නා ක්‍රියාමාර්ග ඉතා විධිමත්ය. එනමුත් මේ අවස්ථාවේ රෝගය ආසාදිතයින් දාහක් දෙදහක් එක රෝහලකට ගොනු කරනවා වෙනුවට මෙම රෝගයේ ආසාත්මිකත නිසා සංකූලතාවයට පත්ව සිටින රෝගීන් යම් වර්ගීකරණයකට ලක් කොට වෙනත් රෝග තිබෙන අය වැඩි පහසුකම් සහිත රෝහලක් වෙතත් කොවිඩ් කොරෝනා රෝගීන් පමණක් හැකි නම් වර්ගීකරණය කොට වෙනත් රෝහල් වෙත රැගෙන ගොස් නේවාසිකව ප්‍රතිකාර ලබා දීමට වැඩපිළිවෙළක් සකස් කළ යුතුය. එය ඉතා සංකීර්ණ ක්‍රියාවලියක් වුවත් අපගේ වෛද්‍ය අංශය සහ සෞඛ්‍ය සේවය විශේෂයෙන් ආරක්ෂක අංශ, වසංගත රෝග නිවාරණ අංශ දක්වන කැපවීම් මත එය සිදු කළ නොහැක්කක් නොවන තැනට පරිවර්තනය කර ගැනීමට අපට පුළුවන. ලෝක සෞඛ්‍ය සංවිධානය පවසන පරිදි කොවිඩ් වසංගතයෙන් මරුමුවට පත් වනුයේ රෝගය ආසාදිතයන්ගෙන් 4%ක් තරම් අඩු ප්‍රතිශතයකි. ඒ අනුව ගත් කල අප රටේ දැනට රෝගීන් සංඛ්‍යාව 5000 ඉක්ම වුවද මරුමුවට පත් සංඛ්‍යාව තාමත් ඉතා අඩු අගයක් ගන්නා තැනක සිටීම වාසනාවන්ත තත්ත්වයකි. අප මේ අවස්ථාවේ මෙම තත්ත්වය දිගටම පවත්වා ගෙන යමින් නිරෝධායන කටයුතු සහ ආසාදිතයින් ඇසුරු කළ පුද්ගලයන් ගෙන් රෝගය සමාජගත වීමට ඇති ඉඩ කඩ උපරිමයෙන් අහුරාලමින් කටයුතු කළ යුතුය. මේ රෝගය සඳහා ඔසුවක් නිපදවා ගන්නා තෙක් අපගේ සියලු කටයුතු අතහැර දැමීමට හැකියාවක් නැත. ඒ නිසා කොවිඩ් 19 තත්ත්වය සමඟ තවදුරටත් රැඳෙමින් එයට නොබියව මුහුණ දෙමින් සාමාන්‍ය ජන ජීවිතය පවත්වාගෙන යෑමේ අභියෝගයට අපට මුහුණදීමට සිදුව ඇත. එය අප පමණක් නොව යුරෝපය, අමෙරිකාව, ඕස්ට්‍රේලියාව, නවසීලන්තය ආදී රටවල් පවා අනුගමනය කරන ක්‍රියා පිළිවෙත වී තිබේ. එක් උදාහරණයක් ලෙස ගත හොත් අප විශ්වවිද්‍යාලයේ එක් සිසුවියකට කොවිඩ් ආසාදිත වී ඇතැයි හඳුනා ගත් මොහොතේ ඇය ඇසුරු කළ සමීපතමයින්ගේ ලේඛනයක් ආරක්ෂක අංශ විසින් ඉල්ලා සිටින ලදී. එහිදී 53කුගේ ලේඛනයක් අප ආරක්ෂක අංශ වෙත ලබා දෙන ලදී. එය ලබා දී පැය 3ක් ඇතුළත එම සියලු දෙනාගේ පවුල්වල සාමාජිකයන් හඳුනාගෙන ඔවුන්ට ස්වයං නිරෝධායනය වීමට අවශ්‍ය කටයුතු මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සහ ආරක්ෂක අංශ සාමාජිකයින් සිදු කළේ ඉතා විශිෂ්ට ලෙස බව මේ මොහොතේ ඔවුන්ට කෘතගුණ දැක්වීමක් ලෙස සඳහන් කරනු කැමැත්තෙමි.

එබැවින් මෙවැනි වසංගත තත්ත්වයන් හමුවේ ඊට නොබියව මුහුණ දෙමින් රටේ ජනතාවගේ ජීවිත සෞඛ්‍ය ආරක්ෂාව සහතික කිරීම රජයේ වගකීමය. ලෝකය පුරා පැතිර යන මෙම වයිරසය හමුවේ එය පාලනය කිරීමට ප්‍රධාන වශයෙන් ක්‍රමෝපාය දෙකක් ලෝකයේ සෑම රටකම නායකයින් සෞඛ්‍ය අංශ බලධාරීන් ක්‍රියාත්මක කරනු ලැබේ. පළමු ක්‍රමෝපාය වූයේ සමාජය තුළ මෙවැනි වයිරසයක් පැතිරයෑමට ඉඩ හැර ඒ තුළින් ගොඩනැගෙන ප්‍රතිශක්තිකරණය ඉහළ යෑම තුළ ක්‍රමිකව මෙය පාලනය කිරීමට හැකි බවය. බොහෝ රටවල් බලාපොරොත්තු වූ පරිදි වයිරසය පැතිර යෑමට ඉඩ හැර සමාජයෙන්ම මතු වුණ ප්‍රතිශක්තිකරණය තුළ මෙය පාලනය වීම සිදු නොවීම අමෙරිකා එක්සත් ජනපදය, ධනවත් යුරෝපීය කලාපීය රටවල් සහ ආසියානු රටවල් කිහිපයකට ද එල්ල වූ මරු පහරක් විය. වයස අවුරුදු 50 ඉක්මවූ වැඩිහිටි ජනගහනය මේ රෝගය නිසා දැඩිව අසරණ වූහ. බොහෝ දෙනාගේ ජීවිත අහිමි වූ අතර සමහරු රෝහල්ගත කර එහි සිටි කාලය දින සති නොව මාස ගණන් ඉක්මවා යන තත්ත්වයක් මතුව ඇත. එය කොරෝනා වයිරසය හමුවේ ප්‍රතිශක්තීකරණය ලබා ගැනීමට නොහැකිව විවිධ සංකූලතා වලට ලක්වීමට වැඩිහිටියන්ට සිදු වීමය.මෙවැනි තත්ත්වයන් පාලනය කිරීම සඳහා තවත් රටවල් අනුගමනය කළ ක්‍රමෝපාය වූයේ සමාජයේ රෝගය පැතිර යන පිරිස් හඳුනා ගෙන ඔවුන් නිසි ලෙස නිරෝධායනයට ලක් කිරීමය. ඊට අමතරව රෝගී තත්ත්වය නිසා පීඩාවට පත්වන හඳුනාගත් රෝගීන් ඇසුරු කරන සියලු දෙනා ආරක්ෂක හමුදාවල බුද්ධි අංශ මඟින් මනාව හඳුනාගෙන ඔවුන් ද නිරෝධායන ක්‍රියාවලියකට ලක් කිරීමය.

ශ්‍රී ලංකාවේ නායකත්වය කොවිඩ් 19 රෝගය පාලනය කිරීම සඳහා මේ දෙවැනි ක්‍රමෝපාය මනාව භාවිතයට ගත්තේය. එලෙස භාවිතයට ගැනීමට රට සූදානම් වූයේ ඉතා නිවැරැදි දේශපාලන තීන්දු තීරණ ගත හැකි සෘජු නායකත්වයක් රටේ මහජනතාව විසින්ම තෝරා පත් කර ගෙන තිබීම නිසාමය. ශ්‍රී ලංකාවේ භූමිය සහ ජනගහනය විශාල නොවූවත් සමහර ධනවත් රටවලට වඩා සාර්ථකව මෙම රෝගය පාලනය කිරීමට සමත්වීම සුළුකොට තැකිය හැකි කරුණක් නොවේ. ශ්‍රී ලංකාවේ වර්තමාන ජනාධිපතිවරයා ගෝඨාභය රාජපක්ෂ මහතා සිය ආරක්ෂක සේවා කාලසීමාවේදී ලද පරිචය අත්දැකීම් දැනුම පළපුරුද්ද සහ යම් අභියෝගයක් හමුවේ කටයුතු කළ යුතු ආකාරය මේ රෝගය පාලනය කිරීම සඳහා තීරණ ගැනීමේදී නිවැරැදි ලෙස භාවිතාවට ගත්තේය.

> සමාජ මාධ්‍ය ජාල විවිධ අසත්‍ය තොරතුරු පදනම්ව ගෙන යන ප්‍රචාරයන්ට හසු නොවී ක්‍රියා කිරීමට ජනතාව සබුද්ධික විය යුතුය. විශේෂයෙන් ජනමාධ්‍ය පවා කොවිඩ් වසංගතය පිළිබඳ පුවත් වාර්තා කිරීමේදී ඊට දෙන ප්‍රමුඛතාව සමාජ යහපත සඳහා විනා මාධ්‍ය ආයතනයේ ජනප්‍රියභාවය රැක ගැනීම සඳහා යොදා නොගත යුතුය.

## සෞඛ්‍ය අංශයේ වගකීම

ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සේවාවේ දිගු කාලයක් තිස්සේ පවතින ඉතා සතුටුදායක තත්ත්වය ද මෙය පාලනය කිරීමට විශාල පිටුබලයක් ලබා දුන්නේය. මෙරට සෞඛ්‍ය අංශයේ මානව සම්පතෙහි පවතින කුසලතා මෙන්ම භෞතික සම්පත්වල පවතින ඉහළ ගුණාත්මක ප්‍රමිතිගත යහපත් භාවය ද වයිරසය පාලනය කිරීමට මනාව යොදා ගන්නා ලදී. ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ නියැළි විශේෂඥ වෛද්‍යවරුන්, වෛද්‍යවරුන්, හෙද හෙදියන් සහ අනිකුත් කාර්ය මණ්ඩල ඉතා යුහුසුලුව මෙම වයිරසය පාලනයේදී කටයුතු කළහ. ඊට අමතරව රෝහල් කාර්ය මණ්ඩල, අනිකුත් අතුරු සේවාවල කාර්ය මණ්ඩල, පර්යේෂණාගාරවල පිරිස්, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් ප්‍රධාන සියලු දෙනා මේ අවස්ථාවේ සියලු වාද භේද දුරලා එකාවන්ව පොදු සතුරා වූ වයිරසය පාලනය සඳහා කටයුතු කළහ. ඊට අමතරව ආරක්ෂක හමුදාවෝ මනාව මෙම කටයුතු සඳහා දායක කර ගැනීමට ජනපති ගෝඨාභය රාජපක්ෂ මහතා අභීත නායකත්වයක් ලබා දුන්නේය.

මෙරට ජනතාවට ඕනෑම මොහොතක ඕනෑම ස්ථානයකදී නොමිලේ වෛද්‍ය ප්‍රතිකාර ලබාගැනීම සඳහා රෝහල් ගතවීමට මධ්‍යගත හා පළාත්බද රජයේ රෝහල් පද්ධතියක් ක්‍රියාත්මකය. මේ නිසා කෝවිඩ් 19 වයිරසය ව්‍යාප්තිය පාලනය කිරීමට ජනතාව රෝහල් වෙත යොමු කිරීමේ වැඩි පහසුකමක් අප රටට තිබිණි. එයද මෙය පාලනයට යහපත් ලෙස බලපෑ සාධකයක් විය.

## ඉදිරි පියවර

ශ්‍රී ලංකාවේ ජනතාව නීතියට ඉතා ගරු කරන පිරිසකි. නීතියට අනුව කටයුතු කිරීමට ඔවුන් පෙලඹී සිටිති. බොහෝ පිරිස් නීතියට බයය. නීතිය පැහැදිලිව ක්‍රියාත්මක නොවන තැන්ද තිබෙන්නට පුළුවන. එහෙත් පොදුවේ ජනතාව නීතිගරුකය. ශ්‍රී ලංකාවේ ආරක්ෂක හමුදාවෝ දිගු කලක් තිස්සේ නීතිගරුකව විනයගරුකව කටයුතු කොට කුරිරු ත්‍රස්තවාදය පරාජයට පත් කොට රටේ ජනතාවගේ සිත්වල වීරවරුන් සහ විශ්වසනීය පිරිසක් ලෙස ජනතා විශ්වාසය දිනාගත් පිරිසකි.

මීට අමතරව මෙරට සෞඛ්‍ය සේවාව හා නිතරම සමීපව සම්බන්ධතා පවත්වාගෙන යනු ලබන විශ්වවිද්‍යාල පද්ධතිය විශේෂයෙන් විශ්වවිද්‍යාලවල වෛද්‍ය පීඨ දාමය ද මේ කටයුත්තේදී මනාව අවබෝධයෙන් සහයෝගයෙන් කටයුතු කළේය. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, කොළඹ, පේරාදෙණිය විශ්වවිද්‍යාල ඇතුළු විශ්වවිද්‍යාල පද්ධතියන් ඒවායේ වෛද්‍ය පර්යේෂණ ආයතන හා ඊහා සම්බන්ධිත සියලු ආයතන සහ මානව සම්පත තමන්ට හැකි උපරිමයෙන් රෝගය පාලනය කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග හඳුනාගැනීම, ඒවාට අනුව කටයුතු කිරීම සිදු කළහ. රජයේ රෝහල්වල පීසීආර් පරීක්ෂණ පැවැත්වීමට ප්‍රමාණවත් තරම් වෛද්‍ය උපකරණ නොමැති අවස්ථාවල විශ්වවිද්‍යාල වල තිබෙන පී.සී.ආර්. පරීක්ෂණ යන්ත්‍ර භාවිතයට ගනිමින් රෝගීන් හඳුනාගැනීමට කටයුතු කිරීම අගය කළ යුතු ක්‍රියාවකි. මෙයද රෝගය පාලනයට බලපෑ කරුණකි.

මීට අමතරව වයිරසය පාලනය කිරීම සඳහා විශ්වවිද්‍යාල පද්ධතියෙන් ලැබුණේ සුවිශේෂ සේවාවකි. එනම් මෙම වයිරසය පැතිර යන්නේ කෙසේද යන්න පිළිබඳව දැඩි විද්‍යාත්මක පරීක්ෂණයන් සිදු කොට නව කරුණු සොයා ගැනීමය. මෙම රෝගය වැලඳී මිය ගිය සංඛ්‍යාව අප රට සහ දකුණු ආසියානු කලාපයේ රටවල අඩුය. අමෙරිකාව, යුරෝපය, මැදපෙරදිග රටවල මිය ගිය සංඛ්‍යාව විශාලය. මෙයට හේතුව සොයා බැලූ පර්යේෂකයෝ සොයා ගත් කරුණක් වූයේ දකුණු ආසියානු කලාපයේ ජනතාවගේ ජාන ශක්තිය ප්‍රබල බවය. එය රෝගය වැලඳී මිය යන පිරිස අඩුවීමට හේතු විය. වියට්නාමය, නවසීලන්තය, භූතානය, ආදී රටවල රෝගයෙන් මිය ගිය සංඛ්‍යාව අඩු බවට වාර්තා විය. මේ අනුව සලකා බලන විට ජනතාවගේ ජානවල පවතින ශක්තිය ද රෝගය පාලනය වීමට බෙහෙවින් බලපාන බව කිව යුතුය.

කොවිඩ් 19 හමුවේ අප ඉන් බිඳ නොවැටී ඉදිරියට ක්‍රියා කළ යුත්තේ කෙසේද යන්න පිළිබඳ කතිකා කරමු. මෙහිදී අප රජය ලබා දෙන වෛද්‍ය උපදෙස් සහ සෞඛ්‍යාරාක්ෂිත ක්‍රමවේද ඒ අයුරින්ම පිළිගනිමින් කටයුතු කළ යුතුය. මෙහිදී රජයට පමණක් මුළුමනින්ම රෝගය පැතිර යෑම වැළැක්වීමට හැකියාවක් නැත. මහජනතාව විශේෂයෙන් රජය සහ සෞඛ්‍ය අංශ ලබා දෙන උපදෙස්වලට අනුගතව කටයුතු කළ යුතුය.

මීට අමතරව සමාජ මාධ්‍ය ජාල විවිධ අසත්‍ය තොරතුරු පදනම්ව ගෙන යන ප්‍රචාරයන්ට හසු නොවී ක්‍රියා කිරීමට ජනතාව සබුද්ධික විය යුතුය. විශේෂයෙන් ජනමාධ්‍ය පවා කොවිඩ් වසංගතය පිළිබඳ පුවත් වාර්තා කිරීමේදී ඊට දෙන ප්‍රමුඛතාව සමාජ යහපත සඳහා විනා මාධ්‍ය ආයතනයේ ජනප්‍රියභාවය රැක ගැනීම සඳහා යොදා නොගත යුතුය. සෑම විටම ජනතාවගේ සිත් තුළ කොවිඩ් 19 සමඟ කොතරම් අභියෝගයක් වුවත් ඉදිරි ජීවිත පවත්වාගෙන යෑම සිදු වන බව ඒත්තු යන ආකාරයෙන් මාධ්‍යකරණයක නියැළිය යුතුය. ජනතාව වැඩි වශයෙන් රොද බැඳ ගනිමින් පොදි කකා අනවශ්‍ය ආකාරයේ ඒකරාශී වීම් වලින් මිදී හුදෙකලා වී සාමාන්‍ය ජන ජීවිතය ගොඩනඟා ගැනීම ඉදිරියට පවත්වා ගැනීම කළ යුතුය. එලෙස ජනතාවගේ පැත්තෙන්ද සිදු විය යුතු වගකිව යුතු වගවිය යුතු ක්‍රියාදාමයක් සිදු වේ නම් රජය සහ සෙසු කොවිඩ් නිවාරණ අංශවලින් ලැබෙන උපදෙස් මනාව සිදුවේ නම් මෙය පැතිර යෑම අවම කර ගැනීමට අප හට එතරම් අපහසු නොවනු ඇත.

ජයසිරි මුණසිංහ



# මිනුවන්ගොඩින් මතු වුණු කොවිඩ් පොකුරේ අලුත්ම කතාව

මිනුවන්ගොඩ ඇඟලුම් කම්හලේ සේවිකාවක කොවිඩ් ආසාදිතයකු බවට හඳුනාගැනීමත් සමඟ ඔබ අප සැම මේ ගත කරන සෑම මොහොතක්ම අභියෝගාත්මකය. මේ තත්ත්වය තරමක් සංකීර්ණ තත්ත්වයක් බවට පත්ව තිබෙන්නේ මේ ආශ්‍රිත පොකුර ව්‍යාප්ත වී තිබීමයි. එහෙත් මේ වන තුරු අදාළ පොකුරෙන් පරිබාහිරව කොවිඩ් ආසාදිතයකු අලුත් රැල්ල ආශ්‍රිතව හමු වී නොමැති බව වගකිව යුතු බලධාරීහු පවසති. මෙය අභියෝගාත්මක තත්ත්වයකි. ඒ අභියෝගය ජය ගැනීමට දේශපාලන අධිකාරියේ සිය නිරෝධායන මධ්‍යස්ථානවල සේවය කරන සාමාන්‍ය සෙබළා දක්වාත් රෝහල්වල සුළු සේවකයා දක්වාත් සියලු දෙනා අවශ්‍ය පියවර ගනිමින් සිටිති. මෙවන් තත්ත්වයක කොරෝනා අලුත් රැල්ල සමඟින් සමාජය තුළ මතු වන විවිධ ආකාරයේ වූ මත සහ දුර්මත සම්බන්ධයෙන් සාකච්ඡා කළ යුතුව තිබේ. ඒ නිවැරදි තොරතුරු සමාජගත වීම අද දැවැන්ත අවශ්‍යතාවක් වී තිබෙන නිසාය. මේ ඒ පිළිබඳ සිදු කෙරෙන සියුම් විවරණයකි.



## මිනුවන්ගොඩදී වෙච්ච දේ

මිනුවන්ගොඩ, යකහටුවේ බ්‍රැන්ඩික්ස් ඇඟලුම් කම්හලේ සේවය කළ දිවුලපිටිය, බෝමුගම්මන ග්‍රාමසේවා කොට්ඨාසයේ පදිංචි කාන්තාවකට කොවිඩ්-19 වයිරසය ආසාදනය වී ඇති බවට පසුගිය 03 වැනිදා සොයා ගැනිණි. එදින එම ආයතනයෙන් පළමු රෝගියා හමු වූ බවට වාර්තා වීමත් සමඟම එදින රාත්‍රිය වන විටම එකී සේවය කරන අයගෙන් හත්සිය පනහක් පමණම ස්වයං නිරෝධායනය කිරීමට සෞඛ්‍ය බලධාරීන් සහ යුද්ධ හමුදාව කටයුතු කර තිබිණි. එසේම එම කම්හල පිහිටි මිනුවන්ගොඩ පොලිස් බල ප්‍රදේශයටත් ආසාදිත කාන්තාව පදිංචි දිවුලපිටිය පොලිස් බල ප්‍රදේශයටත්, එම කම්හලේ සේවක සේවිකාවන් වැඩි ප්‍රමාණයක් සේවය කරන වේයන්ගොඩ පොලිස් බල ප්‍රදේශයටත් ඇඳිරිනීතිය පැනවීමට ද රජය පියවර ගත්තේය.

දිවුලපිටියේ කාන්තාව උණ රෝග ලක්ෂණ නිසා ඊට දින කිහිපයකට පෙරදීත් පෞද්ගලික වෛද්‍යවරයකුගෙන් ප්‍රතිකාර ගෙන තිබිණි. ඒ අතරතුර ඇති වූ ශ්වසන ආබාධයක් නිසා ගම්පහ රෝහලට ඇතුළත්ව ප්‍රතිකාර ගත් ඇය අහඹු ලෙස පීසීආර් පරීක්ෂණයකට යොමු කෙරුණේ රෝහලෙන් පිටව යන මොහොතේදීය.

## අලුත් පොකුරේ අලුත්ම තත්ත්වය

මිනුවන්ගොඩ ඇඟලුම් කම්හලේ කොවිඩ් පොකුරේ ඊයේ (18) දින උදෑසන වන විට සම්පූර්ණ ආසාදිත සංඛ්‍යාව 2,016 දෙනකු බවට වාර්තා විය. ඉන් පුද්ගලයන් 1,041 දෙනකු එම ඇඟලුම් කම්හලේ සේවකයන් වන අතර අනෙක් පුද්ගලයෝ 975 එම කම්හලේ සේවකයන් ළඟින් ඇසුරු කළ පුද්ගලයෝය.

ඊයේ (18) දිනය වන විට 53,937 දෙනකු නිරෝධායන ක්‍රියාවලිය අවසන් කර තම නිවෙස් වෙත පිටව ගොස් ඇත. එසේම, ඊයේ (18) වන විට ත්‍රිවිධ හමුදාව මඟින් පාලනය කරනු ලබන නිරෝධායන මධ්‍යස්ථාන 82ක 9,386 දෙනෙක් නිරෝධායනය වෙමින් සිටති. පෙරේදා (17) දිනය තුළදී පීසීආර් පරීක්ෂණ 8,724ක් සිදු කර ඇති අතර, මේ වන විට ශ්‍රී ලංකාව තුළ පීසීආර් පරීක්ෂණ 374,448ක් සිදු කර ඇත.

## පළමු කාන්තාව සොයා ගැනීමෙන් පසු

මෙවර පළවෙනි ආසාදිත කාන්තාව සොයා ගැනිමත් සමඟ මුල්ම පියවර වශයෙන් ඇයගේ පවුලේ සාමාජිකයන් නිරෝධායනයට යොමු කරනු ලැබීය. ඉන් පසුව මේ පවුලට සම්බන්ධ තව පවුල් දෙක තුනත් හඳුනාගෙන ඔවුනුත් නිරෝධායනයට ලක් කළේ ප්‍රථම පියවර වශයෙනි. එම කාන්තාව රෝහලට ඇතුළත් වී තිබුණේ පසුගිය සැප්තැම්බර් 30 වැනිදාය. සැප්තැම්බර් 21 සහ 30 වැනිදා අතර යම් පිරිසක් රෝග ලක්ෂණ පෙන්නුම් කර ඇති බව සොයා ගැනීමෙන් පසු මුලින්ම වාර්තා වුණු 33 දෙනකුගෙන් යුක්ත කණ්ඩායමක් සොයාගෙන එම පිරිස නිරෝධායනයට සහ පීසීආර් පරීක්ෂණයට යොමු කරනු ලැබූහ. ඉන් පසුව මේ කාන්තාව ආ ගිය තැන් සොයා බලා ඇය ගමන් කළ කාර්යාලීය බස් රථයේ සිටි 40 දෙනකු ගැන තොරතුරු ලබාගෙන ඔවුහු ද නිරෝධායනයට ලක් කර පීසීආර් පරීක්ෂණ සඳහා යොමු කෙරුණහ. එසේම අදාළ කාන්තාවගේ දියණියකට කොවිඩ් ආසාදනය වී ඇති බව දැනගත් වහාම එම දියණියගේ පන්තියේ සිසුන් 39 දෙනා සමඟින් ගුරුවරුන් දෙදෙනකුත් වහාම නිරෝධායනයට යොමු කරනු ලැබූහ. ඔවුන් නිරෝධායනයට ලක් කරද්දී ඔවුන්ට උපරිම පහසුකම් දෙන්නැයි ජනාධිපතිතුමා උපදෙස් දී තිබූ අතර ඒ අනුව ජෙට්වින් මීගමුව හෝටලයේ එම පිරිස නොමිලයේ නිරෝධායනයට යොමු කෙරුණි.

එම දියණිය සමඟ සෘජු සම්බන්ධතා පැවැත් වූ බවට තොරතුරු අනාවරණය වූයේ නැතත් තවත් දහසක් පමණ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ අධීක්ෂණය යටතේ නිවෙස්හිදීම නිරෝධායනයට යොමු කරනු ලැබූහ. ඒ අයුරින් පළමු වළල්ලට හසුවන සියලු ආශ්‍රිතයන් හඳුනාගෙන නිරෝධායනට යොමු කිරීමට මූලිකව බුද්ධි අංශ දුන් තොරතුරු මහත් පිටිවහලක් විය.

## කොවිඩ් රෝගීන් හොයන්න බුද්ධි අංශ දැම්මාම ජාතික ආරක්ෂාවට මොකද වෙන්නේ?

බුද්ධි සේවා තවමත් සක්‍රියව මේ ආසාදිතයන් සෙවීමේ කටයුතුවල නිරත වෙමින් සිටී. එය ඉතා උසස් මට්ටමක වෘත්තීය තත්ත්වයකි. මීළඟට යම් අවදානමක් ඇති වුව හොත් එසේ ඇති විය හැකි කණ්ඩායමක් පවා මේ වන විට හඳුනාගෙන අවසන් බවට වාර්තා වෙයි.

කොවිඩ් ආසාදිතයින්ගේ ආශ්‍රිතයින් සෙවීම බුද්ධි අංශ හරහා සිදු කිරීම තුළ බුද්ධි අංශ හරහා ජාතික ආරක්ෂාව වෙනුවෙන් සිදු කරනු ලබන කටයුතුවල කිසිදු අඩුවක් සිදු නොවන බව ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී සහ යුද්ධ හමුදාපති ලුතිතන් ජෙනරල් ශවේන්ද්‍ර සිල්වා මහතා ප්‍රකාශ කළේය. එහිදී ඔහු වැඩිදුරටත් ප්‍රකාශ කළේ ජාතික ආරක්ෂාව යනු හමුදාව අවි ආයුධ සහිතව ගොස් සිදු කරන ක්‍රියාන්විතයක් පමණක්ම නොවන බවත් ජාතික ආරක්ෂාවට ආහාර සුරක්ෂිතතාව, බලශක්ති සුරක්ෂිතතාව, දේශපාලන ආරක්ෂාව, යුදමය ආරක්ෂාව, පාරිසරික ආරක්ෂාව, සයිබර් ආරක්ෂාව ආදී තවත් කොටස් ඇතුළත් වන බවයි. මේ කොවිඩ් වයිරසයත් රටේ සෞඛ්‍ය ආරක්ෂාවට සම්බන්ධ ප්‍රශ්නයක් නිසා හමුදාමය ආරක්ෂාව සපයන අතරම ජාතික ආරක්ෂාවේ වැදගත්ම කොටසක් වන සෞඛ්‍ය ආරක්ෂාව සම්බන්ධයෙන් ඇති වී තිබෙන තත්ත්වයට මුහුණ දීම සහ ඒ සඳහා අවශ්‍යය දේ සිදුකිරීම නිසා ජාතික ආරක්ෂාවේ යම් අඩුපාඩු ඇති වෙතැයි කිසිදු බියක් ඇති කර ගත යුතු නැති බවයි.



## විශාකාපට්නම් සිට බ්‍රැන්ඩික්ස් දූතයන් සමඟ පැමිණි ගුවන් යානයේ කතාව

අදාළ ඇඟලුම් ආයතනය ගුවන් යානා තුනකින් පිරිසක් ශ්‍රී ලංකාවට රැගෙන ආ බව සත්‍යයකි. ඒවා ජූනි 23 168ක කණ්ඩායමක්, ජූනි 25 තවත් 125 දෙනකුගේ කණ්ඩායමක් සහ සැප්තැම්බර් 22 වැනිදා 48 දෙනකුත් රැගෙන ශ්‍රී ලංකාව පැමිණ ඇත. මේ සියලු දෙනාම ශ්‍රී ලාංකිකයන් මිස විදේශිකයන් නොවේ. ඔවුන් ශ්‍රී ලංකාවට පැමිණි පසු යුද්ධ හමුදාව යටතේ වාද්දුව, කොස්ගොඩ, හබරාදූවේ හෝටල් තුනක නිරෝධායනයට ලක් කර තිබේ. දින 14 නිරෝධායනය කළ බවට සාක්ෂි යුද හමුදාව සතු වන අතර අදාළ පිරිසට නිරෝධායන සහතික ද නිකුත් කර ඇත.

## කොරෝනා සමාජගත වෙලාම නැද්ද?

මේ දක්වා හමු වූ සියලු ආසාදිතයන් හමු වී තිබෙන්නේ මිනුවන්ගොඩ ඇඟලුම් කර්මාන්ත ශාලාව ආශ්‍රිත සබඳතාවලිනි. මෙහිදී විවිධ මත දරන අය විවිධ මත දැරුව ද යථාර්ථය එයයි. ඇතැම් විට බුද්ධි අංශ විසින් සොයා ගෙන නිරෝධායනයට ලක් කරන පුද්ගලයෝ තමන් යම්කිසි ආසාදිතයකුගේ ආශ්‍රිතයකු බවවත් නොදනිති. එහෙත් ඔවුන් දෙවැනි හෝ තුන්වන මට්ටමේ සම්බන්ධතා පැවැත්වූ අයයි. වෛද්‍යවරුන් සහ විද්වතුන් දරන මතය අනුව මේ පොකුරෙන් පරිබාහිර සබඳතා සහිත ආසාදිතයන් තවම හමුවී නැත. වයිරසය සමාජගත වී නැති බවට බලධාරීන් තවමත් පවසන්නේ එබැවිනි.

## රජය සහ බලධාරීන් බොරු තොරතුරු සමාජගත කරනවා ද?

ජනමාධ්‍ය ඔස්සේ නිරන්තරයෙන් නිවැරදි තොරතුරු සමාජගත කිරීමට වගකිවයුතු බලධාරීහු කටයුතු කරති. වයිරසය මිනුවන්ගොඩ ඇඟලුම් කම්හල ආශ්‍රිත පොකුරෙන් බාහිර සමාජයට සමාජගත වී ඇත්නම් රජයට එය ජනතාවගෙන් සැඟවීමේ අවශ්‍යතාවක් නැත.

## හමුදාව මිනිස්සු පැහැරගෙන ගියා ද?

මෙවැනි චෝදනාවක් කන්දකාඩු කොවිඩ් පොකුරත් සමඟ ද එල්ල විය. එහෙත් හමුදාව මැදිහත් වී සිදුකරන්නේ කොවිඩ් පොකුරේ ආශ්‍රිතයන්ව කෙටි කලකින් නිරෝධායනයට ලක් කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීමයි. ඇතැමුන් එය හැඳින්වූයේ පැහැරගැනීමක් ලෙසයි. යුද හමුදාවෙන් සිදු කරනු ලැබුවේ අදාළ ආශ්‍රිතයන් කෙටි කලකින් නිරෝධායනයට යොමු කිරීම පමණයි. මේ පිළිබඳ යුද්ධ හමුදාපතිතුමා පසුගිය දිනෙක ප්‍රකාශ කළේ ප්‍රජාතන්ත්‍රවාදී රටක ඕනෑම අයෙකුට විවේචන එල්ල කළ හැකි බවත් යුද්ධ හමුදාව වෘත්තීය වශයෙන් කටයුතු කරන හමුදාවක් නිසා අදාළ චෝදනාවලට පිළිතුරු වශයෙන් ඉක්මනින්ම සත්‍ය අවබෝධ කර දිය හැකි බවත්ය. විවිධ පුද්ගලයන් විවිධ න්‍යාය පත්‍ර අනුව කටයුතු කරමින් කුමන චෝදනා එල්ල කළත් ලංකාවේ බහුතර ජනතාව සත්‍යය අවබෝධ කරගෙන සිටිය බවත් යුද්ධ හමුදාපතිතුමා පැවසීය.

## නිරෝධායනයේදී සිදුවන දේ

පළමු රැල්ල මෙල්ල කළ ආකාරය ගැන ජනතාව තුළ දැඩි විශ්වාසයක් ඇතිවී තිබිණි. යුද හමුදාව මැදිහත් වී 52000කට වැඩි ප්‍රමාණයක් නිරෝධායනයට ලක් කර තිබිණි. කොරෝනා වයිරසය පැතිරීම ආරම්භ වීමත් සමඟ මෙතරම් පිරිසක් හමුදාව මැදිහත් වී නිරෝධායනය කළ වෙනත් කිසිදු රටක් නැත. යුද හමුදා රණවිරුවන් ආසාදිතයන් සහ ආශ්‍රිතයන් සොයා යමින් ඔවුන් නිරෝධායනයට යොමු කිරීමේ දී ඔවුන් තමන්ගේ ජීවිත පවා අවදානමට ලක් කරමින් සිදු කරන සේවය අතිමහත්ය. මේ වන විට යුද හමුදාව මඟින් ක්‍රියාත්මක කරනු ලබන නිරෝධායන මධ්‍යස්ථාන ප්‍රමාණය 98කි. ඒ සියල්ලම සිදු කරන්නේ සියලු සෞඛ්‍ය නිර්දේශවලට අනුකූලව වීම නිසාම නිරෝධායන මධ්‍යස්ථානයකින් ආසාදිතයකු මතු වුවත් එය නිරෝධායන මධ්‍යස්ථානයේ අනෙකුත් පිරිස් වෙත පැතිරී යෑම වැළැක්වී තිබේ.

## සෞඛ්‍ය අංශයේ දායකත්වය

කොවිඩ් අසාදිත මරණ මෙරටින් වාර්තා වන්නේ 13ක් පමණි. මෙරටින් වාර්තා වූ අඩු මරණ ප්‍රමාණයම සෞඛ්‍ය අංශයේ දායකත්වය කොරම්දැයි පැහැදිලි කරන හොඳම නිදසුනයි. එසේම වෛද්‍යවරුන්, හෙදියන් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සිට සුළු සේවකයා දක්වා සිදු කරන්නේ සුළුපටු සේවයක් නොවේ. සමහරුන්ගේ නින්දිත වැඩ යුද හමුදා නිලධාරීන් ප්‍රමුඛව අනෙකුත් පාර්ශ්ව යමකු නිරෝධායනයට රැගෙන යෑමට පැමිණෙන විට ඇතැම් පිරිස් ඊට බාධා කරමින් කටයුතු කරන ආකාරයක් වාර්තා වී තිබේ. ඇතැම් පුද්ලයන් තම නිවෙසේ ඇතිකරන බල්ලන් පවා ලිහා දමා ඇති බවට තොරතුරු වාර්තා වෙයි. එසේම කොරෝනා ආසාදනය වූ පසු ඇති වන මූලික රෝග ලක්ෂණ සඟවමින් සිටීම තවත් බැරෑරුම් තත්ත්වයකි. එසේම ආශ්‍රිතයන් හෙළි නොකිරීම විශාල ව්‍යසනයකට අතවැනීමකි.

## හමුදාවේ දායත්වය

කොවිඩ් වයිරසය ආසාදනය වූවන් සොයා යෑමේදී සහ ඔවුන් නිරෝධායනයට යොමු කිරීමේ කටයුත්තේදී යුද්ධ හමුදා සෙබළුන් සිදු කරන්නේ අපරිමිත කැප කිරීමකි. එසේම ඔවුන් මේ කටයුත්ත සිදු කරන්නේ තම ජීවිත අවදානම ගැන පවා නොතකමින්ය. ඔවුන් එවන් කැපකිරීමක් සිදු කරන්නේ රට ජාතිය ආරක්ෂා කර ගැනීම වෙනුවෙන්ය. ඒ වගකීම ඔවුන් මානුෂීය මෙහෙයුමේදී මෙන්ම කොවිඩ් පැතිරීම වැළැක්වීමේ මෙහෙයුමේදීද සිය දෙවුරමත දරමින් කටයුතු කරන්නේ ජාතියේ ආරක්ෂකයා වශයෙන් සිදු කළ යුතු උපරිමය තම රට ජාතිය වෙනුවෙන් ඉටු කිරීමටය.

## ජනතාව කළ යුතු දේ

කොවිඩ් සමාජගත විම වැළැක්වීමේදී ජනතාවගේ සහයෝගය ඉතා වැදගත්ය. තමන්ගේ, පවුලේ සාමාජිකයන්ගේ මෙන්ම රටේ ආරක්ෂාව වෙනුවෙන් නිරෝධායන ක්‍රියාවලියට මහජනතාවගේ සහයෝගය ඉතා වැදගත් කාරණයකි. එසේම සෞඛ්‍ය නිර්දේශ පිළිපැදීම ඔවුන්ගේ යුතුකමකි. පක්ෂ, පාට, කුල, මල භේද අමතක කර මේ සඳහා සියලු දෙනාම එකතු විය යුතුයි. එසේම තමා කොවිඩ් ආසාදිතයකු නොවී සිටීමද වගකීමක් ලෙස සැලකිය යුතුයි. එය තම පවුලට සමාජයට සහ රටට කරන යුතුකමක් වනු ඇත. එසේම විමසිලිමත් වීම ඉතා වැදගත්ය.

**දිලංක ගුණතිලක**
**ඡායාරූප - සමන්ත වීරසිරි**
**නිශ්ශංක ද සිල්වා**

> මේ දක්වා හමු වූ සියලු ආසාදිතයන් හමු වී තිබෙන්නේ මිනුවන්ගොඩ ඇඟලුම් කර්මාන්ත ශාලාව ආශ්‍රිත සබඳතාවලිනි. මෙහිදී විවිධ පිරිස් විවිධ මත දැරුව ද යථාර්ථය එයයි. ඇතැම් විට බුද්ධි අංශ විසින් සොයා ගෙන නිරෝධායනයට ලක් කරන පුද්ගලයෝ තමන් යම්කිසි ආසාදිතයකුගේ ආශ්‍රිතයකු බවවත් නොදනිති. එහෙත් ඔවුන් දෙවැනි හෝ තුන්වන මට්ටමේ සම්බන්ධතා පැවැත්වූ අයයි.



# මාධ්‍ය සදාචාරය සුරකිමු

අප මේ ගත කරමින් සිටින මොහොත යනු අතිශය තීරණාත්මක ලෙස අවිනිශ්චිත වූත් ජීවිතය පිළිබඳ යම් සිතීමක් ඇති කර ගත යුතු වූත් තත්ත්වයකි. අපට යමක් වෙනස් කිරීමට අවශ්‍ය වන්නේ නම් ඒ සමාජයේ භාවිත කරන භාෂාව වෙනස් කිරීම ඔස්සේ එය සිදු කළ හැකි බව ෆ්‍රෙඩ්රික් නීට්ෂේ, ෆර්ඩිනන් ඩි. සෝසියර් සහ මාටින් හෙයිඩෙගර් විසින් විවිධ කෝණයන් ඔස්සේ විස්තර කරති. උදාහරණයක් ගෙනහැර දක්වන්නේ නම් "Rape" යන්න හඟවන වචනයක් අරාබි භාෂාවේ නොමැත. මක් නිසාද යත්: එය සිදුවීම සඳහා ස්ත්‍රියගේ කැමැත්ත යන සාධකය එම සමාජය තුළ වැදගත් නොවෙයි. තවත් උදාහරණයක් ලෙස ඉංග්‍රීසි භාෂාව තුළ "ගුරු මුෂ්ටිය" යන්නට අදාළ වන වචනයක් නොමැත්තා වැනිය. එයින් "ගුරුමුෂ්ටිය" සහ "ස්ත්‍රී දූෂණය" සමාන කර නොමැති බව කරුණාවෙන් සලකන්න. අප ජීවත් වන යුගයේ දී සිතීමේ සහ දෙවල් තේරුම් ගැනීමේ ප්‍රධාන මෙහෙයවීම් කාරකය බවට මාධ්‍ය පත් වී ඇත. අද්‍යතන මාධ්‍යයෙහි මූලික කාර්යභාරයන් දෙකක් සිදු වෙයි. එනම් පුද්ගලයන් දැනුම්වත් කිරීමේ කාර්යය සහ මෙහෙයවීමේ කාර්යය මාධ්‍ය විසින් සිදු කරනු ලබයි.

සමකාලීන මාධ්‍ය හැසිරීම දෙස අවධානය යොමු කිරීමේදී මෑත කාලීන ප්‍රවෘත්ති වාර්තාකරණය ඇතැම් මාධ්‍ය විසින් නින්දිත ලෙස උල්ලංඝනය කරමින් පවතී. මෙය ආරම්භයේදී බහුලව සිදු කරන ලද්දේ වාර්ගිකත්වය පසුබිම් කර ගනිමින්ය. එනම් යම් යම් ජාතීන්, කුල සහ ආගම් මුල් කරගෙන යම් සිදුවීම් වාර්තා කිරීමේ දී විශේෂකොට සහ වෙනස්කොට සැලකීම දැක ගත හැකි විය. දැන් එහි නව ප්‍රවණතාවක් ලෙස ඇතැම් මාධ්‍ය සියලු සදාචාරමය සහ ආචාරධර්මීය කොන්දේසි ඉක්මවා ගොසින් නරඹන්නාගේ අසන්නාගේ සහ කියවන්නාගේ "විනෝදය" සහ "කුතුහලය" සංවිධානය කිරීමේ ඔස්සේ තම නාලිකාව පුවත්පත අංක එක බවට පත් කර ගැනීමේ දැඩි නොනිමි මහන්සියක් දරමින් සිටියි. මේ ඔස්සේ සැබැවින්ම වාණිජ අභිලාසයන් ඉටු වනවාද යන්නත් ගැටලු සහගතය. එසේ පවසන්නේ ලංකාවේ පවතින බොහෝ නාලිකා හෝ පුවත්පත් ලාභ ලබන ව්‍යාපාරයන් නොවන බැවිනි. නමුත් මෙවැනි නොගැළපෙන පුවත් වාර්තාකරණය සමාජ වගකීමක් ලෙස ඔවුන් විසින්ම හඳුන්වනු ලැබේ. අප මෙය තේරුම් ගත යුත්තේ කෙසේ ද?

ලංකාවේ මාධ්‍ය වාර්තාකරණයේ පවතින ආචාර ධර්මික ගැටලු වෙනුවෙන් මැදිහත් වීම සඳහා පවතින්නේ සීමිත බලපෑම් කණ්ඩායම් කිහිපයකි. එය අතේ ඇඟිලි ගණනටත් වඩා අඩුය. එහෙත් ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ මාධ්‍ය පිළිබඳ සහ එහි භාවිතය පිළිබඳ හදාරණ සහ ඒ පිළිබඳ පාඨමාලා ගණනාවක් ඇත. මෙය එම ශාස්ත්‍රාලියෙහි අධ්‍යයනයන්හි පවතින අඩුපාඩුවක් ලෙස තේරුම් ගැනීම අලියාගේ නැට්ටේ එල්ලී ගමරාල දිව්‍ය ලෝකයේ ගියා වැනිය. එසේ නම් අප මෙය තේරුම් ගත යුත්තේ සමස්තයේ පවතින හැදෑරීමේ හෝ නියැලීමේ යම් පසුගාමී සහ කොන්දේසි විරහිතව සියල්ල බාර ගැනීමේ තත්ත්වයක් ලෙසය. ශ්‍රාවක/ ප්‍රේක්ෂක/ පාඨක සහ නව මාධ්‍ය පරිශීලකයන් ලෙස අප යම් සංවිධානාත්මක මැදිහත් වීමක් හෝ දැනුවත් වීමක් සිදු විය යුතුය. මෙය සමකාලීන මාධ්‍ය හැසිරීමේදී යම් මට්ටමකින් ඉටු වන මැදිහත්වීම් සමාජ මාධ්‍ය ඇසුරු කිරීමේ දී දැක ගත හැකිය. එහෙත් ප්‍රධාන ධාරාවේ මාධ්‍ය භාවිතයෙහි දී යම් අපරාධයක් හෝ එවැනි සිදුවීමක් සිදු කළා යැයි සැකපිට රැගෙන යන්නා සියල්ලන්ටම විවෘතව පෙන්වන අතර ඔහු එයින් නිවැරදිකරු වූ විට එය පෙන්වීමට හෝ සඳහන් කිරීමට මාධ්‍ය ඉදිරිපත් වන්නේ කලාතුරකිනි. මෙය 2020 ජූලි මස තිරගත කරන ලද කුමාර තිරිමාදුර සහ සරත් කොතලාවල විසින් අධ්‍යක්ෂණය කළ "නිව්ස්පේපර්" සිනමා පටයේ වඩාත් හොඳින් මතු කර පෙන්වයි.

අප අවට සිදු වන බොහෝ සංවේදී පුවත් පවතී. එහෙත් මෙම සංවේදී පුවත් වාර්තාකරණයේ දි සහ යම් පුද්ගලයන්ගේ අනන්‍යතා හෙළි කිරීමේ දී මාධ්‍ය තම සීමා අතික්‍රමණය කරයි. උදාහරණයක් ලෙස එය මෙම කොවිඩ් වංසගතයට ගොදුරු වන්නන් සහ සංවේදී පුවත් වාර්තාකරණයේ දී දැක ගත හැකි විය. මෙවැනි ජනප්‍රිය සිදුවීමක් ඔස්ට්‍රේලියාවේ ටුඩේ එෆ්. එම් (2 Day F.M) නාලිකාවේ සිදු විය. එම සිදුවීමේ බලපෑමට ලක් වූ එහි කතා නායිකාව වන ජසින්තා සල්දානා (Jacintha Saldanha) නම් හෙදිය තම ජීවිතය නැති කර ගැනීම දක්වා එම නාලිකාවේ ප්‍රචාරය වූ විනෝදාස්වාදන දුරකථන පණිවිඩ හුවමාරුව බලපෑවේය. ඔවුන්ට තත්පර කිහිපයකට වැදගත් යැයි විනෝදයයැයි සිතා පෙන්වන කියන සහ පළ කරන නොවැදගත්ම දේවල් එයට ලක්වන්නාගේ මුළු ජීවිත කාලයටම බලපෑමක් විය හැකිය. මාධ්‍ය මේ පිළිබඳව අවබෝධයෙන් සහ වගකීමෙන් කටයුතු කළ යුතුය. අතීතයේ දී මිනිසුන් මාධ්‍ය ඇසුරු කරන ලද්දේ ප්‍රධාන වශයෙන්ම අවිධිමත් අධ්‍යයන මාදිලියක් ලෙසය. මෙහිදී එඩ්වඩ්. එස්. හර්මන් සහ නෝම් චොම්ස්කි (Edward S. Herman and Noam Chomsky) සඳහන් කරන පරිදි පුද්ගලන්ගේ කැමැත්ත හෝ සිතීමේ ක්‍රියාවලිය නිෂ්පාදනය කිරීමේ (Manufacturing Consent) ප්‍රධාන මාදිලියක් බවට මාධ්‍ය පත්ව ඇත. සමකාලීන මාධ්‍ය ප්‍රධාන වශයෙන් සිදු කරනු ලබන්නේ සිතීමේ ක්‍රියාවලිය නවතා දැමීමත් එය මාධ්‍ය පණිඩ්ඩයට අනුව ග්‍රාහකයා අනන්‍යකරණයට ලක් කර ගැනීමත්ය. මෙය වෙනත් අකාරයකින් සඳහන් කරන්නේ නම් "හෙජමොනියට" අවනත කර ගැනීමකි. එනම් යමෙක් අනුමත නොකරන එකඟ නොවන දේ පවා එකඟයැයි යන කොන්දේසි මත පිහිටමින් ක්‍රියා කිරීමයි. එහෙත් මෙම තත්ත්වය වෙනස් කළ යුතුය. ඒ සඳහා "ප්‍රති හෙජමොනික" ව්‍යාපෘතියක අවශ්‍යතාව මේ වන විට මතුව ඇත. එය සක්‍රීය කර ගැනීම සඳහා නිර්වින්දනයට ලක් වී සිටින ග්‍රාහක ප්‍රජාව සවිබල ගැන්විය යුතුය. මේ සඳහා 2016 වසරේදී සම්මත කරන ලද අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ පනත විශාල කාර්යභාරයක් ඉටු කරනු ලබයි. මෙය මහජන යහපත සහ අවබෝධය පිණිස ක්‍රියාත්මක වන තීරණාත්මක නීතිමය මැදිහත් වීමකි.

එහෙත් ලංකාවේ ජනමාධ්‍ය චේන්ද්‍රියව පරිණාමය සිදු වී පවතින්නේ යම් නිශ්චිත පිළිගත් හෝ සම්මුතිගත ක්‍රමවේදයකට නොවන අතරම එය අවිධිමත් ක්‍රමවේදයන්ගේ ප්‍රතිඵලයකි. ජාතික සංවර්ධනයේදී සහ සාමූහික වශයෙන් ඒකාබද්ධකරණය කිරීමේ ක්‍රියාවලියේ මාධ්‍ය හිමිකාරත්වයේ සහ යම් යම් කණ්ඩායම්හි අරමුණු ඉටු කර ගැනීම වෙනුවෙන් ගොඩනැඟී ඇතිවාක් මිස එය පොදු ජන යහපත සහ අවබෝධය පිණිස ගොඩනැගුවක් නොවන බවද පැහැදිලිය. මාධ්‍ය විසින් සකස් කරන ලද පණිඩ්ඩ කිසිදු ප්‍රශ්න කිරීමකින් තොරව බාර ගැනීම මේ යුගයේ සිදු වන සන්නිවේදනයේ ව්‍යුහාත්මක වෙනසක් ලෙස අවබෝධ කර ගත හැකිය. මෙය සාම්ප්‍රදායික මාධ්‍ය අධ්‍යයනයේ දී පවතින ඕපාදූප දාමයට යම් සමානකමක් දක්වයි. මෙහිදී බල අධිකාරයේ ක්‍රියාත්මක වීම සහ එම බල ව්‍යුහයන්ගේ පවතින සබඳතාවය "පශ්චාත් සත්‍ය" ගොඩනැඟීමේ ක්‍රියාවලියක් දක්වා විතැන් වී ඇත. දැන් අප විසින් පිළිගනු ලබන්නේ ද එකඟතා ගොඩනගා ගනු ලබන්නේද ඒ මත පිහිටා වීම යථාවක් බවට පත්ව ඇත. මිනිසාගේ පැවැත්මේ සාරයන් සියල්ල මෙම ක්‍රමය විසින් විනාශය කරා රැගෙන ගොස් ඇත. අප සියල්ලන්ම එහි කොටස් කරුවන් බවට පත් වී අවසානය. මෙයින් යම් ආකාරයක හෝ සහනයක් අපේක්ෂා කරන්නේ නම් විය යුත්තේ කුමක්ද යන්න අවබෝධ කොට ගත යුතුය.

මාධ්‍යයෙහි මෙම අවිචාරවත් වාර්තාකරණ ක්‍රියාවලිය එහි ග්‍රහණයට හසුවන්නන් ලෙස අප විසින් ප්‍රශ්නයට නැගිය යුතුයි. මේ මොහොතේ ප්‍රශ්න කිරීම යනු යම් තීරණාත්මක නව දැනුමක් නිෂ්පාදනය කිරීම සඳහා වන සාධනීය මැදිහත් වීමකි. එයට සංවිධානයක් හෝ ආයතනයක් බිහි වන තෙක් බලා සිටීමෙන් පලක් නැත. එසේ නොවී සිදු වන මැදිහත් විමේ බලපෑම ගණන් නොගෙන සිටීමට ද ඉඩ කඩ පවතී. එහෙත් මේ නිශ්චිත මොහොතේ වඩා වැදගත් වන්නේ තම අදහස හෝ ප්‍රකාශ කිරීමයි. ජර්මානු දාර්ශනික කාල් මාක්ස් පවසන ආකාරයට අපට අර්බුදයකින් ගොඩ ඒම සඳහා පවතින බලගතුම අවියක් පවතී. එම අවිය නම් අද්විතීය අදහස්ය. මෙම මොහොතේ අප සතුව නොපවතින්නේ ද මෙම අද්විතීය අදහස්ය. මන්ද අපගේ සිතීමේ සහ පරිකල්පනයේ සීමාවන් මේ නිශ්චිත මොහොතේ දී නවතා දමා ඇත. ඒ වෙනුවට සකස් කරන ලද ක්‍රමයක් තුළ ජීවත් වීම සහ එය ප්‍රශ්න කිරීම අසුරා තැබීම එම ක්‍රමය විසින්ම ගොඩනගන ලද ශික්ෂිත බවක් බවට පත් කර ඇත. එය වටහා ගෙන එය ප්‍රශ්න කිරීම හෝ අවම වශයෙන් ප්‍රතික්ෂේප කිරීම අනිවාර්යයකි.

**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය**
**සජිතා ලක්මාලි හේවාපතිරණ**
**ජනමාධ්‍ය අධ්‍යයන අංශය**
**ශ්‍රී පාලි මණ්ඩපය**
**කොළඹ විශ්වවිද්‍යාලය.**

| ගොවිසෙත | සුපිරි වාසනා | ලග්න වාසනාව | කෝටිපති කප්රුක | සංවර්ධන වාසනාව | ජයෝදා |
|---|---|---|---|---|---|
| 2020 - 10 - 13 | 2020 - 09 - 21 | 2020 - 09 - 08 | 2020 - 10 - 18 | 2020 - 07 - 31 | 2020 - 09- 09 |
| දිනුම් වාරය - 2569 | දිනුම් වාරය - 1537 | දිනුම් වාරය - 2916 | දිනුම් වාරය - 639 | දිනුම් වාරය - 354 | දිනුම් වාරය - 1688 |
| 13 21 44 54 | 01 33 37 57 | 21 37 45 59 | 16 29 55 74 | 22 23 40 | 07 31 35 43 |
| අක්ෂරය G | සුපිරි අංකය -01 | ලග්නය-මිතුන විශේෂිත අංක<br>රු 500 තෑග සඳහා-9609 | ඉංග්‍රීසි අක්ෂරය- R | දෛව අංකය - 02<br>අක්ෂරය- L | අක්ෂරය-A |

| ශනිදා වාසනාව | සුපර් බෝල් | ජාතික සම්පත | අද කෝටිපති | වාසනා සම්පත | දරු දිරි සම්පත |
|---|---|---|---|---|---|
| 2020 - 09 - 09 | 2020 - 10- 18 | 2020 - 09-30 | 2020 - 09 - 09 | 2020 - 09 - 28 | 2020 - 07 - 30 |
| දිනුම් වාරය - 3366 | දිනුම් වාරය - 1249 | දිනුම් වාරය - 1059 | දිනුම් වාරය - 1036 | දිනුම් වාරය - 1617 | දිනුම් වාරය - 013 |
| 31 34 60 64 | 11 12 13 20 | 0 0 2 7 9 6 | 07 12 39 48 | 37 46 48 58 | 04 12 33 63 |
| අක්ෂරය - D | අක්ෂරය - B<br>විශේෂ අංකය -6215 | අක්ෂරය -H | අක්ෂරය - K<br>රු 500 තෑග සඳහා-2169 | අක්ෂරය - G | අක්ෂරය - U |

# පොඩි ලසීගේ ඔත්තුවෙන් වහන හා ගිනිඅවි සොයා ගැනේ

අපරාධ කල්ලි සමාජික 'පොඩි ලැසී' හෙවත් ජනිත් මධුසංඛගෙන් අනාවරණය කරගත් කරුණු අනුව මීටියාගොඩ තෙල්වත්ත ප්‍රදේශයේ සඟවා තිබූ ස්වයංක්‍රිය පිස්තෝලයක්, ට්‍රක්ටර්-ථයක් හා නවීනතම මෝටර් රථයක් අපරාධ විමර්ශන නිලධාරීන් පෙරේදා (17) සොයාගෙන ඇත. මේ ට්‍රක්ටර්ථය හා මෝටර් රථය යොදාගෙන මනෝජ් මැන්ඩිස්ගේ කල්ලියේ ගෝලයකු වන බන්ධනාගාරගතව සිටින මීටියාගොඩ ජනිත් නිශාන්ත ඝාතනය කිරීමට පොඩි ලැසී සැලසුම් කර ඇතිබව හෙළිවී තිබේ.

ඒ අනුව අපරාධ පරීක්ෂණ නිලධාරින් මීටි-යාගොඩ තෙල්වත්ත ප්‍රදේශයේ සඟවා තිබූ ස්වයංක්‍රිය පිස්තෝලයක් සොයාගත් අතර, මේ ඝාතන සැලසුමට යොදා ගැනීම සඳහා ගඩොල් කපන ස්ථානයක සඟවා තිබූ ට්‍රක්ටර්ථයක්ද, හබ-රාදුව ප්‍රදේශයේ ගරාජයක සඟවා තිබූ නවීනතම මෝටර් රථයක්ද පෙරේදා (17) සොයාගනු ලැබූ බව විමර්ශන නිලධාරිහු පැවසූහ.

මේ රථ වහන හා ගිනිඅවිය පොඩි ලැසීගේ බවට අනාවරණය වී ඇතිබවද එම නිලධාරිහු සඳහන් කළහ.

මේ වන විට ඇප මත මුදාහැර සිටියද අපරාධ විමර්ශන කොට්ඨාසයට බාර දී ඇති පොඩි ලැසී දින 90 ක කාලයක් රඳවා තබාගෙන ප්‍රශ්න කිරී-මට පසුගිය 15 වැනිද අධිකරණයෙන් අවසර ලැබිණ.මේ ඝාතන සැලැස්ම පිළිබඳව ඔහුගෙන් අනාවරණය වූයේ එම ප්‍රශ්න කිරීම් වලදීය. මේ වැටලීම සඳහා කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරිහු මීටියාගොඩ තෙල්වත්ත ප්‍රදේශයට අද පැමිණියහ.

1 පිටුවෙන් ..

## නැති බලයක් ආරෝපණය ...

පුවත්පතේ සිරස්තලය 'නැති බලයක් ආරෝපණය කර ගෙන හිටපු පොලිස්පතිවරයා' ලෙස නිවැරදි විය යුතු අතර එහි පූජිත් යනුවෙන් සඳහන් වූයේ ප්‍රමාද දෝෂයකිනි. එම සිරස්තරය හේතුවෙන් පූජිත් මහතාට යම් අපහසුතාවක් ඇති වූයේ නම් ඒ පිළිබඳ කනගාටුව පළ කර සිටිමු.

## පාප් වහන්සේගේ ...

එම පුද්ගලයා කවුරුන්දැයි තවමත් නිශ්චිතව නිවේදනය කර නොමැති අතර ඔහු 'කෝවිඩ්-19' රෝග ලක්ෂණ පෙන්නුම් කර නැත. කෙසේවෙතත් ඔහු'සැන්ටා මාර්තා' නිවස්නයෙන් නික්ම ගොස් ඇති බව වාර්තා වේ.

ඔහු මුණගැසුණු හා ඔහුගේ සෘජු ආශ්‍රිතයන් සියලු දෙනා ද මේ වනවිට නිරෝධායනයට යොමු කර ඇතැයි වතිකානය නිකුත් කළ නිවේදනයේ දැක්විණි.

## විස්සට එරෙහි ...

සංශෝධන විරෝධී වැඩසටහන් ශක්තිමත් කිරීමට එම පක්ෂය තීරණය කර ඇත.

ඒ අනුව 20 වැනි සංශෝධනය දෙවැනි වර කියවන දිනය වන ඔක්තෝබර් 20 දක්වා පක්ෂයේ මාධ්‍ය හමු සහ අන්තර්ජාල ප්‍රචාරණ කටයුතු සක්‍රියව පවත්වාගෙන යාමට සමගි ජන බලවේගය තීරණය කළ බව එහි මාධ්‍ය ඒකකයේ ප්‍රකාශකයකු දිනමිණට පැවසීය.

ඉදිරි වැඩසටහන් සඳහා සහභාගි වන පක්ෂයේ ඉහළ සාමාජික-යන් සංඛ්‍යාව වැඩිකිරීමට සමගි ජන බලවේගය වැඩිදුරටත් අවධා-නය යොමු කර තිබේ.

## බ්‍රැන්ඩික්ස් පොකුරේ ...

පොලිසිය මගින් ද විමර්ශනයක් ක්‍රියාත්මක කරන බවත් මෙහි සැබෑ තොරතුරු විමර්ශනය කර රටේ ජනතාවට දැනගැනීමට සලස් වන බව හමුදාපතිවරයා පැවැසීය.

එක් ස්ථානයකින් කොවිඩ් ආසාදිතයෙක් සොයා ගැනීමත් සම-ගම බුද්ධි අංශ මගින් ලුහු බැඳ යෑමේ ක්‍රමවේදය භාවිතකරමින් මුල් දිනයේදී සියයකට වැඩි පිරිසක් සහ ඊළඟ දින අට සියය-කට ආසන්න පිරිසක් සොයා ගත්තා. මෙහිදී වැදගත්ම දේ තමයි මේ ආසාදිතයන් ඇති වුණේ කොහොමද කියන තත්ත්වය හඳුන ගැනීම. ඒ සඳහා විවිධ විමර්ශන සිදුකරමින් පවතිනවා. ඒ විම-ර්ශන ඔස්සේ ගොස් මෙහි මූලාශය සොයා ගැනීමයි මූලික අර-මුණ. මෙහි පෙනෙන දෙයක් තමයි මෙය සැප්තැම්බර් මාසයේ මැද දක්වා දිවගොස් තිබෙනවා ද කියන එක. එහෙත් හිතෙන දේවල් විතරක් කියලා හරි යන්නේ නැහැ. මෙය ස්ථිර කරගන්න විමර්ශන කිහිපයක් කරමින් පවතිනවා.

ඒ වගේම මෙහි හැසිරීම අපි දන්නේ නැහැ කොයි ආකාරයට ද සිදුවන්නේ කියලා. තාම එන්නතක් හොයාගෙන නැති භයා-නක වයිරසයක්. මෙහි ප්‍රතිඵල ලංකාවේ අපිවත්, ලෝකයවත් දන්නේ නැහැ. මේ රෝගය හැඳුණු පුද්ගලයකුට පසුකාලීනව ඇති වන තත්ත්වයන් ලෝකයේ හොයාගෙන නැහැ. ලෝක සෞඛ්‍ය සංවිධානය මුලින්ම කිව්වේ මුඛ ආවරණ පළඳින්න අවශ්‍ය නැහැ කියලා. අපි පළඳිනකොට එය විහිළුවකට ගත්තා. එහෙම කිව්ව ඔවුන්ටම පසුකාලීනව කියන්න සිදුවුණා පළඳින්න කියන්න. ඉතින් මෙය හැසිරීමත් එක්ක තීරණය වන දෙයක් බවට පත් වෙලා. එම නිසා මෙය ඉක්මනින් පාලනය කරගත හැකි යැයි අපිට විශ්වාස-යක් තිබෙනවා යැයිද හමුදාපතිවරයා කීවේය.

## පූගොඩ පොලිසියේ ...

මෙම තරුණයා මියගොස් ඇත්තේ පොලිස් අත්අඩංගුවේ සිට රාගම රෝහලට ඇතුළත් කිරීමෙන් අනතුරුවය. එහිදී අදාළ සාක්ෂිකරුවන් ප්‍රකාශ කළ කරුණු මත පිටස්තර පුද්ගලයන් හත් දෙනකු ද අත්අඩංගුවට ගෙන තිබේ. මේ සිද්ධිය සම්බන්ධයෙන් පූගොඩ පොලිස් ස්ථානයට අනුයුක්ත පොලිස් සැරයන්වරයෙක්ද අත්අඩංගුවට ගෙන ඇති අතර ඔහු ඊයේ(18) අධිකරණයට ඉදිරි-පත් කිරීමට නියමිතව තිබුණි.

සිද්ධිය සම්බන්ධයෙන් තව දුරටත් ගම්පහ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරයාගේ අධීක්ෂණය යටතේ සහකාර පොලිස් අධිකාරී වරයෙක් විසින් විමර්ශනයක් ආරම්භ කර ඇති බව ද පොලිස් මාධ්‍ය ප්‍රකාශක වරයා වැඩිදුරටත් පැවැසීය.

## මතුගම ගම් 3ක් ...


බව කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍ය-ස්ථානය පවසයි.

මතුගමින් කොවිඩ් ආසාධිත භික්ෂූන් වහන්සේලා පස් නමක් ඇතුළු පුද්ගලයන් 17 දෙනකු හමුවීමත් සමඟ සෞඛ්‍ය බලධාරීන් විසින් මෙම ගම්මාන තුන හුදෙකලා කිරීමට පියවර ගෙන ඇත.

සංචරණය සීමා කර ඇති මෙම බල ප්‍රදේශ තුළ ගමන් කිරීම, එම බල ප්‍රදේශවලින් පිටතට ගමන් කිරීම, එම බල ප්‍රදේශ හරහා ගමන් කිරීම, එම බල ප්‍රදේශ තුළට ඇතුළු වීම තහනම් බව පොලිසිය පවසයි.

මෙම ප්‍රදේශයන්හී අ.පො.ස උසස් පෙළ සඳහා පෙනී සිටින අපේක්ෂකයින් ඒ සඳහා තමාගේ විභාග මධ්‍යස්ථානය වෙත ගමන් කිරීමට අවසර ලබා දී ඇති බවද පොලිස් මූලස්ථානය සඳහන් කරයි.

### පිටිගල ලේක්හවුස් පුවත්පත් අලෙවි නියෝජිත මහතාගේ ආදරණීය පියාණන් අභාවප්‍රාප්ත විය.



පිටිගල ලේක්හවුස් පුවත්පත් අලෙවි නියෝජිත
ආර්.සී. ප්‍රියන්ත මහතාගේ ආදරණීය
පියාණන් වූ
"සැනසුම" - පොල්වත්ත, පිටිගල විසු
**බස්තියන් රණසිංහ මහතා**
අවුරුදු 78 ක් ආයු වළඳා අභාවප්‍රාප්ත විය.
**ඒ පිළිබඳ අවසන් කටයුතු 18-10-2020 වන ඉරිදා දින වැයිහේන ආදාහනාගාරයේ දී**
සිදු කරන ලදී.
**අලෙවි දෙපාර්තමේන්තුව - ලේක්හවුස්.**

1 පිටුවෙන් ..

## විදේශගත ශ්‍රී ලාංකිකයන්ට ...

2020-2024 මැතිවරණ කොමිෂන් සභාවේ උපාය මාර්ගික සැල-සුමට අදාළව මැතිවරණ නීති සංශෝධනය වීම අත්‍යවශ්‍ය කරුණක් බව මැතිවරණ කොමිසමේ සභාපති මහින්ද දේශප්‍රිය මහතා පෙන්වා දුන්නේය.

මැතිවරණයට අදාළ ඇප මුදල් සංශෝධනය කිරීම, මැතිවරණය පැවැත්වෙන දිනයේ ඡන්දය දැමීමට නොහැකි පුද්ගලයන් වෙනු-වෙන් ඊට පෙර වෙනම දිනයක් ලබාදීම, වයස අවුරුදු 18 සම්පූර්ණ වූ විගස ඡන්ද අයිතිය ලැබෙන සේ ඡන්ද හිමි නාම ලේඛනය මාස තුනකට වතාවක් යාවත්කාලීන කිරීම, විදේශගත ශ්‍රී ලාංකිකයන්ට ඡන්ද අයිතිය ලබාදීම, මැතිවරණ වියදම් පාලනය, අබාධිත පුද්ග-ලයන්ට පහසුකම් සපිරි ඡන්ද මධ්‍යස්ථාන සකස් කිරීම සහ විශේෂ ව්‍යාපෘති යටතේ ඊ-ඡන්ද ක්‍රමය ඇතුළු කරුණු රැසක් පිළිබඳව මැති-වරණ කොමිෂන් සභාවේ නිලධාරිහු මෙහිදී අග්‍රාමාත්‍යවරයා දැනු-වත් කළහ. මෙම අවස්ථාවට ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ලේකම් පාර්ලිමේන්තු මන්ත්‍රී නීතිඥ සාගර කාරියවසම්, අග්‍රාමාත්‍ය අතිරේක ලේකම්වරුන් වන චමින්ද කුලරත්න, ගනේෂ් ධර්මවර්ධන, මැතිව-රණ කොමසාරිස් ජෙනරාල් සමන් ශ්‍රී රත්නායක, නියෝජ්‍ය මැති-වරණ කොමසාරිස් එස්. අච්චුදන්, ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණේ පාලන ලේකම් හා ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සභාපති රේණුක පෙරේරා මහත්වරු එක්ව සිටියහ.

## බැසිල්ට ...

සාක්ෂිකරුවන් විසින් ස්වේච්ඡාවෙන් ලබාදෙන ප්‍රකාශ බලහ-ත්කාරයෙන් ලබාගැනීමට F.C.I.D. ය ක්‍රියා කළ බවත්, F.C.I.D. ය කටයුතු කළේ දූෂණ විරෝධී කමිටු කාර්යාලයේ උපදෙස් මත බවත් හෙතෙම හෙළි කළේය.

කොමිසමේ සභාපති හිටපු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු උපාලි අබේ-රත්න මහතා ඇතුළු ත්‍රිපුද්ගල කොමිසම හමුවේ මෙම සාක්ෂි ලබා දුන්නේය.

සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ හිටපු සභාපති භාෂ්වර ගුණරත්න මහතා සාක්ෂි දෙමින් මෙසේද පැවසීය.

රිමාන්ඩ් භාරයෙන් දින 3කට පසුව මෛත්‍රීපාල මහතා මට කතා කළා. මාව රිමාන්ඩ් ගත කිරීම පිළිබඳව අතිශයින් කනගාටු වෙනව කිව්වා. එදාම මම එතුමාව හමුවුණා. එහිදී ඔහු මට කිව්වා ඔයා ගැනත් අධ්‍යක්ෂ මණ්ඩලය ගැනත් කනගාටු වෙනවා කියලා. මම දවස් 43ක් රිමාන්ඩ් වෙලා එළියට ඇවිල්ලා තමයි ජනපති හමුවුණේ. එදා ජනා-ධිපතිතුමා මාව හෙළිකොප්ටරයෙන් කුරුණෑගලට එක්කගෙන ගියා. එහිදී අකිල විරාජ් මහතා හෙළිකොප්ටරයෙන් ගිය මාව බුලත් දී පිළි-ගත්තා.

එදින සවස මමත් අධ්‍යක්ෂ මණ්ඩලයේ කීප දෙනෙකුත් හිටපු ජනපතිතුමා හමුවුණා. ඒ හමුවුණාට පසුව ජනාධිපතිතුමා කිව්වා මේ ඔක්කොම කරන්නේ දූෂණ විරෝධී කමිටුව කියලා. දූෂණ විරෝධී කමිටුවේ ඉන්න ජේ.සී. වැලිඅමුණ කියන පුද්ගලයා එන්ජීඕ එක්ක එකතුවෙලා මේවා කරලා පිටරටින් සල්ලි ගන්නවා කියලත් කිව්වා. ජනාධිපතිතුමා ලෙස තමන්ගේ කීමවත් ඔවුන් ගාණකට ගන්නේ නැහැ කිව්වා. අපිව රිමාන්ඩ් කිරීම පෙන්නලත් වැලිඅමුණ සල්ලි අරන් ඇති කියලා කිව්වා. හිටපු ජනාධිපතිතුමා මේ ගැන බලන්නම් කියලත් කිව්වා.

එහෙත් හිටපු ජනාධිපතිතුමා හමුවී වසරකට පසුව පොලිස් නඩු පැවරුවා. මාව යළි සිරගත කරන්න සැලසුමක් තිබෙනවා කියලා මට දැනගන්න ලැබුණා. බැසිල් රාජපක්ෂ මහතා සමඟ මැයි දිනය සමරා දින කීපයකට පසුව මෙම කරදර ආවා.

මම දුමින්ද දිසානායක මහතා හමුවුණා. මොකද ඔහු ශ්‍රී ලංකා නිද-හස් පක්ෂයේ සිටිය නිසා. දුමින්ද දිසානායක මහතා හිටපු පොලි-ස්පති පූජිත් ජයසුන්දර මහතාට දුරකථනයෙන් කතා කළා. එහෙම කතා කළාම පූජිත් මහතා F.C.I.D.යේ කාටහරි කතා කළා කියලා මට ඇහුණා. මම දෙන සාක්ෂි වලින් දෙයක් වෙන්නේ නැහැ කියලා මට (127 යටතේ) වන් ටු සෙවන් යටතේ ප්‍රකාශයක් දෙන්න වෙයි කිව්වා. මම වන් ටු සෙවන් ප්‍රකාශයක් ගැන දැනගෙන හිටියේ නැහැ. දුමින්ද දිසානායක මහතාත් දැනගෙන හිටියේ නැහැ. ඒ නිසා මම මගේ නීති-ඥවරයාගෙන් එය දැනගත්තා. මට 127 යටතේ ප්‍රකාශයක් දෙන්න කිව්වේ දන්සැල් ව්‍යාපෘතිය ගැනයි. දන්සැල් ව්‍යාපෘතිය කියලා ඔවුන් හැඳින්වූයේ දේශීය සංචාරක ප්‍රවර්ධන වැඩසටහනට එම සංචාරක ප්‍රවර්ධන වැඩසටහන බැසිල් රාජපක්ෂ මහතාගේ උපදෙස් මත කළා කියලා ප්‍රකාශයක් ගැනීමට F.C.I.D. ය බලාපොරොත්තුවෙන් සිටියා.

ඇත්තටම බැසිල් රාජපක්ෂ මහතා කිසිදු බලපෑමක් නියෝගයක් දීල නැහැ කියලා මම නීතිඥවරයාට කිව්වා. එහෙත් නීතිඥවරයාගේ උපදෙස් පරිදි මම F.C.I.D. යට ගිහිල්ලා 127 යටතේ ප්‍රකාශයක් දෙන්න කල් ලබාගෙන ආවා.

කොමිසම - තමන් දන්නවද 127 ප්‍රකාශය ගැන

සාක්ෂිකරු - ඔව් ස්වාමීනි දූෂණ විරෝධී කමිටුව මගින් ද මෙය එක් ව්‍යාපෘතියක් ලෙස නම් කර තිබුණා. එම ප්‍රකාශය අධිකරණය ඉදිරියේ දෙන සාක්ෂියකට සමානයි.

මීට පෙර මා චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මියද හමු-වුණා. එහිදී එතුමිය වැලිඅමුණ මහතාට කතා කළා. ඔහු ආවා. වැලිඅ-මුණ මහතා ද මේ දූෂණ විරෝධී කමිටුවේ සාමාජිකයෙක්.

කොමිසම - දූෂණ විරෝධී කමිටුව පිහිටුවූ හිටපු අගමැති රනිල් වික්‍රමසිංහ මහතාගේ කැබිනට් පත්‍රිකාව ප්‍රසිද්ධ ලේඛනයක් බවට පත් වෙලා.

සාක්ෂිකරු - මට එරෙහි විමර්ශන කළේ මූලික නීති සිද්ධාන්ත වලට පිටින් බැසිල් රාජපක්ෂ මහතා අල්ලන්නේ කොහොමද කියන ඉලක්කයට ඔවුන් වැඩ කළා. බැසිල් මහතාට චෝදනා කිරීමට නඩු-වක් පැවරීමට අපිට බලපෑම් කළා. අපි F.C.I.D.යේ බලපෑම් වලට යටත් නොවූ නිසා අපිට බොරු නඩුවක් පැටලුවා.

## 20 ගැන ...

තීන්දුව පසුගිය 09 වැනිදා ජනාධිපතිවරයාට හා කථානායකවර-යාට යොමු කර තිබිණ. ඒ අනුව අදාළ ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව කථා-නායකවරයා විසින් පාර්ලිමේන්තුවට දැනුම් දීමෙන් පසුව ඊට අදාළ විවාදය 21 සහ 22 යන දිනවලදී පැවැත්වේ. එම විවාදය පෙ.ව. 10.00 සිට රාත්‍රී 7.30 දක්වා පැවැත්වීමට පසුගියදා පැවති විශේෂ පක්ෂ නායක රැස්වීමේදී තීරණය කෙරිණ.

22 වැනිදා ප.ව. 7.30ට පමණ 20 වැනි ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පතට අදාළ සංශෝධන ඉදිරිපත් කිරීම සිදු වේ. සංශෝධන ඉදිරිපත් කිරීමෙන් පසුව ඊට අදාළ ඡන්ද විමසීම සිදු කිරීමට ද නියමිත වේ.

20 වැනි ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත පිළිබඳ විවාදය පැවැත්වෙන 21 සහ 22 යන දිනවලදී වාචික පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්න සඳහා කාලය වෙන් නොකිරීමට ද තීරණය කර ඇත. එමෙන්ම දිවා ආහාරය සඳහා කාලය වෙන් නොකිරීමට ද පක්ෂ නායක රැස්වී-මේදී තීරණය කර ඇත.

## පුත්තලමේ මන්ත්‍රීවරයකු ...

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් නාත්තන්ඩිය හැවන තෝරවැටිය වතු යායේ අක්කර 52 ක ඉඩමක් මෙලෙස අවභා-විත වන බව විරෝධතාකරුවන් ප්‍රකාශ කළ අතර ඔවුන් කියා සිටියේ පුත්තලම දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී හා පුත්තලම දිස්ත්‍රික් සංව-ර්ධන කමිටුවේ සභාපති අශෝක ප්‍රියන්ත මහතා බලහත්කාරයෙන් මේ ඉඩමේ පොල් කඩන බවයි. යහපාලන රජය සමයේ මේ ඉඩම පුත්තලම දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා විසින් බලහත්කාරයෙන් අල්ලා ගත් බව ප්‍රකාශ කළ නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාවේ උප සභා-පති ප්‍රසන්න මාරසිංහ මහතා එදා සිට මේ දක්වා මේ ඉඩමේ අදායම මොහු භුක්ති විඳින බවද පැවසීය.

සෞඛ්‍ය නීති රීතිවලට මූලිකත්වය දෙමින් පැවති මේ විරෝධතාවය සඳහා ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නියෝජනය කරන නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාවේ උප සභාපති ඇතුළු මන්ත්‍රීවරු බහුතරයක් සහභාගී වීම විශේෂත්වයකි

මෙහිදී ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමේ අවසරය ලබා ගෙන විරෝධතාකරුවන් ඉඩමට පිවිසි අතර ඒ වන විටත් මේ ඉඩමේ රැඳී සිටි පාතාලයට සම්බන්ධ රැකවලුන් හා මුරකරුවන් මේ ඉඩම අත-හැර ගොස් තිබිණි . එහෙත් මේ ඉඩමේ මුර කුටි තුළ වාහන කීපයක් හා යන්ත්‍ර සූත්‍ර කීපයක් දක්නට ලැබිණි .

මේ පිළිබඳව කළ විමසීමේදී ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමේ පුත්තලම දිස්ත්‍රික්කය භාර සහකාර අධ්‍යක්ෂිකා රසිකා උදයංගනී මහත්මිය පැවසුවේ අක්කර 1500 කට ආසන්න ඉඩම් ප්‍රමාණයක් ඇති තෝරවැටිය වතු යායේ ඉඩම් අක්කර 50 කට ආසන්න ප්‍රමාණ-යක් 2014 වර්ෂයේ තෝරවටිය සහ සමාගම නමින් සංජය ප්‍රනාන්දු නමැති අයකුට බදු දී ඇති බවයි. එහෙත් ඔහු මේ වන විට මෙරට නොමැති

බව වාර්තා වී ඇති අතර එදා සිට බදු ගෙවීම පැහැර හැර ඇති බැවින් සන්තකය පවරා ගැනීම සඳහා මාරවිල අධිකරණයේ නඩු පවරා ඇති බවයි.

## පළාත් සභා ඡන්දය ...

කොමිෂන් සභාවේ සභාපති මහින්ද දේශප්‍රිය මහතාගේ අත්සනින් යුතුව මේ ලිපිය යොමු කර ඇත.

එහි කරුණු වැඩිදුරටත් මෙසේ දැක්වේ.

පළාත් සභා ඡන්ද විමසීම නොපවත්වා එකී පළාත් සභා ආණ්ඩු-කාරවරුන් හා නිලධාරින් මගින් පාලනය කිරීම ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවේදය නොව බැවින් සහ මහජන නියෝජිතායතන ඡන්දයෙන් තේරිපත්වූ නියෝජිතයන්ගේන් තොරව පවත්වා ගෙන යෑම අනීතික බව ශ්‍රේෂ්ඨාධිකරණය පළාත් පාලන ඡන්ද විමසීමට අදාළ SCFR 35/2016 මූලික අයිතිවාසිකම් පෙත්සමේදී පෙන්වාදී ඇති බැවින් ද මේ පළාත් සභා ඡන්ද විමසීම කඩිනමින් පැවැත්වීමේ අවශ්‍යතාව පිළිබඳ 2018 වර්ෂයේ අප්‍රේල් මස සිටම ඒ සමයේ ජනපති, අග්‍රාමාත්‍ය සහ කතානායක ප්‍රමුඛ පාර්ලිමේන්තුවේ සියලුම දේශපාලන පක්ෂ නායකයන් වෙතද පිළිගත් දේශපාලන පක්ෂ ලේකම්වරුන් වෙතද මැතිවරණ කොමිෂන් සභාව දන්වා තිබේ.

මේ ඡන්ද විමසීම තවදුරටත් ප්‍රමාද නොකර පැවැත්වීමට අවශ්‍ය පියවර ආණ්ඩු පක්ෂය ප්‍රමුඛ පාර්ලිමේන්තුව ගත යුතු බවත් ඒ බව ජනාධිපති හා අග්‍රාමාත්‍ය ප්‍රමුඛ ආණ්ඩුව වෙත දැන්විය බවට ඉකුත් සැප්තැම්බර් මාසයේ (24) පැවැති දේශපාලන පක්ෂ හා ලේකම්වරු සහ නිත්‍ය නියෝජිතයන්ගේ රැස්වීමේදි යෝජනා කරනු ලදුව කිසිදු විරෝධතාවයකින් තොරව ඒකමතිකව පිළිගනු ලැබිණි.

පළාත් සභා ඡන්ද විමසීම පැවැත්වීම සඳහා දැනට ඇති නීතියවු 2017 අංක 17 දරන පළාත් සභා ඡන්ද විමසීම (සංශෝධන) පනතින් යෝජිත පනහට පනහා මිශ්‍ර සමානුපාත නියෝජන ක්‍රමය යටතේ ඡන්ද විමසීම පැවැත්වීම සඳහා සීමානිර්ණය වාර්තාව පාර්ලිමේන්තුව අනුමත නොකිරීම නිසා එම ක්‍රමය යටතේ ඡන්ද විමසීම පැවැත්වීමට නම් නව පනතකින් බලය ලබාගෙන නැවත සීමා නිර්ණය වාර්තා-වක් සැකසීම හෝ සුදුසු ක්‍රමවේදයක් අනුගමනය කළ යුතු අතර එයට තවත් සැලකිය යුතු කාලයක් ගතවනු ඇත.

එබැවින් 2019 නොවැම්බර්, දෙසැම්බර් කාලසීමාව තුළ බලයේ සිටි එක්සත් ජනතා නිදහස් සන්ධානය,ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ හා ඊට අනුබද්ධ පක්ෂවල ප්‍රධානත්වයෙන් රට පාලනය කරන කාලය තුළ පළාත් සභා ඡන්ද විමසීම පැරණි මනාප සහිත සමානුපාතික නියෝජන ක්‍රමයට පැවැත්වීම සඳහා 2017 අංක 17 සංශෝධන පනත ක්‍රියාත්මකවීම වර්ෂ කිහිපයකට කල් තැබීම මගින් 1988 අංක 2 දරන පළාත් සභා පනතේ පැරණි විධිවි-ධාන නැවත බලාත්මක කිරීම සඳහා පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරනු ලදුව එය අමාත්‍ය මණ්ඩලයේ අනුමත කළේය. ඒ අනුව මැති-වරණ කොමිෂන් සභාවේ මතය වන්නේ පළාත් සභා ඡන්ද විමසීම කඩිනමින් පැවැත්විය හැක්කේ එකී යෝජනාව එනම් 2019 නොවැ-ම්බර්,දෙසැම්බර් යෝජනාව ක්‍රියාත්මක කිරීම මගින් බවයි. ඒ අයුරින් හෝ අන්අයුරකින් හෝ පාර්ලිමේන්තු පනතක් කඩිනමින් සම්මත කර දැනටමත් බොහෝ සෙයින් ප්‍රමාද වී ඇති පළාත් සභා ඡන්ද විම-සීම 2021 වර්ෂයේ මුල මාස තුන ඇතුළත පැවැත්වීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙස ඉතා ඕනෑකමෙන් ඉල්ලා සිටිමු.

## එජාප ජාතික ලැයිස්තු ...

ජාතික ලැයිස්තු මන්ත්‍රී ධූරයේ පුරප්පාඩුව සම්බන්ධයෙන් පක්ෂයේ ජ්‍යෙෂ්ඨයන් පිරිසක් කරුණු විමසූ අවස්ථාවේ දී වික්‍රමසිංහ මහතා මේ බව පවසා තිබේ.

සුදුසුකම් ඇති කිහිප දෙනකු මන්ත්‍රී ධූරය බලාපොරොත්තු වන බව සඳහන් කර ඇති වික්‍රමසිංහ මහතා ඡන්දයෙන් නොතේරුණු කෙනකු ජාතික ලැයිස්තුවෙන් පාර්ලිමේන්තුවට පත් නොකරන බවට පක්‍ෂය තීන්දුවක් ගෙන ඇති බැවින් පාර්ලිමේන්තු යැවිය යුත්තේ කවුරු-න්දැයි ඉක්මණින් තීන්දු කරන බවත් පවසා ඇත.

පක්ෂයේ මහ ලේකම් ධූරයෙන් ඉවත් වී පාර්ලිමේන්තු මන්ත්‍රී ධූරය සඳහා පත්ව යාමට අකිල විරාජ් කාරියවසම් මහතා සිය බල-වත් කැමැත්ත පළ කර ඇතැයි වාර්තා වේ. ජාතික ලැයිස්තු මන්ත්‍රී ධූරය සඳහා මහා ලේකම් අකිල විරාජ් කාරියවසම් මහතාගේ නම ඔහු විසින්ම මැතිවරණ කොමිසමට යැවීමට උත්සාහ කළ බවට පසුගිය දා සමාජ මාධ්‍යවල පළවී තිබිණි.

කෙසේ වෙතත් පාර්ලිමේන්තු මන්ත්‍රි ධූරය සඳහා පක්ෂයෙන් නම් කර එවන නාම යෝජනාව සඳහා පක්ෂයේ මහලේකම් වරයාගේ මෙන්ම පක්ෂ නායකයාගේ අත්සන අනිවාර්යෙන්ම යොදන බව එක්සත් ජාතික පක්ෂය මැතිවරණ කොමසාරිස්වරයා වෙත දන්වා යවා තිබේ.

1 පිටුවෙන් ..

## ඇවන්ගාඩ් සිද්ධියට ...

ඇවන්ගාඩ් හෙවත් සමෘද්ධිය ආරක්ෂාව සම්බන්ධයෙන් කළ විමර්ශනයේ දී 200කට අධික පිරිසකගෙන් ප්‍රකාශ සටහන් කර-ගත්ත ද නඩු පැවරීමට තරම් ප්‍රබල සාක්ෂියක් අනාවරණය නොවූ බවත්, නීතිපති දෙපාර්තමේන්තුව ද ඒ පිළිබඳ දැනුම් දී තිබියදී එම කරුණු පසෙකට දමා හිටපු ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජ-පක්ෂ මහතාව ප්‍රකාශ සටහන් කරගැනීම සඳහා අල්ලස් කොමිස-මට කැඳවූ බවත් හෙතෙම අනාවරණය කළේය.

එලෙස අල්ලස් කොමිසමට කැඳවූ රාජපක්ෂ මහතාව අපහ-සුතාවට පත් කරමින් හා පොලිස් නිලධාරීන්ට බලපෑම් කරමින් ප්‍රකාශ සටහන් කරගත් අයුරු පිලිපිටිය මහතා විස්තර කළේය.

2015 වසරේදී මම සහ ප්‍රධාන පොලිස් පරීක්ෂක මල්ලිකාරච්චි මහතා සමඟ ඇවන්ගාඩ් මූලික විමර්ශන කළා .

අදාළ විමර්ශනයේදී පුද්ගලයින් 200 දෙනෙකුට ආසන්න පිරිස-කගෙන් ප්‍රකාශ සටහන් කර ගත්තා.

ගෝඨාභය රාජපක්ෂ , මේජර් ජෙනරාල් පාලිත ප්‍රනාන්දු සහ ඇවන්ගාඩ් සමාගමේ සභාපති නිශ්ශංක සේනාධිපති ඇතුළු පිරි-සට එරෙහිව නඩු පැවරීමට තරම් ප්‍රබල සාක්ෂි එම විමර්ශණයේදි අනාවරණය වුයේ නැහැ.

නීතිපති දෙපාර්තමේන්තුව ද ඒ පිළිබඳව දැනුම් දී තිබුණා. එම කරුණු නොතකා ගෝඨාභය රාජපක්ෂ මහතාව ප්‍රකාශයක් සට-හන් කර ගැනීමට අල්ලස් කොමිසමට කැඳවූවා. රාජපක්ෂ මහ-තාගෙන් ප්‍රකාශ සටහන් කර ගන්නා ස්ථානයේ CCTV කැමරා පද්ධති සවි කරමින් දිල්රුක්ෂි ඩයස් වික්‍රමසිංහ මහත්මිය සහ කොමිසමේ තවත් උසස් නිලධාරියෙකු වෙනත් ස්ථානයක සිට එය නිරීක්ෂණය කළා.

ගෝඨාභය රාජපක්ෂගෙන් විමසිය යුතු ප්‍රශ්න ඇතුළත් කොළ කැලි කිහිපයක් විමර්ශන නිලධාරින් අතට පත් කර එම නිලධා-රීන්ද මානසික වශයෙන් පීඩාවට ලක් කළා.

කොමිසමේ සභාපතිවරයා.-කොළ කැලිවල ලියලා එවපු ප්‍රශ්න මොනවද?

."විමර්ශනයට කිසිසේත් අදාළ නොවන ප්‍රශ්න එහි ඇතුළත්ති-බුණා o

අදාළ විමර්ශනයන් අනතුරුව ගෝඨාභය රාජපක්ෂ ඇතුළු සැකකරුවන්ට එරෙහිව දූෂණය නැමැති වරද සිදු කර ඇති බව ට සාක්ෂි නොමැති බව වික්‍රමසිංහ මහත්මියට දැනුම් දුන්නා.එම දැනුම් දීමෙන් පසුව උරණ වු දිල්රුක්ෂි මහත්මිය ෆයිල් පොළොවේ ගසා "ගෝඨාභයට නඩු දාන්න බැරි එවුන් මෙහේ ඉඳලා වැඩක් නැහැ.o යනුවෙන් පරුෂ වචනයෙන් බැණ වැදුණා. .

එහි ප්‍රතිඵලය ලෙස මට ස්ථාන මාරුවක් ලබාදී තිබුණා.

අනතුරු ව ඇවන්ගාඩ් විමර්ශනය වෙනත් නිලධාරින් දෙදෙ-නෙකු අතරට පත් කරමින් ගෝඨාභය රාජපක්ෂ , පාලිත ප්‍රනාන්දු , නිශ්ශංක සේනාධිපති ඇතුළු පිරිසට එරෙහි ව නඩු පවරා තිබෙ-නවා.යැයිදි කොමිසම හමුවේ පැවසීය.

## හෙට තීන්දුව ලැබෙන තෙක් ...

මීට පෙර හිටපු අමාත්‍ය රවී කරුණානායක, කුරුණෑගල නග-රාධිපතිවරයා අත්අඩංගුවට ගැනීමට උත්සාහ කළ අවස්ථාවේ දී එයට එරෙහිව ඔවුන් අධිකරණයට ගිය බවත්, ඒ සමඟ ඔවුන් අත්අඩංගුවට ගැනීම අත්හිටවූ බවත් රිෂාඩ් බදියුදීන් සම්බන්ධ-යෙන් නීතිපතිවරයා නියෝගයක් ලබා දී තිබෙන බවත් ඔහු වැඩි-දුරටත් කීවේය.

තත්ත්වය මෙසේ වුවත් රිෂාඩ් බද්යුදීන් වරදකරුවකු ලෙස සමාජයේ කතා බහට ලක් වී ඇති බවත් එහෙත් ඔහු අපරාධ පරී-ක්ෂණ දෙපාර්තමන්තුවේ පරීක්ෂණ 20කට වැඩි ගණනකට මුහුණ දී තිබෙන බවත් ඔහු ඒ එකකටවත් හැංගුණේ නැති බවත් නීතිඥ-වරයා පැවැසුවේය.

එහෙත් මෙවර නීතිපතිවරයා ලබාදුන් උපදෙස වෙනස් ආකාර-යකට පවතින බවත් ඔහුගේ ඥාතීන්ට සහ මිතුරන්ට කරදර වී ඇති බවත් ඔහු මේ අවස්ථාවේ පැවැසීය.

අවතැන් වූ පුද්ගලයන්ට ප්‍රවාහන පහසුකම් ලබා දීම සඳහා හිටපු අගමැති රනිල් වික්‍රමසිංහ මහතාගේ මඟපෙන්වීම යටතේ මුදල් ඇමැතිවරයා මුදල් වෙන් කළ බවත්, ඒ අනුව මුදල් ඇමතිව-රයා මුදල් වෙන් කළ බවත් ඒ මුදල් දින 6ක් ඇතුළත නැවත ලබා දී තිබෙන බවත් නීතිඥ සහීඩ් වැඩිදුරටත් කීවේය.

මෙම මාධ්‍ය සාකච්ඡාවට පාර්ලිමේන්තු මන්ත්‍රී එම්. මුෂාරෆ්, හිටපු නියෝජ්‍ය ඇමැති අමීර් අලී, පක්ෂ ලේකම් සුබයිදීන්, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී හුනෙයිෆ් පාරුෆ් සහ හිටපු පළාත් සභා මන්ත්‍රී එම්. ෆායිස් සහභාගී වූහ.

## සීමාවාසික වෛද්‍ය නිලධාරීන් ...

පත්වීම්වලට අදාළව ඔන්ලයින් (Online) ක්‍රමවේදය ඔස්සේ පිළියෙළ කළ නාම ලේඛනයේ සඳහන් පත්වීම්ලාභීන් සේවා ස්ථාන සඳහා සේවයට වාර්තා කළ යුතු බව වැඩබලන සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විශේෂඥ වෛද්‍ය එස්. ශ්‍රීධරන් මහතා දන්වා සිටියි.

## මම නාමල් කුමාරව ...

සහරාන් සහ අන්තවාදය ගැන ආරක්ෂක මණ්ඩලයේ කතා කරනවා වෙනුවට නාමල් කුමාර ගැන කතා කළ බවට කොමිස-මට සාක්ෂි ඉදිරිපත් වී ඇති බව කියමින් ඒ ගැන ඔබතුමා මොකද කියන්නේ යැයි රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය සිදු කළ විමසීමේදී මේ බව කියා සිටි හිටපු ජනාධිපතිවරයා එම කතාව සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරන බවත් එය අසත්‍යයක් බවත් කොමිසම හමුවේ කීය.

ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා පෙරේදා හතරවන වතාවට කොමිසම හමුවේ සාක්ෂි ලබා දීමට කොමිසම හමුවේ පෙනී සිටියේය.

හිටපු පොලිස්පතිවරයා විසින් නාමල් කුමාර සිද්ධියට අදාළව නියෝජ්‍ය පොලිස්පතිවරයා සමඟ කිහිපවතාවක් තමන් හමුවීමට පැමිණි බව කියා සිටි හිටපු ජනාධිපතිවරයා නාමල් කුමාර යන පුද්ගලයා සම්බන්ධයෙන් කිසිදු දිනක ආරක්ෂක මණ්ඩලයේ කතා කර නැති බවත් කියා සිටියේය.

එමෙන්ම එම ප්‍රකාශය කවුරුන් සිදු කළ ද සම්පූර්ණ අසත්‍යයක් බැවින් ප්‍රතික්ෂේප කරන බවද හිටපු ජනාධිපතිවරයා කොමිසමට කියා සිටියේය.

ලබන 22වනදාට නැවතත් පාස්කු ඉරුදින ත්‍රස්ත ප්‍රහාරය පිළි-බඳ විමර්ශනය කෙරෙන ජනාධිපති කොමිසම හමුවේ පෙනී සිටින ලෙසට හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාට කොමිසම විසින් නියෝග කළේය.

## ගම්පහ පවුල් ...

මෙම වැඩපිළිවෙළේ පළමු අදියර යටතේ මුලින්ම ඇඳිරි නීතිය පැනවූ හා දැනට සංචරනය සීමා කර ඇති ගම්මාන පහක් ඇතුළු මිනුවන්ගොඩ, දිවුලපිටිය, වේයන්ගොඩ පොලිස් බල ප්‍රදේශවලට අයත් මිනුවන්ගොඩ, දිවුලපිටිය, අත්තනගල්ල, හා මීරිගම ප්‍රාදේ-ශීය ලේකම් කොට්ඨාසවල පවුල් 72,345කට රුපියල් 5000 දීමනාව ලබා දීමට කටයුතු යොදා ඇතැයි ඇමැති රණතුංග මහතා ප්‍රකාශ කළේය.

කෝවිඩ් 1 සහ 2 අදියරවලදී අනුගමනය කළ පරිදිම සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සම්බන්ධීකරණය යටතේ මෙම මුදල ගෙවීමට සැලසුම් කර ඇති බව ගම්පහ දිස්ත්‍රික් ලේකම් සුනිල් ජයලත් මහතා කීවේය.

ඇඳිරි නීතිය පනවා ඇති ගම්පහ දිස්ත්‍රික්කයේ අනෙක් පොලිස් බල ප්‍රදේශ 16ක් තුළ වෙසෙන ජනතාවට දෙවන අදියර යටතේ එම මුදල ලබා දීමට අවශ්‍ය ප්‍රතිපාදන ලබා දෙන ලෙස බැසිල් රාජපක්ෂ මහතාගේ හා ඇමති ප්‍රසන්න රණතුංග මහතාගේ උප-දෙස් පරිදි මුදල් අමාත්‍යාංශයෙන් ඉල්ලීමක් කර ඇති බවත් දිස්ත්‍රික් ලේකම්වරයා පැවැසීය.

නිරෝධායන ඇඳිරි නීතිය පැනවීම හේතුවෙන් ජීවනෝපාය අහිමි වූ ගම්පහ දිස්ත්‍රික්කයේ ජනතාවට රුපියල් 5000 දීමනාව ලබා දෙන ලෙස සංචාරක ඇමැති හා ශ්‍රී ලංකා පොදුජන පෙර-මුණේ ගම්පහ දිස්ත්‍රික් නායක ප්‍රසන්න රණතුංග මහතා පසුගිය සතියේදී කැබිනට් මණ්ඩලයේදී ජනාධිපතිවරයාගෙන් ඉල්ලා තිබිණි.

# ශ්‍රී ලංකාවේ නව රාජ්‍ය තාන්ත්‍රිකයෝ අගමැති හමු වෙති



විදෙස් සේවයට පත් වූ නව රාජ්‍ය තාන්ත්‍රික නිලධාරීහු සිවු දෙනෙක් අගමැති මහින්ද රාජපක්ෂ මහතා ව අරලියගහ මන්දිරයේ දී පසුගිය දා (16) හමු වූහ.

නිව්යෝර්ක් හි එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ශ්‍රී ලංකාවේ නිත්‍ය නියෝජිත ලෙස පත් කළ මොහාන් පීරිස්, චීනයේ නව තානාපති ආචාර්ය පාලිත කොහොන, ජපානයේ නව තානාපති සාජිව් ගුණසේකර සහ ජිනීවාහි ශ්‍රී ලංකාවේ නිත්‍ය නියෝජිත සී. ඒ. චන්ද්‍රප්‍රේම මහත්වරු අගමැතිවරයා හමු වූ අවස්ථාව.

# කොවිඩ්-19 සමඟ සෑම ක්ෂේත්‍රයකම මතු වූ අභියෝග ජය ගන්න නවෝත්පාදන අවශ්‍යයි

## පොදු රාජ්‍ය මණ්ඩලයීය විදේශ කටයුතු ඇමැතිවරුන්ගේ 20 වැනි රැස්වීමේදී ඇමැති දිනේෂ් ගුණවර්ධන කියයි

මහින්ද අලුත්ගෙදර



කොවිඩ්-19 වසංගතය හමුවේ පොදු රාජ්‍ය මණ්ඩලයීය රටවල ඊ-වාණිජ්‍යය හා ඊ-පාලනය වැඩි දියුණු කරන මෙන් ශ්‍රී ලංකා පොදු රාජ්‍ය මණ්ඩලයෙන් ඉල්ලයි.

75 වැනි එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයට සමගාමීව පැවති පොදු රාජ්‍ය මණ්ඩලයීය විදේශ කටයුතු ඇමැතිවරුන්ගේ 20 වැනි අතථ්‍ය රැස්වීමට (CFAMN) සහභාගී වූ ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායමේ නායකත්වය දරමින් විදේශ ඇමැති දිනේෂ් ගුණවර්ධන මහතා කොවිඩ්-19 වසංගතය ඇතිවීමත් සමගම සෑම ක්ෂේත්‍රයකම පාහේ පැනනැගී ඇති බහුවිධ වූ අභියෝග ජයගැනීම සඳහා නවෝත්පාදන චින්තනයත්, සාමූහික සහ සමෝධානික උපාය මාර්ගත් අවශ්‍යවන බව ප්‍රකාශ කළේය.

ඊ-වාණිජ්‍යය හා ඊ-පාලනය මගින් පශ්චාත් කොවිඩ්-19 වසංගතය ලෝකයේ තරඟකාරී මායිම් අර්ථ දක්වන බව හුවා දක්වමින්, පොදු රාජ්‍ය මණ්ඩල සාමාජික රටවල, ආර්ථිකයන් සහ සේවාවන් ඩිජිටලීකරණය කිරීම වැඩිදියුණු කිරීම සඳහා සහාය ඉල්ලා සිටි අතර ඩිජිටල් ගණුදෙනු සඳහා ජාත්‍යන්තර ප්‍රමිතීන් සකස් කිරීම සඳහා දකුණු ආසියාවේ පළමු රට වශයෙන් කටයුතු කරන අතරවාරයේ ඩිජිටල් වේදිකාවක් හරහා ප්‍රථම වතාවට තේ හා රබර් වෙන්දේසියක් පවත්වමින් ශ්‍රී ලංකාව ලබාගත් අත්දැකීම පිළිබඳ මෙහිදී සඳහන් කළේය. කොවිඩ්-19ට අදාළව දැනට සිදුකරගෙන යනු ලබන පර්යේෂණ සඳහා පොදු රාජ්‍ය මණ්ඩලයීය රටවල පවත්නා විද්‍යාත්මක සහ තාක්ෂණික විශේෂඥභාවය සහ දැනුම ඒකරාශී කිරීමට ද ඒ මහතා යෝජනා කළේය.

මේ සම්බන්ධයෙන්, කොවිඩ්-19 ආසාධන සම්බන්ධයෙන් ප්‍රතිශක්තිකරණය ඇතිවන ආකාරය අවබෝධ කරගැනීම සඳහා ඩෙංගු ආසාධනය සඳහා පුද්ගලයන් තුළ ප්‍රතිශක්තිය ඇතිවන ආකාරය සම්බන්ධයෙන් ලබාගත් විශේෂඥභාවය බෙදා හදා ගැනීමෙහිලා ශ්‍රී ලංකාවේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සහ ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලය අතර පවත්නා හවුල්කාරිත්වය පිළිබඳව විදේශ ඇමැතිවරයා මෙහි දී අවධානය යොමු කළේය.

මෙම අර්බුදය මගින් ඇතිවන පෙර නොවූ විරූ අයහපත් ආර්ථික සහ සමාජ බලපෑම පිළිබඳව සඳහන් කළ ඇමැති ගුණවර්ධන මහතා දැනට පවතින දුෂ්කරතාවලින් මිදීම සඳහා ණය සහන, ණය ආපසු ගෙවීම සඳහා කල් ලබාදීම සහ මූල්‍ය උත්තේජක කඩිනමින් අවශ්‍ය වන බව හුවා දැක්වීය.

දේශගුණික විපර්යාස පිළිබඳ පැරිස් ගිවිසුමේ කාර්යය සැලැස්ම යටතේ ශ්‍රී ලංකාව ඇප කැප වී සිදුකරන කටයුතු කෙරෙහි අවධානය යොමු කරමින්, වර්ෂ 2030 වනවිට හරිතාගාර වායු විමෝචන සියයට 30 කින් අඩුකිරීම සඳහා සහ ජලය, සූර්ය බලය හා සුළං ආශ්‍රිත විදුලිබලය වෙත යොමුවෙමින් අඩු කාබන් මට්ටමකින් යුත් සහ ආර්ථික වර්ධනයක් සහිත පහසුවෙන් ප්‍රකෘති තත්ත්වයට පත්වන සහ පිරිසිදු අනාගතයක් කරා යාමට ශ්‍රී ලංකාව සැලසුම් කර ඇති බව ඇමැතිවරයා දන්වා සිටියේය. ශ්‍රී ලංකාව ඇතුළුව කුඩා රටවල් සඳහා දේශගුණික මූල්‍ය වර්ධනය කිරීම සඳහා පවතින බාධක, අවධානම සහ අනාගත ඉඩ ප්‍රස්තා හඳුනා ගැනීමේ අවශ්‍යතාව ද අවධාරණය කළේය.

පොදු රාජ්‍ය මණ්ඩලයේ වර්තමාන සභාපතීත්වය දරන එක්සත් රාජධානියේ විදේශ හා පොදුරාජ්‍ය මණ්ඩලයීය කටයුතු පිළිබඳ රාජ්‍ය ලේකම් සහ එක්සත් රාජධානියේ පළමු රාජ්‍ය ලේකම්, පාර්ලිමේන්තු මන්ත්‍රී ඩොමිනික් රාබ් මහතා විසින් මෙම රැස්වීමේ මුලසුන හොබවන ලදී. සම්ප්‍රදායානුකූලව නිව්යෝර්ක් හි එක්සත් ජාතීන්ගේ මහා සම්මේලනයට සමගාමීව පවත්වනු ලබන මෙම පොදු රාජ්‍ය මණ්ඩලයීය විදේශ කටයුතු ඇමැතිවරුන්ගේ රැස්වීම මෙම වසරේ පවතින කොවිඩ්-19 වසංගතය හමුවේ අතථ්‍ය රැස්වීමක් ලෙස පවත්වන ලදී.

විදේශ ලේකම් අද්මිරාල් මහාචාර්ය ජයනාත් කොළඹගේ, එක්සත් රාජධානිය සඳහා ශ්‍රී ලංකා මහකොමසාරිස් සරෝජා සිරිසේන හා විදේශ අමාත්‍යාංශයේ යුරෝපා සංගම් හා පොදු රාජ්‍ය මණ්ඩලයීය අංශයේ අධ්‍යක්ෂ ජනරාල් ධම්මිකා සේමසිංහ මහත්ම මහත්මීහු මෙම රැස්වීමට සහභාගී වූ ශ්‍රී ලංකා නියෝජිත පිරිසට අයත් වෙති.

# ගම්පහ දිසාවේ ඇඳිරි නීතිය පනවා ඇති ප්‍රදේශවලට

# සමෘද්ධි, වැඩිහිටි, මහජනාධාර දීමනා කඩිනමින් දෙන්න පියවර ගන්න

## ඇමැති ප්‍රසන්න රණතුංග

මහින්ද අලුත්ගෙදර



ගම්පහ දිස්ත්‍රික්කයේ ඇඳිරි නීතිය පනවා ඇති ප්‍රදේශවල සමෘද්ධි, වැඩිහිටි දීමනා, මහජනාධාර කඩිනමින් ලබාදීමට පියවර ගන්නැයි සංචාරක ඇමැති ප්‍රසන්න රණතුංග මහතා බලධාරීන්ට උපදෙස් දී තිබේ.

ඊට අමතරව එම ප්‍රදේශවල විහාරස්ථාන ඇතුළු ආගමික සිද්ධස්ථාන පිරිවෙන් වැඩිහිටි හා ළමා නිවාස සඳහා අත්‍යවශ්‍ය ආහාර ලබාදීමේ වැඩපිළිවෙළක් කඩිනමින් ක්‍රියාත්මක කරන ලෙස ද ඇමැතිවරයා ප්‍රකාශ කරයි.

ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී පෙරේදා (17) පැවති රැස්වීමක දී ඇමැතිවරයා මෙම උපදෙස් ලබා දුන්නේය. ගම්පහ දිස්ත්‍රික්කයේ ඇඳිරි නීතිය බල පැවැත්වෙන ප්‍රදේශවල ජනතා අවශ්‍යතා ඉටුකිරීම සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා රැස්වීමක් කැඳවා තිබුණි.

ගම්පහ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ මිගාර යාපා මහතා මෙහි දී පෙන්වා දුන්නේ මේ වනවිට ගම්පහ දිස්ත්‍රික්කයේ කෝවිඩ් රෝගීන් 1589ක් හඳුනා ගෙන ඇති බවත් ක්ෂේත්‍රයන් 1290ක් හා රෝහල්වලින් 229ක් ලෙස මෙම පිරිස හඳුනාගෙන තිබෙන බවත්ය.

ගම්පහ දිස්ත්‍රික්කයේ පසුගිය සිකුරාදා දක්වා සිදුකර ඇති පී.සී.ආර්. පරීක්ෂණ සංඛ්‍යාව 21225 ක් වන අතර ඉන් 19413 ක්ම සිදුකර ඇත්තේ ක්ෂේත්‍රයෙනි. කටුනායක නිදහස් වෙළෙඳ කලාපය ආශ්‍රිතව පසුගිය 16 දා වනවිට කොවිඩ් රෝගීන් 152 හඳුනාගෙන ඇති අතර දිස්ත්‍රික්කයේ වෙනත් කාර්මාන්ත ශාලා ආශ්‍රිතව රෝගීන් 18 දෙනෙකු හඳුනාගෙන ඇතැයි ද ගම්පහ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා මෙහිදී අනාවරණය කෙළේය.

ශ්‍රී ලංකා යුද හමුදාවේ බස්නාහිර ප්‍රාදේශය භාර අඥාපති මේජර් ජනරාල් චූලා අබේනායක මහතා මෙහි දී සඳහන් කළේ මිනුවන්ගොඩ කොවිඩ් පොකුරෙන් හඳුනාගත් ආසාධිතයන්ගේ සමීපතමයන් සියලුම දෙනා මේ වනවිට නිරෝධායන මධ්‍යස්ථාන වෙත යොමු කර ඇති බවයි. ඔවුන්ට අවශ්‍ය පහසුකම් ද සැලසීමට ආරක්ෂක අංශ පියවර ගෙන ඇති බවත් නිරෝධායන මධ්‍යස්ථානවලින් හමුවන ආසාධිතයන් කඩිනමින් රෝහල් ගත කිරීමට පියවර ගෙන ඇති බවත් ඒ මහතා කීවේය.

ගම්පහ දිස්ත්‍රික්කයේ පවුල් 2781ක් මේ වන විට සිය නිවෙස් තුළම නිරෝධායනය සඳහා යොමු කර ඇතැයි දිස්ත්‍රික් ලේකම් සුනිල් ජයලත් මහතා කීවේය. ඉන් වැඩිම පිරිසක් ඇත්තේ මිනුවන්ගොඩ ප්‍රාදේශිය ලේකම් බල ප්‍රදේශයේය. පවුල් 876ක් මිනුවන්ගොඩ ප්‍රාදේශිය ලේකම් බල ප්‍රදේශයේ සිය නිවාස තුළම නිරෝධායනයට යොමුකර ඇතැයි ද දිස්ත්‍රික් ලේකම්වරයා මෙහි දී කීවේය. එම පවුල් වෙත ආහාර හා ඖෂධ අත්‍යවශ්‍ය භාණ්ඩ සැපයීම සඳහා රුපියල් මිලියන 05 ක්ද වෙන් කර තිබේ.

ඇමැති ප්‍රසන්න රණතුංග මහතා මෙහි දී කියා සිටියේ නිරෝධායනය වන සියලු ම පවුල්වලට මෙම අත්‍යවශ්‍ය භාණ්ඩ ලබාදිය යුතු බවයි. ඒ සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙස ඇමැතිවරයා ප්‍රාදේශිය ලේකම්වරුන්ගෙන් මෙහිදී ඉල්ලා සිටියේය. දිස්ත්‍රික්කයේ සමෘද්ධි, වැඩිහිටි දීමනා, මහජනාධාර කඩිනමින් ලබා දීමට පියවර ගන්නා ලෙස ද ඇමැතිවරයා දිස්ත්‍රික් ලේකම්වරයාගෙන් ඉල්ලා සිටියේ.

සමෘද්ධි දීමනාව ලබා දීම සඳහා රුපියල් මිලියන 284.65 ක් මේ වනවිට වෙන්කර ඇතැයි මෙහිදී අනාවරණය විය. ඒ අනුව පවුල් 1,37,416ක් සඳහා සමෘද්ධි දීමනාව කඩිනමින් ලබාදීමට පියවර ගන්නා බවද දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරයා මෙහිදී කියා සිටියේය.

මේ වනවිට දිස්ත්‍රික්කයේ විශේෂ ආරක්ෂිත ගම්මාන ලෙස හඳුනාගෙන සංචරනය සීමාකර ඇති ප්‍රදේශවල වෙසෙන ජනතාව සඳහා අත්‍යවශ්‍ය ආහාර පාන ලබාදීමේ යාන්ත්‍රණය විධිමත් කරන ලෙස ද ඇමැතිවරයා මෙහිදී උපදෙස් දුන්නේය. සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුව එම ප්‍රදේශවල ජනතා අවශ්‍යතා ඉටුකිරීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට ද තීරණය කෙරිණි.

ඇඳිරි නීතිය පනවා ඇති ප්‍රදේශවල ජීවනෝපාය අහිමි පවුල්වලට දීමනාවක් ලබාදීම සඳහා වන යෝජනාව තමන් ආණ්ඩුවට ඉදිරිපත් කර ඇතැයි පැවසු ඇමැති ප්‍රසන්න රණතුංග මහතා ඉදිරියේ දී ඒ සම්බන්ධයෙන් ආණ්ඩුවේ අවධානය තවදුරටත් යොමුකරන බවද කීවේය.

# කෑගල්ල දිසාවේ

## වාහන ආදායම් බලපත්‍ර දීම

# තාවකාලිකව අත්හිටුවීමට පියවර

## දිස්ත්‍රික් කොවිඩ් මෙහෙයුම් කමිටුව තීරණය කරයි

කොවිඩ් වසංගතය යළි හිස එසවීම හේතුවෙන් පවතින අනාරක්ෂිත තත්ත්වය හමුවේ කෑගල්ල දිස්ත්‍රික්කයේ වාහන ආදායම් බලපත්‍ර ලබා දීම තාවකාලිකව අත්හිටුවීමට පියවර ගැනීමට දිස්ත්‍රික් කොවිඩ් මෙහෙයුම් කමිටුවේ දී පසුගිය දා (14) තීරණය කෙරිණි.

ඒ අනුව සති දෙකක කාලයක් සඳහා මෙම තීරණය ගත් බව සබරගමු පළාත් ආණ්ඩුකාර ටිකිරි කොබ්බෑකඩුව මහතා මෙහි දී සඳහන් කළේය.

කෑගල්ල දිසාපති/දිස්ත්‍රික් ලේකම් මහින්ද එස්. වීරසූරිය මහතාගේ කැඳවීමෙන් සබරගමු පළාත් ආණ්ඩුකාර ටිකිරි කොබ්බෑකඩුව මහතාගේ ප්‍රධානත්වයෙන් සහ දිස්ත්‍රික් දේශපාලන අධිකාරියේ සහභාගීත්වයෙන් දිස්ත්‍රික් කොවිඩ් මෙහෙයුම් කමිටුව අද උදෑසන දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය ශ්‍රවණාගාරයේ දී රැස්විය.

සියලුම ක්ෂේත්‍ර අතර මනා සම්බන්ධීකරණයක් පවත්වා කොවිඩ් පාලනය කටයුතු සිදු කිරීම මගින් දිස්ත්‍රික්කයේ තත්ත්වය ආරක්ෂා කර ගත හැකි වන බව කෑගල්ල දිසාපති/දිස්ත්‍රික් ලේකම් මහින්ද එස්. වීරසූරිය මහතා මෙහි දී සඳහන් කළේය.

කෑගල්ල දිස්ත්‍රික්කය තුළ මේ වන විට කොවිඩ් රෝගීන් 13 ක් වාර්තා වන බවත් දිස්ත්‍රික්කය තුළ 532 ක පිරිසක් නිවෙස් වල නිරෝධායන කටයුතු සිදු කෙරෙන බවත් දිස්ත්‍රික්කයේ කොවිඩ් තත්ත්වය පිළිබඳ අදහස් දක්වමින් දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක වෛද්‍ය කුමාර් වික්‍රමසිංහ මහතා ප්‍රකාශ කළේය.

දිස්ත්‍රික්කය තුළ උසස් පෙළ විභාගය පැවැත්වීම විධිමත්ව ආරක්ෂාකාරී තත්ත්වයක් යටතේ සහ සෞඛ්‍ය අංශයේ අඛණ්ඩ නිරීක්ෂණය යටතේ සිදු කෙරෙන බවත් කොවිඩ් මර්ධන කටයුතු සඳහා ආරක්ෂක අංශ සහ පළාත් පාලන ආයතන මැදිහත් වී කටයුතු කරන බවත් මෙහි දී අනාවරණය විය.

එමෙන්ම රාජ්‍ය ආයතනවල සේවකයන් සේවා අවශ්‍යතා අනුව කාර්යාලයට ගෙන්වීම කෙරෙහි ද කමිටු රැස්වීමේ දී අවධානය යොමු කෙරිණි.

මේ අවස්ථාව සඳහා සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ වතු ආශ්‍රිත බෝග, කර්මාන්ත නවීකරණ තේ හා රබර් අපනයන ප්‍රවර්ධන සහ රාජ්‍ය ඇමැති කනක හේරත්, කලාපීය සහයෝගිතා ඇමැති තාරක බාලසූරිය, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සම සභාපතිනි රාජිකා වික්‍රමසිංහ, පාර්ලිමේන්තු මන්ත්‍රී උදයකාන්ත ගුණතිලක යන මහත්ම මහත්මීන් සහ ප්‍රාදේශීය සභා සභාපතිවරුන් ඇතුළු දිස්ත්‍රික් දේශපාලන අධිකාරිය, අතිරේක දිස්ත්‍රික් ලේකම් (පාලන) නාලිකා පියසේන, අතිරේක දිස්ත්‍රික් ලේකම් (ඉඩම්) දිනීෂා එස්. රත්නායක, සහකාර දිස්ත්‍රික් ලේකම් විජයානි රත්නසේකර යන මහත්මීන් ඇතුළු ප්‍රාදේශීය ලේකම්වරුන් සහ දිස්ත්‍රික්කයේ රාජ්‍ය ආයතන ප්‍රධානීන්, සබරගමු පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක කපිල කන්නන්ගර මහතා ඇතුළු සෞඛ්‍ය අංශ ප්‍රධානීන්, කෑගල්ල දිස්ත්‍රික් නියෝජ්‍ය පොලිස්පති ඇතුළු දිස්ත්‍රික්කයේ ආරක්ෂක අංශ වල නිලධාරීන් පිරිසක් සහභාගී වූහ.

# ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී රොෂාන්ට නව තනතුරක්



පොලිස් පරිසර සංරක්ෂණ කොට්ඨාසයේ සහ ජනාධිපති කාර්යාල විශේෂ පැවරුම් හා පාරිසරික කොට්ඨාසයේ අධ්‍යක්ෂ ලෙස ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි රොෂාන් රාජපක්ෂ මහතා පත් කර තිබේ.

ඒ මහතා මහජන සම්බන්ධතා හා පරිසර අලංකාරය සහ පරිසර ආරක්ෂණ කටයුතු සම්බන්ධ අත්දැකීම් ඇති නිලධාරියෙකි. මේ ධූරයට අමතරව පොලිස් පරිසර ආරක්ෂණ හා පුරාවිද්‍යා කොට්ඨාසයේ අධ්‍යක්ෂවරයා ලෙස ද රාජපක්ෂ මහතා රාජකාරි කරයි.

# සෑම පළාතකටම 'රජ වාසල' මධ්‍යස්ථාන ඇති කරනවා

## ඇමැති, ආචාර්ය බන්දුල ගුණවර්ධන

ගාල්ල මධ්‍යම විශේෂ



ජනතා අවශ්‍යතා එකම වෙළෙඳ මධ්‍යස්ථානයකින් ලබා ගත හැකි වන අයුරින් රජයේ සියලුම වෙළෙඳ සේවා ආයතන එකම වහලක් යටතට ගෙන එමේ අරමුණින් බහුවිධි වාණිජ මධ්‍යස්ථාන පළාත් මට්ටමින් ස්ථාපිත කරන බවත් ඒම මධ්‍යස්ථාන "රජ වාසල" නමින් හඳුන්වනු ලබන බවත් වෙළෙඳ ඇමැති ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතා ප්‍රකාශ කළේය.

ලංකා සතොස සමාගමේ දකුණු පළාත් තොග ගබඩා සංකීර්ණය ගාල්ල බූස්සේ දී පසුගිය දා විවෘත කිරීමේ උත්සවයට එක්වෙමින් ඇමැතිවරයා මේ බව පැවසීය.

තවදුරටත් ඇමැතිවරයා මෙසේද පැවසීය.

රජය සතු වෙළෙඳ ආයතන රැසක් ජනතාවගේ විවිධ පාරිභෝගික අවශ්‍යතා සපුරාලමින් රට පුරා සිය සිල්ලර වෙළෙඳ සල් ජාලයන් මඟින් සුවිසල් සේවාවන් රාශියක් ලබා දෙනවා. මේවා ස්ථාන ගතව ඇත්තේ පළාතේ විවිධ ප්‍රදේශවල. මෙම ආයතන සියල්ලම එකම ආයතනයක් තුළ ස්ථාපිත කිරීම තුළින් ජනාතවට වඩා ඵලදායි හා විපුල සේවාවක් ලබාදිය හැකි වෙනවා. රජ වාසල වෙළෙඳ සංකීර්ණ සංකල්පයේ අරමුණ වන්නේ එයයි. එකී බහුවිධ වෙළෙඳ සංකීර්ණයක් දකුණු පළාතේ ගාල්ලට ලබා දෙනවා.

අද දවසේ රට මුහුණ දෙන බරපතලම සෞඛ්‍ය තර්ජනය වන්නේ කොවිඩ්-19 වසංගතයයි. ලොව මෙතේක මුහුණු දුන් දරුණුතම සෞඛ්‍ය ඛේදවාචකය ලෙස සැලකෙන්නේ කොරෝනා වසංගතයයි. සෞඛ්‍ය විශේෂඥයන්ගේ විශ්ලේෂණයන්ට අනුව දෙවැනි ලෝක මහා යුද්ධයෙන් පසුව මානව වර්ගයා මුහුණ දෙන බිහිසුණුම ඛේදවාචකය මෙම වසංගත අර්බුදයයි. අමෙරිකාව ,රුසියාව හා බ්‍රිතාන්‍ය වැනි ප්‍රධාන රටවල් පවා මෙම වසංගතය හමුවේ දුර්මුඛ වී තිබෙනවා. මේවන විට ලොව ජනගහනයෙන් මිලියන් ගණනක් කෝවිඩ් -19 ට ගොදුරු වී සිටිනවා. තවත් මිලියන ගණනක් ඉන් මියැදී තිබෙනවා. කෙසේ නමුත් වෙනත් රටවල් හා සැසඳීමේ දී කොවිඩ් -19 පැතිරීම පාලනය කිරීමේ දී අපරට ඉදිරියෙන් සිටිනවා.

ලොව සෑම ආර්ථිකයක් ම පාහේ බිහිසුණු ලෙස කඩාවැටිලා. මිලියන ගණින් ජනතාවගේ රැකියා අහිමි වී තිබෙනවා. මේ සියලු අභියෝග මැද්දේ අපගේ ආර්ථිකයත් ජනතාවත් ආරක්ෂාකර ගැනීමට අපේ ආණ්ඩුවට හැකි වී තිබෙනවා.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ මග පෙන්වීම යටතේ ඒ සඳහා අපි සැලසුම් ගත වැඩපිළිවෙළ රැසක් දියත් කර තිබෙනවා. අපිට කොවිඩ් අභියෝගය සාර්ථක අයුරින් ජයගැනිමට හැකි වුණා. ඒ සම්බන්ධයෙක් ජාතික මෙන්ම අන්තර්ජාතික සෞඛ්‍ය විශ්ලේෂකයන්ගේ අගැයුමට ලක්විමට අපගේ ආණ්ඩුවට හැකි වී තිබෙනවා.

අනාගත අභියෝග ගැන මනා අවබෝධයෙන් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා අපගේ දේශිය නිෂ්පාදන ධාරිතාව වැඩිකර ගැනීමට කඩිනම් කෘෂි හා ආර්ථික සංවර්ධන සැලැස්මක් දියත් කර තිබෙනවා. දේශිය ගොවියාට දිය හැකි හැම සහනයක්ම හා දිරි ගැන්විමක් ම ලබා දී තිබෙනවා. ජනාධිපතිවරයාගේ නියමයෙන් මෙරට නිෂ්පාදනය කළ හැකි කෘෂි නිෂ්පාදන ආනයනය කිරීම තහනම් කර තිබෙනවා. ඉන් අපේක්ෂා කරන්නේ රටේ නිෂ්පාදනය වර්ධනය කිරීමයි.

වැවිලි ඇමැති වෛද්‍ය රමේෂ් පතිරණ, රාජ්‍ය ඇමැති මොහාන් පී. ද සිල්වා, පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන් වන චන්දිම වීරක්කොඩි හා ඉසුරු දොඩංගොඩ, ලංකා සතොස සභාපති නුෂාඩ් පෙරේරා හා වෙළෙඳ අමාත්‍යාංශයේ ලේකම් බද්‍රාණි ජයවර්ධන යන මහත්ම මහත්මීන් ඇතුළුවිශාල පිරිසක් මේ අවස්ථාවට සහභාගී වූහ.

# රටේ ආරක්ෂාවට පසුගිය ආණ්ඩුව කාලයේ බලපෑම් එල්ල වුණා

## ජාතික ආරක්ෂක විශ්වවිද්‍යාලයේ 13 වැනි පර්යේෂණ සැසියේදී ඇමැති, මහාචාර්ය ජී.එල්. පීරිස් කියයි



මෙරට ජාතික ආරක්ෂාව පිළිබඳ පසුගිය ආණ්ඩු සමයේ ඇති වූ වියවුල් සහගත තත්ත්වය නිසා අදටත් රට තුළ කිසියම් චකිතයක් තිබෙන බවත් 2015 සිට 2019 දක්වා රට තුළ ජාතික ආරක්ෂාවට අන්තර්ජාතික බලපෑම් එල්ල වුණා බවත් අවුරුදු 30කට ආසන්න කාලයක් මේ රට ගිලගෙන තිබුණු එල්ටීටීඊ ත්‍රස්තවාදයෙන් රට ගලවා ගැනීමේ මෙහෙයුම ඉටු කිරීමේ දී එවක ආරක්ෂක ලේකම් වශයෙන් සිටි වර්තමාන ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා විශාල කැප වීමක් කළ බවත් අධ්‍යාපන ඇමැති මහාචාර්ය ජී.එල්. පීරිස් මහතා පැවසීය.

ඇමැතිවරයා මේ බව පැවසුවේ කොතලාවල ජාතික ආරක්ෂක විශ්වවිද්‍යාලයේ 13 වැනි පර්යේෂණ සැසියේ සමාරම්භක උත්සවයේ ප්‍රධාන ආරාධිතයා ලෙස සහභාගී වෙමිනි.

එහිදී තවදුරටත් අදහස් දැක්වූ ඇමැතිවරයා මෙසේද පැවසීය.

බුද්ධි අංශ සමඟ ඉතාම කිට්ටු සම්බන්ධතාවයක් පවත්වාගෙන ගියා. විශේෂයෙන්ම අභ්‍යන්තර ආරක්ෂක විධිවිධාන වගේ ම පිටරටින් පැමිණෙන පුද්ගලයන් පිළිබඳ පවා සුවිශේෂී ආරක්ෂිත ක්‍රමෝපායයන් ක්‍රියාවට නංවන්න කටයුතු කර තිබුණා. ලංකාවට පැමිණෙන විදේශිකයන්ට වීසා නිකුත් කිරීමේ දී ඔවුන්ගේ වටපිටාව පරීක්ෂා කිරීම ආදිය නිසි පරිදි සිදු කරන්න අදාළ නිලධාරීන්ට උපදෙස් සහ විධිවිධාන ලබා දී තිබුණා. නමුත් පසුගිය කාලයේ එය ක්‍රියාත්මක වුණේ නැහැ. නිදසුනක් ලෙස පාස්කු ප්‍රහාරය පිළිබඳ විමර්ශන සිදුවන මේ දිනවල හිටපු පොලිස්පති, ආරක්ෂක ලේකම් දක්වන අදහස්වලින් පෙනී යනවා ඔවුන් ජාතික ආරක්ෂාව සම්බන්ධව කටයුතු කළේ කවරාකාරයෙන් ද කියලා. ඒ නිසා කොතලාවල ජාතික ආරක්ෂක විශ්වවිද්‍යාලයේ 13වැනි පර්යේෂණ සැසිය සඳහා 'ජාතික ආරක්ෂා සහ රටේ සංවර්ධනය' මාතෘකා කොට ගෙන තිබීම අතිශය වැදගත් ලෙස මා දකිනවා. ජාතික ආරක්ෂාව සහ සංවර්ධනය අතර තිබෙන්නේ නොබිඳෙන සබඳතාවක්. එය පසුගිය ආණ්ඩුව කිසසේත් ම සැලකූ බවක් පෙනෙන්නට තිබුණේ නැහැ. ඒ නිසාම පාස්කු ප්‍රහාරය එල්ල වෙලා අහිංසක පුරවැසියන් 265ක් මරණයට පත් වුණා. තවත් විශාල සංඛ්‍යාවක් සදාකාලික ආබාධිතයන් බවට පත් වුණා. එපමණක් නොවෙයි, ඔවුන් අසමත් වුණා යුද්ධයෙන් පසු මෙරට ඇති කළ යුතුව තිබූ සංහිඳියාව පිළිබඳ කාර්යය සාර්ථකව ඉටු කරන්න.

එයත් එක් හේතුවක් බවට පත්වන්නට ඇති එවැනි කණගාටුදායක සිදුවීම්වලට. ඒවගේ ම අන්තර්ජාතික මැදිහත්වීම ඉතා ම තදින් අපේ රටට බලපෑවා එම යුගයේ. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව හිමිකම් කවුන්සිලයෙන් ලංකාවට එරෙහිව යෝජනා පවා සම්මත කර ගත්තා. මානව හිමිකම් කොමසාරිස් ප්‍රසිද්ධියේ ලංකාවට එරෙහි ව සිය අදහස් ප්‍රකාශ කළා. 30/1 සහ 34/1 වගන්ති සම්මත කර ගත්තා. රටේ ආරක්ෂක හමුදාව, පොලිසියට එරෙහිව කටයුතු කිරීමට, ජාතික ආරක්ෂාවට තර්ජනයක් වන ලෙස යෝජනා සම්මත කර ගත්තා. ලංකාවේ පාර්ලිමේන්තුව තිබිය දී රටේ ජාතික ආරක්ෂාව සම්බන්ධව අණ පණත් සම්මත කර ගන්න ඒ ඒ ආයතනවලට ඉඩ දී බලා සිටි බව පේනවා. අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධානවල දැඩි බලපෑමක් රටට එල්ල කළා. එවක ආණ්ඩුවට අමතක වුණා රටේ බහුතරයේ කැමැත්ත පිළිබඳව. නැති නම් රටේ බහුතර ජනතාව පිළිබඳ. කොටින් ම කියනවා නම් රටේ ජනතාවගේ ආරක්ෂාව සැපයීම තමන්ගේ මූලික ම කටයුත්තක් බව එම ආණ්ඩුවේ බොහෝ දෙනාට අමතක වෙලා තිබුණා. නමුත් දැන් තත්ත්වය වෙනස්. ඒ නිසා ම ඔබ විශ්වවිද්‍යාලය සිය 13වැනි පර්යේෂණ සැසියේ තේමාව බවට ජාතික ආරක්ෂාව සහ සං ව ර් ධ න ය යොදා ගැනීම පැසසිය යුතු යි.

පසුගිය කාලයේ කාත්තන්කුඩිවල ඉදිවුණු පෞද්ගලික විශ්වවිද්‍යාලය පිළිබඳ සලකා බැලුවොත් පේනවා ජාතික ආරක්ෂාව කොතැන තිබෙන්න ඇති ද කියලා. මම දෑසින් දැක්කා එහි ගොඩනැඟිලි ආදිය ඉදිකොට තිබෙන අයුරු. ඒවා සඳහා අතිවිශාල මුදලක් ලැබී තිබෙනවා. ඒවා කෙසේ පැමිණියා ද යන්න පවා ගැටලුවක්. එම ගොඩනැඟිලි ඇතැම්විට රජයේ විශ්වවිද්‍යාලවල ගොඩනැඟිලි පරදනවා. කොළඹ, පේරාදෙණියට වඩා හොඳට හදලා තිබෙනවා. ඒවගේ ම සුළු අන්තවාදී පිරිස්වලට නිදහසේ වැඩෙන්නට ඉඩහැර තිබෙන බැව් අපට දැන් පේනවා. ජාතික ආරක්ෂාව පිළිබඳ නිසි වුවමනාවක් තිබුණා නම් කිසිසේත් ම එසේ සිදුවන්නේ නැහැ.

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් මහාචාර්ය කපිල පෙරේරා, විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් රියල් අද්මිරාල් මහාචාර්ය ජයන්ත කොළඹගේ, ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ උපකුලපති මේජර් ජනරාල් මිලින්ද පීරිස්, අන්තර්ජාතික පර්යේෂණ සමුළුවේ සභාපති ආචාර්ය ප්‍රදීප් කලංසූරිය මහත්වරු ද මේ අවස්ථාවට සහභාගි වූහ.



# ත්‍රිවිධ හමුදාව පොලීසිය සහ සෞඛ්‍ය ක්ෂේත්‍ර සමඟ කැප වීමෙන් වැඩ කරනවා

## ● ඇමැති ජොන්ස්ටන් ප්‍රනාන්දු

**සුභාෂිණී සේනානායක**

රාජ්‍ය නිලධාරීන්, ත්‍රිවිධ හමුදාව හා පොලිසිය සහ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ඉන්න අයත් සමඟ කැපවීමෙන් වැඩ කරන බව මහාමාර්ග ඇමැති ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා පවසයි.

මුළු ලෝකයේම රටවල් වහගෙන යනකොට අපේ ජනාධිපතිතුමා, අගමැතිතුමා, රජය, ත්‍රිවිධ හමුදාව, සෞඛ්‍ය සේවාවේ නිලධාරීන්, P.H.I. මහත්වරුන් මහා දැවැන්ත සේවයක් කරලා තමයි අපේ රට ආරක්ෂා කර ගත් බව පිළිගත යුතු බව පවසන ඒ මහතා ඒ නිසා අවම මරණ සංඛ්‍යාවක් වාර්තා වූ බවත් කියා සිටී.

ඒ මහතා මෙසේ ද කීවේය.

විපක්ෂයෙන් යම් යම් චෝදනා කරනවා ආණ්ඩුව මේක හරියට කළේ නැහැ කියලා. ජනතාව ආරක්ෂා කළේ නැහැ. කොවිඩ් නැහැ වගේ රටේ නායකයා කටයුතු කළේ. රැස්වීම් තිබ්බා. ජනතාව එකතු කෙරුවා. මේ ගැන කිසිම හැඟීමක් කෙරුවේ නැහැ, කියන චෝදනාව තමයි. මේවා අලුත් කතන්දර නොවේ. මේ කතන්දර පහුගිය මාස හයේම ඇහුවා. අපි මැතිවරණයක් තිබ්බා. ඒ මැතිවරණයේ පෝස්ටරයක් ගහන්න දුන්නේ නැහැ. ජනතාව රැස් කරන්න, මහා රැස්වීම් තියන්න ඉඩ දුන්නේ නැහැ. එතකොට විපක්ෂය කිව්වේ කොවිඩ් එක හරහා ඡන්දය කරන්න හදනවා. මේක නිසා ජනතාව ඡන්දය දෙන්න යන්නේ නැහැ. මේ නිසා විශාල ප්‍රශ්නයක් වෙනවා. ඒ නිසා විසුරුවපු පාර්ලිමේන්තුව නැවත කැඳවන්න. පාර්ලිමේන්තුව කැඳෙව්වේ නැත්නම් covid එක පාලනය කරගන්න බැරි වෙනවා. පාර්ලිමේන්තුව නැවත කැඳෙව්වේ නැත්නම් පනත් සම්මත කරගන්න බැරිවෙනවා. ඒ නිසා covid එක පාලනය කරගන්න බැරි වෙනවා. කොවිඩ් එක පාලනය කරගන්න මුදල් අවශ්‍ය වෙනවා. මුදල් නැතිව මේක කරන්න බැහැ. ඒ නිසා පාර්ලිමේන්තුව වහාම කැඳවන්න. විසුරුවපු පාර්ලිමේන්තුව නැවත කැඳවන්න. ඔවුන් බල කෙරුවා විතරක් නෙවෙයි උසාවිත් ගිහින් තමයි නතර වුණේ.

අන්තිමට විශාල ප්‍රතිශතයක් ඡන්දය ලබා දීලා කවදාවත් 2/3 ගන්න බෑ කිව්ව ජේ ආර් ජයවර්ධන මහත්තයා හදපු මැතිවරණ ක්‍රමය හරහා 2/3 ජයග්‍රහණයක් රජය ලබාගත්තා. ඒ විශ්වාසය මං හිතන්නේ කෝවිඩ් එක පාලනය කරපු නිසා තමයි විජයග්‍රහණයක් ලබා ගන්න ජනතාවට දැඩිව විශ්වාස ආවෙ. මේ රටේ ජනතාව කල්පනා කෙරුවා ජනාධිපතිතුමාට අවශ්‍ය ශක්තිමත් රජයක් හදලා දෙන්න ඕනි කියලා. විපක්ෂය එදා බලාපොරොත්තු වුණේ මේ රටේ ජනතාව රකින්න නෙවෙයි. විපක්ෂය බලාපොරොත්තු වුණේ කෝවිඩ් එක හරහා අපේ රටේ මිනිස්සු මැරෙයි කියලා. මැරෙන ගාන ගනන් කරන්න හිටියේ. එක් අමාත්‍යවරයෙක් ප්‍රකාශයක් කෙරුවා ඉස්සෙල්ලාම covid එකෙන් එක්කෙනෙක් මැරුනා. අණ්ඩුව හංගගෙන ඉන්නේ කියලා. ඒ නිසා ජන ජීවිතත් එක්ක විපක්ෂය වගකීමක් නැහැ. ඒ ජන ජීවිත බිල්ලට දෙන්න කැමති විපක්ෂයක් අද ඉන්නේ. අපේ ආණ්ඩුව එහෙම නොවෙයි. දැන් විපක්ෂයේ මොනවද කියන්නේ. ආපහු රට වහන්න ඕනි කියලා. ඇයි? මේ බලන්නේ එක පැත්තකින් බලනවා කොවිඩ් එක හැදිල මිනිස්සු මැරෙන්න ඕනි කියලා. අනිත් පැත්තෙන් බලන්නේ රට වහලා කොහොම හරි ආර්ථිකය වට්ටන්න. මේක තමයි ඔවුන්ගේ තිබෙන එකම පරමාර්ථය. ඔවුන් මේ සද්භාවයෙන් රටේ ජනතාව ගැන බලන විපක්ෂයක් නොවේ අද තියෙන්නේ. විපක්ෂයත් එහෙමයි. විපක්ෂ නායකතුමා එහෙමයි. විපක්ෂ නායකතුමා ෆේස්බුක් එකේ ගිහින් live ගිහින් කිව්වා බෙහෙතක් ගන්න කියලා. Donald Trump වගේ. මතකයිනේ ප්ලැකනිල්.

ඒ නිසා වගකීමකින් තොරව වැඩ කරන්න හොඳ නැහැ. මේ වෙලාවෙදි අපි දන්නවා අපේ ජනතාව ආරක්ෂා කරන්න ඕනි කියලා. මොකක්ද ඔවුන්ගේ ගෙනාපු පළවෙනි චෝදනාව. කෝ රට විරුවෝ. ඡන්දය ගන්න විතරයි ගෙනාවේ. දැන් එන්න දෙන්නේ නැහැ. ගෙන්වන්න කියලා බල කෙරුවා. රට විරුවෝ කියලා සැලකුවා ඡන්ද කාලේ. දැන් රට ඉන්න අය ගේන්න දෙන්නේ නැහැ කියලා පාර්ලිමේන්තුවේ කතා කෙරුවා. ප්‍රවෘත්ති සාකච්ඡා තිබ්බා. ආණ්ඩුවට බල කෙරුවා ගේන්න කියලා. ජනාධිපතිතුමා හැම වෙලාවෙම කිව්වේ අපි මේක පරිස්සමින් කරන්න ඕනි කියලා. හැම වෙලාවෙම විපක්ෂය බැලුවේ දේශපාලන වාසි ගන්න. පිට රට ඉන්න මිනිස්සුන් වෙනුවෙන් පෙනී ඉඳලා දේශපාලන වාසි ගන්න. ඒ නිසා අපි ඉතා වගකීමෙන් කියනවා. අපේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ, ත්‍රිවිධ හමුදාවේ, අපේ රාජ්‍ය නිලධාරීන්ගේ තියන කැපවීම, ගෝඨාභය ජනාධිපතිතුමාගේ තියෙන ස්ථිර අධිෂ්ඨානය, අගමැතිතුමාගේ හා ජනාධිපතිතුමාගේ තියන සුසංයෝගය, ඒ නිසා පැහැදිලිව අපි කියනවා අපි කිසිසේත්ම මේ රටේ ජනතාව අමාරුවෙ වැටෙන කිසිදු තීන්දුවක් ගන්නේ නැහැ. ඉතාමත් වගකීමෙන් කියනවා අපි මේ රටේ ජනතාව ආරක්ෂා කරනවා. ජීවිත අවදානම පවා නොතකා රජය, රාජ්‍ය නිලධාරීන්, ත්‍රිවිධ හමුදාව හා පොලිසිය සහ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ඉන්න අයත් සමග කැපවීමෙන් අපි වැඩ කරනවා. දැන් ප්‍රචාරය කරනවා මුළු රටම දැන් වහන්න ඕනි කියලා. හැමතැනම කොවිඩ් ආසාදිතයන් ඉන්නවා කියලා ප්‍රචාරය කරනවා. හැබැයි ඉතාමත්ම උපක්‍රමශීලීව මේ තීන්දු තීරණ රජයක් හැටියට රාජ්‍යය නිලධාරීනුත් එකතු කරගෙන නිවැරදිව තීන්දු තීරණ ගන්නවා.

# ශ්‍රී ලාංකිකයන්ගේ වෘත්තීය දායකත්වය විශිෂ්ටයි

## ● ඔස්ට්‍රේලියාවේ නිව්සවුත් වේල්ස්හි ආණ්ඩුකාරවරිය කියයි

**මහින්ද අලුත්ගෙදර**

ඔස්ට්‍රේලියාවේ ශ්‍රී ලාංකිකයන්ගෙන් ලැබෙන වෘත්තීය දායකත්වය විශිෂ්ට බව ඔස්ට්‍රේලියාවේ නිව්සවුත් වේල්ස්හි ආණ්ඩුකාර මාග්‍රට් බීස්ලි මහත්මිය ප්‍රකාශ කරයි.

එරට විවිධ අංශවල සේවයේ නියුතු ශ්‍රී ලාංකිකයන්ගෙන් සුවිශාල වෘත්තීය දායකත්වයක් ලැබෙන බව පෙන්වා දෙන ඒ මහත්මිය ඕස්ට්‍රේලියාවේ ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් ලක්ෂ්මන් හුළුගල්ල මහතා ඉකුත් ආණ්ඩුකාරවරිය බැහැදුටු අවස්ථාවේ ඇය මේ බව සඳහන් කර ඇත.

ශ්‍රී ලංකාව හා ඕස්ට්‍රේලියාව අතර අධ්‍යාපනික සබඳතා තවදුරටත් වැඩිදියුණු කළහැකි බව ද ඇය එහිදී සඳහන් කර තිබේ. ශ්‍රී ලංකාවේ කාර්මික හා වැඩිදුර අධ්‍යාපන ආයතන සමග සබඳතා පුළුල් කර ගැනීමෙන් ශ්‍රී ලංකාවේ සිට ඕස්ට්‍රේලියාවට සංක්‍රමණය වන පුහුණු ශ්‍රමිකයන්ගෙන් වැඩි ප්‍රතිලාභ ලබාගත හැකි බවද ආණ්ඩුකාරවරිය පෙන්වා දී තිබේ.

ශ්‍රී ලංකාව ඕස්ට්‍රේලියාව සමඟ පවත්වාගෙන යන මිත්‍රශීලි ද්විපාර්ශ්වීය සබඳතා තවදුරටත් දියුණු කර දෙරටේ වෙළෙඳ, සංචාරක සබඳතා වැඩි දියුණුකර ගැනීමේ වැදගත්කම කොන්සල් ජනරාල් ලක්ෂ්මන් හුළුගල්ල මහතා මෙහිදී ආණ්ඩුකාරවරියට පෙන්වා දී තිබේ. කලාපයේ ආර්ථික සංවර්ධනය සඳහා ගුවන් හා මුහුදු ප්‍රවාහනයේ කලාපීය කේන්ද්‍රස්ථානයක් ලෙස ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීමෙන් ලැබෙන වාසිය ද හුළුගල්ල මහතා මෙහිදී අවධාරණය කළ බව විදේශ සබඳතා අමාත්‍යාංශය පවසයි.

සාක් කලාපය තුළ ශ්‍රී ලංකාව ඕස්ට්‍රේලියාවේ වැදගත් වෙළඳ හවුල්කරුවකු බව පෙන්වා දී ඇති හුළුගල්ල මහතා ඕස්ට්‍රේලියාවේ සංචාරකයන්ට ශ්‍රී ලංකාව හිතකර ගමනාන්තයක් බවද පෙන්වා දී ඇත.

මේ හමුවේදී කොන්සල් ජනරාල් හුළුගල්ල මහතා ශ්‍රී ලංකා ජනාධිපතිවරයාගේ හා අගමැතිවරයාගේ සුබ පැතුම් ද ආණ්ඩුකාරවරියට පිරිනැමුවේය. ශ්‍රී ලංකාවේ දේශපාලන ජයග්‍රහණ හා කොවිඩ්-19 මර්දනය කිරීමේ දී අනුගමනය කරන සාධනීය ක්‍රියාමාර්ග පිළිබඳව ද මේ හමුවේ දී දීර්ඝ ලෙස සාකච්ඡා කර තිබේ.

# කටුනායක වෙළෙඳ කලාපයේ සේවකයන් ආයතන වාහනවලින් සේවයට පැමිණිය යුතුයි

## ● කටුනායක පොලිස් ස්ථානාධිපති අකිල රණසිංහ

**කටුනායක ටී.කේ.ජී.කපිල**

කටුනායක නිදහස් වෙළෙඳ කලාපයේ සේවකයන් අද (19) සිට තම සේවා ස්ථාන වෙත පැමිණිය යුත්තේ තම පෞද්ගලික රථවාහන වලින් නොව, කර්මාන්තශාලාව විසින් සපයන ප්‍රවාහන මාධ්‍යයෙන් පමණක් බව කටුනායක පොලීසියේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක අකිල රණසිංහ මහතා පවසයි.

කටුනායක නිදහස් වෙළෙඳ කලාපයේ සේවකයන් තම සේවා හැඳුනුම්පත ඇදිරි නීති බලපත්‍රයක් සේ යොදා ගෙන, සේවයට පැමිණෙන මුවාවෙන් වෙනත් ප්‍රදේශ වෙත ගමන් කර සිටියදී පොලීසිය විසින් පසුගියදා අත්අඩංගුවට ගෙන තිබුණි.

මේ නිසා කොරෝනා වයිරසය රට පුරා පැතිර යෑමේ අවදානමක් මතු වී ඇති නිසා උසස් පොලිස් නිලධාරීන් මේ තීරණය ගෙන ඇතැයි කටුනායක පොලීසියේ ස්ථානාධිපතිවරයා පැවසීය .

ඒ අනුව 2020.10.19 දින සිට පෞද්ගලික රථවාහන වලින් පැමිණෙන සියලු සේවකයන් කර්මාන්තශාලාව විසින් ප්‍රවාහන පහසුකම් සළසා දෙන ලෙස පොලීසිය කම්හල් හිමියන් දැනුවත් කර ඇත.

එසේම කටුනායක නිදහස් වෙළෙඳ කලාපය ආසන්නයේ පිහිටි නේවාසිකාගාරවල නැවතී සිටින සේවකයන් අවශ්‍ය නම් පා ගමනින් ද සේවය සඳහා කර්මාන්තශාලා වෙත පැමිණිය හැකි බව ද කම්හල් හිමියන් ද එම සේවකයන් වෙත දැනුම් දී තිබේ.

# කුලියාපිටිය රෝහලේ දැඩි සත්කාරයේ කතකට කොරෝනා

## වෛද්‍යවරුන් ඇතුළු 53ක් නිරෝධායනයට

**සන්ධ්‍යා කරුණාරත්න**

කුලියාපිටිය රෝහලේ දැඩි සත්කාර ඒකකයේ ප්‍රතිකාර ලබමින් සිටි කාන්තාවකට කොරෝනා වෛරසය ආසාදනය වීමත් සමඟ රෝහලේ වෛද්‍යවරුන් 13ක් ඇතුළු කාර්ය මණ්ඩලයේ 53ක් නිරෝධායනයට ලක් කර ඇති බව රෝහලේ වෛද්‍ය අධිකාරී වෛද්‍ය ප්‍රභාත් වේරවත්ත මහතා ‘දිනමිණ’ට ඊයේ (18) පැවැසුවේය.

වයිරසය ආසාදිත කාන්තාව හඳුනා ගැනීමත් සමඟ රෝහලේ වාට්ටු දෙකක් සහ දැඩි සත්කාර ඒකකයක් තාවකාලිකව වසා දැමීමට රෝහල් පරිපාලනය තීරණය කර තිබේ.

හෘද රෝග තත්ත්වයක් හේතුවෙන් ප්‍රතිකාර ගැනීමට මෙම කාන්තාව පසුගිය 12 වැනිදා රෝහල්ගත වී ඇති බවත් පසුගිය 15 වැනිදා පී.සී.ආර්. පරීක්ෂණයකට ලක්කිරීමේ දී ඇයට කොරෝනා වෛරසය ආසාදනය වී ඇති බවට තහවුරු වූ බවත් ඒ මහතා කීය.

ප්‍රදේශයේ විවාහ මංගල උත්සවයකට මේ කාන්තාව සහභාගී වී ඇති අතර එහි සිටි පුද්ගලයන් 4 කට කොරෝනා වයිරසය ආසාදිත බවට හඳුනාගැනීමත් සමඟ අදාළ කාන්තාව පී.සී.ආර්. පරීක්ෂණයකට ලක් කළ බව ද ඔහු පැවැසුවේය.

හෝමාගම, කහතුඩුව හයිඩ්‍රාමනි ඇඟලුම් කර්මාන්ත ශාලාවේ සේවය කළ හෙද නිලධාරිනියකට ද කොරෝනා වයිරසය ආසාදනය වී ඇති බව සෞඛ්‍ය අංශ සඳහන් කරයි.

හෙද නිලධාරිනියට වයිරසය ආසාදිත බවට තහවුරු වීමත් සමඟ ඇඟලුම් කම්හලේ සේවයේ නියුතු 200 කට පී.සී.ආර්. පරීක්ෂණ සිදුකිරීමට තීරණය කර තිබේ. වයිරසය ආසාදිත මේ හෙද නිලධාරිනිය පසුගිය 03 වැනිදා මිනුවන්ගොඩ ප්‍රදේශයේ පැවැති විවාහ මංගල උත්සවයකට සහභාගී වී ඇති බවට වාර්තා වේ.

කොළඹ නැව් තටාකාංගණයේ සේවකයන් 05 කට ද කොවිඩ් - 19 වයිරසය ආසාදනය වී ඇති බවට හඳුනාගෙන තිබේ. මතුගම සිට කොළඹ දක්වා අධිවේගී මාර්ගයේ ධාවනය වූ බස් රථයේ සිටි ආසාදිතයකුගේ ආශ්‍රිතයන් ලෙස මේ පිරිස හඳුනාගෙන ඇත.

මතුගම සිට කොළඹ දක්වා අධිවේගී මාර්ගයේ ධාවනය වූ තවත් බස් රථයක සේවකයකු ද කොරෝනා වයිරස් ආසාදිතයකු ලෙස හඳුනාගෙන තිබේ.

# ස්වභාව සෞන්දර්යය රැකගැනීමෙන් සංචාරක ආකර්ෂණය වැඩි කරගත හැකියි

## ● ඇමැති මහින්ද අමරවීර

**අමෝදා ජයමහ**

ශ්‍රී ලංකාවෙහි ස්වභාව සෞන්දර්ය ආරක්ෂා කර ගැනීම තුළින් විදෙස් සංචාරකයන්ගේ ආකර්ෂණය රට තුළට වැඩි වශයෙන් යොමු කරගත හැකි බව පරිසර ඇමැති මහින්ද අමරවීර මහතා පැවසුවේ ය.

එමෙන්ම පරිසර පද්ධති ආරක්ෂා කිරීම තුළින් නිතරගයෙන්ම මුළු රටම සුරැකෙන බව ද මහින්ද අමරවීර මහතා අවධාරණය කළේය.

පොල්ගොල්ල ජලාශය අශ්‍රිත ප්‍රදේශයේ ඉකුත් (17) වැනි දින නිරීක්ෂණ චාරිකාවනට සහභාගී වෙමින් ඇමැතිවරයා මේ බව කීවේය.

එහි දී වැඩිදුර අදහස් දක්වමින් ඇමතිවරයා මෙසේ ද කීවේය.

පොල්ගොල්ල ජලාශය ආරක්ෂා කිරීම පිළිබඳ සාකච්ඡා කිහිපයක් පැවැත්වුවා. සංවිධානය මේ ජලාශය පරීක්ෂා කර බලන ලෙස අපෙන් ඉල්ලීමක් කළා. ඒ ඉල්ලීමට අනුව මේ ජලාශය නිරීක්ෂණයට මම ගියා. ඒ අවස්ථාවේ මා හට පොල්ගොල්ල ජලාශය ආශ්‍රිතව විශාල පරිසර දූෂණයක් වන බව මම දැක්කා. ජලාශය අශ්‍රිතව අනවසර ඉදිකිරීම් රාශියක් තිබෙනවා. අනවසර ගොඩකිරීම් ද සිදු වී තිබෙනවා. මේ පිළිබඳ මා අද මූලික නිරීක්ෂණයක් සිදු කළා. ඉදිරියේ දී ඇති වී තිබෙන මේ තත්ත්වය වෙනස් කිරීමටත්, ජලාශය අශ්‍රිතව සිදුවන ඉදිකිරීම් පාලනය කිරීමටත් පියවර ගන්නවා. නීතියට පිටින් ඉදි වී තිබෙන ඉදිකිරීම් වේ නම් ඒ සියල්ල සම්බන්ධව නීතිය අනිවාර්යෙන් ක්‍රියාත්මක කරනවා. මේ සියලු ඉදිකිරීම් පරිසර අධිකාරියේ අනුමැතියකින් තොරව ඉදි වූ ගොඩනැගිලියි.මේ ස්ථානයේ අනවසර මහා පරිමාණයේ හෝටල් හිමි පුද්ගයන් හා ජලාශය අශ්‍රිතව අනවසරයෙන් පදිංචි වී සිටින පිරිසකුත් සිටිනවා. යම් යම් ආර්ථික අපහසුතාවන්ගෙන් පසුවන අසරණ මිනිස්සු වුවත් මේ අතර සිටින්නට පුළුවන්.ඒ අය වෙනුවෙන් ස්ථිර පදංචියක් සලස්වා දීමටත් අප කටයුතු කරනවා. පොල්ගොල්ල ජලාශය පිළිබඳ අධිකරණය ලබා දී තිබෙන තීන්දුවෙහි යම් ගැටලුවක් තවම තිබෙනවා. නීතිපති දෙපාර්තමේන්තුවෙන් මේ සම්බන්ධව නිශ්චිත පැහැදිලි කිරීමක් අවශ්‍යයි. ඉන්පසු අප අධිකරණයෙහි තීන්දුව අනුව ක්‍රියාත්මක වෙනවා. මේ පරිසර පද්ධති ආරක්ෂා කර ගැනීමේ වගවීමෙන් අප බැහැර වීමට කිසිදු සූදානමක් නෑ. ලංකාව තුළ ජල මූලාශ්‍ර 103ක් සංරක්ෂණය කිරීමේ අරමුණින් මේ වනවිට කැබිනට් පත්‍රිකාවක් නිකුත් කරමින් සුරකිමු ගංගා නමින් වූ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට කටයුතු මේ වන විට සූදානම් කර තිබෙනවා. ග්‍රාම නිලධාරීවරයා, දිසාපතිවරයා, ප්‍රාදේශීය ලේකම්වරයා යන මේ සියලුදෙනා එක්කර ගනිමින් මේ වැඩසටහන ප්‍රායෝගිකව හා ඵලදායී ලෙස හැකි ඉක්මනින් ක්‍රියාවට නැංවීම අපගේ මූලික අරමුණයි. ඒ ඒ බල ප්‍රදේශවල සිටින නිලධාරීන්ට තමන්ගේ ප්‍රදේශයට අයත් වන ගඟෙහි කොටස ආරක්ෂා කිරීමේ වගකීම පවරනු ලබනවා. ඒ සඳහා අවශ්‍ය කරන්නා වූ මූල්‍ය ප්‍රතිපාදන අප ලබා දෙනවා.මේ ගංගා ආරක්ෂා කිරීම තුළින් ඉදිරියේ දී ජල අවශ්‍යතා සපුරා ගැනිමේ ගැටලුවක් මතු වන්නේ නෑ. මේ පොල්ගොල්ල ජලාශය නිවැරදි ක්‍රමවත් පටිපාටියකට සංරක්ෂණය කිරීමෙන් මේ ජලාශය හරහා ප්‍රවාහන සේවා සිදු කිරීමට ද හැකියාව තිබෙනවා. ඒ හරහා මේ ප්‍රදේශයට වැඩි සංචාරක ආකර්ෂණයක් යොමු කර ගැනීමට ද හැකිවනවා. දැනට පරිසර පනත සංශෝධනය කරගෙන යමින් තිබෙනවා. අවසන් වරට පරිසර පනත සංශෝධනය වී තිබෙන්නේ 2000 වර්ෂයේ යි. ඒ පරිසර පනතෙහි පරිසර පද්ධතීන්වලට සිදුකරන හානී උදෙසා නියම කර තිබෙන දඩ මුදල් හා දඬුවම් ප්‍රමාණවත් නොවන බව මේ වන විට තහවුරු වී තිබෙනවා.



# පෞරාණික වාහන අපනයනයට අවසර දීමට පියවර

**නිමල් රාජපක්ෂ**

ශ්‍රී ලංකාව වාහන ආනයනය කරනවා වගේම පෞරාණික වාහන අපනයනයටත් මොටර්රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව දැන් අවසර ලබාදීමට තීරණය කොට තිබේ.

මේ පෞරාණික වටිනාකමකින් යුත් වාහන සඳහා බටහිර රටවලින් විශාල ඉල්ලුමක් තිබෙන අතර එම වාහන ඒ ඒ රටවලට ගෙන්වා ගැනීමේ ක්‍රමවේදයක් ඔවුන් සතුව පැවතියද මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මෙවැනි ක්‍රමවේදයක් නොතිබුණු අතර පසුගිය මාස කිහිපයේ දී අපි කළ සාකච්ඡාවල සාර්ථකත්වයත් සමඟ නව ක්‍රමවේදයක් යටතේ පැරණි වාහන අපනයනය සඳහා අවසර ලබා දීමට තීරණය කර ඇතැයි ප්‍රවාහන රාජ්‍ය ඇමැති දිලුම් අමුණුගම මහතා පවසයි.

මේ නව ක්‍රමවේදය පැරණි වාහන පිටරට යැවීමට අදහස් කරන පුද්ගලයන්ට බටහිර රටවල් සමඟ තිබෙන සබඳකම් අනුව ඔවුන්ගේ ඉල්ලීමට අනුකූලව පෞරාණික වටිනාකමකින් යුත් වාහන අපනයනය කිරීමට හැකි වෙයි. තවද මේ වාහන පිටරට යැවීමේ දී මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට ගොස් ලංකාවේ ලියාපදිංචිය කැන්සල් කිරීමකින් අනතුරුව එනම් ලංකාවෙන් අපනයන කිරීමට අදහස් කරන අදාළ වාහනයට හිමි පොත අවලංගු කිරීමෙන් පසු අපනයනය කිරීම සඳහා අවසර හිමි වනු ඇත.

මේ පෞරාණික වටිනාකමකින් යුත් වාහන මෙරට තුළ භාවිත කරන්නේ නම් විශේෂයෙන් ceylon අංක කාණ්ඩයට අයත් පැරණි වාහන ‘C’ අකුරින් සහ ‘EN’ අංකවලින් පවතින සමහරක් වාහන,මේ වාහන සඳහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව සතුව ලියාපදිංචි පොතක් නොමැති වුවද, මෙම වාහන හිමිකරුවන් සීමිත පිරිසක් සතුව පැරණි වාහනයට අදාළ ලියකියවිල්ලක් එසේත් නැත්නම් කුමන හෝ ලියාපදිංචි පොතක් තිබීමේ හැකියාවක් ඇති අතර මේ වාහන අලුත් අංකයක් යටතේ ලියාපදිංචි කිරීමට අවසර ලබා දීමට ද මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව තීරණය කර ඇත.

# ජාතික ඉතිරිකිරීමේ බැංකුව වෙස්ටන් යූනියන් සමඟ සම්බන්ධ වීම ගනුදෙනුකාර භවතුන්ට මහඟු අවස්ථාවක්

## ● ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සභාපතිනි කේෂලා ජයවර්ධන

**ජයසිරි මුණසිංහ**

ඔබේ විශ්වාසනීයම බැංකුව ලෙස විරුදාවලිය ලැබූ ජාතික ඉතිරිකිරීමේ බැංකුව අද (19) ලොව ප්‍රමුඛතම විදේශ මුදල් ප්‍රේෂණ ජාලය වන වෙස්ටන් යූනියන් (Western Union) සමඟ එක්ව සිය ගනුදෙනුකාර භවතුන්ට වඩාත් ඉහළ සේවාවක් ලබාදීමට සූදානම් වේ.

තම බැංකුව සහ වෙස්ටන් යූනියන් සේවාව සමඟ සමීප සම්බන්ධවීම ලංකාවාසී ගනුදෙනුකාර භවතුන්ට වඩාත් ඉහළ සේවාවක් ලබාදීමට අවස්ථාවක් උදාකර ගැනීමක් බවත් ඒ බව සතුටින් ගනුදෙනුකාර භවතුන්ට දන්වා සිටින බවත් ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සභාපතිනි කේෂලා ජයවර්ධන මහත්මිය ප්‍රකාශ කළාය.



ඒ අනුව ලොව පුරා ඇති රටවල් 200කට අධික සංඛ්‍යාවක සිට ඔබගේ ආදරණීයන් සිදුකරනු ලබන මුදල් ප්‍රේශන, විනාඩි 5ක් වැනි කෙටි කාලයක් තුළ වඩා පහසුවෙන්, හා සුරක්ෂිතව ලබාගත හැකි වන අතර, ඒ සඳහා ඔබ කළ යුත්තේ අදාළ රහස් අංකය සමඟ ජාතික හැඳුනුම්පත හෝ විදෙස්ගමන් බලපත්‍රය හෝ රියැදුරු බලපත්‍රය බැංකුව වෙත ඉදිරිපත් කිරීම පමණි.

මේ ලෝක ව්‍යාප්ත Western Union ජාලය මඟින් ඔවුන්ගේ කවර නියෝජිතයකු හරහා මුදල් ලබාගත්තද ස්ථාවර එක් සේවා ගාස්තුවක් පමණක් අයකරනු ලබන අතර, එය අනෙකුත් තරඟකාරී විදේශ ප්‍රේශන සේවා ජාලයන්ට සාපේක්ෂව අඩු පිරිවැයකි. මෙහි ආරම්භක අදියර වශයෙන් දිවයින පුරා පිහිටි අපගේ NSB ශාඛා 260ක් මෙකී සේවාව සමඟ සම්බන්ධ වනු ඇත. ඒ අනුව ඔබට ආසන්නතම NSB ශාඛාව වෙතින් Western Union විදේශ ප්‍රේෂණ ලබාගැනීම මඟින්, පූර්ණ රාජ්‍ය ආරක්ෂාව සහිත බැංකුවක් සමඟ ගනුදෙනු සිදුකිරීම සමඟ විශ්වාසනීයභාවය, සුහදශීලී ගනුදෙනුකාර සේවාව ලබාගන්නා සේම දිවයිනේ ජනප්‍රියම විදේශ ප්‍රේෂණ ප්‍රවර්ධන වැඩසටහන වන NSB U - Trust “සල්ලි එහෙන් තෑගි මෙහෙන්” ප්‍රවර්ධන වැඩසටහනට නොමිලේ ඇතුළුවීමට අවස්ථාව ලබාගනිමින්, එහි සාඩම්බර ජයග්‍රාහකයකු වීමේ හැකියාව ද ලැබේ. එබැවින් Western Union මගින් සල්ලි එහෙන් එවූ සැනින් NSB - Trust හරහා සල්ලි මෙහෙන් ලබාගැනීමට ඔබත් අදම ළඟම පිහිටි ජාතික ඉතිරිකිරීමේ බැංකු ශාඛාව වෙත පිය නඟන ලෙසට ඉතා ගෞරවයෙන් යුතුව ආරාධනා කරන බව ද සභාපතිනිය සඳහන් කළාය.

# කේරළ ගංජා කිලෝ ග්‍රෑම් 200ක් අත්අඩංගුවට

**රක්ෂණ ශ්‍රියන්ත**

කේරළ ගංජා කිලෝ ග්‍රෑම් 200කට අධික තොගයක් ඊයේ (18) ශ්‍රී ලංකා නාවික හමුදාව සහ පොලීසිය එක්ව මන්නාරම ඕලුතුඩුවායි ප්‍රදේශයේ සිදු කළ විශේෂ මෙහෙයුමකදී අත්අඩංගුවට ගෙන තිබේ.

උතුරු මැද නාවික විධානය හා මන්නාරම පොලිස් කොට්ඨාස දූෂණ මර්දන ඒකකය එක්ව මන්නාරම ප්‍රදේශයේ සිදු කළ මේ විශේෂ මෙහෙයුමේදි මුහුදු මගින් ඕලුතුඩුවායි වෙරළට ගෙනවිත් බෙදා හැරීමට සූදානම් කරමින් තිබූ පොලිතීන් කවර 10ක් තුළ පාර්සල් 94ක් වශයෙන් අසුරා තිබූ කේරළ ගංජා කිලෝ 200 ග්‍රෑම් 825ක තොගයක් අත්අඩංගුවට ගැනීමට කටයුතු කර ඇත.

# කැලණි ගඟ ළඟ අනවසර කර්මාන්ත සොයා මෙහෙයුමක්

පරිසර බලපත් ලබා නොගෙන කැලණි ගගේ වම් හා දකුණු ඉවුරුවල පවත්වාගෙන යන කර්මාන්ත සොයා ඊයේ (18) සිට 22 දක්වා මධ්‍යම පරිසර අධිකාරිය මගින් මෙහෙයුමක් ක්‍රියාත්මක කෙරේ.

මධ්‍යම පරිසර අධිකාරියේ නිලධාරීන් සහ පොලිසීය එක්ව මේ මෙහෙයුම් ක්‍රියාත්මක කරන අතර මධ්‍යම පරිසර අධිකාරියේ, බස්නාහිර පළාත් කාර්යාලයේ සහ ගම්පහ දිස්ත්‍රික් කාර්යාලයේ නිලධාරීන්ගෙන් සමන්විත කණ්ඩායම් 13ක් මේ සඳහා යොදවා තිබේ.

කැලණි ගගේ ජලයේ ගුණාත්මකභාවය ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් කැලණි ගඟට අපජලය හා අපද්‍රව්‍ය බැහැර කරන කර්මාන්ත සෙවීම මෙහි අරමුණ වී තිබේ.

# කතුන් දෙදෙනෙක් හෙරොයින් සමඟ දැලේ

**රක්ෂණ ශ්‍රියන්ත**

කළුතර බන්ධනාගාරයේ සිට ජංගම දුරකතන උපයෝගී කරගනිමින් මෙහෙයවන මත්ද්‍රව්‍ය ජාවාරමකට සම්බන්ධ කාන්තාවන් දෙදෙනකු අඟුලාන ප්‍රදේශයේ දී හෙරොයින් ග්‍රෑම් 8යි මිලිග්‍රෑම් 570ක් ද සමඟ අත්අඩංගුවට ගෙන තිබේ.

අඟුලාන පොලිස් දූෂණ මර්දන අංශයේ නිලධාරීන් විසින් සැකකාරියන් දෙදෙනා අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී ඔවුන් හෙරොයින් අලෙවි කර උපයාගත් බවට සැක කෙරෙන රුපියල් 33,000ක මුදලක්ද හමුවී තිබේ.

වයස අවුරුදු 21 සහ 34 යන වයස්වල පසුවන ඔවුන් අඟුලාන සයුරපුර නිවාස සංකීර්ණයේදී සහ රාවතාවත්ත ප්‍රදේශයේදී පෙරේදා (17) අත්අඩංගුවට ගෙන ඇත.

# සේවකයන් දෙදෙනකුට කොරෝනා වැළඳී වරායේ පැත්තක් වැසීමේ කතාව බොරුවක්

## ශ්‍රී ලංකා වරාය අධිකාරිය

**නුවන් කොඩිකාර**

සේවකයන් දෙදෙනකුට කොරෝනා ආසාදනය වීම නිසා කොළඹ වරායේ පැත්තක් වසා දමා ඇති බවට ගෙන යන ප්‍රචාරය පදනම් විරහිත බවත් එය තරයේ ප්‍රතික්ෂේප කරන බවත් ශ්‍රී ලංකා වරාය අධිකාරිය පවසයි.

ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් සියලු පර්යන්තවල මෙහෙයුම් කටයුතු හා අනෙකුත් අංශවල කටයුතු මේ වන විට කිසිදු බාධාවකින් තොරව පවත්වාගෙන යන බව එම අධිකාරිය ප්‍රකාශ කරයි.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවක මහත්ම මහත්මීන්ගේ හා කොළඹ වරායේ අනෙකුත් පර්යන්ත හා පරිශ්‍රයන් වෙත පැමිණෙන සියලු පුද්ගලයන් හා වාහන, රජයේ සෞඛ්‍ය නිර්දේශයන්ට හා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කොවිඩ්-19 වැළැක්වීමේ මාර්ගෝපදේශයන්ට අනුව හඳුන්වා දී ඇති කොවිඩ්-19 වැළැක්වීමේ විධි විධානවලට අනුව යමින් නියමිත පරීක්ෂාවන් ඇතුල්වීමේ දොරටුවල දී හා කාර්යාල පරිශ්‍රයයන් හී දී ක්‍රියාත්මක වෙමින් පවතින බව ශ්‍රී ලංකා වරාය අධිකාරිය කියයි.

දැනට ප්‍රචාරය වෙමින් තිබෙන කරුණු සම්බන්ධයෙන් කොළඹ වරාය පරිශ්‍රයේ අදාළ සමාගම කරුණු දැක්වීමක් සිදු කරනු ඇතැයි ශ්‍රී ලංකා වරාය අධිකාරිය බලාපොරොත්තු වේ. එබැවින් මෙවැනි තීරණාත්මක අවස්ථාවක කරුණු හරි හැටි විශ්ලේෂණය කිරීමෙන් තොරව ප්‍රසිද්ධ කිරීමෙන් හෝ ප්‍රචාරණය කිරීමෙන් වළකින ලෙස ශ්‍රී ලංකා වරාය අධිකාරිය වගකිව යුතු පාර්ශ්වයන්ගෙන් ඉල්ලා සිටී.

ශ්‍රී ලංකාව වරාය අධිකාරිය සම්බන්ධයෙන් හෝ ඒ හා සම්බන්ධ පර්ශ්වයන් පිළිබඳ තොරතුරු වාර්තා කිරීමේදී සත්‍ය තොරතුරු ලබා ගැනීම සඳහා එහි සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාසයේ චිත්‍රාල් ජයවර්ණ - ප්‍රධාන කළමනාකරු (වැ.බ.) - 071 853 18 63,නිලන්ත සිරිකුමාර - ජ්‍යෙෂ්ඨ කළමනාකරු-076 860 64 57, හර්ෂ පීරිස් - කළමනාකරු- 071 868 83 11, කාව්‍ය ඉන්ද්‍රජිත් - සහකාර කළමනාකරු- 071 874 16 62 නිලධාරීන් පහත දුරකථන අංක ඔස්සේ සම්බන්ධ කර ගන්නා ලෙස කාරුණික ඉල්ලා සිටින බව අධිකාරිය පවසයි.

දිනමිණ ක්‍රීඩා
sports.dinamina@lakehouser.lk
2020 ඔක්තෝබර් 19 සඳුදා



## ජාතික රයිෆල් හා පිස්තෝල ශූරතාවලියට සූදානම්

# නව වෙඩි තැබීමේ ක්‍රීඩාංගණ 3ක් කඩිනමින් ඉදි කිරීමට නියෝග

**ප්‍රින්ස් ගුණසේකර**

කොරෝනා ව්‍යාප්තිය ඉහළ යෑම හේතුවෙන් ඇති වූ අවිනිශ්චිත බව මධ්‍යයේ වුවද, ශ්‍රී ලංකා වෙඩි තැබීමේ ක්‍රීඩා සම්මේලනය (NSSF) ජාතික රයිෆල් හා පිස්තෝල ශූරතාවලිය ලබන නොවැම්බර් 12 සිට 21 දක්වා වැලිසර ශ්‍රී ලංකා නාවික හමුදා වෙඩි පිටියේදී පැවැත්වීමට කටයුතු යොදයි.

මේ ශූරතාවලියට යෞවන, කනිෂ්ඨ සහ විවෘත යන කාණ්ඩ තුන යටතේ ඉසව් 16ක් ඇතුළත් වේ. යෞවනයන් සඳහා වයස් කාණ්ඩය අවුරුදු 12 සිට 18 දක්වා, කනිෂ්ඨ තරග අවුරුදු 18 සිට 21 දක්වා සහ විවෘත තරගවලට අවුරුදු 21 සහ ඊට වැඩි අය සහභාගී වෙති. මේ තරගාවලිය කාන්තා හා පිරිමි තරගකරුවන්ට පිස්තෝල හා රයිෆල් යන දෙඅංශයෙන්ම විවෘත වේ.

මේ අතර, ජාතික වෙඩි තැබීමේ ක්‍රීඩා සම්මේලන නිලධාරීන් ක්‍රීඩා හා තරුණ කටයුතු ඇමැති නාමල් රාජපක්ෂ මහතා සමඟ කළ සාකච්ඡාවකදී පාසල් ක්‍රීඩකයන් සඳහා නව වෙඩි තැබීමේ ක්‍රීඩාංගණ 3ක් ඉක්මනින් ඉදි කිරීමේ වාතාවරණය සැකසී ඇත.

ජාතික වෙඩි තැබීමේ ක්‍රීඩා සම්මේලනයේ සභාපතිවරයා ඔවුන්ගේ සංවර්ධන සැලැස්ම ක්‍රීඩා ඇමැතිවරයා වෙත ඉදිරිපත් කළ අතර, එහි පියවරක් ලෙස මෙරට 7500කට වැඩි පාසල් වෙඩිකරුවන්ට පහසුකම් සැලසීම සඳහා දිස්ත්‍රික්කයකට එක් වායු තුවක්කු ක්‍රීඩාංගණය බැගින් ඉදි කිරීමට අනුමැතිය හිමි විය.

එහි අවසන් ප්‍රතිඵලය ලෙස රට පුරා දිස්ත්‍රික්ක 25 තුළ වෙඩි තැබීමේ ක්‍රීඩාංගණ 25 ඉදි කිරීමට නියමිත අතර, එහිදී පාසල් ක්‍රීඩකයන්ට පමණක් නොව, සාමාන්‍ය ජනතාවට ද තරගකාරී මට්ටමින් මෙන්ම විනෝදාස්වාදය සඳහා වෙඩි තැබීමේ ක්‍රීඩාවේ නිරත වීමට අවස්ථාව හිමි වනු ඇත. එම හමුවේදී ඉතා ඉක්මනින් සාදා නිම කළ යුතු ක්‍රීඩාංගණ 3ක් අනුමත කිරීමට ඇමැතිවරයා කඩිනම් පියවර ගත් අතර, දෙසැම්බර් මස 31 වැනිදාට පෙර එම ක්‍රීඩාංගණ 3 ඉදි කර අවසන් කිරීමේ කර්තව්‍ය ජාතික වෙඩි තැබීමේ ක්‍රීඩා සම්මේලනයේ සභාපතිවරයාට සහ ලේකම්වරයාට පැවරීමට ද කටයුතු කළේය. ජාතික වෙඩි තැබීමේ ක්‍රීඩා සම්මේලනයේ සභාපතිවරයා කියා සිටියේ වසර ගණනාවකට පසු ක්‍රීඩා ඇමැතිවරයකු බාධාවකින් තොරව වෙඩි තැබීමේ ක්‍රීඩාව දියුණු කිරීමට යහපත් පදනමක් දැමූ පළමු අවස්ථාව මෙය බවය. ප්‍රකාශ නිකුත් කිරීමට වඩා ක්‍රියාව ගැන විශ්වාස කරන ඇමැතිවරයකු සමඟ වැඩ කිරීමට ලැබීම තමාට මහත් සතුටක් බව ද ජාතික වෙඩි තැබීමේ ක්‍රීඩා සම්මේලනයේ සභාපති ශිරාන්ත පීරිස් මහතා පැවසීය.

පාසල් ගුරුවරුන් පුහුණුකරුවන් ලෙස පුහුණු කිරීම සඳහා ද මේ වැඩසටහන ව්‍යාප්ත කර ඇති අතර, එමඟින් ඔවුන් යටතේ සිටින සිසුන්ගේ පුහුණුව වර්ධනය කිරීමට ද සම්මේලන බලාපොරොත්තු වේ. මේ ව්‍යාපෘතිය අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණය වන අතර, වෙඩි තැබීමේ සම්මේලනයේ සභාපතිවරයා සහ ලේකම්වරයා ඒ සම්බන්ධයෙන් දැනටමත් අධ්‍යාපන හා ක්‍රීඩා අධ්‍යක්ෂ දයා බණ්ඩාර මහතාගේ සභාපතිත්වයෙන් යුත් අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ සාකච්ඡා පවත්වා ඇත. ශ්‍රී ලංකා වෙඩි තැබීමේ ක්‍රීඩාව අන්තර්ජාතික තලයේ ඉදිරියට ගතහැකි ක්‍රීඩාවක් බවට හඳුනාගත හැකි අතර, මෙමඟින් ඔලිම්පික්, පොදු රාජ්‍ය මණ්ඩලයීය, ආසියාතික හා දකුණු ආසියානු වැනි සියලු ඉහළ පෙළේ ක්‍රීඩා උළෙළ නියෝජනය කිරීමට ශ්‍රී ලංකා ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට අවස්ථාව උදා වේ.



ක්‍රීඩා හා තරුණ කටයුතු ඇමැති නාමල් රාජපක්ෂ මහතා ජාතික වෙඩි තැබීමේ ක්‍රීඩා සම්මේලනයේ සභාපති ශිරාන්ත පීරිස් මහතා හා නිලධාරීන් සමඟ.

LANKA PREMIER LEAGUE 2020

## එල්පීඑල් නිල ලාංඡනය එළි දක්වයි

**නිරෝෂාන් ප්‍රියංකර**

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සංවිධාන කරන ලංකා ප්‍රිමියර් ලීග් ක්‍රිකට් තරගාවලියේ නිල ලාංඡනය එළි දැක්වීමට තරගාවලියේ මෙහෙයුම් කටයුතු සිදු කරන ඩුබායිහි පිහිටි අයිපීජී (Innovative Production Group) කටයුතු කර තිබේ.

ශ්‍රී ලංකා ජාතික ධජයේ ප්‍රධාන සංකේතය වන සිංහ රුවක් සහිතව නිර්මාණය කර ඇති ලාංඡනය පිළිබඳ අදහස් දක්වමින් එම සමාගම පවසන්නේ දේශීයත්වයට මුල් තැන දෙමින් මෙය සකසා ඇති බවයි.

සිංහයකුගේ ධෛර්යය, අධිෂ්ඨානය සහ නිර්භීතකම තේමා කරමින් නිර්මාණය කර ඇති මේ ලාංඡනයට මෙරට ඉතිහාසය ද එක් කර තිබේ. එමඟින් ජාතියේ පොහොසත් සංස්කෘතිය, උරුමය, ජනතාවගේ නිදහස සහ ශ්‍රී ලාංකික ක්‍රීඩකයන් පිටියේ සිටින විට දක්වන නිර්භීත ආකල්ප පෙන්වීමට උත්සාහ කර ඇත.

ඒ අනුව ඓතිහාසික මහනුවර යුගයේ චිත්‍ර සහ සීගිරි බිතුසිතුවම්වල වර්ණ යොදා ගනිමින් තැඹිලි සහ රතු වර්ණයන්ගෙන් ලාංඡනයේ සිංහයා දක්වා ඇති අතර, නිල් සහ කහ වර්ණය ශ්‍රී ලංකා ක්‍රිකට්හි වර්ණ ලෙස භාවිතා කර ඇත.

සිංහයාගේ කේශරවල වර්ණයන්ගෙන් තරගාවලියට එක් වන කණ්ඩායම් පහ නිරූපනය කර තිබේ.

මේ වර්ණ යොදා ගැනීම මඟින් දේශීය හා විදේශීය රසිකයන්ට සමානව ආකර්ෂණය වන ශ්‍රී ලංකා සන්නාමයක් ලෙස තරගාවලිය ස්ථාපිත කිරීම පරමාර්ථය වූ බව අයිපීජී ප්‍රධාන විධායක නිලධාරී අනිල් මොහාන් මහතා පවසයි.

මේ තරගාවලිය ලබන මස 21 වැනිදා සිට දෙසැම්බර් මස 13 වැනිදා දක්වා මහනුවර පල්ලේකැලේ සහ හම්බන්තොට මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගණ දෙකේ පැවැත්වීමට නියමිත අතර, ක්‍රීඩකයන්ගේ කෙටුම්පත් (Player Draft) සකස් කිරීම අද (19) සිදු කිරීමට නියමිතය. මේ සඳහා විදෙස් ක්‍රීඩකයන් 75 දෙනකු ඉදිරිපත් වන බව අයිපීජී සමාගම පවසයි. කොරෝනා වයිරසය යළි හිස එසැවීම හේතුවෙන් මේ ක්‍රීඩක කෙටුම්පත් සැකසීම දෙවරක් කල් දැමීමට සිදු විය.

මේ තරගාවලියට කොළඹ, මහනුවර, ගාල්ල, දඹුල්ල සහ යාපනය ලෙස කණ්ඩායම් 5ක් එක් වන අතර, එක් කණ්ඩායමකට විදෙස් ක්‍රීඩකයන් 6 දෙනකු බැගින් ක්‍රීඩකයක් 30 දෙනකු තෝරා ගැනීමට නියමිතය.

කෙසේ වෙතත් මෙය වෙන්දේසියක් ලෙස සිදු නොකරන බවට වාර්තා වෙයි. ඒ අනුව කණ්ඩායම් හිමිකරුවන්ට දේශීය සහ විදෙස් ක්‍රීඩකයන් කුසපත් ඇදීමේ ක්‍රමයක් මඟින් තෝරා ගැනීමට සිදු වන අතර, ඒ සඳහා ක්‍රීඩකයන්ගේ දක්ෂතා අනුව කාණ්ඩ ගත කර ඇතැයි ද වාර්තා වේ.



## ධවාන්ගේ මංගල ශතකයෙන් දිල්ලි පිල යළි පෙරමුණේ

විස්සයි20 තරග බිමේ පළමු ශතකය රැස් කරමින් ශිකර් ධාවන් දියත් කළ විශිෂ්ට ඉනිම හේතුවෙන් චෙන්නායි සුපර් කිංග්ස් පිලට එරෙහිව කඩුලු 5ක ජයක් අත් කර ගැනීමට දිල්ලි කැපිටල්ස් පිල සමත් විය.

මේ සමඟ එක්සත් අරාබි එමීර්හිදී පැවැත්වෙන 13 වැනි අයිපීඑල් ක්‍රිකට් තරගාවලියේ යළිත් ප්‍රසාද ලකුණු සටහනේ පෙරමුණ ගැනීමට ද දිල්ලි පිලට හැකි විය.

ෂාජාහිදී පැවැති තරගාවලියේ 34 වැනි තරගයේ පළමුව පන්දුවට පහර දුන් චෙන්නායි පිල ලකුණු 179කට සීමා කළ දිල්ලි ක්‍රීඩකයෝ පන්දුවක් ඉතිරිව තිබියදී ජය හිමි කර ගත්තේ කඩුලු 5ක් පමණක් අහිමි කර ගනිමිනි. චෙන්නායි පිලට හිමි වූ 6 වැනි පරාජය මෙය වන අතර, ඔවුන් ලකුණු සටහනේ 6 වැනි තැන සිටී.

දිල්ලි පිල ජයග්‍රහණය කරා ගෙන යමින් සිය විස්සයි20 තරග දිවියේ ඉහළම ඉනිම ලෙස ලකුණු 101ක් රැස් කළ ශිකර් ධවාන් හතරේ පහර 14කින් සහ හයේ පහරකින් ඉනිම වර්ණවත් කර ගත් අතර, ඊට වැය කළේ පන්දු 58ක් පමණි. චෙන්නායි පන්දු රකින්නන්ගෙන් ධවාන්ට ශතකය වෙත යෑමට අනගි සහායක් හිමි වුණේ උඩ පන්දු 4ක් ගිලිහී යෑම හේතුවෙනි. මෙවර තරගාවලියේ වාර්තා වූ තෙවැනි ශතකය මෙයයි.

අක්සාර් පටෙල් පන්දු 5කින් ලකුණු 21ක් සහ මැකස් ස්ටොයිනිස් ලකුණු 24ක් ඉනිමට එක් කළහ.

චෙන්නායි පිල වෙනුවෙන් අම්බති රයිදු පන්දු 25කින් වේගවත් ලකුණු 45ක් රැස් කළ අතර, ෆෆ් ඩු ප්ලෙසිස් ලකුණු 58ක් සහ ෂේන් වොට්සන් ලකුණු 36ක් ඉනිමට එක් කළහ.

### කෝලිලාට ජය

මේ අතර, ඒ.බී ඩි විලියර්ස්ගේ වේගවත් පිති හරඹය හේතුවෙන් තරගාවලියේ 6 වැනි ජය වාර්තා කිරීමට විරාට් කෝලිගේ රෝයල් චැලෙන්ජර්ස් බැංගලෝර් පිල සමත් විය.

තරගාවලියේ 33 වැනි තරගය ලෙස පැවැති මේ තරගයෙන් බැංගලෝර් පිල හමුවේ රාජස්ථාන් රෝයල්ස් පිල කඩුලු 7කින් පරාජයට පත් විය.

මේ ජය සමඟ බැංගලෝර් ප්‍රසාද ලකුණු සටහනේ තෙවැනි තැන පසුවන අතර, රාජස්ථාන් පිල 7 වැනි තැන සිටින්නේ පරාජයන් 6ක් සමඟිනි.

රාජස්ථාන් පිල පළමුව පන්දුවට පහර දෙමින් දුන් ලකුණු 178ක ඉලක්කය හඹා ගිය බැංගලෝර් පිල පන්දු 4ක් ඉතිරිව තිබියදී ජය හිමි කර ගත්තේ කඩුලු 3ක් දැවී තිබියදීය.

ඩි විලියර්ස් පන්දු 22කදී හතරේ පහරක් සහ හයේ පහර 6ක් සමඟ නොදැවී ලකුණු 55ක් රැස් කළ අතර, විරාට් කෝලි ලකුණු 43ක් සහ දේවදත් පඩික්කාල් ලකුණු 35ක් ඉනිමට එක් කළහ.

නායක ස්ටීව් ස්මිත් පන්දු 36කින් ලකුණු 57ක් රැස් කරමින් රාජස්ථාන් ඉනිමේ වැඩිම ලකුණුලාභියා වූ අතර, රොබින් උතප්පා ඉනිමට වේගවත් ආරම්භයක් දුන්නේ පන්දු 22කින් ලකුණු 41ක් රැස් කරමිනි.

පන්දු යැවීමේදී ක්‍රිස් මොරිස් කඩුලු 4ක් දවාගත් අතර, ඕවර 3ක් ක්‍රියාත්මක කළ ඉසුරු උදානට කඩුලු නොදෙමින් ලකුණු 43ක් උදුරා ගැනීමට රාජස්ථාන් පිතිකරුවෝ සමත් වූහ.

## යුද හමුදාපති කුසලාන ලීග් ක්‍රිකට් කිරුළ

# චන්දිමාල්ගේ සදර්න් වොරියස්ට

**නිරෝෂාන් ප්‍රියංකර**

යුද හමුදාපති කුසලාන ලීග් විස්සයි20 මංගල ක්‍රිකට් තරගාවලියේ ශූරතාව දිනා ගැනීමට දිනේෂ් චන්දිමාල්ගේ නායකත්වයෙන් තරග වැදුණු ඩීමෝ සදර්න් වොරියස් කණ්ඩායම සමත් විය.

දොඹගොඩ යුද හමුදා ක්‍රීඩාංගණයේ පැවැති තරගාවලියේ අවසන් තරගයේදී සදර්න් පිල හමුවේ සීක්කුගේ ප්‍රසන්න මෙහෙය වූ සුපර් ෆැෂන් නොදර්න් වොරියස් පිල ලකුණු 9කින් පරාජයට පත් විය.

එළැඹෙන පළමු පෙළ තරගාවලිය සඳහා යුද හමුදා ක්‍රීඩා සමාජයට නවක දක්ෂ ක්‍රීඩකයන් සොයා ගැනීම සහ යුද හමුදාවේ ක්‍රිකට් ක්‍රීඩා කරන ක්‍රීඩකයන්ට නව තරග අත්දැකීම් දීමේ අරමුණින් යුද හමුදා ක්‍රිකට් කමිටුව පළමු වරට මේ තරගාවලිය සංවිධාන කළේය. තරගාවලියේ අවසන් තරගයේ කාසියේ වාසිය දිනා පළමුව පන්දුවට පහර දුන් සදර්න් පිල ඕවර 20 අවසානයේ කඩුලු 6ක් දැවී ලකුණු 159ක් වාර්තා කළ අතර, එම ඉලක්කය හඹා ගිය නොදර්න් පිලට ඕවර 19කදී සියල්ලන් දැවී රැස් කළ හැකි වූයේ ලකුණු 150ක් පමණි.

නායක සීක්කුගේ ප්‍රසන්න වේගවත් ඉනිමක් දියත් කරමින් නොදර්න් පිල ජයග්‍රහණය කරා ගෙන යෑමට උත්සාහ කළ ද අවසන් කඩුලු 5 ලකුණු 25ක් තුළ බිඳ වැටීමෙන් එය අසාර්ථක විය. හතරේ පහර 3ක් සහ හයේ පහර 5ක් සමඟින් ලකුණු 49ක් රැස් කළ සීක්කුගේ ඊට වැය කළේ පන්දු 23ක් පමණි. දසුන් ශානක පන්දු 32කින් ලකුණු 34ක් ඉනිමට එක් කළේය. පන්දු යැවීමේදී සුමින්ද ලක්ෂාන් කඩුලු 3ක් බිඳ දැමූ අතර, මලින්ද අභිෂේක්, වනිඳු හසරංග සහ සුරංග ලක්මාල් අතරේ කඩුලු 2 බැගින් බෙදී ගියේය.

හතරේ සහ හයේ පහර 2 බැගින් එල්ල කරමින් පන්දු 40කින් ලකුණු 47ක් රැස් කළ අසිත බස්නායක සදර්න් ඉනිමේ වැඩිම ලකුණුලාභියා විය. වනිඳු හසරංග පන්දු 19කින් ලකුණු 29ක් සහ ගිහාන් කෝරළගේ ලකුණු 24ක් ඉනිමට එක් කළහ. පන්දු යැවීමේදී හෂාන් හෙට්ටිආරච්චි කඩුලු 2ක් බිඳ දැම්මේය. අවසන් තරගයේ වීරයා සම්මානය වනිඳු හසරංගට හිමි විය.

නොදර්න් පිල අනුශූරතාව දක්වා ගෙන යමින් තරග 7කදී පිතිකරණයෙන් ලකුණු 176ක් රැස් කරමින් පන්දු යැවීමේදී කඩුලු 9ක් දවා ගනිමින් දස්කම් දැක්වූ සීක්කුගේ ප්‍රසන්න තරගාවලියේ වීරයා ලෙස සම්මාන දිනාගත් අතර, තරග 7කදී අර්ධ ශතක 3ක් සමඟින් ලකුණු ලකුණු 288ක් රැස් කළ සදර්න් නායක දිනේෂ් චන්දිමාල් තරගාවලියේ හොඳම පිතිකරු ලෙසත්, අවසන් තරගයට සුදුසුකම් නොලැබුවද මෙල්බර්න් වෙස්ටන් කණ්ඩායමේ නායක තිසර පෙරේරා කඩුලුලාභීන් අතර, පෙරමුණ ගනිමින් තරගාවලියේ හොඳම පන්දු යවන්නා ලෙසත් සම්මාන දිනා ගත්හ. තිසර තරග 6කදී කඩුලු 12ක් දවා ගෙන තිබිණි. ප්‍රීමා ස්ටෙලා ඊස්ටන් වොරියස් කණ්ඩායමේ තෙනු රාධන් හොඳම පන්දු රකින්නා ලෙස නම් කෙරිණි.

තරගාවලියේ ජය සංකේත ප්‍රදානෝත්සවය යුද හමුදාපති ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැති අතර, යුද හමුදා ක්‍රිකට් කමිටු සභාපති මේජර් ජෙනරාල් රුවන් වනිගසූරිය, උප සභාපති බ්‍රිගේඩියර් ශිරාන් අබේසේකර, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ සභාපති ශම්මි සිල්වා මහත්වරු ද මේ අවස්ථාව සහභාගි වූහ.




යුද හමුදපති ලුතිනත් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතා අතින් සදර්න් වොරියස් නායක දිනේෂ් චන්දිමාල් ශූරතාව ලබාගත් අයුරු.



අනුශූරතාව සහ තරගාවලියේ වීරයා නොදර්න් නායක සීක්කුගේ ප්‍රසන්නට



ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනයට පවරා දුන් ගාල්ල ක්‍රීඩා සංකීර්ණයේ අඩුපාඩු සොයා බැලීමටත්, එහි ඉදිරිපස වෙරළ තීරයේ බීච් වොලිබෝල් ක්‍රීඩාංගණයක් ඉදි කිරීමටත් අවශ්‍ය කටයුතු සොයා බැලීම සඳහා ක්‍රීඩා හා තරුණ කටයුතු ඇමැති නාමල් රාජපක්ෂ මහතා පසුගියදා එහි නිරීක්ෂණ චාරිකාවක නිරත වූ අයුරු. ගාල්ල ක්‍රීඩා සංකීර්ණයේ ඇති පාපන්දු ක්‍රීඩාංගණයේ අඩුපාඩු සකසා විදුලි ආලෝකය මැද්දේ පාපන්දු ක්‍රීඩා කිරීමට අවශ්‍ය කටයුතු සකස් කරන ලෙස ද මෙහිදී ඇමැතිවරයා නිලධාරීන්ට උපදෙස් ලබාදී තිබේ. මේ අවස්ථාවට වැවිලි කර්මාන්ත ඇමැති වෛද්‍ය රමේෂ් පතිරණ, පොහොර නිෂ්පාදන සැපයුම්, රසායනික පොහොර හා කෘමිනාශක භාවිතා නියාමන රාජ්‍ය ඇමැති මොහාන් ද සිල්වා, ගාල්ල නගරාධිපති ප්‍රියන්ත සහබන්ධු මහත්වරුන් ඇතුළු පිරිසක් එක්ව සිටියහ.

*ඡායාරූපය – හිනිදුම විශේෂ රවීන්ද්‍ර ලියනගේ*

## අලි ඛාන් වෙනුවට සෙයිෆර්ට්



අමෙරිකා එක්සත් ජනපදයේ වේග පන්දු යවන ක්‍රීඩක අලි ඛාන්ට ආබාධයක් හේතුවෙන් එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ පැවැත්වෙන අයිපීඑල් තරගාවලිය අහිමි වී තිබේ. 29 හැවිරිදි අලී ඛාන් මෙවර කොල්කටා නයිට් රයිඩර්ස් පිල නියෝජනය කරමින් අයිපීඑල් තරගාවලියට එක් වූයේ පළමු අමෙරිකානු ක්‍රීඩකයා ලෙසිනි. කෙසේ වෙතත් ඔහුට මෙවර තරගවාරයේ එකම තරගයක් හෝ ක්‍රීඩා කිරීමේ අවස්ථාව හිමි නොවිණි. ඒ අනුව ඔහු වෙනුවට නවසීලන්ත කඩුලු රකින ක්‍රීඩක ටිම් සෙයිෆර්ට් කොල්කටා කණ්ඩායමට එක් වීමට නියමිතය.


## නරේන්ගේ පන්දු යැවීමේ ඉරියව් නිවැරදියි

කොල්කටා නයිට් රයිඩර්ස් කණ්ඩායමේ දඟ පන්දු යවන ක්‍රීඩක සුනිල් නරේන්ගේ පන්දු යැවීමේ ඉරියව් නිවැරදි බව අයිපීඑල් සැකසහිත පන්දු යැවීමේ ඉරියව් සම්බන්ධ කමිටුව තහවුරු කර තිබේ.

ඒ සමඟින් සැකසහිත ඉරියව්වෙන් පන්දු යවන්නන්ගේ ලැයිස්තුවෙන් ද ඔහුගේ නම ඉවත් කර තිබේ.

අයිපීඑල් තරගාවලිය යටතේ පසුගිය 10 වැනිදා කිංග්ස් ලෙවන් පන්ජාබ් පිල සමඟ පැවැති 24 වැනි තරගයේදි නරේන්ගේ පන්දු යැවීමේ ඉරියව් සැක සහිත බවට විනිසුරුවන් විසින් චෝදනා එල්ල කළහ. ඒ සමඟ ඔහු අනතුරු ඇඟවීමේ ලැයිස්තුවට ඇතුළත් කර තිබූ අතර, ඔහුගේ පන්දු යැවීම සම්බන්ධයෙන් තවත් වරක් විනිසුරුවන් විසින් පැමිණිලි කළ හොත් එම ඉරියව් නිවැරදි කර ගන්නා තෙක් මෙවර තරගාවලියේදී ඔහුට පන්දු යැවීම අත්හිටුවීමට සිදු වන බව ඉන්දීය ක්‍රිකට් පාලක මණ්ඩලයේ සැක කටයුතු පන්දු යැවීමේ ක්‍රියාකාරි කමිටුව නිවේදනය කර තිබිණි.

ඒ අනුව ඉන් පසු ඔහු තරගවලට එක් කර ගැනීමෙන් වැළකුණු කොල්කටා කණ්ඩායම් කළමණාකාරීත්වය තරගාවලි සංවිධායකයන්ගෙන් කළ ඉල්ලීමකට අනුව ඔහුගේ පන්දු යැවීමේ ඉරියව්වට අදාළ දර්ශන නැරඹීමෙන් පසුව ඉරියව් නීත්‍යනුකූල බවට තීරණය කර ඇත.



## උමාර් ගුල් ක්‍රීඩාවට සමු දෙයි

පාකිස්තාන වේග පන්දු යවන ක්‍රීඩක උමාර් ගුල් ක්‍රිකට් ක්‍රීඩාවෙන් විශ්‍රාම ගැනීමට තීරණය කරයි.

ඒ අනුව ඔහු සියලු ආකාරයේ ක්‍රිකට් ක්‍රීඩාවෙන් සමු ගන්නා බව පවසා ඇත්තේ පසුගියදා පාකිස්තානයේ පැවැති ජාතික විස්සයි20 ක්‍රිකට් තරගාවලියේ ඔහු නියෝජනය කරන බලුකිස්තාන කණ්ඩායමට අවසන් පූර්ව වටයට පිවිසීමේ අවස්ථාව අහිමි වීමත් සමඟය.

2003 වසරේ ජගත් පිටියට පිවිසි 36 හැවිරිදි ගුල් පාකිස්තානය වෙනුවෙන් ටෙස්ට් තරග 47කදී කඩුලු 163ක්, එක්දින තරග 130කදී කඩුලු 179ක් සහ විස්සයි20 තරග 60කදී කඩුලු 85ක් බිඳ දැමීමට සමත්ව තිබේ. 2012 වසරේ දණහිසේ ආබාධයකට ගොදුරු වන තෙක් ජාතික කණ්ඩායමේ නිත්‍ය සාමාජිකයකු වූ ඔහු අවසන් වරට ජගත් තරගයකට එක් වූයේ 2016 වසරේදීය.

විස්සයි20 පන්දු යවන්නන් ශ්‍රේණිගත කිරීම්වල පළමු ස්ථානය ද අත් කර ගෙන ඇති ඔහු පළමු පන්තියේ තරග 125ක්, ඒ කාණ්ඩයේ තරග 213 ක් සහ විස්සයි20 තරග 167ක් ක්‍රීඩා කරමින් කඩුලු 987ක් දවා ගැනීමට සමත්ව තිබේ.







# හිත් මත බොහෝ දේ තබා ගිය රතු හැට්ටකාරිය අනුලා





අනුලා බුලත්සිංහල නමැති රංගන ශිල්පිනිය අප වේදිකාව අතහැර ගොස්ය. ඇය සමඟ "තාරාවෝ ඉගිළෙති" නාට්‍යයේ රඟපාමින් වේදිකාව බැබළවූ රංගන ශිල්පිනිය මර්සි එදිරිසිංහ සොහොයුරිය ද කලකට පෙර අප අතැර ගියාය. වේදිකාවට අපූර්ව රංග සොබාවක් එක් කළ චන්ද්‍රා කළුආරච්චි සොහොයුරිය ද අප අතැර ගොස්ය. හැටේ දශකයේ වේදිකාවේ දක්ෂතම නිළිය ප්‍රේමා ගණේගොඩ අප අතැර විදේශගත වී ඇත. මේ අතර සිංහල වේදිකාවේ එදා මෙදා තුර අප මතකයේ රැඳී ඇති චරිත අතර ගායන, රංගන සහ නර්තන හැකියාව මෙන්ම නිළියකට අවශ්‍ය මනා රූ සපුවකින් ද හෙබි අනුලා බුලත්සිංහල රංගන ශිල්පිනිය වේදිකාවට දායක කළ චරිත එදා මෙදා තුර රසිකයන්ගේ මනසේ අපූර්ව ලෙස සිත්තම් වී ඇත.

අනුලා දක්ෂ නිළියක ලෙස තම දක්ෂතා ප්‍රකට කළත් ඇය ජනප්‍රිය නිළියක් වූයේ තම සැමියා වූ නාට්‍ය අධ්‍යක්ෂ ලූෂන් බුලත්සිංහලයන්ගේ "රතු හැට්ටකාරී" සහ අතිශයින් ජනප්‍රිය වූ "තාරාවෝ ඉගිළෙති" නාට්‍ය දෙකෙනි. දිග ගවුමකින් සැරසී දිග වරලස මුදා හැර ප්‍රේක්ෂකාගාරයේ සියලු දෙනාගේම අවධානය යොමු කර ගනිමින් "තාරාවෝ ඉගිළෙති" නාට්‍යයේ තම නිවෙසේ දොර ඇරගෙන වේදිකාවට ප්‍රවේශ වන ලොරීටා නිදහසේ ගී ගයමින් රඟයි.

"තට්ටු කරන්න හෙමින්
මාගේ විමානෙ දොරටුව ඔබගෙයි
තට්ටු කරන්න හෙමින් ..."

ලොරීටා ලෙසින් එදා 1981 ජූලි මස 24 වෙනි දින ලුම්බිණි රඟහලේදී පැවැති මංගල දර්ශනයේදී අනුලා බුලත්සිංහල ප්‍රකට කළ අපූර්ව රංග විලාසය මගේ මනසේ මෙන්ම එදා නාට්‍ය නැරඹූ නාට්‍ය රසිකයින්ගේ මනසේ සදා රැඳී ඇති බව මම විශ්වාස කරමි. ලූෂන්ගේ ගී පද සංකලනයෙන් ගුණදාස කපුගේ නිර්මාණය කළ සංගීතයෙන් සහ අතිශය ජනප්‍රිය වූ නළු නිළි පිරිසකගේ දායකත්වයෙන් ජනප්‍රියත්වයෙන් ජනප්‍රියත්වයට පත් "තාරාවෝ ඉගිළෙති" නාට්‍යයේ අනුලා ගැයූ ගී සියල්ල අදත් ජනප්‍රිය වේදිකා නාට්‍ය ගීත බවට පත්ව ඇත. පසුගිය කාලපරිච්ඡේදය තුළ මා සහභාගි වූ පාසල් විවිධ ප්‍රසංග නාට්‍ය හා රංග කලා ප්‍රායෝගික පරීක්ෂණවලට ඉදිරිපත් වූ දරුවන් වැඩි දෙනකු තම රංගනය හා ගායනය සඳහා භාවිත කළේ අනුලා "රතුහැට්ටකාරි" නාට්‍යයේ හෝ "තාරාවෝ ඉගිළෙති" නාට්‍යයේ රඟපාමින් ගැයූ ගීතයන්ය. සෑම දරුවකුම අනුලා අනුකරණය කිරීමට උත්සාහ ගත් අයුරක් දක්නට ලැබුණි.

හැටේ දශකයේ ආර්.ආර්. සමරකෝන් අධ්‍යක්ෂණය කළ "ලෙඩක් නැති ලෙඩෙක්" නාට්‍යයේ රඟපාමින් රඟපෑම නමැති සදාකාලික සුව නොවන රෝගයකට ඇය ගොදුරු වුණි. ඇය එකල අනුලා මෙන්ඩිස් නමින් හැඳින්වූවත් ශ්‍රී ලාංකේය වේදිකාව මත අපූර්ව මඟ සලකුණු තැබූ ලූෂන් බුලත්සිංහල නමැති නාට්‍යවේදියා සමඟ සරණ යෑම නිසාවෙන් ඇය ද බුලත්සිංහල පෙළපත උරුම කර ගනිමින් අනුලා බුලත්සිංහල ලෙසින් ප්‍රකට වන්නීය.

එකල අප කලාකෙත සරු කළ අනුලාවෝ දෙදෙනෙක් වූහ. ඉන් අනුලා කරුණාතිලක සිංහල සිනමාවේ තම රංගන ප්‍රතිභාව ප්‍රකට කරද්දී වේදිකාවට එක් වුණු අනුලා මෙන්ඩිස් ආර්. ආර්. සමරකෝන්ගේ "ලෙඩක් නැති ලෙඩෙක්" සහ "චරිත දෙකක්" නාට්‍යයන්හි ද ප්‍රේමරංජිත් තිලකරත්නගේ "වහලක් නැති ගෙයක්" (දෙවන නිෂ්පාදනය "මුහුණු සයකි රූකඩයකි", "කෝන්තරේ", සුගතපාල ද සිල්වාගේ "දැවද්දෝ", දයානන්ද ගුණවර්ධනයන්ගේ "මධුර ජවනිකා", "නරිබෑනා", සුනන්ද මහේන්ද්‍රයන්ගේ "පොකුරු වැස්ස", කේ.බී. හේරත්ගේ "දෝන කතිරිනා" යන නාට්‍යයන්හි මෙන්ම ලූෂන් බුලත්සිංහල රූපවාහිනියට නිෂ්පාදනය කළ බන්දුල ජයවර්ධනයන්ගේ "බෙරහඬ" නාට්‍යයේ රඟපෑම තුළින් ජනාදරයට පත් විය.

රඟපෑම තුළින් වේදිකාව ජයගත් ඇය ජන්මයෙන් උරුම වූ ගායනා හැකියාව නිසාම හෙන්රි ජයසේනගේ "කුවේණි" නාට්‍යයේ දෙවන නිෂ්පාදනයේ දී කුවේණියගේ චරිතය රඟපාන්නට වාසනාව ද උරුම කර ගත්තීය. කුවේණිය ගායනා කළ "සත් සියක් කපු මල් රැගෙන මම" අනුලාගේ ගායනා හැකියාව ඔස්සේ ප්‍රතිනිර්මාණය වූ කුවේණිය නිසාම මහාචාර්ය සරච්චන්ද්‍රයන්ගේ "මහාසාර" නාට්‍යයේ රඟපාන්නට ඇයට ලැබුණු අවස්ථාව මෙහිලා සිහිපත් කළ යුතුය.

අවර ගණයේ නාට්‍ය එක දිගට නැරඹීමෙන් හොඳටම ඇට්ටකුණා වී සිටි අප එකල රාජ්‍ය නාට්‍ය උලෙළේ නාට්‍ය නැරඹුවේත් සම්මාන උලෙළ නැරඹුවේත් මහත් උද්වේගයෙනි. උනන්දුවකිනි. අපට අමතක නොවන සුවිශේෂ නාට්‍ය උලෙළක් වූ 1974 රාජ්‍ය නාට්‍ය උලෙළ වෙනුවෙන් වේදිකාගත වුණු "රතු හැට්ටකාරී" නාට්‍යයේ අනුලා බුලත්සිංහල ඉදිරිපත් කළ රංග විලාසය නිසාම අප කාගේත් බලාපොරොත්තුව වූයේ අනුලා එම වසරේ හොඳම නිළිය වේයන්නය. එසේ වුවත් අනුලාට එම සම්මානය අහිමි විය. එහෙත් ඇය එයින් පසුබට නොවී "රතුහැට්ටකාරී" ලෙසින් දීකිරි මුට්ටිය හිස තබාගෙන ශ්‍රී ලංකාවේ රංග ශාලාවන් සිය ගණනක වසරක ගණනාවක් තිස්සේ "දීකිරි දීකිරි ගෙනාව දීකිරි" යනුවෙන් ගයමින් ප්‍රේක්ෂකාගාරය පිනවමින් තම රසික පිරිසේ නොමඳ ගෞරවය හා සම්මානය දිනා ගත්තාය.

ලූෂන් බුලත්සිංහලයන් සතු අපූර්ව රචනා කෞශල්‍යයෙන් පිරිපුන් නාට්‍යමය පදමාලා ඔස්ටින් මුණසිංහයන්ගේ ගී තනුවලින් සහ සංගීතයෙන් ඔපවත් වූ ගීතාවලියකින් පිරුණු "රතු හැට්ටකාරී" නාට්‍යයේ ඇය ගැයූ ගීත පසුකලෙක කවුරු ගැයූවත් අනුලා බුලත්සිංහල ප්‍රේක්ෂයා තුළ ඇති කළ මතකය බිඳ දමන්නට කිසිදා සමත් නොවනු ඇත.

ටවර් රඟහල රජයට පවරා ගැනීමත් සමඟ එවකට අග්‍රාමාත්‍ය ආර්. ප්‍රේමදාස මහතා විසින් ටවර් හෝල් රඟහල පදනම පිහිටුවා ආරම්භයේ දීම ප්‍රවීණ නාට්‍යවේ දී හෙන්රි ජයසේනයන්ගේ අධ්‍යක්ෂණයෙන් "සිරිසඟබෝ" නූර්තියත් පේ‍්‍රමරංජිත් තිලකරත්නයන්ගේ අධ්‍යක්ෂණයෙන් "ශ්‍රී වික්‍රම" නූර්තියත් නිෂ්පාදනය කරන ලද අතර, එයින් "ශ්‍රී වික්‍රම" නූර්තියේ අනුලා රඟපෑ ඇහැළේපොළ කුමාරිහාමිගේ චරිතය ඇය අතිශයින්ම ප්‍රිය කළ චරිතයක් බව මම පෞද්ගලිකවම දනිමි. ටවර් නූර්ති ගී ප්‍රසංගයට ඇය ඉතා කැමැත්තෙන් සහභාගි වෙමින් ඇය එම ගීතය ගයන්නට ඇහැළේපොළ කුමාරිහාමිගේ ඇඳුම පෞද්ගලිකව සකස් කරගෙන තිබුණි. දුර්වල සෞඛ්‍ය තත්ත්වයක් තිබිය දී පවා ඇය එම ගීතය ගයන්නට එක්වූවත් ඇයගේ ගායනය පෙර මෙන් ප්‍රබල නොවූ බවත් සාර්ථක නොවන බවත් ඇයම වටහාගෙන තිබුණි. එහෙත් ඇයට ටවර් හෝල් රඟහල පදනම වෙතින් ඇයගේ සේවය අගය කරමින් මාසික වියපත් දීමනාවක් මෙන්ම විශේෂ වෛද්‍යාධාරයක් ද ඇයගේ මරණය සිදු වන තෙක් මාසිකව දුන් බවත් මෙහිලා සිහිපත් කරමි.

ටවර් හෝල් රඟහල පදනම සංවිධානය කරන වියපත් කලාකරුවන්ගේ වන්දනා චාරිකාවන්ට ද ඇය සහභාගි වූයේ උනන්දුවෙනි.

රෝගී තත්ත්වය නිසා ඇයගේ ශක්තිය ක්‍රමයෙන් හීන වෙද්දී වුවද ඇය රඟමඩල අතහැර යන්නට පෙර 1974 රාජ්‍ය නාට්‍ය උලෙළේදී ඇයට අහිමි වුණ හොඳම නිළිය සම්මානය වෙනුවට ජීවිතයේ එක් වරක් පිදෙන ගෞරව සම්මානය රාජ්‍ය නාට්‍ය උලෙළෙකදී හිමි කර ගනිමි යන අධිෂ්ඨානය ඇය මෙයට මාස දෙකකට පමණ පෙර ඉටු කර ගත්තාය.

ප්‍රවීණ නාට්‍යවේ දී දයානන්ද ගුණවර්ධනයන්ගේ "මධුර ජවනිකා" නාට්‍යයේ නෙයිනගේ සුදුවේ ජවනිකාවේ ජැංඩි සිඤ්ඤෝගේ චරිතය රඟපෑ ජැක්සන් ඇන්තනී ප්‍රවීණ රංගවේදියා සමඟින් රෝසා නෝනගේ චරිතය රඟපාමින්

"පළමුව මම වැන්දා බුදුන්
සිහි කර ගෙන ඒ ගුණකඳ
දෙවනුව සද්ධර්ම උතුම්
මුදුනත් කර මෙන්න වැන්දා"

ගීතය ගයමින් රබාන වයමින් වේදිකාව පුරා දුව පනිමින් රඟන ලද දඟකාර විසේකාර "රෝසා නෝනාගෙ" චරිතය මතකයට ඉතිරි කරමින් ජීවිතයට එක් වරක් පමණක් පිදෙන ගෞරව සම්මානය පිළිගැනීමට ඇය ආවේ තවත් සගයකුගේ සහායෙන් අපගේ ඇසට කඳුළක් ද එක් කරමිනි.

ඇය ගත් සම්මානය දරා ගන්නට තරම් ඇයට එය ද බර වැඩි විය. ප්‍රේක්ෂකාගාරයේ සියලු දෙනා නැඟිට අත්පොළසන් දෙන ගමන් ඇයට නීරෝගී සුවය පැතුවත් ඇයගේ පැතුම වන්නට ඇත්තේ "රතු හැට්ටකාරී" නාට්‍යයේ රඟපෑම වෙනුවෙන් එදා අහිමි කළ සම්මානය වෙනුවට සුවිශේෂී සම්මානයක් ගෙන ජීවිතයෙන් සමුගැනීම විය යුතුය.

“ජීවිතය රඟමඩලකි අපි සියල්ලෝම එහි රඟන අය වෙති.” එහෙත් වේදිකාවේ රඟපාමින් තම ප්‍රතිභාපූර්ණ හැකියාවෙන් ජය දද නැංවූ මෙවන් සුවිශේෂ චරිත එකිනෙකා රඟමඬලෙන් ඉවත් වන විට ඇති වන හිඩැස නම් සදාකාලයටම පවතිනු ඇත.

**අනුලා බුලත්සිංහල සොහොයුරිය ඔබට නිවන් සුව ලැබේවා!**

**නීතිඥ ඩග්ලස් සිරිවර්ධන**
**අධ්‍යක්ෂ ජනරාල්**
**ටවර් හෝල් රඟහල පදනම**

**ඡායාරූප - දයාන් විතාරණ සහ ලේක්හවුස් පුස්තකාලයෙනි**




# මිහිඳු පරිනිර්වාණ ජාතික පූජෝත්සවය - 2020

ඓතිහාසික මිහින්තලා පින්බිමට වැඩම කරවා සිරිලකටම දහම් පණිවුඩය බෙදා දීමේ අපරිමිත ශාසනික මෙහෙවරට උර දුන් අනුබුදු මිහිඳු මහ රහතන් වහන්සේගේ පරිනිර්වාණය සිදු වී වසර 2280ක් සපිරෙයි. ඒ නිමිති කොට ගෙන පවත්වනු ලබන "මිහිඳු පරිනිර්වාණ ජාතික පූජෝත්සවය"

**මිහින්තලා රජමහා විහාරාධිපති හා භාරකාර ආචාර්ය වළවාහැංගුණු වැවේ ධම්මරතන නායක හිමිපාණන් වහන්සේගේ අනුශාසනා පරිදි, ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ඔක්තෝබර් මස 23 වැනි දින රාජ්‍ය අනුග්‍රහකත්වය යටතේ, ඓතිහාසික මිහින්තලා පුදබිමේ දී පැවැත්වීමට කටයුතු සංවිධානය කර තිබේ.**

- ඔක්තෝබර් 23 වැනි දින ප.ව.4.00ට ගුවන් හමුදාව විසින් මිහිඳු මහා සෑයට සහ මිහින්තලා පුදබිමට ගුවනින් පිච්ච මල් පූජෝපහාර දැක්වීම
- ශ්‍රී ලංකා ත්‍රිවිධ හමුදාවේ අනුග්‍රහයෙන් හේවිසි හඬ මධ්‍යයේ මිහිඳු සෑයේ ප්‍රතිසංස්කරණ කටයුතු ජනපතිතුමන්ගේ සුරතින් මුල්ගල තබා ආරම්භ කිරීම.
- කිරිබත්ගොඩ ඤාණානන්ද ස්වාමීන් වහන්සේගේ අනුශාසනා පරිදි, භික්ෂූන් වහන්සේ දහස් නමකගේ සහභාගීත්වයෙන් පින්කම් මාලාව ආරම්භ වීම.
- මිහිඳු ගුහාව, මිහිඳු ගුහාවට ගමන් කරන මාර්ගය දෙපස, ධර්ම ශාලාව හා ධාතු මන්දිරයේ ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීම.



ප්‍රචාරණ අනුග්‍රහය - ලේක්හවුස් ආයතනය හා ශ්‍රද්ධා රූපවාහිනී නාලිකාව




■ ජෝශප් පයස් - වත්තල විශේෂ

# කොරෝනා වසංගතයට ගොදුරු වූවන්ට සෙත් පතා දේව පූජාවක්



රටට, ජනතාවට, රජයට සෙත් පැතීම හා කොරෝනා වසංගත තත්ත්වයෙන් පීඩා විඳින්නන්ට ඉක්මන් සුවය, සහනය හා එම වසංගත තත්ත්වය රටින් තුරන් කිරීම අරමුණින් වත්තල හේකිත්ත ශ්‍රී ශිවසුබ්‍රමනියම් හින්දු දේවස්ථානයෙදී පසුගියදා (16) විශේෂ දේව පූජාවක් පැවැත් විණි.

වත්තල ප්‍රාදේශීය ලේකම් පී.වී.ටී.සී. රාජිකා මහත්මියගේ ප්‍රධානත්වයෙන් හා වත්තල රණවිරු සම්පත් කේන්ද්‍රයේ යුද හමුදා නිලධාරීන්, වත්තල පොලිස් ස්ථානයේ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් ආගමික පූජාව සිදු කෙරිණි.

සභාපති ඇස්. රවිචන්ද්‍රන් මහතා ප්‍රමුඛ එම දෙවස්ථාන පාලක සභා **සාමාජිකයන් විශේෂ පූජාව සංවිධානය කර තිබිණි.**

දිනමිණ දිසත දස අත ම එක තැන

■ නාඋල සමූහ

# වැසි නිසා මධ්‍යම කඳුකරයේ වගා රැසකට හානි

මධ්‍යම පළාතට විටින් විට ඇද හැළෙන වැසි තත්ත්වය හා දැඩි සුළං තත්ත්වය හමුවේ වාර්ෂික හා අර්ධ වාර්ෂික බෝග රැසකට බලපෑම් එල්ල වී ඇතැයි ගොවීහු කියා සිටිති.

මේ වන විටත් පවතින සුළං තත්ත්වය හේතුවෙන් දිස්ත්‍රික්ක රැසක කරාඹුනැටි, සාදික්කා සහ පුවක් වගාවන්වල ගෙඩි බිම වැටීම, අතු කඩා වැටීම් ආදීය සිදුවී ඇති බව ඔවුහු කියා සිටිති.

මේ අතර ආධාරක උපයෝගි කරගෙන සිදු කරනු ලබන එළවළු වගාවන්වලට සුළං තත්ත්වය බාධාවක් වී ඇතැයි ගොවි සංවිධාන රැසක් කියා සිටිති. මාතලේ දිස්ත්‍රික්කයේ බහුලව වගාකෙරෙන තක්කාලි, බෝංචි, දඹල, මෑ කරල්, පතෝල වැනි ආධාරක ආශ්‍රිත බෝග රැසකට සුළං තත්ත්වය බාධාවක් වී ඇතැයි දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයට වැඩිම එළවළු තොග සපයන නාඋල - අඹන වෙල්යායේ ගොවීහු පසුගියදා කියා සිටියහ.

■ චන්දන ජයවීර - හැටන්

# බිල නම් වෙලාවට එනවා පොඩි වැස්සටත් කරන්ට් එක නෑ

## කඳුකර වැසියන්ගෙන් මැසිවිලි



අයහපත් කාලගුණික තත්ත්වයක් හමුවේ වර්ෂාවක් හෝ සුළං තත්ත්වයක් ඇතිවූ විගස දිනකට දහ පහළොස් වරකටත් වඩා විදුලිය විසන්ධි වීම දිගින් දිගටම සිදුවෙද්දීත් නිසි පිළියමක් යොදන්නට නොහැකි නම් ලංකා විදුලිය බල මණ්ඩලය කුමකට දැයි කඳුකරයේ විදුලිය පාරිභෝගික ජනතාව විමසයි. නිසි කලට මනු කියවන්නා පැමිණ විදුලි බිල ලබා දීමත්, බිල් පත් නොගෙවන අවස්ථාවන්වලදී විදුලිය විසන්ධි කිරීම නිසි අයුරින් සිදු කරන ලංකා විදුලිය බල මණ්ඩලයට පාරිභෝගිකයා අපහසුතාවට පත් නොකර අඛණ්ඩව විදුලිය ලබා දිය නොහැක්කේ මන්දැයි චෝදනා කරති.

මධ්‍යම කඳුකරයේ බටහිර බෑවුම් ප්‍රදේශයට වාර්ෂාව ඇද හැළීම හෝ සුළං තත්ත්වයක් ඇතිවූ වහාම ජනතාව විටෙන් විට සිදු වන විදුලිය විසන්ධි වීම් නිසා දැඩි අපහසුතාවට පත්වේ. රජයේ කාර්යාල, පෞද්ගලික ආයතන හා සේවා ස්ථාන, වෙළෙඳසල් හිමියන් මෙන්ම ගෘහිණියෝ හා නිවැසියන් ඇතුළු සමස්ත ජනතාවට මෙම තත්ත්වය දැඩි පීඩාවක් බවට පත්ව ඇති බවට මැසිවිලි නගති.

විශේෂයෙන් කර්මාන්ත ශාලා හා සේවා ස්ථානවල යන්ත්‍ර ක්‍රියාත්මක කළ නොහැකි වීම හා නිවාසවල විදුලි උපකරණවලට විදුලිය විටෙන් විට සම්බන්ධ වීම හා විසන්ධි වීම තුළ හානි සිදුවේ. වෙළෙඳසල්වලට දෛනික කටයුතුවලට බාධා මතුවන අතර ශීතකරණය තුළ වූ ආහාර ද්‍රව්‍ය විනාශ වේ.



මේ නිසා විශාල ආර්ථික පාඩුවක් ද ඔවුන් අත් විඳිමින් සිටින බව පවසති.

අත්‍යාවශ්‍ය සහතික වන උප්පැන්න, විවාහ, මරණ සහතික ලබා ගැනීමට හා ආදායම් බලපත්‍ර ලබා ගැනීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට පැමිණි ජනතාවට පැය ගණන් බලා සිට හිස් අතින් යන්න වූ වාර අනන්තය. එම නිසා විදුලියබල ඇමතිවරයාගේ මැදිහත් වීමෙන් හෝ මුදල් ගෙවා සේවාවක් ලබන පාරිභෝගික ජනතාවට නිසි සේවයක් සැලසීමට කටයුතු කරන මෙන් ඔවුහු ඉල්ලා සිටිති.

මේ සම්බන්ධයෙන් ලංකා විදුලියබල මණ්ඩලයේ විධායක නිලධාරිවරයකුගෙන් කළ විමසීමකදී පැවසුවේ වර්ෂාව සහ සුළඟ සහිත අවස්ථාවලදී විදුලිය සැපයුම් රැහැන් පද්ධතියට ගස්වල අතු වැදීම, ගස් කඩා වැටීම මෙන්ම සැපයුම් රැහැන් හා කණු පද්ධතියට හානි සිදුවීම නිසා විටෙන් විට විදුලිය ඇණ හිටීම සිදු වන බවයි. මෙම තත්ත්වයන් යථා පරිදි සකස් කිරීමට කාර්යමණ්ඩලය දිවා රෑ නොබලා දැඩි දුෂ්කරතා හමුවේ කැපවීමෙන් කටයුතු කරමින් සිටින බවයි.

■ බී.ඒ.එන්. ශාන්ත කුමාර - කටුපොත

# යෞවන සමාජ පිහිටුවීමේ වැඩසටහනක්

ජාතික තරුණ සේවා සභාවේ කුරුණෑගල දිස්ත්‍රික් කාර්යාලය මෙහෙයවීමෙන් යෞවන සමාජ පිහිටුවීමේ වැඩසටහනක් ජාතික තරුණ සේවා සභාවේ වයඹ පළාත් අධ්‍යක්ෂ එම්.ඩී. ගුණසේන මහතා උපදෙස් පරිදි ආරම්භ කර තිබේ.

මෙම වැඩසටහන යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයට අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 30ට අයත් ග්‍රාම සේවා වසම් 1,610ක් තුළ යෞවන සමාජ 1,610ක් පිහිටුවීමට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල සේවය කරන තරුණ සේවා නිලධාරීන්ගේ මාර්ගයෙන් ආරම්භ කිරීම සඳහා අවශ්‍යය කටයුතු යොදා ඇති බව කුරුණෑගල දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂ ඩබ්ලිව්.එම්. වසන්ත මහතා පැවසීය.

■ කළුතර මධ්‍යම විශේෂ

# මත් විරෝධී ස්වේච්ඡා පුහුණු නිලධාරීහු සමාජ සේවයට බඳවා ගනිති



කොළඹ අන්තරායකර ඖෂධ ජාතික මණ්ඩලයේ සහ කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය මත්ද්‍රව්‍ය නිවාරණ ඒකකය හා දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකක නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් පසුගිය දිනවලදී කළුතර දිස්ත්‍රික් ගුරුවරුන්, මත්ද්‍රව්‍ය විරෝධි ස්වේච්ඡා පුහුණු නිලධාරීන් ලෙස සමාජ සේවයට බඳවා ගැනීමේ වැඩසටහනක් දියත් කළේය. කළුතර දිසාපති කාර්යාලයීය ශ්‍රවණාගාරයේදී දින තුනක් පුරා පැවැති මෙම කාලීන වැදගත් වැඩසටහනේදී ආරම්භක දේශනය පවත්වමින් කළුතර දිස්ත්‍රික් මත්ද්‍රව්‍ය නිවාරණ හා පුහුණු නිලධාරිනි චාමලී ජීවන්ති මහත්මිය පැවසුවාය.

■ අජිත් ගංගොඩ - උඩදුම්බර සමූහ

# කිරි නිෂ්පාදන පුහුණු වැඩමුළුවක්

මධ්‍යම පළාතේ කිරි ආශ්‍රිත නිෂ්පාදන පිළිබඳව උනන්දුවක් දක්වන කාන්තාවන් වෙනුවෙන් කිරි නිෂ්පාදන කිරීමට අවශ්‍ය නිපුණතාව ලබා දීමේ පුහුණු වැඩසටහනක් ගන්නෝරුව අඛණ්ඩ අධ්‍යාපන ආයතනයේ දී පසුගියදා පැවැත්විණි.

මෙම පුහුණු වැඩසටහන සඳහා මධ්‍යම පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය පශු වෛද්‍ය කාර්යාල හරහා අයැදුම් කරන ලද ව්‍යවසායකයන් 28 දෙනෙක් සහභාගී වූහ. පුහුණු වැඩසටහනේ සම්පත් දායකත්වය හා අනෙකුත් පහසුකම් සැපයීම සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය මඟින් සිදු කරනු ලැබීය. පුහුණු වැඩසටහනේ දී පනීර්, අයිස් ක්‍රීම් හා යෝගට් නිෂ්පාදන කිරීම පිළිබඳව ප්‍රයෝගික ක්‍රියාකාරකම් මඟින් පුහුණුලාභීන් දැනුම්වත් කෙරිණි.




මේ වැඩසටහන පැවැත්වූ අවස්ථාවට මධ්‍යම පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අතිරේක පළාත් අධ්‍යක්ෂ ඇතුළු නිලධාරීන් සහ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ නිලධාරීහු සහභාගී වූහ.

■ ප්‍රසන්න පත්මසිරි - ඌව පළාත් සමූහ

# ගමකට පොරොන්දු දීලා දැන් ගමට එන්නෙවත් නෑ

## ලුණුගල මඩුවත්ත වැසියෝ කියති



ආර්.ඩබ්. චන්ද්‍රසිරි



සුමිත් නිලංග



තිළිණි නිසංසලා

ලුණුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මඩුවත්ත ගම්මානයේ පවුල් 70ක ගැමියන් කිසිදු පොදු පහසුකමක් නොමැතිව අසරණ වී සිටිති.

"මඩුවත්ත" පෞරාණික ගම්මානයකි. මේ ගමට මාර්ග, ජලය ඇතුළු පොදු පහසුකම් කිසිවක් නොමැතිව ජනතාව වසර සිය ගණනක් තිස්සේ ගොවිතැනින් දුක්ඛිත ජීවිතයක් ගෙවති.

මේ සම්බන්ධයෙන් අදහස් දැක්වූ ඩබ්ලිව්.එම්. තිළිණි නිසංසලා,

දේශපාලකයෝ එන්නේ ජන්දයට විතරයි. වසර ගණනාවක් තිස්සේ අපේ ගමට දුන්න පොරොන්දු මේ වන තෙක් ඉටු කරලා නෑ. අපි හැමදාම අසරණයි. ජන්දය ඉල්ලන්න ගමට එන දේශපාලකයෝ දිනපුවාම ඒ අය පිළිගන්න අපිට ප්‍රධාන පාරට එන්න කියනවා. ගැබිනි මවුවරුන් සැතපුම් දහයක් පා ගමනින් සායන සඳහා යන්න ඕනි. ත්‍රිවිලරයකට බදුල්ල ලුණුගල පාරේ සිට ගමට එන්න රුපියල් 1,800ක් ගන්නවා ඒත් එන්න පාරක් හරියට නෑ. රජයෙන් ගමට පාරවත් හදලා දුන්නා නම් ඇති ගමේ මිනිස්සු විඳින දුක මේ රටේ කාටවත් පේන්නේ නෑ.





ආර්.ඩබ්ලිව්. චන්ද්‍රසිරි,

'ගමේ වී, රබර්, ගම්මිරිස්, හේන් වගාව තිබුණත් රිළවුන් වගාවන් විනාශ කරනවා. ගමේ කුඹුක්කන් ඔය හරස් කරලා පෞද්ගලික ආයතනයක් ජල විදුලි බලාගාරයක් හැදුවා සැතපුම් දෙකක් දිගට ඔයේ ජලය සිඳිලා. ඔයෙන් වතුර ගත්ත කුඹුරු අක්කර 37ක් දුන් පුරන් වෙලා මේ ගැන කාට කීවත් වැඩක් නෑ බලධාරීන්ට ඕනි විදියට ගමේ දූෂණ වැඩ සිදු වෙනවා.'

ආර්.ඩබ්ලිව් සුමිත් නිලංග මහතා,

'ගමට කිසිම පොදු පහසුකමක් නෑ හැමදාම දේශපාලකයෝ අපිව රවටනවා දරුවන්ට ඉගෙන ගන්න පහසුකමක් නෑ මේ අහිංසකයන්ගේ දුක ජනපතිතුමාව යොමු වේවා.'

■ කළුතර මධ්‍යම විශේෂ

# කළුතර නව දිසාපති වැඩ භාර ගනී

ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයේ හිටපු අධ්‍යක්ෂ ජනරාල් ගීගනගේ ප්‍රසන්න ජනක කුමාර මහතා, කළුතර මහ දිසාපති, කළුතර දිස්ත්‍රික් ලේකම් තනතුරේ ඉකුත්දා (16) කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය නිල මැදිරියේදී සුබ මොහොතින් වැඩ භාර ගත්තේය.

සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලයේ උත්තරීතර ලේකබාධිකාරී, බස්නාහිර පළාත් ප්‍රධාන සංඝ නායක, කොරොස්දූව වජ්‍රකොත් පුරාණ විහාරාධිපති, ශාස්ත්‍රපති ගෝනදූවේ ගුණානන්ද, පාලි හා බෞද්ධ විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය නෙළුවේ සුමනවංශ යන නාහිමිවරුන් ඇතුළු මහා සංඝයා වහන්සේලාගේ සෙත් පිරිත් සජ්ඣායනා හා ආශිර්වාද මැද්දේ වැඩ භාර ගත්තේය.

■ ගාල්ල දිසා සමූහ

# දකුණේ පොල් ලෙලි හා කටුවල හිඟයක්

දකුණු පළාත තුළ පොල් ලෙලි හා පොල් කටුවල හිඟයක් පවතින බව දකුණු පළාතේ කොහු කර්මාන්තයේ නිරත කර්මාන්තකරුවෝ පවසති. මෙම තත්ත්වය නිසා සිය කර්මාන්ත කරගෙන යෑමේ දී දැඩි අසරණ තත්ත්වයට පත්ව ඇති බවද ඔවුහු පෙන්වා දෙති.

පොල් ලෙල්ලක මිල රුපියල් 3.50ක් දක්වා වැඩිවී ඇති බව පවසන කොහු කර්මාන්තකරුවෝ පොල් කටු කිලෝවක මිල රුපියල් 20 දක්වා වැඩි වී ඇති බවද ඔවුහු පෙන්වා දෙති.

මේ සම්බන්ධව පොල් සංවර්ධන අධිකාරියේ ක්ෂේත්‍ර නිලධාරී ඒ.ජී.එස්. රංගජීව මහතාගෙන් අප කළ විමසුමකදී ඔහු මෙසේ පැවසීය.

"පොල් ලෙලි හා පොල් කටුවල හිඟයක් තියෙනවා. පොල් එළදාව අඩුවීමත් මෙයට එක් හේතුවක්. ඊට අමතරව දකුණු පළාතේ පොල් ලෙලි වැඩි මිලට කුරුණෑගල ප්‍රදේශයට රැගෙන යන බවටත් ආරංචියක් තියෙනවා. ඒ විතරක් නෙවෙයි ඇතමුන් පොල් ලෙලි කපලා රට පටවනවා. එය ලාභදායි ව්‍යාපාරයක් බවට පත්වෙලා තියෙනවා. රුපියල් 2.50ට තිබූ පොල් ලෙල්ල රුපියල් 3.50 දක්වා වැඩිවෙලා තියෙනවා.

■ නුවන් ජයසේකර - සූරියවැව විශේෂ

# පොලිස් ස්ථානාධිපතිවරුන් ලෙස රඟමින් සල්ලි ගරලා

හුංගම හා වීරකැටිය පොලිස් ස්ථානයේ පොලිස් ස්ථානාධිපතිවරු ලෙස පෙනී සිටිමින් දුරකතනය ඔස්සේ ව්‍යාපාරිකයන්ගෙන් මුදල් ගැරීමේ ජාවාරමක නිරත වූ බව කියන පුද්ගලයකු හුංගම හා වීරකැටිය පොලිස් ස්ථාන දෙකෙහි නිලධාරීන් විසින් සිදු කළ විශේෂ මෙහෙයුමකදී පසුගියදා (15) සවස අත්අඩංගුවට ගෙන තිබේ.

මෙලෙස අත්අඩංගුවට ගෙන ඇත්තේ නුවර, අංකුඹුර, උඩකිතුල්ගොල්ල, ගල්හින්න පදිංචි 39 හැවිරිදි විවාහක පුද්ගලයෙකි.

සැකකරු පසුගියදා (05) තමන් හුංගම පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා බවත් ගමනක් යමින් සිටියදී වාහනය අතරමගදී කාර්මික දෝෂයකට ලක්ව ඇති බවත් ඒ සඳහා මුදල් ටිකක් අවශ්‍ය බවත් පවසමින් හුංගම ප්‍රදේශයේ ව්‍යාපාරිකයන් 06 දෙනකුට දුරකතනය ඔස්සේ කතා කර ඊසි කෑෂ් ක්‍රමයට මුදල් ගෙන්වාගෙන තිබේ. මේ පිළිබඳව හුංගම පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ක්‍රිෂාන්ත සම්පත් ජයසිංහ මහතාට දැන ගැනීමට ලැබීමෙන් පසු වහාම සිද්ධිය පිළිබඳව තංගල්ල කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී රවීන්ද්‍ර අඹේපිටිය මහතා දැනුවත් කිරීමෙන් පසු ඔහුගේ උපදෙස් පරිදි පරීක්ෂණ ආරම්භ කර තිබේ.

■ සී. ගමගේ - සොරණාතොට සමූහ

# සහෝදරයාට පහරදී නිවෙසටත් ගිනි තියලා

කොස්ලන්ද ලේමස්තොට ප්‍රදේශයේ නිවෙසක සිටි සිය බාල සහෝදරයට අතින් පයින් පොල්ලකින් පහරදී තුවාල සිදු කර නිවෙසට ගිනි තබා රුපියල් 45,000ක පමණ අනර්ථයක් සිදු කළැයි සැකපිට වැඩිමහල් සහෝදරයකු පසුගියදා (16) අත්අඩංගුවට ගත් බව කොස්ලන්ද පොලීසිය පවසයි.

මෙසේ අත්අඩංගුවට ගෙන ඇත්තේ කොස්ලන්ද ලේමස්තොට වනසිංහගම ප්‍රදේශයේ පදිංචි 34 හැවිරිදි පුද්ගලයකු යැයි පොලීසිය කියයි.

පහරකෑමෙන් තුවාල ලැබූ බාලසහෝදරයා කොස්ලන්ද රෝහලට ඇතුළත් කොට ඇත.

මෙම පුද්ගලයා සිය සහෝදරයකුගේ නිවෙසක රාත්‍රී සිටියදී පැමිණ ඇති සැකකරු එක්වරම මොහුට අතින් පයින් පොල්ලකින් පහරදී ඇති අතර ඒ සමගම තුවාලකරු නැන්දාගේ නිවෙසට දිවගොස් බේරී ඇති බවත් පොලීසිය සඳහන් කළේය.

ඌව සබරගමුව පළාත් භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රොෂාන් ප්‍රනාන්දු, බදුල්ල දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති රොෂාන් විජේසිංහ, බණ්ඩාරවෙල ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි අතුල ද සිල්වා ඇතුළු නිලධාරීන් වැඩිදුර පරීක්ෂණ පවත්වති.

■ ඩබ්ලිව්.පී. ධර්මසේන - මාතර සමූහ

# පෙම්වතුන් ජෝඩුවක් කොල්ල කෑ හොර යුවළක් අත්අඩංගුවට

මාතර මුහුදු වෙරළේදී පෙම්වතුන් යුවළකගේ ගෙලකපා රුපියල් 304,000ක් වටිනා යතුරුපැදියක් සහ මුදල් රුපියල් 15,000ක් කොල්ලකා පලාගිය සැකකාර පෙම්වතුන් යුවළක් මාතර පොලීසිය විසින් අත්අඩංගුවට ගෙන ඇත.

සැකකරු මාවනැල්ල පදිංචි 23 හැවිරිදි අයෙක් වන අතර සැකකාරිය බුත්තල කුඩාඔය පදිංචි 23 හැවිරිදි තැනැත්තියෙකි. කඹුරුගමුව පදිංචි පෙම්වතුන් යුවළක් පසුගියදා රාත්‍රී 7.00ට පමණ මාතර මුහුදු වෙරළට පැමිණ ඇත. එම අවස්ථාවේ මෙම සැකකාර යුවළ ඒ ආසන්නයේ බංකුවක් මත වාඩිවී පෙම් බස් දොඩමින් සිටින බව අඟවා ටික වේලාවකින් එම ස්ථානයෙන් නැගිට කඹුරුගමුවේ පදිංචි පෙම්වතුන් යුවළ අසුන්ගෙන සිටි බංකුවට පිටුපසින් පැමිණ එම යුවළගේ දෑස්වලට මිරිස්කුඩු ගසා තර්ජනය කර යතුරුපැදියේ යතුර, බලපත්‍ර සහ මුදල් පසුම්බිය උදුරාගෙන කඹුරුගමුව පදිංචි පෙම්වතියගේ රුපියල් 15,000ක් වටිනා ජංගම දුරකතනය ද උදුරාගෙන යතුරුපැදියෙන් පලාගොස් තිබිණි.

■ මීගහකිවුල කුමාර

# නැන්දම්මා - ලේළි හබයෙන් 2ක් රෝහලේ

නැන්දම්මා ලේළි හබයක් දුර දිග ගොස් එකම පවුලේ සාමාජිකයන් දෙපිරිසක් අතර පසුගියදා (15) සවස ඇති වූ ගැටුමකින් බරපතළ තුවාල ලැබූ මවක් හා දියණියක් බදුල්ල පළාත් මහ රෝහල වෙත ඇතුළත් කර ඇති අතර සිද්ධිය සම්බන්ධයෙන් රෝහල් ගතවූ එක් කාන්තාවකගේ සැමියා සහ නැන්දම්මා සැකපිට අත්අඩංගුවට ගෙන ඇතැයි කන්දකැටිය පොලීසිය පවසයි.

මීගහකිවුල පුවක්ගහවත්ත ගම්මානයේ පදිංචි වයස අවුරුදු 20ක එක් දරු මවක් හා 47 හැවිරිදි ඇයගේ මව සිද්ධියෙන් රෝහල්ගත කර ඇත.

රෝහල්ගත කර සිටින තරුණ මවගේ සැමියා හා ඔහුගේ මව සිද්ධිය සම්බන්ධයෙන් සැකපිට අත්අඩංගුවට ගෙන ඇත.

■ අශෝක සේනාරත්න - අනුරාධපුර සමූහ

# ගම්පෙරළියෙන් ගම කාලා




## ● පාර මැද වළක්: ඒ වළේ මී හරක් නානවා ගම්බිරිගස්වැව වැසියෝ කියති

යහපාලන රජය සමයේ ගම්පෙරළිය වැඩසටහන යටතේ රුපියල් ලක්ෂ විස්සක මුදලක් වැය කර ප්‍රතිසංස්කරණය කළ කැබිතිගොල්ලෑව ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයේ හේන්කෙටිගම සිට ගම්බිරිගස්වැව තෙක් ඇති මාර්ගය ඉදිකිරීමේදී කොන්ත්‍රාත්කාරුවන් සහ නිලධාරීන් එක් වී රජයේ මුදල් ගසා කා ඇති බවට ගොවිහු චෝදනා කරති.

2019 වර්ෂයේදී මෙහි ඉදිකිරීම් කටයුතු සිදු කෙරිණි. ගම්බිරිගස්වැව, මහවැව, කුඩා කදුරුවැව, මහබෙල්ලන්කඩවල හා මහකඳුරුවැව යන ගොවි ගම්මාන වලට යාමට ඒමට මෙම මාර්ගය ඉදිකිරීමෙන් ඉහමත් සෙතක් සැලසෙන බව ගොවිහු පෙන්වා දෙති.

මෙම මාර්ගයේ ප්‍රතිසංස්කරණ කටයුතු සම්බන්ධයෙන් පාරම්පරික ගොවි මහතෙකු වන ආර්. ජෝතිපාල මහතා මෙසේ පැවසීය. ගිය අවුරුද්දේ (2019) කැබිතිලිගොල්ලෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරියෙක් මේ පාර බලන්න ආවා. ඇවිත් කිව්වා කිලෝ මීටර් එකයි කාලක් ප්‍රතිසංස්කරණය කරන්න මුදල් වගයක් ඇවිත් තිබෙනවා කියලා මේ අවුරුද්ද අවසන් වීමට



ජෝතිපාල



ජයරත්න

ඉස්සල්ලා මේ පාර හැදුවේ නැත්නම් මුදල් ආපසු යන බව කීවා.

එහෙම කියලා නොවැම්බර් 26 වෙනිදා වැහි කාලයේ බැකෝ යන්ත්‍රයක් එව්වා. එදා බැකෝ යන්ත්‍රයෙන් පාර කපන්න හැදුවා. අධික තෙතමනය නිසා පාර කපන්න බැරි වුණා. අයෙත් දෙසැම්බර් මාසයේ බැකෝ යන්ත්‍රයක් ගෙනත් එක දවසට පාර හුරාගෙන ගියා. පාර මැද්දේ වළක් තිබුණා. වළ මග හරවලා පාර එතනින් විශාල ඇදයක් කරලා කපලා එතනට බොක්කුවක් දාලා තිබෙනවා. බොක්කුව බැඳලා තිබෙන්නේ වළ මග හරවලා . ඒක බැන්දට බෝක්කු උඩින් මිනිසුන්ට යන්න එන්න බැහැ. බොක්කුව පොළොව උඩට මතු වෙන්න තිබෙන්නේ බෝක්කුව වැහෙන්න පස් දාලා නෑ. පාර බැකෝ යන්ත්‍රයෙන් කපලා හැදුවට දෙපස කාණු කපලා නැහැ. මෙච්චර මුදල් කන්දරාවක් වැය කරලා පාර හැදුවට ට්‍රැක්ටරයකටවත් මේ බෝක්කුවෙන් යන්න බෑ. පාර මැද තිබුණු වළේ මී හරකුන් නිදියනවා. මේවා නිලධාරින්ට පෙන්නේ නැද්ද.

මම මේ පාර සම්බන්ධයෙන් සොයා බලන්න කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය ලේකම්වරයා හම්බවෙන්න ගියා. ඔහු මට කිව්වා මේ පාර කපන්න ඇස්තමේන්තු කරලා නැති නම් කාණු කපන්න බෑ කිව්වා. කාණු කපන්නේ නැතිව පාරවල් හදන රටක් තියෙනවද කියලා මම අහනවා. දෙපස කාණු නැතුව පාර හදන්න ඇස්තමේන්තුව අනුමත කෙරුවේ කවුද කියලා අපි අහනවා.

යූ. ජයරත්න මහතා - මේ පාර හදන්න කොන්ත්‍රාත්තුව දිලා තිබෙන්නේ බෙල්ලන්කඩවල ගොවි සංවිධානයට අල්ලපු ගමේ ගල්කඩවල ගොවි සංවිධානයට කොන්ත්‍රාත්තුව දිලා නෑ. අපට පෙනෙනවා මෙකෙන්ම යටි මගඩියක් ගහල තිබෙන බව . නොවැම්බර් මාසයේ මඩ තල්ලු කරලා සල්ලි ටික ගන්න ආපු වෙලාවේ අපි කිවුවා මඩේ පාර හදන්න එපා කියලා . බොරළු අරගෙන ආපු ලොරියක් එදා පාරේ එරිලා තියෙනවා. කැබිතිගෝලෑව ප්‍රාදේශීය ලේකම් වජිර රත්නායක මහතාගෙන් මේ පිළිබඳව කළ විමසුමකදී මෙසේ පැවසීය. ගම්පෙරලිය වැඩසටහන යටතේ මේ පාර හදන්න මුදල් වෙන් කළා. පාර හදන්න මුදල් වෙන් කිරීමේදී කාණු කපන්න ඇස්තමේන්තු කරලා නෑ. බෙල්ලන්කඩවල ගොවි සංවිධානයට පාරේ අඩුපාඩු සම්පුර්ණ කරන්න මම දැනුම් දුන්නා.

■ මීගහකිවුල සමූහ

## කට්ටියට හඳට යන්න බයිට් එකට අරවා දාලා

දෙයියෝ සාක්කි

තම ආයතනයේ සහෝදර සේවක පිරිසක්ද සමග මත්පැන් සාදයකට සහභාගීවී මත්පැන් ප්‍රතික්ෂේප කොට කටගැස්ම පමණක් අනුභව කරමින් විනෝද වූ තරුණයකු මත්පැන් පානය කළ පිරිසටත් පෙර පදමට වෙරි වී යකා නටන්නට වූ බව කියැවෙන පුවතකි. සිද්ධිය මෙසේය.

ඔවුහු එකම ආයතනයක සේවක පිරිසකි. මිතුරකුගේ නිවසක පැවති සාදයකට සියලු දෙනා සහභාගි වූයේ ඔවුන් විසින් එකතු කරගත් මුදලින් මිලදී ගත් තෑග්ගක්ද රැගෙනය. සාදය වෙනුවෙන් ඉස්තරම්ම වර්ගයේ බීම වර්ග මෙන්ම මස් සහ මාළු වර්ග වලින් කට ගැස්ම ද පිළියෙල කර තිබිණි. පිරිසේ සිටි එක් අයකු තමුන් මත්පැන් නොබොන බව පවසමින් මිතුරන් සමග කාලය ගත කරන්නට වූයේ එහි තිබූ කටගැස්ම පමණක් ආහාරයට ගනිමිනි.

සාදය ඇදීගෙන යද්දි මත්පැන් පානය කළ බොහෝ දෙනකු ගීත ගායනා කරමින් එකිනෙකාට උසුළු විසුළු කරමින් සතුටු වන්නට වුවද කටගැස්ම පමණක් අනුභව කළ තරුණයා පසෙකට වී සිනහවෙමින් බලා ගත් අත බලා සිටියේ මිතුරු පිරිසද අන්ද මන්ද කරමිනි.

මිතුරකු ඔහු වෙත ගොස් කාරණය කුමක්දැයි විමසද්දී කටගැස්ම පමණක් අනුභව කළ තරුණයා ඔහුගේ ඇගට කඩා පැන නන් දොඩන්නට වූයේ නිවැසියන් පවා තිගස්සමිනි." මහත්තයෝ බයිට් එක හදද්දී ඒකට අරව මිටියකුත් අඹරලා දැම්මා (ගංජා මිටියක් ) අර මහත්තය බයිට් ඒක වැඩිපුර කාගෙන යද්දී අපි ඕක වෙයි කියලා හිතුවා" යනුවෙන් සිද්ධිය දෙස බලා සිටි නිවසේ අත් උදව්වට පැමිණි අසල්වැසියකු කියා සිටියේ මිතුරන් පිරිසගේ නළල රැළි ගන්වමිනි.



දිනමිණ දසත දස අත ම එක තැන

■ මිහිර විජේසේකර - මාරවිල සමූහ

## කල්පිටියේ දෙළුම් වගාව ඉවරෙටම ඉවරයි

කල්පිටියේ දෙළුම් වගාව ප්‍රචලිත කිරීමට රාජ්‍ය නිලධාරීන් මැදිහත් නොවීම හේතුවෙන් වගාකරුවෝ දැඩි අසීරුතාවකට පත්ව ඇති බව කියා සිටිති.

ලබා ගන්නා අස්වැන්න සඳහා නිසි මිලක් නොමැතිවීමත්, වගාවන්ට සිදුවන හානියත් හේතුවෙන් දෙළුම් වගාව නිසි ලෙස පත්වාගෙන යාමට නොහැකි තත්ත්වයක් උදාවී ඇති බවද පෙන්වා දෙති.

කල්පිටිය අර්ධද්වීපයේ විවිධ ප්‍රදේශ වල අක්කර දෙසීයකට ආසන්න ප්‍රමාණයක් දෙළුම් වගාව කරගෙන යන වගාකරුවන් පනහකට වැඩි ප්‍රමාණයක් පූර්ණ වශයෙන් වගාවේ නිරතව සිටිති.

1996 වසරේ ආරම්භ කළ කල්පිටියේ දෙළුම් වගාව මේ වන විට යම් සාර්ථක මට්ටමක පැවතියද වගාකරුවන් පවසන්නේ තමන්ට නිසි දැනුම හා තාක්ෂණය ලබා දීමට රජය මැදිහත් වන්නේ නම් රටේ පවතින දෙළුම් අවශ්‍යතාවය සපුරාලීමට හැකි බවටයි.

**දෙළුම් වගාවේ නිරත වගාකරුවකු වන එස්.එච්.එම්. අස්මි මහතා -**

" කල්පිටිය භූ විෂමතාව අනුව දැවැන්ත වැලි සහිත භූමියක් බව කිව යුතුයි. නමුත් මේ භූමියේ වගාවන් කරන්න පස සරු කළ යුතුයි . එලෙස තමා මේ බිම සාරවත් කරලා වගාවන් ආරම්භ කරන්නේ . ඒ වුණත් මේ බිමේ අපි දෙළුම් වගාව විශාල මහන්සියක් ඇතිව ආරම්භ කරලා කරද්දි විවිධ අභියෝග එල්ල වෙනවා එය තමා දෙළුම් වගාවට ඇති බරපතළම ගැටළුව. දෙළුම් වගාවේ හොදම අස්වැන්න විනාශ වෙනවා .ඉතිරි වන්නේ සුළු ප්‍රමාණයක් විතරයි .ඒ තරමට දෙළුම් වගාවට හානි සිදුවෙනවා.

අනික මේ වගාවට කෘමි හානි සේම වන සතුන්ගෙන් එල්ල වන හානිය වැඩියි. මේ නිසා වගාවන් ආරක්ෂා කර ගන්න අපි විශාල වෙහෙසක් ගන්නවා. අපේ දෙළුම් ගෙඩියක් වෙළඳපොළේ අධික මුදලකට ගියත් අපිට ලැබෙන්නේ සොච්චම් මුදලක්. අදාළ බලධාරීන් අවශ්‍ය පියවර ගත්තොත් විදේශයෙන් එන දෙළුම් වෙනුවට අපේ රට කල්පිටිය දෙළුම් වලින් සරුකරන්න අපිට හැකියාව තිබෙනවා..



මේ පිළිබඳව කළ විමසීමේදි පුත්තලම **නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ ඩබ්ලියු .එම්.එස් .වන්නිනායක -**

"අපේ නිලධාරින්ගේ පැත්තෙන් මැදිහත් විම අඩු වුණේ මොකද කියලා මම සොයා බලන්නම් .ඇත්තටම මේ පිළිබඳව අපි මැදිහත් විය යුතුයි . ඒ නිසා මම දැන්ම අපේ කල්පිටිය බාරව සිටින නිලධාරීන්ව දැනුවත් කරන්නම් . අනික අපිට කල්පිටියට නිලධාරී හිගයක් තදින් තිබෙනවා . ඒ නිසාම යම් යම් ගැටළු මතු වෙන්න ඇති කියලා හිතෙනවා.

■ සී .ගමගේ - සොරණාතොට සමූහ

## ගිනි අවි සමඟ දෙදෙනෙක් අසුවෙති

නිවසක සහ කුඹුරක සඟවා තිබූ බෝර 12 පතරොම් තුවක්කුවක් , බෙහෙත් කොටන වර්ගයේ තුවක්කුවක් සමඟ සැකපිට පුද්ගලයන් දෙදෙනකු පස්සර හිගුරුකඩුව තොලබෝවත්ත ප්‍රදේශයේ දී අත්අඩංගුවට ගත් බව පස්සර පොලිසිය පවසයි .

පස්සර හිගුරුකඩුව හෙල්අගල ප්‍රදේශයේ කුඹුරක සඟවා තිබූ මෙරට නිෂ්පාදිත බෙහෙත් කොටන වර්ගයේ තුවක්කුවක් සමඟ 35 හැවිරිදි පුද්ගලයකුද, පස්සර තොලබෝවත්ත ප්‍රදේශයේ නිවසක සඟවා තිබූ බෝර 12 පතරොම් තුවක්කුවක් සමඟ 45 හැවිරිදි පුද්ගලයකු මෙසේ අත්අඩංගුවට ගනු ලැබූ බවද පොලිසිය පැවසීය . ලැබුණු තොරතුරක් මත පස්සර පොලිසියේ නිලධාරීන් හිගුරුකඩුව ප්‍රදේශයේ මෙම වැටලීම සිදුකර කුඹුරේ සඟවා තිබූ ගිනි අවිය අත්අඩංගුවට ගෙන ඇති අතර ,මොහු වනසතුන් දඩයම් කිරීම සඳහා මෙසේ ගිනිඅවිය සඟවා තබන්නට ඇතැයි පොලිසිය කියයි .

මීට අමතරව පස්සර පොලිස් විශේෂ කාර්ය බළකා නිලධාරීන් පස්සර පොලිසිය සමඟ එක්වී ලැබුණු තොරතුරක් මත තොලබෝවත්ත ප්‍රදේශයේ නිවසක සඟවා තිබූ බෝර 12 පතරොම් තුවක්කුවක් අත්අඩංගුවට ගනු ලැබූ බවත් ,එය කිසියම් අපරාධයක් කිරීමේ අරමුණින් මෙසේ සඟවා තබන්නට ඇතැයි පොලිසිය සැකකරයි .

■ රවීන්ද්‍ර ලියනගේ - හිනිදුම විශේෂ

## ළිඳට වැටුණු ගැට කිඹුලා බූන්දල වන උයනට

ගාල්ල අක්මීමන අංකොක්කාවල, හල්ගස්මුල්ලේ ඉඩමක පිහිටි අඩි 7 ක් පමණ ගැඹුරැති ළිඳකට වැටී සිටි අඩි 9ක් පමණ දිගින් යුත් ගැට කිඹුලෙකු අල්ලා බූන්දල වන උද්‍යානය වෙත රැගෙන යාමට හික්කඩුව වනජීවි කාර්යාලයේ නිලධාරීහු කටයුතු කළහ.

කිඹුලා දුටු එම ඉඩමේ හිමිකරුවන් ඒ පිළිබඳ හික්කඩුව වනජීවි කාර්යාලයේ නිලධාරින් දැනුවත් කර තිබිණි. ඒ අනුව ප්‍රදේශවාසීන්ගේ ද සහයෝගය ඇතිව එම කිඹුලා ගොඩට ගෙන, මුදාහැරීම සඳහා බූන්දල වන උද්‍යානය වෙත රැගෙන යාමට කටයුතු කළ බව වනජීවි අඩවි ආරක්ෂක ශාන්ත නන්ද මහතා පැවසීය.

■ රසුල දිල්හාර ගමගේ - උතුරු පළාත් විශේෂ

## කඩු කල්ලියකින් නිවෙසකට ප්‍රහාරයක්



යාපනයේ කෝණ්ඩාවිල් දකුණ අරසඩි ප්‍රදේශයේ පිහිටි නිවසකට යාපනයේ ක්‍රියාත්මක කඩු කල්ලියේ සාමාජිකයන් පිරිසක් විසින් ප්‍රහාරයක් එල්ල කොට තිබේ.

මේ ප්‍රහාරය සඳහා පැමිණි පිරිස නිවසට පහර දී අලාභ සිදු කිරීමෙන් පසුව නිවස ඉදිරිපිට නවතා තිබූ වෑන් රථයකට හා යතුරු පැදි දෙකකටද දැඩි හානි සිදු කොට ඇත.

ප්‍රහාරය සඳහා යතුරු පැදි කීපයක නැගුණු තරුණයන් පිරිසක් පැමිණි බවත් ඔවුන් සියලුම දෙනා මුහුණු ආවරණය කරගෙන සිටි බවත් නිවෙස් හිමියා පොලීසියට ප්‍රකාශ කොට තිබේ.

යාපනය පොලීසිය මෙම සිද්ධිය පිළිබඳ පරීක්ෂණ පවත්වා ගෙන යයි.

යාපනයේ ක්‍රියාත්මක මෙම සංවිධානාත්මක අපරාධ කල්ලි මැඩ පවත්වන මෙන් ඉල්ලා මීට මාසයකට පමණ ඉහතදී උතුරු පළාත් ආණ්ඩුකාරවරිය වන පී.එම්.එස්. චාර්ල්ස් මහත්මිය විසින් ආරක්ෂක ලේකම්වරයාට ලිපියක් යවා තිබූ අතර එම ලිපිය යැවීමෙන් පසුව යාපනයේ කල්ලි විසින් යාපනයේ සිදු කළ හත් වෙනි ප්‍රහාරය මෙය වෙයි.

මෙම ප්‍රහාරය එල්ල කරණ ලද්දේ කවර කල්ලියක් විසින්ද යන්න මෙතෙක් හෙළි වී නොමැත.

■ රත්නපුර විශේෂ

## ගොඩනැඟිල්ලේ ඉදිකිරීම් අතර මඟ ඇයි?



රත්නපුර මිහිඳුගම ප්‍රදේශයේ පෙරපාසල් දරුවන් සඳහා 2000 වසරේදි අලුතින් ඉදිකර අතරමග නවත්වා දමා ඇති පෙර පාසල් ගොඩනැගිල්ලයි මේ.

මෙම ගොඩනැගගිල්ල ඉදිකිරීමට ප්‍රදේශවාසියකු විසින් ඉඩම පරිත්‍යාගකර ඇති අතර මේ සඳහා රත්නපුර මහ නගර සභාව මගින් ලක්ෂ 85ක මුදලක් හිටපු නාගරික මන්ත්‍රීවරයකු ගේ මුලිකත්වයෙන් වැය කර ඇති බවත් ගොඩනැගිල්ල ඉදිකිරීමට මේ තරම් විශාල මුදලක් වැය වී නැති බව ප්‍රදේශවාසීහු පවසති. එම අවධියේ හැටියට මේ සඳහා ලක්ෂ 30පමණක් වැය වන්නට ඇති බව ප්‍රදේශවාසීහු පවසති.

මිහිඳුගම ප්‍රදේශයේ දරුවන්ට පහසුකම් ඇති පෙරපාසල් ගොඩනැගිල්ලක් තිබියදී විශාල මුදල් ප්‍රමාණයක් වැය කර මෙවන් ගොඩනැගිල්ලක් ඉදිකිරීම ආරම්භ කළේ කාගේ වුමනාවටද? මෙම ගොඩනැගිල්ල ඉදි කිරීමේදී විශාල මුදල් වංචාව සිදුවී ඇති බැවින් මේ පිළිබඳ වහාම පරීක්ෂණයක් පවත්වා මුදල් වංචා කළ පුද්ගලයන්ට දඩුවම් කරන ලෙසත් ජනාධිපතිතුමන්ගෙන් ඉල්ලා සිටින අතරම මිහිඳුගම ප්‍රදේශයේ පෙර පාසල් දරුවන් වෙනුවෙන් රත්නපුර මහ නගරසභා මුදලින් ඉදිකිරීම් ආරම්භ කළ මෙම ගොඩනැගිල්ල ඉදිකිරීම් නවත්වා ඇත්තේ කාගේ බලපෑම් මතදැයි සොයාබලා වහාම ඉදිකරන ලෙසද ප්‍රදේශවාසී ජනතාව ජනාධිපති තුමාගෙන් සහ අගමැති තුමාගෙන් ඉල්ලා සිටිති.

■ ප්‍රසන්න පත්මසිරි - ඌව පළාත් සමූහ

## අබලන් පාරට පිළියම් යොදන්න



මැදගම-පල්ලේකිරුව මාර්ගය දැඩි ලෙස අබලන්වීම නිසා රියදුරන් හා මගී ජනතාව දැඩි අසීරුතාවයට පත්ව සිටිති. මැදගම සිට කැන්දවින්න හරහා පල්ලේකිරුවට යන මාර්ගයේ දිනකට වාහන සිය ගණනක් හා දහස් ගණනක ජනතාවක් ගමන් කරන අතර කිලෝමීටර් දහයක පමණ දුරක් මෙසේ දැඩි ලෙස අබලන්ව තිබේ.

■ ඒ.පී.දයාචන්ද්‍ර - ඌරුබොක්ක විශේෂ

## වල් ඌරුමස් විකුණුවාට දඩ

බලපත්‍රයක් නොමැතිව මිනිස් පරිභෝජනයට නුසුදුසු වල් ඌරුමස් ග්‍රෑම් 950 ක් අලෙවිය සඳහා තබා තිබූ පුද්ගයකු ඌරුබොක්ක පොලීසිය විසින් මොරවක මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු මොරවක මහෙස්ත්‍රාත් අතිරේක දිසා විනිසුරු ශශිකා මිතුන ආරච්චිගේ මෙනවිය හමුවේ වරදකරු බවට පිළිගත් සැකකරුට රුපියල් දසදහසක(10000.00)දඩ මුදලක් ගෙවන ලෙසට නියෝග කළේය. මෙසේ දඩ මුදල් ගෙවීමට නියම කළේ මොරගල අයකුටයි.

පැමිණිල්ල වෙනුවෙන් පොලිස් ස්ථානාධිපති ප්‍ර. පො.ප.සමරවික්‍රම මහතාගේ උපදෙස් මත පො.සැ.56012 පේමරත්න මහතා අධිකරණයට කරුණු දැක්වීය. මස් විකිණීම සඳහා ලබා ගන්නා ලද බලපත්‍රයක් නොමැතිව වල් ඌරුමස් අලෙවි කිරීම සිදු කරන බවට තොරතුරක් ලැබුණා. ඒ තොරතුරට අනුව ඌරුබොක්ක පොලිස් බල ප්‍රදේශයේ මොරගල ප්‍රදේශයේ සිදු කරන ලද වැටලීමකදී නිවසක මනුෂ්‍ය පරිභෝජනයට නුසුදුසු වල් ඌරුමස් ග්‍රෑම් 950 ක් අලෙවිය සඳහා තබා තිබියදී සොයා ගත්තා.

අලෙවි කිරීම සඳහා තබා තිබූ වල් ඌරුමස් වැටලීම කරන අවස්ථාව වන විටත් නරක්වී තිබූ අතර මනුෂ්‍ය පරිභෝජනයට ගත නොහැකි තත්ත්වයට නරක්ව තිබූ අතර වල් ඌරු මස් අලෙවි කිරීම සඳහා බලපත්‍රයක් තිබී නොමැත.

■ දකුණු පළාත් සංචාරක එස්. දීයගහගේ

## රියැදුරකු පහරදී සැරයන් රෝහලේ

ගාල්ල පොලීසියේ සැරයන්වරයකුට ඉමදූව ප්‍රදේශයේදී ත්‍රීරෝද රථ රියදුරකු විසින් පහරදීම නිසා සැරයන්වරයා ඉමදූව රෝහලට ඇතුළත් කර ඇතැයි ඉමදූව පොලීසිය පවසයි. පහරකෑමට ලක්ව ඇති සැරයන්වරයා සේවය නිමවා ගාල්ලේ සිට ඉමදූව බස් රථයෙන් ගොස් නිවසට යාම සඳහා රාත්‍රී අටට පමණ පැගිරිහේන හන්දියෙන් බැස එහි තිබූ ත්‍රීරෝද රථයකට ගොඩවී ඇති බවත්, යාමට සූදානම් වූ අවස්ථාවේ ත්‍රී රෝද රථ රියදුරා බීමත්ව සිටින බව දැන නතර කරන ලෙස කී විට එයට උරණ වී මෙසේ පහරදී ඇති බවත් පොලීසිය පවසයි.

සැරයන්වරයා ඉමදූව රෝහලට ඇතුළත් කර ඇති අතර සැකකාර ත්‍රීරෝද රථ රියැදුරා ඉමදූව පොලීසිය විසින් අත්අඩංගුවට ගෙන ඇති අතර ගාල්ල මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතව තිබිණ.

■ එස් දීයගහගේ - දකුණු පළාත් සංචාරක

## පිලිපීන ජාතික නැවියකුටත් කොරෝනා

කරාපිටිය රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටි පිලිපීන ජාතික නැවියකුට කොරෝනා ආසාදනය වි ඇති බවට තහවුරු වීම නිසා පසුගියදා හම්බන්තොට රෝහල වෙත රැගෙන ගිය බව ගාල්ල දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය පවසයි.

ඊජිප්තුවේ සිට චිනය බලා යාත්‍රා කරමින් සිටි නෞකාවක සේවය කළ මොහුට අසනීපවිම නිසා ගාල්ල වරායට රැගෙන්විත් කරාපිටිය රෝහලට ඇතුළත් කර ඇත.

එහිදී ඔහුට කරන ලද පී.සී.ආර්.පරික්ෂණයෙන් කොරෝනා ආසාදිතවී ඇති බවට තහවුරුවී තිබේ.

ඔහු නැවේ සිට වරාය වෙත ගෙන එනලද බෝට්ටුවේ සිටි නාවික හමුදාවේ සෙබලුන් තිදෙනාද නිරෝධායනය කිරීමට පියවර ගෙන ඇති බවත් ගාල්ල දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය පවසයි.

■ බී.එම්. විජේසූරිය - අනුරාධපුර මධ්‍යම විශේෂ

## වැඩ බලන ස්ථානාධිපති කුඹුක් ගස කපා ගෙදර ගෙනගිහින්

ගලෙන්බිදුණුවැව ගොවිජනපදයේ පිහිටි නිට්ටෑව වැවේ තිබු දශක ගණනක් පැරණි විශාල කුඹුක් ගසක් ගලනේබිදුණුවැව පොලිස්ස්ථානයේ වැඩ බලන ස්ථානාධිපතිවරයා විසින් දින කිහිපයකට ඉහතදී කපා නිවසට රැගෙන යාම සම්බන්ධයෙන් වහාම පරික්ෂණයක් පවත්වන ලෙස ගම්මානයේ වැසියන් උතුරුමැද පළාත බාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නන්දන මුණසිංහ මහතාගෙන් ඉල්ලා සිටිති. ගලෙන්බිදුණුවැව පොලිස්ථානයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරික්ෂක සුජීව කුමාර මහතා අසනීපව රෝහල් ගතවී සිටි සමයේ වැඩබලන ස්ථානාධිපති වශයෙන් කටයුතු කළ පොලිස් පරික්ෂකවරයා විසින් ඔහුට හිතවත් දැව ජාවාරම්කරුවන් පිරිසක් යොදවා කුඹුක්ගස කපාදමා එහි දැව කිසියම් ස්ථානයකට ප්‍රවාහනය කළ බව ගම් වැසියෝ අනාවරණය කළහ.

■ මීගහකිවුල සමූහ

## තඹ කළය සොරාගත් තරුණයා කොටු වෙයි

කන්දකැටිය උල්පතගම ගම්මානයේ නිවසක තිබූ තඹ කළයක් සොරකම් කළ විසිනව හැවිරිදි තරුණයකු සොරකම් කරන ලද තඹ කළය ද සමග සැකපිට අත්අඩංගුවට ගත් බව කන්දකැටිය පොලීසිය පවසයි.

මෙලෙස අත්අඩංගුවට ගෙන ඇත්තේ කන්දකැටිය උල්පතගම පදිංචි තරුණයෙකි. තම නිවසේ තිබූ වටිනා තඹ කළයක් අතුරුදහන්ව ඇති බවට නිවැසියන් කරන ලද පැමිණිල්ලක් මත සිදු කළ විමර්ශනයකදී සොරකම් කරන ලද තඹ කළය සහ සැකකාර තරුණයා අත්අඩංගුවට ගත් බව කන්දකැටිය පොලීසිය පවසයි. සොරකම් කරන කළය හා සැකකරු බදුල්ල අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතය. කන්දකැටිය පොලීසිය සිද්ධිය සම්බන්ධයෙන් වැඩිදුර පරීක්ෂණ පවත්වයි.

■ පී.මද්දුමගේ - මාවරල සමූහ

## මංකොල්ලකරුවන් ගිය රිය අල්ලයි

පසුගිය දින වලස්මුල්ල පොලිස් වසමේ ඕමාර ප්‍රදේශයේදී, කාන්තාවකගේ ගෙල බැඳි රන් මාලයක් මංකොල්ල කා පලා ගිය සැකකරුවන් භාවිත කළ වැගන් ආර් වර්ගයේ අංක එස්.ජී.සීඒඑක්ස් 7702 අංක දරණ කාර් රථය ඇඹිලිපිටිය නගරයේ, වාහන කුලියට දෙන ස්ථානයක තිබී, තංගල්ල කොට්ඨාස දූෂණ මර්දන ඒකකයේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන වලස්මුල්ල පොලිසියට භාරදී ඇති බව පොලිසිය පවසයි. මහමග ගමන් කරමින් සිටියදී ගෙල බැඳි මාලය කිසියම් පිරිසක් විසින් රුපියල් 47000 ක් වටිනා මාල කොටසක්,කඩාගෙන ගිය බවට ඕමාර පදිංචි තරුණියක , වලස්මුල්ල පොලිසියට පැමිණිලිකර තිබිණි .

මෙදිනම හුංගම රන්න ප්‍රදේශයේ දී ද කාන්තාවක ගෙල බැඳි රන් මාලයක් මංකොල්ල කා පලා ගිය සිද්ධියක්ද වාර්තාවී තිබේ.

වලස්මුල්ල සිද්ධියට අදාළ සැකකරු හඳුනාගෙන ඇති බවත්, ඔහු පොලිසිය මග හැර පදිංචි ගම් පළාතෙන් බැහැරව සැඟව සිටින බවත් පොලිසිය වැඩිදුරටත් පැවැසීය.

කොවිඩ් -19 වයිරසය ලෝකය පුරා පැතිර යන විට බුදුදහම සුරක්ෂිතව පවතින සිරිලක් භූමියට දැඩි හානියක් සිදු කිරීමට නොහැකි විය. සම්බුදු රජාණන් වහන්සේගේ ධර්මයේ සුරක්ෂිතභාවයෙන්ම ලක්දෙරණ ආරක්ෂා වූ බව පුරවැසි සියලුදෙනාට ප්‍රත්‍යක්ෂව ඇත. පසුගිය කොරෝනා කාලයේ රට පුරා සෑම පන්සලකම, නිවෙසකම රතන සූත්‍ර දේශනාව ඇතුළු පිරිත් සජ්ඣායනා සිද්ධ විය. ධර්මයේ ආරක්ෂාවෙන්ම ජනතාව සුරක්ෂිත විය. ක්‍රමයෙන් ධර්මයෙන් ඈත් වන විට නැවතත් වයිරසයේ බලපෑම පෙන්වා ධර්මයේම සැරි සැරිය යුතු බව ජනතාවට මතක් කර දී ඇත. කොළඹ දිස්ත්‍රික් සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන් සම්බන්ධීකරණ) පාසල්, දහම් පාසල් සහ පිරිවෙන් පෙළ පොත් සම්පාදක මණ්ඩලයේ සාමාජික, රත්මලාන පුරාණ රාජමහා විහාරය, බුත්තල, හප්පෝරුව පුරාණ විහාරය යන උභය විහාරාධිකාරී රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති පූජ්‍ය කොටනෙළුවේ පුඤ්ඤානන්ද ස්වාමීන් වහන්සේ මේ සම්බන්ධයෙන් පැහැදිලි කළේ මෙසේයි.



# ධාර්මිකව ජීවත් වුණොත් ලෙඩ-රෝගවලින් වැළකෙන්න පුළුවන්

## ශාස්ත්‍රපති පූජ්‍ය කොටනෙළුවේ පුඤ්ඤානන්ද හිමි

**● ස්වාමීන් වහන්ස, කොවිඩ් - 19 වැනි වසංගත රෝග බුදුරජාණන් වහන්සේ වැඩ සිටි කාලයේත් තිබුණා ද?**

ඒ කාලයේ අහිවාතක නමින් රෝගයක් තිබුණා. අහි යනු සර්පයා. වාත යනු සුළඟ. සර්පයෙක් නිසා සුළඟෙන් හට ගත් රෝගයක් ද, නැත්නම් සර්පයන් ආහාරට ගැනීමෙන් හටගත් රෝගයක් ද යන්න නිශ්චිතව කිව නොහැකියි. කෙසේ නමුත් සර්පයකු නිසා හට ගත් රෝගයක් කියා හඳුන්වන්න පුළුවන්. චීන ජාතිකයන් සර්පයන් ආහාරයට ගැනීම නිසා මේ වයිරසය හට ගත්තා කියන මතය අද තිබෙනවා. බුදුරජාණන් වහන්සේගේ කාලයේ සහ අද තිබෙන මේ වයිරසය අතර සම්බන්ධතාවක් තිබෙනවා කියලා අපට හිතන්න පුළුවන්. මේ කියන ලක්ෂණම තමයි එදත් අහිවාතක නමින් හැඳින්වූ රෝගයට තිබුණේ.

සුළඟ වැදුණු වැදුණු කෙනාට රෝගය වැලඳෙන බවට ප්‍රකාශයට පත් වෙලා තිබුණා. අහිවාතක රෝගය නිසා කුඩා සතුන් ප්‍රථමයෙන්ද, දෙවනුව බල්ලන් පූසන් වැනි සතුන්ද, සේවකයන් තෙවනුවද, පසුව සිටු මැතිවරුන්ද මරණයට පත්ව තිබෙනවා. සිටු මැතිවරුන්ට පෙර සේවකයන්ට රෝගය හැදෙන්න හේතු වුණේ සිටු මාලිගයේ සතුන් මැරුණු විට ඔවුන් වළ දැමීම සිදු කරන්නේ සේවකයන් නිසාවෙන්. ඒ නිසා සේවකයන් මේ රෝගයට ගොදුරුව තිබෙනවා. අද වගේම එදත් හරි අමාරුවෙන් ඇතැම් අය මේ රෝගයෙන් බේරුණා.

**● බෞද්ධ ප්‍රතිපදාව නිසා කොරෝනා වයිරසයෙන් ජනතාවට ආරක්ෂාවක් තිබෙනවා ද?**

කොතරම් න්‍යෂ්ටික දේ සෑදුවත් ඇසට නොපෙනෙන වයිරස අපට ප්‍රහාර එල්ල කරනවා. බෞද්ධයන්ට මේ රෝගය නොවැලඳෙන බවට ප්‍රකාශ කරනවා. මෙරට මරණ සංඛ්‍යාව 13 යි. ඒ පිරිස මරණයට පත් වුණේත් තවත් රෝගයක් තිබූ නිසා. ලංකාව, කාම්බෝජය, ලාඕසය, මියන්මාරය, බුරුමය, තායිලන්තය, තායිවානය යනාදි රටවල දරුණු ලෙස මේ රෝගය පැතිර නැහැ. සමහරු කියනවා උණුසුම් දේශගුණයක් තිබෙන නිසා මේ රටවලට රෝගය වැලඳෙන්නේ නෑ කියලා. එහෙනම් ඉන්දියාවේ, පාකිස්තානයේ කොහොම රස්නයක් තිබෙනවා ද? ඒ රටවල දහස් ගණන් මේ රෝගයට ගොදුරුව මරණයට පත් වෙලා. ලක්ෂ දහයකට වඩා ලෝකයේ මරණ සිදු වන විටදී, ලක්ෂ 30ක් පමණ රෝගයට ගොදුරු වන විටදී ලංකාව රෝගයට ගොදුරු නොවී සිටීම අපට සතුටක්. අප මේ විදියට ආරක්ෂා වී සිටින්නේ ධර්මය නිසාමයි.

**● කොරෝනා වයිරසය නිසා පසුගිය කාලයේ මුළු රටටම සංචරණ සීමාවන් පනවන විට ජනතාව අතර පංචශීලය ආරක්ෂා වුණා නේද?**

‘ධම්මෝ හවේ රක්ඛති ධම්මචාරිං’ ධර්මයේ හැසිරෙන කෙනා ධර්මයෙන්ම ආරක්ෂා කරනවා. ලංකාවේ පන්සල් 10000ක් පමණ තිබෙනවා. හැම පන්සලකම උදේ, සවස රතන සූත්‍ර දේශනාව ප්‍රචාරය කළා. රටේම එකම වේලාවක පිරිත් දේශනා කළා. විද්‍යුත් නාලිකාවල උදේ සවස පිරිත් දේශනා පැවැත්වූවා. රට වටේම සෑම නිවෙසකම පිරිත් වැඩසටහන් විකාශය වුණා. විසි කර තිබූ දුම් කබල් ටික නැවත ගෙවල්වලට අරගෙන දුම් අල්ලන්න පටන් ගත්තා, කහ දියර ඉසින්න පටන් ගත්තා, බුදුන් වඳින්න පටන් ගත්තා. රටම ධර්මයට නැඹුරු වුණා. එහි විපාකය අපට හොඳටම දැනුණා. ‘ධම්මෝ හවේ රක්ඛති ධම්මචාරිං’ පද පෙළේ අර්ථය අපට හොඳින්ම දැනුණා. කොරෝනා එන්න කලින් සායනවල ලෙඩ්ඩු පෝලිමේ සිටියා. නමුත් කොරෝනා කාලය තුළ ලෙඩ්ඩු මැරුණෙත් නැහැ. බෙහෙත් ගන්න ගියෙත් නැහැ. ස්වාමීන් වහන්සේලා විදියට අපි ඒ බව හොඳටම දන්නවා. මොකද කෙනෙක් මැරුණා නම් පාංශු කූලයට ආරාධනා කරන්නේ පන්සලට නිසා. සිල්වත් ගුණවත් යහපත් මිනිසුන් බිහි වන විට ධර්මයෙන්ම ජනතාව රැක දෙනවා. මුළු රටම සිල්වත් වුණා. රටම එක්වෙලා දැනුවත්ව හෝ නොදැනුවත්ව පන්සිල් ආරක්ෂා කළා. මෙරට හන්දියක් හන්දියක් ගානේ වයින්ස් කඩ, කොත්තු කඩ තිබෙනවා. සාමාන්‍යයෙන් එවැනි කඩ 10000ක් රට පුරා තිබෙනවා කියලා හිතුවොත් එක කඩයකට කුකුළන් දහය ගණනේ මැරුවොත් දිනකට ලක්ෂයක් කුකුළන් මරනවා. ලක්ෂයක් කුකුළන්ගේ මරණ එක දිනකට නතර වීමෙන් සහ ලංකාවේ කඩ ටික මාසයක් වසා තිබීමෙන් ලක්ෂ 30ක් කුකුළන්ගේ ජීවිත බේරුණා. මාළු අල්ලන එක නැවතුණා. රටේම ප්‍රාණඝාතය විශාල ලෙස අඩු වුණා. එහි විපාකය අපට ලැබුණා. හොරකම් කරන, කොමිස් ගන්නා සියලු දේ නැවතුණා. රටේම කාර්යාල වහලා තිබුණා. සංචරණ සීමා දැමූ නිසා අනියම් සබඳතා පැවැත්වීමට නොහැකි වුණා. මුසාවාද ශික්ෂාපදය යටතේ බොරු කීම පමණක් නොව හිස් වචන කීම, පරුෂ වචන කීම යනාදියත් ආරක්ෂා වුණා. පස්වන ශික්ෂා පදයත් ආරක්ෂා වුණා. රට පුරා සුරා සල් වසා තැබුණා. මළ ගෙයක් වුණොත් පැය කිහිපයකින් මිනිය ආදාහනය කළා. විවාහ උත්සව නොපවත්වා විවාහ වුණා. සම්පූර්ණයෙන්ම මිනිසුන් සරල ජීවිතයක් ගත කළා. දිට්ඨ ධම්මවේදනීය ලෙසම මිනිසුන්ට ලෙඩ අඩු වුණා, මනස සතුටින් තිබුණා.

> සුළඟ වැදුණු වැදුණු කෙනාට රෝගය වැලඳෙන බවට ප්‍රකාශයට පත් වෙලා තිබුණා. අහිවාතක රෝගය නිසා කුඩා සතුන් ප්‍රථමයෙන්ද, දෙවනුව බල්ලන් පූසන් වැනි සතුන්ද, සේවකයන් තෙවනුවද, පසුව සිටු මැතිවරුන්ද මරණයට පත්ව තිබෙනවා. සිටු මැතිවරුන්ට පෙර සේවකයන්ට රෝගය හැදෙන්න හේතු වුණේ සිටු මාලිගයේ සතුන් මැරුණු විට ඔවුන් වළ දැමීම සිදු කරන්නේ සේවකයන් නිසාවෙන්. ඒ නිසා සේවකයන් මේ රෝගයට ගොදුරුව තිබෙනවා.




**● අල්පේච්ඡතාව සම්බන්ධයෙන් බුදුරජාණන් වහන්සේගේ දේශනාව කුමක් ද?**

ඔව්, මේ සම්බන්ධයෙන් සම්බුදු රජාණන් වහන්සේ ගාථාවක් දේශනා කර තිබෙනවා. ‘ඒකේන භෝගෙය භුංජෙය, ද්වීහි කම්මං පයෝජෙ, චතුත්ථම්පි නිධාපෙය, ආපදාසු භවිස්සති’ හම්බ කරන මුදලෙන් කොටසක් කන්නත්, කොටස් දෙකක් ආයෝජනයටත්, එක් කොටසක් ඉතිරි කරන්නත් දේශනා කළා. ආපදාවකදී භාවිතයට ගැනීම සඳහා මේ ඉතුරුව සිදු කළ යුතුයි. භික්ෂූන් වහන්සේට බුදුරජාණන් වහන්සේ සිව්පසය දේශනා කර තිබෙනවා. චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලානප්‍රත්‍ය සිව්පසයට අයත් වෙනවා. චීවර යනු සිවුරු. භික්ෂූන් වහන්සේලා සිවුරු පෙරවිය යුතුයි. චීවරයේ පරමාර්ථ හතරක් තිබෙනවා. ලජ්ජාව නැති වීම, ආරක්ෂාව, උණුසුමෙන් ආරක්ෂාව, මැසි මදුරුවන්ගෙන් ආරක්ෂා වීම චීවරය පොරවා ගැනීමෙන් අදහස් වෙනවා. මේ දේවලට අමතරව ගිහියන් ඇඳුම් අඳින්නේ ලස්සනට. එතැනින් තමයි ගිහියා අමාරුවේ වැටෙන්නේ. විවිධ මෝස්තර සහිත ඇඳුම් ගැනීමට විශාල මුදලක් වැය කරනවා. කොරෝනාවලින් හොඳ පාඩමක් එහිදී කියා දුන්නා.

මේ කාලයේදී කාටවත් ඇඳුම් ගන්න බැරි වුණා. අවුරුදු පහක් ගත වන තෙක් රෙදිපිළි පිටරටින් ගෙන ඒම තහනම් කරනවා කියලා හිතමු. කිසි කතාවක් නැහැ නිවෙස්වලට ගිහිං බැලුවාම අවුරුදු පහකට අඳින්න ඇඳුම් ගෙවල්වල තිබෙනවා. අවශ්‍යතාවට අනුව නොව ආසාවට ඇඳුම් ගැනීමෙන් සිදු වන්නේ මුදල් වියදම් වීම පමණයි. පිණ්ඩපාත යනු ආහාර ලබා ගැනීම. ඇතැම් පුද්ගලයන්ට මාන්නයක් තිබුණා අසවල් ලොකු කඩෙන් කන්න ඕනෑ කියලා. කොරෝනා කාලයේදී ඒ මොකුත් නැහැ, පොල් සම්බෝලයි බතුයි කාලා හිටියා. අනෙක් කාරණාව සේනාසන, එනම් නිවාස. නිවෙසක පරමාර්ථය වන්නේ අව්වෙන් වැස්සෙන් ආරක්ෂා වීම. ගිහියන් ණය ගෙන ලොකු ගෙවල් හදනවා. ඊට පසුව අවුරුදු ගණන් අඬ අඬා ඉන්නවා. කොරෝනා කාලයේදී මේ කිසිදෙයක් සිද්ධ වුණේ නැහැ. ගිලානප්‍රත්‍ය යනු බෙහෙත්. රෝගී වීම නිසා බෙහෙත් ගන්නවා. සල්ලි තිබෙනවා නම් මිනිසුන් කල්පනා කරන්නේ ප්‍රසිද්ධම වෛද්‍යවරයාගෙන් බෙහෙත් ගන්න ඕනෑ කියලා. ඒකත් මාන්නයක් කරගෙන තමයි බෙහෙත් ගන්නේ. මිනිස්සු රැවටීමකින් තමයි ජීවත් වන්නේ. මිනිසුන් අසරණ වූ අවස්ථාවේ උදව්වට ආවේ ධර්මය.

**● ස්වාමීන් වහන්ස, ධාර්මික ජීවිතයක් ගත කිරීම වැදගත් වන්නේ කෙසේ ද?**

උත්සාහයෙන්, සිහියෙන් යුතුව ජීවත් විය යුතුයි. ධාර්මික විය යුතුයි. ධාර්මික වීමේදී වසවිස භාවිතයට ගන්නේ නැහැ. අද කහ ලංකාවේ නැහැ. ඉස්සර අපේ ගෙවල්වල වත්තේ කහ වගා කර තිබුණා. අද සිටුවන්නේ ලකී ප්ලාන්ට් කියන ගස්. මෙයින් ලකී වන්නේ විකුණන මිනිහා පමණයි. ඉස්සර මිනිසුන් ගහක් සිටෙව්වොත් මොනවා හරි කන්න පුළුවන් විදියට සිටුවනවා. ඒ කාලයේ මල් ගසක් සිටෙව්වත් පුද්ගලයා සිතන්නේ මල් පූජා කරන්න හරි පුළුවන් කියලා. පැරැණියන් තුළ ධාර්මික සිතිවිලි තිබුණා. ධාර්මික වෙළෙඳාමත් අවශ්‍යයි. බුදු දහමත් සමඟ ජීවත් වන විට ගැටුමක් නැහැ.

**සන්ධ්‍යා කරුණාරත්න**

# හේතු ප්‍රත්‍ය දැන ධර්මය අවබෝධ කරමු

අවිද්‍යාව යනු නැති දේවල් ඇතැයි යන සිති විලි පහළ වීමයි. මෙසේ රැස්කර ගන්නා සංස්කාර හේතුකොට ගෙන යළි තණ්හාව උපාදාන කරගෙන භවය සකස් කර ගනී. භවයේ උපත (ජාති) සඳහා පංච උපාදානස්ඛන්ධයක් උපයෝගී කර ගැනීමක් විනා සත්වයකු පුද්ගලයකු, ආත්මයක් නැත. සත්ත්ව, පුද්ගල, ආත්ම වශයෙන් නැතත් ඇතැයි සිතා ගැනීම අවිද්‍යාවයි.

අවිද්‍යාව හෝ තණ්හාව ප්‍රහාණය කරන විට භවය සකස් වීමක් සිදු නොවන අතර, ජාති පැවැත්මක් නැත. සංඛාර පටිච්ච සමුපන්නව පැමිණ තණ්හාව උපාදාන කරගෙන භවය සකස් වීම මෙසේ සිදු වේ. අපුඤ්ඤාභි සංකාර හෝ පුඤ්ඤාභි සංකාර හෝ හේතුකොට ගෙන ඒ කර්ම බලවේගය මව් කුසට පිවිස එහි කලලය සකස් වන විට සංඛාර ප්‍රත්‍ය කොටගෙන විඥානය පැමිණ කලලය ජීවියකු බවට පත් කරයි. එතැන් සිට මව්කුස තුළ නාම, රූප, සළායතන සකස්ව ස්පර්ශය දැනී විඳීමක් (වේදනා) ඇතිව විඳීම තව දුරටත් පවත්වා ගැනීමට තණ්හාව ඇති වී තණ්හාවේ දැඩි ලෙස බැඳීම (උපාදාන) ඇති වේ. ඒ බැඳීයෑම තුළ එය හේතු ප්‍රත්‍ය කරගෙන මව් කුසින් පිටවීම (ජාතිය) ඇති වේ.

තණ්හාව ක්ෂය වීම නිරෝධයට හේතු වේ. ආර්ය අෂ්ටාංගික මාර්ගයට අනුව සීල සමාධි, ප්‍රඥා වඩා චතුර් ආර්ය සත්‍ය අවබෝධ කොට ගෙන රාග,ද්වේෂ, මෝහ සමග සියලුම කර්මද ක්ෂය කිරීමෙන් භවය, ජාතිය, (උපත) නවත්වන රහත් බව ලැබීම සසර දුකින් නිදහස් වීමයි. රහත්බව ලැබීම යළි උපතක් කරා නොයෑමකි. පුරාණ කර්ම ද ක්ෂය කරන විට මව් කුසකට පිවිසීමට හේතුවක් නැත.

මෙසේ නොවන තාක් සත්ව, පුද්ගල, ආත්ම යන හැඟීමෙන් අවිද්‍යාවෙන් සංඛාර රැස් කිරීමෙන් දිගටම භවය සකස් කර ගනිමින් භවගාමීව දුකට පත් වීම සිදු වේ. භවයෙන් ඉවත් වීමට නම්, ආත්ම සඥාවෙන් ඉවත්ව මමත්වයෙන් මිදී භව තණ්හාව හළ යුතුය. සීල සමාධි, පඤ්ඤා මාර්ගය වැඩීමේදී ආත්ම සංඥාවෙන් තොර විය යුතුය. මෙහිදී සත්වයකු, පුද්ගලයකු, ආත්මයක් ද නැති බවත්, තමා පුද්ගලයකු නොව විශ්වයේ කොටසක් බවත් සිහිකර ඥාන මාර්ගයේ ගමන් කළ යුතුය. මම යන්නක් ගැන කල්පනා කරන තුරු මම, මගේ, ආත්මය වශයෙන් මගේ පැවැත්ම, මගේ ආරක්ෂාව උදෙසා අවශ්‍ය සංඛාර ගොඩ ගසමින් භවය සකස් කිරීමක් විනා භවයෙන් ඉවත් වීමක් සිදු නොවේ. සසර දුකින් නිදහස් වීමක් අරමුණු නොවේ නම් එය බුදු මග ද නොවේ.

සසර දුක් බව මෙනෙහි කරන විට ආශ්‍රව දුරුවේ නම් එයින් කෙලෙස් සංසිඳීම වේ. දුකින් නිදහස් වීමට මග විවර වේ. බොහෝ විට සාමාන්‍ය බෞද්ධ ජනතාව මෙනෙහි කරන්නේ කෙලෙස් වැඩෙන වැඩ පිළිවෙළයි. ආශ්‍රව ධර්ම වැඩෙන වැඩ පිළිවෙළයි.

මල් පිදීමෙන්, පහන් පිදීමෙන් ආහාර පාන පිදීමෙන් සිදුවන්නේ නැවත සසර උපදින තත්ත්වයයි. පිනින් හා පවින් දෙකින්ම සිදුවන්නේ යළි යළි සසර උපතට හේතු ප්‍රත්‍ය වීමයි. බුදුරජාණන් වහන්සේ දේශනා කළේ ‘ජාතිපි දුක්ඛා’ යනුවෙන් උපත දුක බවයි. එසේ නම් දෙව්ලොව, මනුලොව උපත ද සතර අපායේ උපත ද දුකට හේතු වන බවයි.

මුල් බුදු සමය තුළ වැඳුම් පිදුම් පුද පූජා තිබුණේ නැත. සසර දුකින් නිදහස් වීමේ මාර්ගය අනුගමනය කිරීමට සීල සමාධි ප්‍රඥා, වැඩීමයි කළ යුතුව තිබුණේ සීලය යනු ශික්ෂා පද සමාදන් වීම නොවේ. සිත හික්මවා ගැනීමයි. ඉන්ද්‍රිය සංවරයයි. සිත, කය, වචන සංවරය සඳහා සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත , සම්මා ආජීව , සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි යන ආර්ය අෂ්ටාංගික මාර්ගයට අවතීර්ණ විය යුතුය.

ඔබ සිල් සමාදන් වුවද, නැතිවද ඔබ කළ යුතු වන්නේ මනස සකස් කිරීමයි. සතිය පැවැත්වීමයි. කොතරම් සිල් ගත්තද ඔබගේ හිතේ ආශ්‍රම ධර්ම, කෙලෙස් සංඛාර උපදී නම් ඔබ සීලයේ නියම ඵල ලබන්නේ නැත. රෙද්ද සුදු වීමට වඩා ඔබගේ සිත පිරිසුදු වීමයි විය යුතු වන්නේ.

“කායේන සංවරෝ සාදු, සාදු වාචාය සංවරෝ, මනසා සංවරෝ සාදු, සාදු සබ්බත්ත සංවරෝ”

කය, වචන, සිත සංවර කළ යුතුය. මේ සඳහා ඇස, කන, දිව, නාසය, කය, මනස යන ආයතන හය සංවරයට පාලනයට උනන්දු විය යුතුය. ඇසෙන්, කනින්, දිවෙන්, නාසයෙන්, කයෙන්, සිතෙන් ඊට අදාළ රූප ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, ධම්ම අරමුණු ගැනීම තුළ සිත ලොවට, සසරට බැඳීම සිදු වේ.

මිනිසා ද මිනිස් සිතේ නිර්මාණයක් වන විට සෙසු බාහිර දේ මිනිස් සිතේම නිර්මාණ බැව් පැහැදිලිය. එසේ නම් තමාට හෝ බාහිර දේට ඇලුම් කිරීම අර්ථ විරහිත බව අවබෝධ වන විට තණ්හාවෙන් උපාදාන කර ගන්නේ කුමක් ද? උදය - විය පඤ්ඤාව, පටිච්ච සමුප්පාදය, හේතු ප්‍රත්‍ය ධර්මය අවබෝධ නොකරන තාක් අවිදු අඳුරේ ගමන් කරන ඔහු බුදු දහම යයි වරදවා වැඳුම් පිදුම් පුද පූජා කරමින් ප්‍රාර්ථනා කරමින් නොසිට බුදු පියාණන් වහන්සේ වදාළ පරිදි අන්තගාමී නොවී, ඇත, නැත යන්න අතහැර මැදුම් පිළිවෙතට පැමිණ ආර්ය අෂ්ඨාංගික මාර්ගයට පිවිස චතුර් ආර්ය සත්‍යය අවබෝධ කරමු.

**බන්දුල සේනානායක**
**කලාභූෂණ - සාමවිනිසුරු**



# උතුම් වූ පැවිද්දට ඇති නූතන අභියෝග

ශ්‍රී සම්බුද්ධ ශාසනයෙහි පැවිද්ද යනු අතිශයින්ම දුර්ලභ වූවකි. මේ මනුෂ්‍ය සමූහයා පඤ්ච කාම ඕඝයට ඇද වැටී එයම සැපතකැයි එහිම ඇලී ගැලී ගිලී සිටිති. එයින් නික්ම දුර්ලභ වූ පැවිද්ද ලත් කුල පුත්‍රයන්ට ක්ෂේම භූමිය වූ නිර්වාණ ප්‍රතිලාභයට ඍජු මාර්ගය වූ ආර්ය මාර්ග සංඛ්‍යාත ප්‍රතිපත්තියට පිවිසෙන්නට සිත් දෙන්නේ අතිශයින්ම දුර්ලභ වූ වාසනා මහිමයකිනි. මහ පොළොවේ පස් වැලි ගල් බොරලු ගණනට මහාර්ඝ වූ මාණික්‍ය රත්නයන් නැත්තේ ම ය. එලෙසම සම්බුද්ධ ශාසනයෙහි පැවිද්ද දුර්ලභ ය.

බුදුරජාණන් වහන්සේ විසින් භික්ෂු සංඝයා ඇති කළේ තමන්ගේ බුද්ධිමය ආධ්‍යාත්මික දියුණුව සඳහා පමණක් නොව පරාර්ථ සේවය සඳහා ද ජීවිතය කැප කරන්නට කැමති අයට ඉඩ සලසා දීම සඳහා ය. ගෘහ ජීවිතයේ බැඳීම්වලින් හිරවුණු ගිහියාට පරාර්ථ සේවය සඳහා මුළු ජීවිතය කැප කරන්නට පිළිවෙළක් ඇත්තේ නැත. එහෙත් ගෘහ ජීවිතයේ බැඳීම්වලින් නිදහස් සහ වෙනත් ලෞකික බාධාවක් නැති භික්ෂුවට බුදුරජාණන් වහන්සේගේ ඉගැන්වීමට අනුව බොහෝ දෙනාගේ හිතසුව පිණිස මුළු ජීවිතයම කැප කිරීමට පුළුවන. ඒ නිසාම බෞද්ධ සංඝාරාමය ආධ්‍යාත්මික කේන්ද්‍රස්ථානයක් පමණකින් නොනැවතී අධ්‍යාපනික සංස්කෘතික කේන්ද්‍රස්ථානයක් බවට අනුක්‍රමයෙන් පැමිණියේය.

“චරථ භික්ඛවෙ චාරිකං බහුජන හිතාය බහුජන සුඛාය....” ආදී වශයෙන් “වැඩි දෙනකුගේ යහපත සඳහා වැඩි දෙනකුගේ සැපත සඳහා ලෝකය කෙරෙහි කරුණාවෙන් දෙවි මිනිසුන්ගේ යහපත සහ ලාභය සලසා දීමේ අරමුණින් ඉදිරියටම ගමන් කරන්න. කථාවෙන් මෙන්ම ක්‍රියාවෙන්ද පරිපූර්ණ පිරිසුදු ජීවිතයක් ගෙන යන්න” යන මේ ප්‍රථම භික්ෂු සමූහයාට වදාළ බුද්ධ වචනය ප්‍රකාශ කොට යුග ගණනාවක් ගෙවී ඇත. ඒ බුද්ධ චරිතයට අනුව යමින් හැම යුගයකම පිරිසුදු බුද්ධ ධර්මය දේශනා කරමින් කෝටි සංඛ්‍යාත ජනතාවකගේ සිත් සතන් සැනසූ සංඝ පරම්පරාවක් මේ දක්වාම පැවත එයි. සඟ පරපුර නිර්දය ලෙස විවේචනය කරමින් අභූත චෝදනා නඟමින් බොහෝ දෙනෙක් හැම යුගයකම බුදුදහමටත් සඟ පරපුරටත් පහර ගැසූහ. එහෙත් දහස් සංඛ්‍යාත භික්ෂු පරපුරක් හැම යුගයකම සිටීමෙන් පෙනී යන්නේ බෞද්ධ භික්ෂුව බුද්ධ ශාසනයට එල්ල වූ සියලු අභියෝගයන්ට සාර්ථකව මුහුණ දුන් බවයි.

තුන්වන රත්නය හෙවත් සංඝ රත්නය නොතිබිණි නම් ධර්මය ප්‍රායෝගික ධර්මයක් නොවනු ඇත. ශත වර්ෂ ගණනාවක් තිස්සේ බෞද්ධ ධර්මයේ වැදගත්කම නිදර්ශනාත්මකව මහජනතාවට පෙන්වා දෙනු ලැබුවේ මේ සංඝ සමාජයයි. එසේ නොවූයේ නම් සාමාන්‍ය ජනතාව අතර බුද්ධ ධර්මය ඉතා සුළු කලකින් නැති වී යනු ඇත. ගේ දොර අත හැර පැවිදිව කසාවතින් සිටින මේ සංඝයා වහන්සේ තමන්ගේ ශ්‍රේෂ්ඨ නායකයා වෙනුවෙන් ලෝකයේ විශාල කොටසක් පාලනය කරති.

සමාජයක් වශයෙන් ගත් කළ සංඝ සමාජය සාකල්‍යයෙන්ම යහපත් සමාජයක් හැටියට හැඳින්විය නොහැකිය. ඕනෑම සමාජයක හොඳ සහ නරක අඩු වැඩි වශයෙන් තිබීම ලෝක ස්වභාවයයි. මේ නියමය සංඝ සමාජයටද සාධාරණය. අපවත් වී වදාළ යක්කඩුවේ ප්‍රඥාරාම හිමිපාණන් වහන්සේ විසින් භික්ෂූන් උදෙසාම ලියන ලද ‘සඟිබණ’ නමැති ග්‍රන්ථයේ බුද්ධ කාලයේ ද සංඝ සමාජයේ විවිධ වැරදි සහිත භික්ෂූන් සිටිය බව උදාහරණ සහිතව අනාවරණය කොට ඇත. ඒවායින් එකක් හෝ කීපයක් උපුටා නොදක්වන්නේ අපගේ ලියැවිල්ල දීර්ඝ වීමට ඉඩ නොතැබිය යුතු හෙයිනි. ලාභ සත්කාර සඳහා සසුන්ගතව සංඝ සමාජය කිලුටට පත් කළ භික්ෂූහු බුද්ධ කාලයේ ද සිටියහ. එසේ නම් බුදුරජාණන් වහන්සේගේ පිරිනිවනින් වසර දෙදහස් පන්සියකට ද අධික කාලයකට පසු සංඝ සමාජය සාකල්‍යයෙන් ම යහපත් විය හැකි ද?

ශ්‍රී ලංකාද්වීපය තුළ එතෙක් මෙතෙක් බුදුදහමත් බෞද්ධකමත් ආරක්ෂා වූයේ බෞද්ධ භික්ෂු සංඝයා හේතුවෙන් බවට විවාදයක් නැත. භික්ෂු සමාජය එක්තරා පසුබෑමකට ලක්ව තිබූ මහනුවර අඳුරු යුගයේ දී උපසපන් භික්ෂුවක සොයා ගැනීමට නොහැකි තරමට සංඝ සමාජය කඩා වැටීමකට ගොදුරුව තිබිණි. වැලිවිට සරණංකර සඟරාජ හිමිපාණන් නැවත උපසම්පදාව ඇති කොට භික්ෂු ශාසනය චිරස්ථායි කරන්නට උර නොදුන්නා නම් මේ රටෙන් බුද්ධ ශාසනය ඒ යුගයේදීම අතුරුදන් වෙන්නට ඉඩ තිබිණි. අප මුලින්ම සඳහන් කළ කරුණු අනුව බුද්ධ ශාසනයේ පැවැත්මට මහා සංඝ රත්නයේ අවශ්‍යතාව වටහා ගත හැකි බවයි.


ඒ නිසා බෞද්ධ විරෝධීන්ගේ ප්‍රධාන ඉලක්කය සංඝ සමාජය බවට පත්ව ඇත. සංඝ සමාජය විනාශ කිරීම ඔවුන්ගේ ප්‍රධාන අරමුණ යි. ඒ එක්කම අපගේ සාර ධර්ම විනාශ කිරීමද ඔවුන් තුළ ඇති එවැනිම අරමුණකි. ඔවුනට අනුව බුද්ධාගම තුරන් කිරීමට නම් බෞද්ධයන් ඔවුන්ගේ ආගමට හරවා ගත යුතුය. එසේ නොහැකි වන විට බෞද්ධයන් දුරාචාරයට යොමු කොට, ඔවුන්ගේ බෞද්ධ සාර ධර්ම විනාශ කළ යුතු ය. එක බෞද්ධයෙක් ඔවුන්ගේ ආගමට හරවා ගන්නවාට වඩා අපගේ සාර ධර්ම විනාශ කොට සිය ගණනක් ආගමක් දහමක් නැති නිවටුන් බවට පත් කිරීම පහසු බව ඔවුන් හඳුනා ගෙන ඇත. සංඝ සමාජයට ඇති පිළිගැනීම, ගෞරවය නැති කොට බෞද්ධයින් භික්ෂු සමාජයෙන් ඈත් කළ විට අපගේ සාරධර්ම අපෙන් ගිලිහෙන බව ඔවුහු හොඳින් දනිති.

මේ තරම් භික්ෂූන්ට අපහාස උපහාස කරන්නේ ඇයි ද යන ප්‍රශ්නයට පිළිතුර දැන් පැහැදිලිය. අපගේ සමහර බෞද්ධයන් සියලු බණ පොත් පසෙකට දමා කියවන තමන් රහත් බව නොකියා කියන හෙවත් අඟවන භික්ෂුවකගේ පොත් පෙළක පළමු පොතේ මෙයට ගැළපෙන මෙවැනිම සාහසික ප්‍රකාශයක් වෙයි. “ඔබේ ඉන්ද්‍රියන් කැමති හැම දෙයක්ම අත්දැකීමෙන් විඳ රස බලා එහි අනිත්‍යය දකින්න. ඔබට ඒ නිදහස තවමත් ඇත. අත් නොවිඳ අත් නොදැක අනිත්‍යය දකින්නට යාමෙන් ඔබට ඉදිරියේදී ප්‍රශ්න ඇති විය හැකිය. ඔබ වැඩියෙන් ආශා කරන කැමති දෙයක් ඇතොත් නැවත නැවත ඒ දෙය රස විඳ ඒ කැමැත්තෙන් මිදෙන්න....” යනු ඒ ප්‍රකාශයයි. අපට මතක හැටියට අප විසින් මෙයට පෙර ‘මනරම් සදහම්’ වෙළුමකට සපයන ලද ප්‍රස්තාවනාවක බුද්ධ ධර්මය විකෘති කිරීමට උදාහරණයක් ලෙස මේ ප්‍රකාශය උපුටා දක්වා ඇත.

සංඛ්‍යාත්මකව ගත් කළ ශ්‍රී ලංකාවේ ජනගහනයට සාපේක්ෂව භික්ෂූහු සීමිතය. වර්තමාන සංකීර්ණ සමාජය ඉවක් බවක් නැතිව කාම ඕඝයට අසුවී කාම ඕඝයෙහි ඇලී ගැලී සිටියදී සසුන්ගත වන්නට සිත් දෙන්නන්ගේ විශාල අඩුවක් ඇත.

පැවිද්දට ඇතුළු වූ පසුව ද මේ කාම ඕඝයට හසුව සහ තවත් විවිධ දුෂ්කරතා හේතුවෙන් උපැවිදි වන්නන්ගේ සංඛ්‍යාවෙහි වැඩි වීමක් ද දක්නට ඇත. කලකට පෙර පටන් ක්‍රියාත්මක වූ පවුල් සංවිධාන වැඩසටහන් අනුව එක පවුලකට දරු දෙදෙනකු සීමා වීමෙන් මව්පියන්ට සසුනට දායාද කරන්නට දරුවන් නැත.

මේ අභියෝග හමුවේ මේ සංඝ පරම්පරාව රැකගැනීම ගිහි සමාජයේ ද පරම යුතුකමක් හා වගකීමක් වෙයි. සමාජයක් වශයෙන් ගත් කල මේ සංඝ සමාජය සාකල්‍යයෙන් ම නිවැරැදි නොවන බව යට සඳහන් කළෙමු. සමාජයක් හැටියට අඩු වැඩි වශයෙන් ඇති වරදක් අල්ලා ගෙන සමස්ත සංඝ සමාජයම විවේචනය කරන අය කොතෙකුත් සිටිති. මේ සංඝ පරම්පරාව පවත්වාගෙන යෑම ඉතා දුෂ්කර කටයුත්තක් බව නැවත නැවතත් සඳහන් කරනු කැමැත්තෙමු.



ජ්‍යෙෂ්ඨ මහාචාර්ය
උතුරාවෙල
**ධම්මරතන නාහිමි**
ශ්‍රී ලංකා බෞද්ධ හා
පාලි විශ්වවිද්‍යාලය
හෝමාගම

# කහවත්ත ප්‍රාදේශීය සභාව

## ප්‍රසම්පාදන දැන්වීමයි

## 2021 වර්ෂය සඳහා දේපළ වත්කම් බදු දීම

කහවත්ත ප්‍රාදේශීය සභාවට අයත් මෙහි පහත දක්වා ඇති උපලේඛනයේ සඳහන් දේපළ, වත්කම් (කහවත්ත පොදු වෙළඳපල ගවමස් කඩය සහ කහවත්ත පොදු වෙළඳපල එළු මස් සහ කුකුළු මස් කඩය, කහවත්ත හා ඇන්දන සති පොළ, පොදු වැසිකිළි) 2021.01.01 දින සිට 2021.12.31 දින දක්වා වර්ෂයක කාල සීමාවකට සහ කහවත්ත පොදු වෙළඳපල ඉහළ මහල උපකාරක පන්ති පවත්වන ස්ථානයක් / වෛද්‍ය සේවා සපයන ස්ථානයක් / කායවර්ධන මධ්‍යස්ථානයක් / සුපිරි වෙළඳ සංකීර්ණයක් / නිමි ඇඳුම් විකිණීමේ ආයතනයක් / උත්සව අවස්ථා සඳහා සැරසිලි, උපකරණ හා සේවා සපයන ආයතනයක් යන ව්‍යාපාර වලින් ඉහළම මාසික කුලී ලංසුව ඉදිරිපත් වන එක් ව්‍යාපාරයක් සඳහා වසර 03 ක කාලසීමාවක් සඳහා බදු දීම සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩර්පත් 2020 නොවැම්බර් මස 03 දින පෙ.ව. 10.00 දක්වා මවිසින් භාරගනු ලබන අතර, එදිනම පෙ.ව. 10.30 ට මෙම කාර්යාලයේ දී ටෙන්ඩර්පත් විවෘත කරනු ලැබේ.

ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතු වන්නේ 2020.10.09 දින සිට 2020.11.03 වන දින ප.ව. 3.00 දක්වා නියමිත ටෙන්ඩර් ඇප හා පෝරම ගාස්තු ගෙවීමෙන් අනතුරුව මෙම කාර්යාලයෙන් ලබාගත් ආකෘති පත්‍ර මගින් පමණි. ටෙන්ඩර් පෝරම ලබාගැනීමේදී ටෙන්ඩර් ඉල්ලුම්කරු විසින් තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කර අනන්‍යතාවය තහවුරු කළ යුතුය. මෙම දේපළ බදු දීම ටෙන්ඩරයේ මුදල අනුව රජය විසින් පනවනු ලබන වෙනත් බදුවලට ද යටත් වේ. මේ සම්බන්ධව වැඩිදුර විස්තර සතියේ දිනවල කාර්යාල වේලාවන් තුළදී කහවත්ත ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයට පැමිණ හෝ 045-2270275 යන දුරකථන අංකය ඇමතීමෙන් විමසා දැනගත හැකිය.

ටෙන්ඩර් පෝරම ලබාගැනීම සඳහා ගෙවිය යුතු ටෙන්ඩර් ඇප හා ගාස්තු මෙසේය.

### උපලේඛනය 01

| අනු අංකය | විස්තරය | ටෙන්ඩර් පෝරම ගාස්තුව රු. | ටෙන්ඩර් ඇප තැන්පත් රු. | අවම ලංසුව රු. |
|---|---|---|---|---|
| 01. | කහවත්ත පොදු වෙළඳපල ගවමස් කඩය | 1,000.00 | 75,850.00 | 1,517,000.00 |
| 02. | කහවත්ත පොදු වෙළඳපල එළු මස් සහ කුකුළු මස් කඩය | 1,000.00 | 10,150.00 | 203,000.00 |
| 03. | කහවත්ත සති පොළ | 1,000.00 | 47,500.00 | 950,000.00 |
| 04. | ඇන්දන සති පොළ | 1,000.00 | 17,500.00 | 350,000.00 |
| 05. | බණ්ඩාරනායක මාවත පොදු වැසිකිළිය | 1,000.00 | 250.00 | 5,000.00 |
| 06. | කහවත්ත පොදු වෙළඳපල පොදු වැසිකිළිය | 1,000.00 | 250.00 | 5,000.00 |

### උපලේඛනය 02

කහවත්ත පොදු වෙළඳපළ ඉහළ මහල

| අනු අංකය | බදු කාලය | අවම ලංසුව (මාසික කුලිය) රු. | ටෙන්ඩර් ඇප තැන්පතු රු. | ටෙන්ඩර් පෝරම ගාස්තුව රු. |
|---|---|---|---|---|
| 01 | වසර 03 | 40,000.00 | 20,000.00 | 1,000.00 |

**2020.10.09 වන දින**
**කහවත්ත ප්‍රාදේශීය සභා කාර්යාලයේ දීය.**

**කේ.එම්. ජිනදාස**
**සභාපති,**
**කහවත්ත ප්‍රාදේශීය සභාව.**

**දු.අං. 045-2270275**

# ටෙන්ඩර් දැන්වීම

## ප්‍රාදේශීය සභාව - අඟුණකොළපැලැස්ස

අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාවට අයත් පහත උපලේඛනයේ සඳහන් දේපළ 2021.01.01 දින සිට 2021.12.31 දින දක්වා කාලය තුළ බදු එකතු කිරීමේ අයිතිය, එළදව නෙළා ගැනීමේ අයිතිය බදු දීම සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් මා විසින් භාරගනු ලැබේ.

| අනු අංකය | විස්තරය | අවම ලංසුව රු. ශත | ටෙන්ඩර් පෝරම ගාස්තුව රු. ශත | ටෙන්ඩර් ඇප මුදල රු. ශත |
|---|---|---|---|---|
| 01 | අඟුණකොළපැලැස්ස මහජන සති පොළ | 7,154,385.00 | 5,000.00 | 300,000.00 |
| 02 | අඟුණකොළපැලැස්ස මාළු වෙළඳපොළ | 1,568,574.50 | 2,000.00 | 50,000.00 |
| 03 | අඟුණකොළපැලැස්ස පොදු වැසිකිළිය | 26,250.00 | 250.00 | 1,000.00 |
| 04 | අඟුණකොළපැලැස්ස නගරයට පැමිණෙන සංචාරක වෙළඳ වාහන වලින් බදු අය කිරීම | 224,070.00 | 1,000.00 | 10,000.00 |
| 05 | තලාව පුස්තකාල ඉඩමේ පොල් එළදව | 2,530.00 | 100.00 | 500.00 |

**ටෙන්ඩර්පත් නිකුත් කිරීම** - 2020.10.19 දින පෙ.ව. 10.00 සිට
**ටෙන්ඩර්පත් භාර ගැනීම** - 2020.11.04 දින පෙ.ව. 10.30 දක්වා
**ටෙන්ඩර්පත් විවෘත කිරීම** - 2020.11.04 පෙ.ව. 11.00

**ටෙන්ඩර්පත් ලබාගැනීම**

I. සතියේ වැඩ කරන දිනවල කාර්යාලීය වේලාවන් තුළදී අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභා කාර්යාලයෙන් ලබා ගැනීම හෝ
II. ටෙන්ඩර් පෝරම ගාස්තුව සහ ටෙන්ඩර් ඇප මුදල යන දෙකෙහි වටිනාකම සහිත මුදල් ඇණවුමක් (Money Order) අඟුණකොළපැලැස්ස තැපැල් කාර්යාලයෙන් මාරු කර ගත හැකි පරිදි "**ලේකම්, අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාව**" නමට එවීම මගින් ගෙන්වා ගැනීම සිදු කළ හැකිය.

**වැඩි විස්තර**

**දුරකථන අංක : 047-2228275 / 047-5678317**
**ෆැක්ස් : 047-2229022**
**වෙබ් : www.angunakolapelessa.ps.gov.lk ඊ-මේල් : angupelessaps@gmail.com**

2020.10.13 වන දින අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභා කාර්යාලයේ දීය.

**ගාමිණී වීරබද්ධන**
**සභාපති,**
**අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාව.**




මෙම සේවාව දැන් දිවයිනපුරා ක්‍රියාත්මකයි.
ලේක්හවුස් සමාජ සත්කාරයකි

# බස්නාහිර පළාත් සභාව

## පළාත් ඉංජිනේරු කාර්යාංශය

## ලංසු කැඳවීමේ ආරාධනයයි

01. පහත විස්තර සඳහන් කාර්යයන් සඳහා අදාළ ප්‍රාදේශීය ඉංජිනේරුවරුන්ගේ ප්‍රසම්පාදන කමිටුව විසින් යෝග්‍යතාපූර්ණ හා සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.
02. ජාතික තරඟකාරී ලංසු කැඳවීම මගින් කොන්ත්‍රාත්කරුවන් තෝරනු ලැබේ.
03. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සාර්ථක ලංසුකරු අසාධු ලේඛනගත නොවී හෝ පවරන ලද කොන්ත්‍රාත් හැර ගොස් හෝ අවසන් නොකර නොතිබිය යුතු අතර, පහත සඳහන් අවශ්‍යතා සපුරා තිබීම හා වලංගු CIDA ලියාපදිංචිය තිබිය යුතුය. (ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රය)

| ව්‍යාපෘති අංකය | (2) ව්‍යාපෘතියේ නම | (3) ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය | (4) අරමුදල් මූලාශ්‍ර | (5) අවශ්‍ය අවම CIDA ලියාපදිංචිය | (6) වැට් රහිත ඉදිකිරීම් සඳහා ඇස්තමේන්තු කළ පිරිවැය (සෘජු ඉදිකිරීම් සඳහා පිරිවැය) රු. | (7) ආපසු ගෙවනු නොලබන ගාස්තුව (රු.) | (8) ආපසු ගෙවනු ලබන තැන්පතුව/ ලංසු සුරක්ෂිතය (රු.) | (9) ලංසු ලිපිලේඛන නිකුත කරන / ලංසු තැන්පත් කළ යුතු / බහාලිය යුතු ස්ථානය හා දුරකථන අංකය |
|---|---|---|---|---|---|---|---|---|
| WP/DB/CON/20/82 | බප/ කො/ ප්‍රෙස්බිටීරියන් බාලිකා විද්‍යාලය - පළමු මහල කොන්ක්‍රීට් ස්ලැබ් එක ඉදිකිරීම (අඩි 50 X 34) සිව් මහල් ගොඩනැගිල්ල | කොළඹ | පළාත් අධ්‍යාපන | C8 | 3,099,170.20 | 2000.00 | මුදලින් 25,000.00 | ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය (කොළඹ), නො. 151/4/2/1, මාලිගාවත්ත පෙදෙස, මාලිගාවත්ත, කොළඹ 10. දු.ක. 0112447773 |
| WP/DB/CON/20/83 | තෙමහල් වාට්ටු සංකීර්ණ ගොඩනැගිල්ලේ පිටුපස රුඳවුම් බැම්ම ඉදිකිරීම - හෝමාගම මූලික රෝහල | හෝමගම | පළාත් සෞඛ්‍ය | C7 | 4,343,344.84 | 2000.00 | මුදලින් 25,000.00 | ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය (හෝමාගම), උසාවිය පාර, හෝමාගම. දු.ක. 011-2855090 |
| WP/DB/CON/20/84 | ප්‍රාදේශීය වෛද්‍ය ප්‍රතිකාර ඒකකය ඉදිකිරීම - කළගෙඩිහේන (හතර වන අදියර) | ගම්පහ | පළාත් සෞඛ්‍ය | C5 | 38,075,919.79 | 5000.00 | ලංසු සුරක්ෂණය 500,000.00 | ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය (ගම්පහ), උසාවිය පාර, ගම්පහ. දු.ක. 033-2222515 |
| WP/DB/CON/20/85 | බප/ ගම්/ සංඝමිත්තා බා/ ම. වි. මායිම් තාප්පයේ හදිසි අලුත්වැඩියාව | | පළාත් අධ්‍යාපන | C8 | 2,609,842.70 | 1000.00 | ලංසු සුරක්ෂණය 20,000.00 | |
| WP/DB/CON/20/86 | වෛද්‍ය/ අධිකාරි නිල නිවාස අලුත්වැඩියාව වතුපිටිවල මූලික රෝහල | | පළාත් සෞඛ්‍ය | C6 | 8,522,806.30 | 40,000.00 | ලංසු සුරක්ෂණය 200,000.00 | |
| WP/DB/CON/20/87 | ගිලන් රථ ගරාජය ඉදිකිරීම කිරිබත්ගොඩ මූලික රෝහල. | බියගම | පළාත් සෞඛ්‍ය | C8 | 4,167,925.41 | 2000.00 | මුදලින් 25,000.00 | පේරාදෙණිය ඉංජිනේරු කාර්යාලය (බියගම), උඩුපිල පාර, මාකොළ, බියගම. දු.ක. 011-2963524 |
| WP/DB/CON/20/88 | බප/ කළු/ අගමැති බාලිකා ම. වි. 90X25 පන්ති කාමර ගොඩනැගිල්ලේ ව්‍යුහාත්මක අලුත්වැඩියාව | පානදුර | පළාත් අධ්‍යාපන | C8 | 1,849,997.40 | 1000.00 | මුදලින් 10,000.00 | ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය (පානදුර) ශ්‍රී මහා විහාර පාර, පානදුර. දු.ක. 038-2243078 |
| WP/DB/CON/20/89 | බප/ කළු/ අගමැති බාලිකා ම. වි. 90X25 තෙමහල් ගොඩනැගිල්ලේ ව්‍යුහාත්මක අලුත්වැඩියාව | | පළාත් අධ්‍යාපන | C9 | 1,388.000.00 | 1000.00 | මුදලින් 10,000.00 | |
| WP/DB/CON/20/90 | මොල්ලිගොඩ ආයුර්වේද රොහලෝ වාට්ටු ගොඩනැගිල්ලේ වැසිකිළි හා අපජල පද්ධතිය අලුත්වැඩියා කිරීම | | පළාත් සෞඛ්‍ය | C8 | 2,212,780.40 | 1000.00 | මුදලින් 10,000.00 | |
| WP/DB/CON/20/91 | බප/හෝ/ විද්‍යාගම කණිෂ්ඨ විද්‍යාලය වැසිකිළි පද්ධතිය ඉදිකිරීම. | | පළාත් අධ්‍යාපන | C9 | 920,000.00 | 500.00 | මුදලින් 5,000.00 | |

04. ලංසු ලියවිලිවල සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.
05. මේ සඳහා උනන්දුවක් දක්වන සුදුසුකම් ඇති ලංසුකරුවන්ට වැඩි විස්තර වගුවේ තුන්වන තීරුවෙහි සඳහන් අදාළ ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලවෙතින් අදාළ මුදල් ගෙවීමෙන් පසු ලබාගත හැකි අතර, කාර්යාල වේලාව තුළදී එම කාර්යාලවලදී ලංසු ලිපි ලේඛන ගාස්තු ගෙවීමකින් තොරව පරීක්ෂාකර බැලිය හැකිය.
06. ඉහත වගුවේ පස්වන තීරුවෙහි සඳහන් ආකාරයෙන් ආපසු ගෙවනු නොලබන ගාස්තුවක් **2020.10.19 දින සිට 2020.11.06** දින දක්වා ඕනෑම වැඩ කරන දිනයකදී **9.00 පැය හා 15.00 පැය** අතර, අදාළ ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයට (වගුවේ 09 තීරුවේ සඳහන් පරිදි) ගෙවීමෙන් අනතුරුව ප්‍රාදේශීය ඉංජිනේරු වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් ලංසුකරු හෝ ඔහුගේ / ඇයගේ බලයලත් නියෝජිත හට සම්පූර්ණ ලංසු ලිපිලේඛන කට්ටලයක් මිලදී ගත හැකිය.
07. "**මුල් පිටපත**" හා "**අනු පිටපත**" ලෙස සඳහන් කළ කවර දෙකක බහා මුද්‍රා තබන ලද වම් ඉහළ කෙළවරේ ව්‍යාපෘති නාමය සඳහන් කළ එක් කවරයක ඇතුළත් කරන ලද පිටපත් දෙකකින් යුත් ලංසු ලියවිල්ල අදාළ ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයට (වගුවේ 09 තීරුවේ සඳහන් පරිදි) වෙත ගෙනැවිත් භාරදීමෙන් හෝ උපලේඛනයේ සඳහන් අදාළ ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් හෝ **2020.11.09 දින පෙ.ව. 10.30** ට හෝ ඊට පෙර ලැබීමට සැලැස්විය යුතුය. ලංසු භාර ගැනීම අවසන් වූ වහාම එම අවස්ථාවට පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් ඉදිරියේදී ලංසු විවෘත කරනු ලැබේ.
08. සියලුම ලංසු සමග (ඉහත වගුවේ සඳහන් පරිදි) ආපසු ගෙවනු ලබන ලංසු තැන්පතුව මුදලින් ගෙවූ බවට ලද රිසිට් පත/ ලංසු සුරක්ෂණය අමුණා එවිය යුතුයි.
09. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.
10. මෙම කොන්ත්‍රාත් සඳහා බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිය ඇති කොන්ත්‍රාත්කරුවන් හෝ ආයතන සඳහා පමණක් ඉල්ලුම් කළ හැකිය.
11. මිලියන 05 ට වැඩි කොන්ත්‍රාත් සඳහා සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි විය යුතුයි.

**ගොඩනැගිලි අධ්‍යක්ෂ, ඉංජිනේරු කාර්යාංශය,**
**5 වන මහල, 204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.**

**දු.ක. / ෆැක්ස් 011-2092510**

# ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය

## කුලියාපිටිය

# 2021 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයට 2021 වර්ෂය සඳහා පහත සඳහන් භාණ්ඩ හා සේවාවන් සැපයීමට අදාළව සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. භාණ්ඩ හා සේවා කාණ්ඩ 42 ක් යටතේ ලියාපදිංචිය සිදු කරනු ලබන අතර, www.wyb.ac.lk වෙබ් අඩවිය මගින් ද මෙම විස්තර ලබාගත හැකිය.

එක් කාණ්ඩයකට වඩා වැඩි කාණ්ඩ සංඛ්‍යාවක් සඳහා අයදුම් කිරීමට අපේක්ෂා කරන්නේ නම් ඒ සඳහා අයදුම්පත් වෙන වෙනම ඉදිරිපත් කළ යුතුය. **ඒ සෑම කාණ්ඩයක් සඳහාම නැවත නොගෙවනු ලබන රු. 2,000.00 බැගින් වන කාණ්ඩ සංඛ්‍යාවට සමාන වටිනාකමැති දින 90 ක් වලංගු "ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය" නමින් ලබාගත් බැංකු අණකරයක් සමග අයදුම්පත ඉදිරිපත් කළ යුතුය. තැන්පතු සඳහා චෙක්පත් හෝ මුදල් ඇණවුම් භාරගනු නොලබන අතර,** ඕනෑම අයදුම්පතක් පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ පූර්ණ අයිතිය විශ්වවිද්‍යාලය සතුය.

2021 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේදී ඔවුන් 2020 වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයෙන් නිකුත් කළ මිල කැඳවුම් හා ඇණවුම් සම්බන්ධයෙන් ක්‍රියාකළ ආකාරය ඇගයීමට ලක් කරනු ලැබේ. මිල කැඳවීම් සඳහා ප්‍රතිචාර නොදක්වන ලද හා ඇණවුම් සඳහා භාණ්ඩ ලබා නොදෙන ලද සැපයුම්කරුවන් සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රසම්පාදන කමිටුව මගින් ලබා දෙන තීරණ අනුව ලියාපදිංචිය සම්බන්ධයෙන් කටයුතු කරනු ලැබේ. භාණ්ඩ හා සේවා සඳහා මිල කැඳවීම සාමාන්‍යයෙන් ලියාපදිංචි වූ සැපයුම්කරුවන්ගෙන් සිදු කරනු ලැබුවද තරගකාරී මිලක් ලබා ගැනීමට අවශ්‍ය වූ විට හා ප්‍රමාණවත් සැපයුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති විට වෙනත් සැපයුම්කරුවන්ගෙන්ද මිල ගණන් ලබා ගැනීමේ අයිතිය විශ්වවිද්‍යාලය සතුය.

2021 වර්ෂය සඳහා ලියාපදිංචි සැපයුම්කරුවන් අවම වශයෙන් දින 30 ක කාලයක් සඳහා ණය පහසුකම් මත භාණ්ඩ සැපයුම් කිරීමට එකඟ විය යුතුය.

අයදුම්පත්‍රය සමග ව්‍යාපාරයේ ලියාපදිංචි සහතිකය, VAT සඳහා ලියාපදිංචි සහතිකය සහ ජාතික හැඳුනුම්පත / පත් හි පිටපත් අමුණා එවිය යුතුය. කොන්ත්‍රාත් කාර්යයන් සඳහා ලියාපදිංචි වීමට අපේක්ෂා කරන්නේ නම් CIDA සහතිකයේ පිටපතක්ද අමුණා එවිය යුතුය.

භාණ්ඩ හා සේවාවන්ට අදාළ කාණ්ඩ / අනුකාණ්ඩ හා ආදර්ශ ආකෘති පත්‍රය පහතින් දක්වා ඇත. ඒ අනුව සකස් කළ අයදුම්පත්‍ර නිසි පරිදි සම්පූර්ණ කර ලිපි කවරයක බහා "2021 **වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම**" ලෙස වම්පස ඉහළ කෙළවරේ සඳහන් කර **ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී / සැපයුම්, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය, කුලියාපිටිය** යන ලිපිනයට 2020 නොවැම්බර් 13 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය.

මේ සම්බන්ධයෙන් තවදුරටත් අවශ්‍ය විස්තර ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ සැපයීම් අංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරීගෙන් ලබාගත හැකිය. (දු. අ. 037-2283617)

**ලේඛකාධිකාරී,**
**ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය,**
**කුලියාපිටිය.**

2020-10-09

## භාණ්ඩ ප්‍රසම්පාදනය

**කාණ්ඩ අංක 01**

**කාර්යාලීය ලිපිද්‍රව්‍ය සහ පාරිභෝගික භාණ්ඩ**

1.1 මුද්‍රණ කඩදාසි, මුද්‍රණ ද්‍රව්‍ය, යතුරුලියන කඩදාසි, රෝනියෝ කඩදාසි, කාබන් කඩදාසි, ලිපිකවර, ෆයිල් කවර සී.ආර්.පොත්, තීන්ත. පෑඩ් තීන්ත, ඇල්පෙනිති, ඇමුණුම් කටු, ස්ටේප්ලර්, ස්ටේප්ලර් කටු, ලිපිබරු, බෝල්පොයින්ට් පෑන්, පැන්සල්. රටහුනු. රබර් සිල්, මැග්නෙටික් පෑන් යනාදිය

1.2 ඡායා පිටපත් කොළ සහ පරිගණක ලිපි ද්‍රව්‍ය

1.3 පොත් සහ සඟරා

**කාණ්ඩ අංක 02**

ඡායා පිටපත් කිරීමේ යන්ත්‍ර හා පරිගණක මුද්‍රණ යන්ත්‍ර සඳහා ටෝනර් කාට්රිජ්, සහ රිබන් ආදිය

**කාණ්ඩ අංක 03**

**කාර්යාලයීය ලී බඩු**

3.1 කාර්යාලයීය ලී බඩු (දැව)

3.2 කාර්යාලයීය ලී බඩු (වානේ )

3.3 කාර්යාලයීය ලී බඩු (ෆයිබර් ග්ලාස්)

3.4 පොලිමර් සහ ප්ලාස්ටික් ගෘහ භාණ්ඩ

3.5 MDF ගෘහ භාණ්ඩ

**කාණ්ඩ අංක 04**

**කාර්යාලයීය උපකරණ**

4.1 ගණක යන්ත්‍ර, ඉලෙක්ට්‍රොනික් සහ සාමාන්‍ය යතුරු ලියනයන්, පණිවිඩ හුවමාරු උපකරණ, රෝනියෝ යන්ත්‍ර, Fax Machine, ආදිය.

4.2 පරිගණක, පරිගණක මෘදුකාංග හා දෘඩාංග

4.3 ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ හා අමතර කොටස්

4.4 ඉලෙක්ට්‍රොනික උපකරණ හා අමතර කොටස්

4.5 ආරක්ෂක කැමරා පද්ධති

**කාණ්ඩ අංක 05**

**විදුලි උපකරණ සහ උපාංග**

5.1 අධි ශීතකරණ, ශීතකරණ, රෙදි සෝදන යන්ත්‍ර

5.2 විදුලි ජනන යන්ත්‍ර, වායුසමීකරණ යන්ත්‍ර

5.3 විදුලිපංකා, විදුලි උදුන්, Vacuum Cleaners, Floor Polishers, Hot Cupboards, Water Dispenser, විදුලි කේතල්, ජල පෙරණ

5.4 රූපවාහිනී යන්ත්‍ර, Video Recorder, Voice Recorder

**කාණ්ඩ අංක 06**

**විද්‍යාගාර රසායන ද්‍රව්‍ය හා උපකරණ**

6.1 විද්‍යාගාර උපකරණ හා අන්වීක්ෂ

6.2 විද්‍යාගාර රසායන ද්‍රව්‍ය හා වීදුරු බඩු

6.3 කෘෂි රසායන ද්‍රව්‍ය

6.4 කාබනික පොහොර / රසායන පොහොර

6.5 තවාන් සඳහා අවශ්‍ය ද්‍රව්‍ය හා පැළ

6.6 රසායනාගාරයේ භාවිතය සඳහා අවශ්‍ය උපකරණ (පිපෙට්ටු ප්ලාස්ටික් නළ වැනි දේ)

6.7 වෛද්‍ය උපකරණ හා ආශ්‍රිත උපකරණ

6.8 මිනිස් ආකෘති

6.9 ඉංජිනේරු විද්‍යාගාර සඳහා අවශ්‍ය උපකරණ හා ආශ්‍රිත උපකරණ

**කාණ්ඩ අංක 07**

**ආහාරයට සුදුසු රසායනික අමුද්‍රව්‍ය සැපයුම්කරුවන්**

7.1 කිරි නිෂ්පාදන ආශ්‍රිත අමුද්‍රව්‍යයන්

7.2 එන්සයිම

7.3 කැල්සියම් ක්ලෝරයිඩ්

7.4 අනුමත රසකාරක හා වර්ණක

**කාණ්ඩ අංක 08**

**සත්ව ජෛව තාක්ෂණික** (Animal Biotechnology) **ක්‍රමවේදයන්ට අදාළ පර්යේෂණ සිදුකිරීමට අවශ්‍ය රසායනික ද්‍රව්‍ය**

8.1 taqපොලිරේස් එන්සයිම

8.2 DNTP (නියුක්ලියෝටයිඩ් මිශ්‍රණය)

8.3 100 base pair ladder

8.4 Bovine Serum Albumin (BSA)

**කාණ්ඩ අංක 09**

**සත්ව ගොවිපළ සඳහා වෛද්‍ය සැපයුම්කරුවන් සහ සත්ත්ව පාලන උපකරණ**

9.1 බෙහෙත් වර්ග (සත්ත්ව)

9.2 සැරහුම් ද්‍රව්‍ය

9.3 සත්ව පෝෂණ ද්‍රව්‍යයන්

9.4 කිරි දෙවීමේ උපකරණ ඇතුළු අනිකුත් උපකරණ

9.5 සත්ව පර්යේෂණ සඳහා අවශ්‍ය උපකරණ (සත්ව කොටු සෑදීමට, සතුන්ට ජලය, ආහාර ලබා දෙන උපකරණ)

**කාණ්ඩ අංක 10**

**මෝටර් වාහන අමතර කොටස් සැපයුම්කරුවන්**

10.1 මෝටර් වාහන අමතර කොටස්

10.2 ටයර්, ටියුබ් සහ වාහන බැටරි

10.3 මෝටර් වාහන අමතර කොටස් අධ්‍යයන කටයුතු සඳහා

**කාණ්ඩ අංක 11**

**ගොඩනැගිලි ද්‍රව්‍ය සහ අනෙකුත් ද්‍රව්‍ය සැපයුම්කරුවන්**

11.1 තීන්ත, පොලිෂ්, වැක්ස්, වාර්නිෂ්, තිනර් සහ ටර්පන්ටයින්ට්

11.2 වානේ, ජී අයි තහඩු සහ පයිප්ප, යකඩ ඇණ, බෝල්ට් ඇණ, වතුර ටැංකි. උදළු, ගල්කටු, විල්බැරෝ, අලවංගු ආදිය

11.3 P.V.C. පයිප්ප සහ සවිකිරීම්

11.4 පිඟන්, මැටි භාණ්ඩ, මුළුතැන්ගෙයි උපකරණ, සනීපාරක්ෂක උපකරණ සහ නාන කාමර කට්ටල

11.5 කොසු, බුරුසු සහ ඉදල්

11.6 රබර් සහ කොහු මෙට්ට

11.7 බල්බ,වයර්, මීටර්ස්, කේබල්ස්, ස්විච්, ප්ලග් ටොප්, හෝල්ඩර් සහ අනෙකුත් විදුලි උපාංග.

11.8 ගඩොල්, වැලි, සක්කගල්, ගල් සහ හුණු, සිමෙන්ති, උළු, වීදුරු ආදිය

11.9 දැව සහ ඉරන ලද ලී

**කාණ්ඩ අංක 12**

**ක්‍රීඩා භාණ්ඩ සහ ක්‍රීඩා ඇඳුම් සැපයුම්කරුවන්**

12.1 ක්‍රීඩා භාණ්ඩ

12. 2 ක්‍රීඩා ඇඳුම්

12. 3 ක්‍රීඩා උපකරණ

**කාණ්ඩ අංක 13**

**ඖෂධ වර්ග සැපයුම්කරුවන්**

**කාණ්ඩ අංක 14**

**රෙදි පිළි / තිර රෙදි / පාවහන් /වැහි කබා සැපයුම්කරුවන්**

14.1 නිල ඇඳුම් රෙදි

14.2 ජනෙල් රෙදි

14.3 පාවහන් (සාමාන්‍ය)

14.4 ආරක්ෂක පාවහන්

14.5 වැහි කබා ආරක්ෂක ඇඳුම් කට්ටල් ආදිය

**කාණ්ඩ අංක 15**

15.1 ආරක්ෂක උපකරණ

15.2 ගිනි නිවීමේ උපකරණ

**කාණ්ඩ අංක 16**

16.1 පදක්කම් ( ලෝකඩ හා රන් ආලේපිත ) සෑදීම

16.2 උපාධි සහතික බහාලන මංජුසා

16.3 උපාධි ලෝගු සැපයීම

16.4 උපාධි මාලා

## සේවා ප්‍රසම්පාදනය

**කාණ්ඩ අංක 17**

**කාර්යාලයීය උපකරණ අලුත්වැඩියාව**

17.1 සාමාන්‍ය හා විදුලියෙන් ක්‍රියාකරන යතුරු ලියන ඇතුළු කාර්යාල උපකරණ සහ කැල්කියුලේටර් අලුත්වැඩියා කිරීම

17.2 පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර ඡායා පිටපත් යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර, අලුත්වැඩියා කිරීම

17.3 ශීතකරණ, අධි ශීතකරණ, වායුසමීකරණ යන්ත්‍ර අලුත්වැඩියාව

17.4 ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ අලුත්වැඩියාව

17.5 සන්නිවේදන උපකරණ අලුත්වැඩියාව (ෆැක්ස් යන්ත්‍ර)

17.6 වෛද්‍ය උපකරණ අලුත්වැඩියාව

**කාණ්ඩ අංක 18**

**මුද්‍රණ කටයුතු**

18.1 මුද්‍රණ කටයුතු සහ පොත් බැඳීම

18.2 ශිෂ්‍ය හැඳුනුම්පත් මුද්‍රණය / ශිෂ්‍ය වාර්තා පොත් මුද්‍රණය

**කාණ්ඩ අංක 19**

පුටු විවීම.

**කාණ්ඩ අංක 20**

**පානීය ජලය සැපයීම**

20.1 ජල බවුසර් මගින් පානීය ජලය සැපයීම

**කාණ්ඩ අංක 21**

**නළ ළිං**

21.1 නළ ළිං පොම්ප අලුත්වැඩියාව හා සේවා කිරීම්

21.2 නළ ළිං ඉදිකිරීම

**කාණ්ඩ අංක 22**

**විදුලි ජනන යන්ත්‍ර**

22.1 විදුලි ජනන යන්ත්‍ර අලුත්වැඩියාව හා සේවා කිරීම්

**කාණ්ඩ අංක 23**

**මෝටර් වාහන අලුත්වැඩියාව**

23.1 මෝටර් වාහන අලුත්වැඩියාව හා වාහන සේවා කිරීම

23.2 ඔටෝ ඒසී, ඔටෝ ඉලෙක්ට්‍රිකල්, ටින්කර් කිරීම, තීන්ත ගෑම හා එන්ජින් අලුත්වැඩියා කිරීම, කුෂන් වැඩ

**කාණ්ඩ අංක 24**

**පවිත්‍ර කිරීම් හා සනීපාරක්ෂක කටයුතු**

24.1 කාර්යාල, දේශන ශාලා හා නිවාස ශුද්ධ පවිත්‍ර කිරීම

24.2 ගලි ඇදීම.

24.3 උද්‍යාන අලංකරණ,

24.4 උපාධි ලෝගු සේදීමේ සේවාවන්

24.5 විද්‍යාගාර කබා සේදීමේ සේවාවන්

24.6 තිර රෙදි සේදීම

24.7 ඇඳ ඇතිරිලි, තුවා, කොට්ට උර සේදීමේ සේවාව

24.8 ව්‍යච්ඡේදනය කරනලද මළ සිරුරු කොටස්, අස්ථි කොටස් ආදහනය කිරීම හෝ භූමදානය කිරීම.

**කාණ්ඩ අංක 25**

**ගෘහ අලංකරණ**

25.1 ගොඩනැගිලි ඇතුළත අලංකරණ කොන්ත්‍රාත්කරුවන් (තිර රෙදි වර්ටිකල් බ්ලයින්ඩ්ස්, වීදුරු, ස්ටිකර්, උත්සව සඳහා මල් සැකසුම් ආදිය)

**කාණ්ඩ අංක 26**

**ශ්‍රම සේවා සැපයීම**

26.1 කම්කරු සේවා සැපයීම.

26.2 ආරක්ෂක සේවා සැපයීම

**කාණ්ඩ අංක 27**

**භාණ්ඩ හා මගී ප්‍රවාහනය**

27.1 කුලියාපිටිය සිට සහ මාකඳුර සිට (කාර්, වෑන්, බස්, ලොරි ආදිය) ප්‍රවාහන පහසුකම් සැපයිය හැක්කේ කුලියාපිටිය පරිශ්‍රයේ සිට ද සහ මාකඳුර පරිශ්‍රයේ සිට ද යන්න පැහැදිලිව දැක්විය යුතුය.

**කාණ්ඩ අංක 28**

පස් භාරන තලන යන්ත්‍ර, ලොරි රථ, ටිපර් රථ ආදිය කුලියට දෙන කොන්ත්‍රාත්කරුවන්

**කාණ්ඩ අංක 29**

උත්සව සඳහා තාවකාලික කුටි (Canapees ) කුලියට සැපයීම

**කාණ්ඩ අංක 30**

ආහාරපාන සැපයීම

**කාණ්ඩ අංක 31**

පුස්තකාල පොත් හා වාර සඟරා (ප්‍රකාශකයින් සහ දේශීය නියෝජිතයින්)

**කාණ්ඩ අංක 32**

ගිනි නිවීමේ උපකරණ සේවා සහ නඩත්තු කටයුතු

**කාණ්ඩ අංක 33**

උපාධි ප්‍රදානෝත්සව ඡායාරූපකරණය, කැමරාකරණය

## වැඩ ප්‍රසම්පාදනය

**කාණ්ඩ අංක 34**

පරිගණක ජාලකරණය

**කාණ්ඩ අංක 35**

ඇලුමිනියම් කොන්ත්‍රාත්කරුවන් (ඇලුමිනියම් පාටිෂන්, ජිප්සම් බෝඩ් පාටිෂන්, සස්පෙන්ඩඩ් සීලින්, MDF පාටිෂන් )

**කාණ්ඩ අංක 36**

වානේ හා මල නොබැඳෙන වානේ නිපැයුම්කරුවන් (වැටවල්, බර වානේ ගෘහ භාණ්ඩ, අත් වැටවල්, වෙල්ඩින් වැඩ, කාප්ප)

**කාණ්ඩ අංක 37**

මාර්ග ඉදි කිරීම් කොන්ත්‍රාත්කරුවන්

**කාණ්ඩ අංක 38**

ගොඩනැගිලි ඉදිකිරීම, තීන්ත ගෑම, අලුත්වැඩියා හා නඩත්තු වැඩ. (CIDA සහතිකයේ පිටපතක් අයදුම්පත් සමග ඉදිරිපත් කළ යුතුය. )

**කාණ්ඩ අංක 39**

වඩු කාර්මික යන්ත්‍ර , උපකරණ කොටස් සහ අමුද්‍රව්‍ය

**කාණ්ඩ අංක 40**

වැඩහල් යන්ත්‍ර උපකරණ කොටස් සහ අමුද්‍රව්‍ය

**කාණ්ඩ අංක 41**

වෙල්ඩිං සහ වාත්තු උපකරණ

**කාණ්ඩ අංක 42**

විද්‍යුත් සහ විදුලි උපකරණ කොටස්

### ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ
### 2021 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි වීම
### ආදර්ශ අයදුම්පත්‍රය

01. සැපයුම්කරුගේ / ව්‍යාපාර ආයතනයේ නම : ..............................

02. ව්‍යාපාර ආයතනයේ ලිපිනය : ..............................

03. ඇමතුම් අංක :

★ දුරකථන අංක : ..............................

★ ෆැක්ස් අංක : ..............................

★ ඊ මේල් ලිපිනය : ..............................

04. ව්‍යාපාරයේ හිමිකාරීත්වය

(අදාළ කොටුව තුළ (✓) ලකුණ යොදන්න)

තනි පුද්ගල ව්‍යාපාරයක් ☐
හවුල් ව්‍යාපාරයක් ☐
සීමිත සමාගමක් ☐
රාජ්‍ය ආයතනයක් ☐
සංස්ථාවක් ☐

05. අයිතිකරුගේ / අයිතිකරුවන්ගේ නම් : ..............................

06. ජාතික හැඳුනුම්පත් අංකය
සහ ගුවන් ගමන් බලපත්‍ර අංකය : ..............................

07. නිෂ්පාදක ද, එකම අලෙවි නියෝජිත ද, එකම ආනයනකරු ද, එකම බෙදා හරින්නා ද, තොග රැස්කරන්නා ද යනාදී විස්තර :

..............................

..............................

..............................

08. ව්‍යාපාරයේ ලියාපදිංචි අංකය : ..............................

09. ලියාපදිංචි ව්‍යාපාරයේ ස්වභාවය : ..............................

(සැපයුම්කරුගේ / ව්‍යාපාර ආයතනයේ ප්‍රධාන ව්‍යාපාර ක්ෂේත්‍රය සඳහන් කළ යුතුය.)

10. ගිණුම් පවත්වාගෙන යනු ලබන බැංකුව / : ..............................

බැංකු හා ගිණුම් අංක : ..............................

11. එකතු කළ අගය මත බදු අංකය (VAT ) : ..............................

බදු ගෙවන්නා හඳුනා ගැනීමේ අංකය (TIN) : ..............................

12. ලියාපදිංචි වීමට අපේක්ෂා, කරන භාණ්ඩ / සැපයුම් කාණ්ඩ අංකය /අනු අංක ..............

(i) කාණ්ඩ අංකය ☐☐

(ii) අනු අංක ☐☐☐☐☐☐

(එක් එක් භාණ්ඩ කාණ්ඩය හෝ සේවා කාණ්ඩය වෙනුවෙන් ලියාපදිංචි වීමට වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.)

13. දින 30 ක අවම කාලයට ණය පහසුකම් මත සැපයීම් කිරීමට එකඟ වන්නේ ද යන වග

: ..............................

14. වෙනත් පහසුකම්, ප්‍රවාහනය, ගබඩා පහසුකම් ආදිය : ..............................

15. (i) බැංකු අණකර අංකය : ..............................

16. (ii) වටිනාකම : රු ..............................

17. පහත සඳහන් සහතිකවල පිටපත් මෙයට අමුණා ඇත.

අදාළ කොටුව තුළ (✓) ලකුණ යොදන්න

I. ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ සහතිකය ☐
II. VAT සඳහා ලියාපදිංචි සහතිකය ☐
III. ජාතික හැඳුනුම්පත / පත් ☐
IV. CIDA සහතිකය ☐

**දිනය :..............................**

..............................
**අයදුම්කරුගේ අත්සන**
**නිල මුද්‍රාව**

# දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව

## 2021 වර්ෂය සඳහා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම

2021 වර්ෂය සඳහා මෙම නගර සභාවේ ව්‍යාපෘති ඉටු කිරීම පිණිස කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කර ගැනීම සඳහා පහත සඳහන් කොන්දේසිවලට යටත්ව ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) 2021 වර්ෂය සඳහා ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගෙන් 2020.11.10 දින ප.ව.2.00 දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්පත් බහා එවනු ලබන කවරයේ ඉහළ වම් කෙළවරේ **"කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම - 2021"** යනුවෙන් පැහැදිලිව සටහන් කර **"දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවේ නාගරික කොමසාරිස්"** වෙත ලියාපදිංචි තැපෑලෙන් හෝ පෞද්ගලිකව අතින් ගෙනැවිත් හෝ නාගරික කොමසාරිස් කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ නියමිත දින නියමිත වේලාවට ප්‍රථම තැන්පත් කිරීම හෝ කළ හැකිය. නියමිත දිනට පසුව ඉදිරිපත් කරනු ලබන හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් පිළිබඳව සලකා බැලීම සිදු නොකරන අතර, තැපෑලේදී නැතිවන හෝ අස්ථානගත වන අයදුම්පත් වෙනුවෙන් මෙම සභාව වගකියනු නොලැබේ.

එසේම කොන්ත්‍රාත්කරුවකු වශයෙන් ලියාපදිංචි වීමට එක් එක් ලියාපදිංචි සීමාවන් සඳහා ලියාපදිංචි ගාස්තු මුදල් පහත දක්වා ඇති පරිදි වේ. මෙම ගාස්තු ගෙවීමෙන් පසු නාගරික ඉංජිනේරු දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන අයදුම්පත ලබාගත හැකි අතර, ඒ මගින් ලියාපදිංචි වීමට ඉල්ලුම් කළ හැකිය.

| කොන්ත්‍රාත් කාණ්ඩය | ශ්‍රේණිය | ලියාපදිංචි ගාස්තු |
|---|---|---|
| • ගොඩනැගිලි ඉදිකිරීම හා නඩත්තු කිරීම.<br>• මහාමාර්ග ඉදිකිරීම හා නඩත්තු කිරීම.<br>• පාලම් ඉදිකිරීම. | C-10 | රු.2,000.00 |
| | C-9 | රු.2,500.00 |
| | C-8 | රු.3,000.00 |
| | C-7 | රු.3,500.00 |
| | C-6 | රු.4,000.00 |
| | C-5 | රු.4,500.00 |
| | C-4 | රු.5,000.00 |
| | C-3 | රු.5,500.00 |

**කොන්දේසි :**

1. මෙම සභාවේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ට අමතරව පිටස්තර කොන්ත්‍රාත්කරුවන්ගෙන් හෝ ආයතනවලින් ද අවශ්‍යතාවය මත ලංසු මිල සැඳහුම් කැඳවීමේ අයිතිය සභාව සතුවේ.

**ඩබ්.ටී.ඒ. මානෙල්**
**නාගරික කොමසාරිස්,**
**දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව.**

# පිස්කල් විසින් කරනු ලබන වෙන්දේසියයි

## කොළඹදී පවත්වනු ලබන බස්නාහිර පළාත්බද (වාණිජ) මහාධිකරණයේ දීය.

සීමාසහිත මාතර දිස්ත්‍රික් සමූපකාර ග්‍රාමීය බැංකු සංගමය
**Matara District Co-operative Rural Banks Union Limited,**
නො. 38/A/1, උයන්වත්ත පිට්ටනිය පාර,
මාතර.

පැමිණිලිකරු

නඩු අංකය : MB 351/15 - එදිරිව -
ස්වභාවය : උකස්
කාර්ය පටිපාටිය : සාමාන්‍ය
වටිනාකම : රු. 62,534,966/-

රේඩියන්ට් ට්‍රේඩින් කම්පැණි පුද්ගලික සමාගම,
Radiant Trading Company (Private) Limited,
නො. 455, සමූපකාර මන්දිරය,
ගාලුපාර, කොළඹ.

විත්තිකරු

කොළඹ වාණිජ මහාධිකරණයේ ඉහත අංක දරන නඩුවෙන් මා වෙත නිකුත් කර ඇති දේපළ තහනමට ගෙන විකිණීමේ රීට් ආඥාව මත ඉහත සඳහන් විත්තිකරුගෙන් පැමිණිලිකරුට අයකර ගැනීමට ඇති වර්ෂ 2018.02.01 වන දිනට ශ්‍රී ලංකා රුපියල් පනස් අට මිලියන එක් ලක්ෂ දස දහස (රු. 58,110,000/-) ක මුදලක් සහ එකී මුදලට 2018.02.01 වන දින සිට පැමිණිල්ලේ දින දක්වා වසරකට 20% බැගින් වූ පොලියක්ද, පැමිණිල්ලේ දින සිට තීන්දු ප්‍රකාශයේ දින දක්වා එම මුදල සම්පූර්ණ මුදල මත නෛතික පොලිය ද අයකර ගැනීම සඳහා මොරවක දිසා අධිකරණයේ රෙජිස්ට්‍රාර් / නියෝජ්‍ය පිස්කල් වන මා විසින් 2020 ක් වූ මාර්තු මස 05 වැනි දින තිසි ලෙස තහනමට ගත්තා ලද පහත උපලේඛනයේ විස්තර වන දේපළ, වර්ෂ 2020 ක් වූ නොවැම්බර් (11) මස විස්ස (20) වන දින පෙරවරු 10.00 ට එකී නිශ්චල දේපළ පිහිටි .... යන ස්ථානයේදීම වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

**ගෙවීමේ ක්‍රමය :**

වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් ගෙවීම් ගැනුම්කරු විසින් මා වෙත ගෙවිය යුතුය. සියලුම ගෙවීම් මුදලින් පමණක් කළ යුතු අතර, චෙක්පත් භාරගනු නොලැබේ.

★ සම්පූර්ණ මුදල් ගෙවා එදිනම භාණ්ඩ නිදහස් කරගත යුතුය.

**ඉහත කී උපලේඛනය**

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මොරවක් කෝරළයේ, කොටපොළ ප්‍රාදේශීය සභා සීමාව තුළ, කොටපොළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මොරවක ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, මොරවක නැමති ගමේ පිහිටි ටී.ජී. 366841 දරන උඩහිටිහේන, උඩහිටිකන්ද නොහොත් තානායම්ගොඩැල්ල සහ උඩහිටිලන්දදෙණිය නැමති ඒකාබද්ධ ඉඩම අයි. කොටඹගේ බලයලත් මිනින්දෝරු තැන සකස් කළ අංක 1304 සහ 1996.04.03 දින දරන පිඹුර අනුව බෙදූ අංක 01, 08, 11, 12, 13, 13ඒ, 14, 15, 16, 17, 18, 19, 20, 21ඒ, 21බී, 22, 23, 24, 25, 26, 27, 28, 29, 30, 32, 33, 34, 35, 36, 37, 38, 39, 40, 41, 42, 43, 44, 45, 46,47, 48, 49, 50, 51, 52, 53, 54, 55, 56, 57, 59, 60, 61, 62, 63, 64, 65, 66, 67, 68, 69, 70, 71, 72, 73, 74, 75, 76, 77, 78, 79, 80, 81, 82, 84, 85, 86, 87, 88, 89, 90, 91, 92, 93, 94, 95, 96, 97, 98, 99ඒ, 99බී, 100, 101, 102 දරන කැබලිවලින් සමන්විත ඒකාබද්ධ ඉඩම නම් වූ,

උතුරට : අකුරැස්ස - දෙනියාය මහා මාර්ගය, කොනේ කඩේ, බී.පී. දෙන් අර්නෝලිස්ට අයිති ඉඩම, එස්.පී. ඩයස් සහ ඒ.ඒ. අලහකෝන්ට අයිති ඉඩම්, මෙම ඉඩමේ මීට පෙර අන්සතු කර ඇති අංක 02, 03, 4ඒ, 4බී, 05, 06, 07ඒ, 07බී, 09, 10, 31 සහ 58 දරන කැබලි ද,

නැගෙනහිර : ගුරුබැවුලලෙහේන ද, මෙම ඉඩමේ මීට පෙර අන්සතු කර ඇති අංක 07, 09, 10, 31 සහ 58 දරන කැබලි ද,

දකුණට : නිල්වලා ගඟ, කංකානම්ගේවත්ත, කෝපිවත්ත සහ කනත්තේගෙදරවත්ත ද,

බස්නාහිරට : ගම්සභා පාරට ද මායිම් වූ අක්කර දහයක් (අක්. 10, රූ. 00, ප. 00) ක් විශාල ඉඩමෙන් කැබලි අංක 01, 08, 11, 15,16, 18, 19, 20, 25B, 26A, 30, 31, 62, 63, 65, 75, 76, 77, 85, 90, 96 යන ඉඩම් කැබලි අතහැර ඒ තුළ පිහිටි ඉතිරි සියලු බිම ගහකොළ, පළතුරු ආදිය සමග වේ.

**අධිකරණයේ අණ පරිදි**
**රෙජිස්ට්‍රාර් / නියෝජ්‍ය පිස්කල්**
**දිසා අධිකරණය - මොරවක**

**වර්ෂ 2020 ක් වූ ඔක්තෝබර් (10) මස 15 දින දීය.**

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

### රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

පුර නැගුම

## ලංසු සඳහා ආරාධනයයි (IFB)

## (ජාතික තරගකාරී ලංසුකරණය)

**දිනය** : 2020.10.20
**ලංසු ආරාධනා අංකය** : LGESP-AF- UVA-24
**ණය අරමුදල් අංකය හා ශීර්ෂය** : L3431, පළාත් පාලන වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතිය (අමතර අරමුදල් සැපයීම)
**කොන්ත්‍රාත් අංකය හා ශීර්ෂය** : පැකේජ අංකය : UVA-AF-WS-CKD-17, රහතන්ගම ප්‍රදේශයේ බෙදාහැරීමේ පද්ධතිය නැවත එලා දීර්ඝ කිරීම
**ලංසු භාරගැනීමේ අවසන් දිනය** : 2020.11.23 දින14.30පැය (දේශීය වේලාවෙන්)

1. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත, ආසියානු සංවර්ධන බැංකුව (ADB) වෙතින්, පළාත් පාලන වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතියෙහි අමතර අරමුදල් සැපයීම (LGESP-AF) පිරිවැය සඳහා ණය මුදලක් ලැබී ඇති අතර, ඉන් කොටසක් ඉහත සඳහන් කොන්ත්‍රාත්තුව යටතේ වන සුදුසුකම්ලත් ගෙවීම් සඳහා යෙදවීමට අපේක්ෂිතය.
2. ශ්‍රී ලංකාවේ ඌව පළාත් සභාවේ ප්‍රධාන ලේකම් (සභාපති, පළාත් ප්‍රසම්පාදන කමිටුව) විසින් ඉහත සඳහන් කාර්යය ඉටුකිරීම සඳහා සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍ර, තැබූ ලංසු කැඳවනු ලැබේ.
3. ආසියානු සංවර්ධන බැංකුවේ තනි අදියර - තනිකවර ලංසුකරණ ක්‍රියාපටිපාටිය (NCB/1S1E) ප්‍රකාරව ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය තුළින් මෙම ලංසුකරණය පවත්වනු ලබන අතර, ලංසු ලේඛනයන්හි විස්තර කොට ඇති පරිදි සුදුසුකම්ලත් රටවල සියලුම ලංසුකරුවන් හට විවෘතය.
4. පහත සඳහන් ප්‍රධාන සුදුසුකම් සහිත ලංසුකරුවන් පමණක් මෙම ලංසුකරණය සඳහා සහභාගී වීමට සුදුසුකම් ලබති.
   අ. ජාතික ලංසුකරුවන්, CIDA (කලින් ICTAD) ආයතනයේ, ජලසම්පාදන හා මලාපවහන ක්ෂේත්‍රයේ C5 හෝ ඉහළ ශ්‍රේණියක ලියාපදිංචි වී සිටිය යුතු අතර, පහත 4 (ඇ) හි සඳහන් සුදුසුකම් සම්පූර්ණ කොට තිබිය යුතුය.
      (i) බද්ධ ව්‍යාපාර සම්බන්ධයෙන් ගත්විට, දේශීය ලංසුකරුවන් අතර ප්‍රධාන හවුල්කරු අවශ්‍ය CIDA (කලින් ICTAD) ලියාපදිංචිය සතු අයකු විය යුතුය.
   ආ. විදේශ ලංසුකරුවන්, පහත 4 (ඇ) හි සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.
      (i) බද්ධ ව්‍යාපාර වශයෙන් ගත්විට, දේශීය හා විදේශීය හවුල්කරුවන් අතරින් විදේශ හවුල්කරු විසින් 4 (ඇ) කොටසේ සඳහන් අවශ්‍ය සුදුසුකම් සපුරා තිබියදී වුවද, දේශීය හවුල්කරු, අවශ්‍යයෙන්ම විශේෂයෙන් සඳහන් CIDA (කලින් ICTAD) ලියාපදිංචිය ලබා තිබිය යුතුය.
   ඇ. ලංසුකරුවන් සතුවිය යුතු සුදුසුකම්:

| අනු අංකය | පැකේජයේ නම / ක්‍රියාත්මක කිරීමේ කාල සීමාව | සුදුසුකම් නිර්ණායක | | | |
|---|---|---|---|---|---|
| | | මූල්‍ය තත්වය - මුළු වත්කම් හා මුළු වගකීම්වල වෙනස ලෙසට ගණනය කළ ලංසුකරුගේ පසුගිය වසර සඳහා ශුද්ධ වත්කම්, (පසුගිය වසර 03 තුළ විගණනය කළ මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කළ යුතුය) | වාර්ෂික ඉදිකිරීම් පිරිවැටුමේ අවම සාමාන්‍යය - පසුගිය වසර 03 තුළ සම්පූර්ණ කළ හෝ කෙරෙමින් පවත්නා කොන්ත්‍රාත් සඳහා ලද සහතික කළ මුළු ගෙවීම් ලෙස ගණනය කෙරේ | මූල්‍ය සම්පත් - පවතින මූල්‍ය සම්පත් | ඉදිකිරීම් පළපුරුද්ද - ලංසු අවසන් දිනට පසුගිය වසර 5 තුළ සාර්ථකව හෝ ප්‍රමාණාත්මකව සම්පූර්ණ කළ අවම වශයෙන් එක් කොන්ත්‍රාත්තුවක සහභාගීත්වය හෝ ක්‍රියාත්මක කිරීම |
| 1 | රහතන්ගම ප්‍රදේශයේ බෙදාහැරීමේ පද්ධතිය නැවත එලා දීර්ඝ කිරීම පැකේජ අංකය UVA-AF-WS-CKD-17 ඉදිකිරීමේ කාලය දින 180 ක් | ශුද්ධ වටිනාකම ධනාත්මක විය යුතුයි | පසුගිය වසර 03 තුළ ශ්‍රී ලංකා රුපියල් මිලියන 90 ක අවම වාර්ෂික ඉදිකිරීම් පිරිවැටුම් සාමාන්‍යයක් තිබිය යුතුය | ලංසුකරුගේ කැපවීම ඉක්මවා වත්මන් ව්‍යාපෘතිය සඳහා අවම වශයෙන් රුපියල් මිලියන 25 ක් තිබිය යුතුය | ලංසුකරුවන් යෝජිත කර්මාන්තයට සමාන අවම වශයෙන් ව්‍යාපෘති 1ක් සම්පූර්ණ කොට තිබිය යුතු අතර, එහි ලංසුකරුගේ සහභාගීත්වයෙන් වටිනාකම ශ්‍රී ලංකා රු. මිලියන 36 (වැට් බදු හැර) ඉක්මවා තිබිය යුතුය |

**සටහන :** මින් පෙර ක්‍රියාත්මක කළ කොන්ත්‍රාත් බද්ධ ව්‍යාපාර සඳහා ලංසුකරු, පාර්ශවයක් ලෙස කටයුතු කර තිබුණහොත්, ඔහුගේ සහභාගීත්වය නිශ්චය කරනු ලබනුයේ ලංසු ලේඛනයන්හි අවශ්‍යතා අනුකූලවය.

5. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් හට පහත සඳහන් කාර්යාලය වෙතින් වැඩිදුර තොරතුරු ලබාගත හැකි අතර, එම කාර්යාලයේ දී ලංසු ලිපිලේඛන නොමිලේ පරික්ෂා කර බැලිය හැකිය.

   **පළාත් ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
   **පළාත් පාලන වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතිය - අමතර මුදල් සැපයීම (LGESP-AF)**
   **උප ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකය - ඌව පළාත,**
   **නො 3/104, රේස්කෝස් පාර, බදුල්ල**

   **දුරකථනය : +94552225201, ෆැක්ස් : +94552225201**
   **විද්‍යුත් තැපෑල : lgespuvanew@gmail.com**

6. ඉංග්‍රීසි බසින් සකස් කරන ලද ලංසු ලිපිලේඛන මිලදී ගැනීම සඳහා යෝග්‍යතා පූර්ණ උනන්දුවක් දක්වන ලංසුකරුවන්,
   - පැකේජයේ නම පැහැදිලිව සඳහන් කොට ලිඛිත අයදුම්පතක් ඉහත ලිපිනය වෙත ඉදිරිපත් කළ යුතුය.
   - ඉහත 4 වන ඡේදයේ සඳහන්ව ඇති පරිදි පැකේජය සඳහා ආපසු ගෙවනු නොලබන ශ්‍රී ලංකා රුපියල් 12,500/= ක් (ශ්‍රී ලංකා රුපියල් දෙළොස් දහස් පන්සියයක්) ඉහත 5 වන ඡේදයේ සඳහන් ලිපිනයේ "**පළාත් ව්‍යාපෘති අධ්‍යක්ෂ, උප ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකය (ඌව පළාත), පුරනැගුම - පළාත් පාලන වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතිය** (LGESP) " වෙත මුදලින් ගෙවිය යුතුය.
   - ලංසු ලිපි ලේඛන 2020.10.21 වන දින සිට 2020.11.19 දින දක්වා රාජකාරී දිනයන්හි 09.00 පැය සහ 15.00 පැය අතර ලබාගත හැකිය.
7. පූර්ව ලංසු රැස්වීම 2020.11.04 වෙනි දින 10.30 පැයේදී බදුල්ල, මාටින් සිල්වා මාවතේ පළාත් පාලන දෙපාර්තමේන්තු රැස්වීම් ශාලාවේදී පැවැත්වීමට සැලසුම් කොට ඇත. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් තමන්ගේ වියදමින් පූර්ව ලංසු රැස්වීමට සහභාගි විය හැකිය.
8. සම්පූර්ණ කරන ලද ලංසු, පහත සඳහන් ලිපිනය වෙත ඉදිරිපත් කරන ලෙස උනන්දුවක් දක්වන ලංසුකරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

   **පළාත් ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
   **පළාත් පාලන වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතිය - අමතර මුදල් සැපයීම (LGESP-AF)**
   **උප ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකය - ඌව පළාත,**
   **නො 3/104, රේස්කෝස් පාර, බදුල්ල**

   - 2020.11.23 වෙනි දින 14.30 (දේශීය වේලාව) පැයට පෙර,
   - ලංසු ලිපිලේඛනයේ නියම කොට ඇති පරිදි ලංසු ඇපකරයක් සමඟ,
   - අදාළ මුල් පිටපත හා අනුපිටපත බහාලූ කවරවල වම් ඉහළ කෙළවරේ කොන්ත්‍රාත් පැකේජ අංකය සඳහන් කර ඉදිරිපත් කළ යුතුය.
   - ලංසු භාර ගැනීම අවසන් වූ වහාම ඉහත සඳහන් ස්ථානයේදී එම අවස්ථාවට පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයන් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.
9. අදාළ වැඩබිම් චාරිකා සඳහා වැයවන පිරිවැය හා වියදම් ද ඇතුළත්ව ලංසු පිළියෙල කිරීමේදී හෝ ගෙනැවිත් භාරදීමේදී ලංසුකරුවන් හට සිදුවිය හැකි යම් පිරිවැයක් හෝ වියදමක් සම්බන්ධයෙන් සේවා යෝජකයා කිසිදු වගකීමක් දරන්නේ නැත.
10. IFB ඇතුළු ලිපිලේඛන **http://www.puraneguma.lk/additional-finanncing/project-tender-notices.php** යන ව්‍යාපෘති වෙබ් අඩවියෙන් සහ අදාළ දෙපාර්තමේන්තු වෙබ් අඩවිවල බැලීම සඳහා පමණක් ප්‍රසිද්ධ කොට ඇත. ආපසු ගෙවනු නොලබන ටෙන්ඩර් ගාස්තු ගෙවීමෙන් අනතුරුව උප ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකය (ඌව) වෙතින් මිලදී ගනු ලබන ලංසු ලිපිලේඛන පමණක් ඇගයීම සඳහා සලකා බලනු ලැබේ.

**පී. බී. විජයරත්න,**
**ප්‍රධාන ලේකම් - ඌව,**
**සභාපති - පළාත් ප්‍රසම්පාදන කමිටුව,**
**ඌව පළාත් සභාව,රජවීදිය,බදුල්ල**



සිළුමිණ The Silumina
වට පිට
පල දරන්න - පළ කරන්න
මංගල යෝජනා
දශක ගණනාවක විශ්වසනීය සේවාව...
දැන් වචන 15ක් රු. 560ක් පමණයි...

# කහවත්ත ප්‍රාදේශීය සභාව

## 2021 වර්ෂයට සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම

2020 වර්ෂය සඳහා පහත සඳහන් භාණ්ඩ හා සේවාවන් සැපයීම පිණිස පිළිගත් නිෂ්පාදකයින්, කොන්ත්‍රාත්කරුවන්, නියෝජිතයින්, සැපයුම්කරුවන්, ලියාපදිංචි සමුපකාර සමිති ඇතුළු රජයේ පිළිගත් ආයතන හා පුද්ගලයින්, කොන්ත්‍රාත්කරුවන්ගේන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**අයදුම්පත් 2020.11.31 දින හෝ ඊට ප්‍රථම ලේකම්,කහවත්ත ප්‍රාදේශීය සභාව, කහවත්ත** යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්‍ර බහා එවන කවරයේ **වම්පස ඉහළ කෙළවරේ** සැපයුම්කරුවන් **ලියාපදිංචි කිරීම – 2021** යනුවෙන් සඳහන් කළ යුතුය. ලියාපදිංචි ගාස්තුව **තැපැල් මඟින් එවනු ලබන්නේ නම් සභාපති, කහවත්ත ප්‍රාදේශීය සභාව** නමින් ලියන ලද චෙක් පතකින් ගෙවිය යුතුය. කාර්යාලයට පැමිණ භාර දෙන්නේනම් මුදලින් ගෙවිය හැක.

පහත දක්වා ඇති ආකෘතියට අනුව තමන් විසින් සකස් කරන ලද අයදුම්පතක් සහ අදාළ සහතිකවල පිටපත් (සියලු විස්තර සහිතව) සමඟ අමුණා එවිය යුතුය.

| අයිතම අංකය | සැපයුම් හා සේවා | ලියාපදිංචි ගාස්තු (රජයේ බදු සහිතව) |
|---|---|---|
| | **භාණ්ඩ** | |
| 1 | සියලුම කාර්යාලයීය උපකරණ, ලිපි ද්‍රව්‍ය හා පාරිභෝගික භාණ්ඩ | 1000.00 |
| 2 | කාර්යාලයීය ලී බඩු හා වානේ පුටු, අල්මාරි, කැබිනට් | 1000.00 |
| 3 | පරිගණක හා පරිගණක උපාංග | 1000.00 |
| 4 | විදුලි ආලෝක කිරීමට අවශ්‍ය සියලුම උපකරණ, වීථි ලාම්පු , අමතර කොටස්, ඇලුමිනියම් ඉනිමං, බඳපටි | 1000.00 |
| 5 | පී.වී.සී.පයිප්ප, ජල මීටර්, ජල සේවා සඳහා අවශ්‍ය උපාංග | 1000.00 |
| 6 | කොන්ක්‍රීට් භාණ්ඩ, හියුම් පයිප්ප, කොන්ක්‍රීට් කණු, සිමෙන්ති ගල් ඇතුළු පෙර නිමි කොන්ක්‍රීට් නිෂ්පාදන හා අන්තර් සම්බන්ධිත කුට්ටි ගල් සැපයීම | 1000.00 |
| 7 | සියලුම වර්ගයේ මෝටර් රථ අමතර කොටස් (ඩීසල්, පෙට්‍රල්, ඉදි කිරීම් යන්ත්‍ර) මෝටර් රථ, ට්‍රැක්ටර් හා ට්‍රේලර්, බැකෝ යන්ත්‍ර, ගල් රෝල්, ඩෝසර්, ලෝඩර්, කෘෂි කැබ් ආදී යන්ත්‍ර අමතර කොටස් | 1000.00 |
| 8 | තීන්ත වර්ග හා ගොඩනැගිලි අලුත්වැඩියා කටයුතු සඳහා අවශ්‍ය උපාංග, ගල්, වැලි, සිමෙන්ති, යකඩ ඇතුළු ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම | 1000.00 |
| 9 | වාහන බලපත්‍ර තහඩු හා වරිපනම් අංක තහඩු | 1000.00 |
| 10 | විෂබීජ නාශක (ක්ලෝරීන්, බේ ටැක්ස්, ජේ.සී.පවුඩර්) ආදිය | 1000.00 |
| 11 | නිල ඇඳුම් සඳහා අවශ්‍ය වන රෙදි වර්ග, බොත්තම් හා බැජස්, වැහි කබා, අත්වැසුම්, සපත්තු, බූට්ස් ආදිය | 1000.00 |
| 12 | ගැල්වනයිස් පයිප්ප අමතර කොටස්, යකඩ කම්බි, වානේ කම්බි, ඇත්ගල් යකඩ හා ලෝහ භාණ්ඩ, ඇණ හා මුරිච්චි, උදලු, අලවංගු, පිහිය ඇතුළු කම්කරු භාණ්ඩ | 1000.00 |
| 13 | කොසු, ඉදල්, බුරුසු, මොප්, වේවැල් කුඩ, කසළ කරත්ත, විල්බැරෝ, වැසිකිළි බුරුසු, විෂබීජ නාශක හා බාල්දි වැනි සෞඛ්‍ය උපකරණ | 1000.00 |
| 14 | වාහන සඳහා ටයර්, ටියුබ් සහ බැටරි | 1000.00 |
| 15 | කර්ටන් රෙදි, කොකු වර්ග හා උපාංග | 1000.00 |
| 16 | කාර්යාලයීය විදුලි උපකරණ, ගණක යන්ත්‍ර, විදුලි පංකා, විදුලි කේතල්, හීටර්, රෙකොඩර්, ටීවී ආදිය | 1000.00 |
| 17 | දැව සැපයීම (ලෑලි, පරාල, රීප්ප ආදිය) | 1000.00 |
| 18 | තාර හා ප්‍රිමික්ස් | 1000.00 |
| 19 | දින මුද්‍ර හා රබර් මුද්‍ර | 1000.00 |
| 20 | පෙර පාසල් ක්‍රීඩා උපකරණ | 1000.00 |
| 21 | දුරකථන පද්ධති උපාංග | 1000.00 |
| 22 | වීදුරු භාණ්ඩ, වීදුරු නිෂ්පාදන | 1000.00 |
| 23 | බෙහෙත් වර්ග | 1000.00 |
| | **සේවාවන්** | |
| 1 | ලී උපකරණ සාද ගැනීම (වඩු මඩුව) | 1000.00 |
| 2 | වානේ සහ යකඩ වැල්ඩින් කිරීම හා වානේ සුළු උපකරණ සෑදීම | 1000.00 |
| 3 | නාම පුවරු, දැන්වීම් පුවරු, සංඥා පුවරු, පින්තූර රාමු කිරීම, බැනර් ඇඳීම හා සකස් කිරීම | 1000.00 |
| 4 | වාහන අලුත්වැඩියා කිරීම හා සේවා කිරීම | 1000.00 |
| 5 | ශබ්ද විකාශන යන්ත්‍ර හා උපාංග සැපයීම | 1000.00 |
| 6 | හිස් බැරල්, පරණ පත්තර, අබලි භාණ්ඩ මිලදී ගැනීම | 1000.00 |
| 7 | ඉඩම් මැනීම හා තක්සේරු සේවා කටයුතු | 1000.00 |
| 8 | මුද්‍රණ කටයුතු හා පෝරම මුද්‍රණ කර ගැනීම | 1000.00 |
| 9 | මාර්ග තලන, ට්‍රැක්ටර් හා ට්‍රේලර්, බැකෝ යන්ත්‍ර, මාර්ග නඩත්තු යන්ත්‍ර කුලියට ගැනීම, | 1000.00 |
| 10 | වෑන් රථ හා ත්‍රී රෝද රථ ඇතුළු මෝටර් රථ කුලියට සැපයීම | 1000.00 |
| 11 | පරිගණක ඇතුළු සියලුම කාර්යාල විදුලි උපකරණ අලුත්වැඩියා කිරීම යන්ත්‍ර හා උපාංග අලුත්වැඩියා කිරීම | 1000.00 |
| 12 | පරිගණක උපදේශාත්මක සේවාවන් | 1000.00 |
| 13 | භාෂා පරිවර්තන සේවා | 1000.00 |
| 14 | විසි කැති, මුල්ලු ආදිය අලුත්වැඩියා කිරීම | 1000.00 |
| 15 | නීතිඥ සේවාවන් හා මිනින්දෝරු සේවා | 1000.00 |
| 16 | ටයර් පිරවීම | 1000.00 |
| 17 | වාහන ෂීට් කුෂන් කිරීම | 1000.00 |
| 18 | ගස් කපා ඉවත් කිරීම | 1000.00 |
| 19 | CCTV සවිකිරීම සහ නඩත්තු කටයුතු සිදු කිරීම | 1000.00 |
| | **ඉදිකිරීම් හා කොන්ත්‍රාත්කරුවන්** | |
| 1 | රුපියල් 50000.00 දක්වා | 1000.00 |
| 2 | රුපියල් 50001.00 සිට 100000.00 දක්වා | 1200.00 |
| 3 | රුපියල් 100001.00 සිට 500000.00 දක්වා | 1500.00 |
| 4 | රුපියල් 500001.00 සිට 1000000.00 දක්වා | 2000.00 |
| 5 | රුපියල් 1000000.00 ට වැඩි | 2500.00 |

**පොදු කොන්දේසි**

01. අවශ්‍ය අවස්ථාවලදී ලියාපදිංචි සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් හැරුණු විට වෙනත් සැපයුම්කරුවන්ගෙන් ද සැපයුම් ලබා ගැනීමේ බලය සභාව සතු වේ.
02. ලියාපදිංචි සැපයුම්කරුවන් මිල ගණන් ඉදිරිපත් කිරීමට හෝ නිසි වේලාවට ඇණවුම් සැපයීමට අපොහොසත් වන හා මිල ගණන් කැඳවීමේ කොන්දේසිවලට අනුකූලව ක්‍රියා කරනු නොලබන සැපයුම්කරුවන් කිසිදු දැනුම් දීමකින් තොරව සැපයුම් කටයුතුවලින් ඉවත් කිරීමට සිදුවේ.
03. සභාවට සැපයුම් කිරීමට අත්තිකාරම් මුදල් ඉල්ලා සිටින සැපයුම්කරුවන්ගේ නම් ලියාපදිංචි කරනු නොලැබේ. අවම වශයෙන් දින 30ක කාල සීමාවකට සභාව වෙත ණය පහසුකම් ලබා දිය යුතුය.
04. ඉදිකිරීම් හා කොන්ත්‍රාත්කරු ලෙස ලියාපදිංචි වීමේදී ඉක්ටැඩ් ආයතනයේ හෝ පළාත් සභාවේ ලියාපදිංචි වීමේ සහතික පිටපත් හා වත්කම් ප්‍රකාශවල පිටපත් අයදුම්පත්‍රය සමඟ අමුණා තිබිය යුතුය. කහවත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචියක් ඇති කොන්ත්‍රාත්කරුවන්ට හා මූල්‍යමය හා ඉදිකිරීම් කටයුතු පිළිබඳ පළපුරුද්ද සඳහා සහතික පත්‍ර ඉදිරිපත් කර ලියාපදිංචි විය හැක.
05. ව්‍යාපාර ලියාපදිංචි සහතික, වැට් බදු, පිරිවැටුම් බදු සඳහා ලියාපදිංචිව ඇත්නම් ලියාපදිංචි වීමේ සහතික පිටපත් ද ඉදිරිපත් කළ යුතුය.
06. සැපයුම් කටයුතු කිරීමේදී ප්‍රාදේශීය සභා පනත, මුදල් රෙගුලාසි මූල්‍ය රීති අනුවද රජය මඟින් වරින් වර නිකුත් කරනු ලබන චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව ද කටයුතු කළ යුතු අතර, ප්‍රාදේශීය සභාව විසින් පනවනු ලබන කොන්දේසිවලට ද එකඟ විය යුතුය.
07. මේ සම්බන්ධ වැඩි විස්තර සඳහා 045 2270275 අමතන්න.

**කේ. ඇම්. ජිනදාස**
**සභාපති, (වැ. බ.)**
**කහවත්ත ප්‍රාදේශීය සභාව,කහවත්ත**

**2020-10-01 දින**
**කහවත්ත ප්‍රාදේශීය සභාවේ දීය.**

### කහවත්ත ප්‍රාදේශීය සභාව

### 2021 වර්ෂය සඳහා සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම

01. අයදුම්කරුගේ සම්පූර්ණ නම :- ..................................
02. ලිපිනය :- ..................................
03. හැඳුනුම්පත් අංකය :- ..................................
04. ආයතනයේ දුරකථන අංකය, ෆැක්ස් අංකය, ඊ-මේල් ලිපිනය :- ..................................
05. ව්‍යාපාරයේ ස්වභාවය :- ..................................
06. නිෂ්පාදක ද, එකම අලෙවි නියෝජිත ද, එකම ආනයනකරු ද, එකම බෙදා හරින්නා ද, තොග රැස් කරන්නාද යනාදී විස්තර :- ..................................
07. සපයනු ලබන භාණ්ඩ හෝ සේවාව :- ..................................
08. අයිතම අංකය :- ..................................
09. ව්‍යාපාරයේ ලියාපදිංචි අංකය :- ..................................
    ඉක්ටැඩ් ලියාපදිංචි අංකය (පිටපත අමුණන්න)
10. පිරිවැටුම් බදු ලිපි ගොනු අංකය :- ..................................
11. දින 30 ක අවම කාලයකට ණය පහසුකම් මත සැපයීම් කිරීමට එකඟ වන්නේද යන වග :- ..................................
12. ණය සීමාව :- ..................................
13. වෙනත් :- ..................................
14. චෙක්පත් වටිනාකම හා චෙක්පත් අංක :- ..................................

ඉහත සඳහන් විස්තර සත්‍ය සහ නිවැරදි බව සහතික කරන බැවින්, .................................. ආයතනය සැපයුම්කරු/කොන්ත්‍රාත්කරු ලෙස ලියාපදිංචි කර ගන්නාමෙන් ඉල්ලා සිටිමි.

.................................. ..................................
දිනය අයදුම්කරුගේ අත්සන

**(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)**

ලදුපත් අංකය හා දිනය :- ..................................
ලියාපදිංචි ලේඛනයේ පිටු අංකය :- ..................................

.................................. ..................................
දිනය විෂය භාර නිලධාරී

අදාළ සැපයුම්කරුවා/කොන්ත්‍රාත්කරුවා ලියාපදිංචි කර ගැනීම සඳහා අනුමත කරමි/නොකරමි.

.................................. ..................................
**දිනය** **ලේකම්**

### සෞඛ්‍ය අමාත්‍යාංශය

# ශික්ෂණ රෝහල - මඩකලපුව

## 2021 වසර සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම

පහත සඳහන් භාණ්ඩ සැපයීම හා සේවා ලබාදීම සඳහා මෙම රෝහල යටතේ 2021 වසර සඳහා ලියාපදිංචි වීමට රජය විසින් පිළිගත් වාණිජ ආයතන සහ පුද්ගලයින් ඇතුළු නිෂ්පාදකයින් / නියෝජිතයින් / ලියාපදිංචි සමුපකාර සමිති / සංස්ථා මෙමගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්පත් 2020.11.09 දිනට හෝ ඊට පෙර මඩකලපුව, ශික්ෂණ රෝහලේ, ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටු සභාපති වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් සෘජුව මඩකලපුව, ශික්ෂණ රෝහලේ, ප්‍රධාන ගණකාධිකාරී කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම් ඉහළ කෙළවරේ "**2021 වසර සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම**" යනුවෙන් සඳහන් කළ යුතුය.

| අයිතම අංකය | භාණ්ඩ / සේවා | ආපසු නොගෙවන ගාස්තුව (රු.) |
|---|---|---|
| G-1 | General Stationery | 2,500.00 |
| G-2 | Computer, Printer, Computer Accessories & Hardware, Networking Accessories, Toner, Fax Machine & Accessories, CCTV Camera & Accessories, Fax Machine, Cartridges, Roneo Ink, Computer Printer Ribbons, UPS, Photocopiers, Projector, Roneo Machine, Other Electronic accessories | 2,500.00 |
| G-3 | Tables, Chairs, Cupboards and such office equipment (Steel, Wooden and Plastic). | 2,500.00 |
| G-4 | Supply of Nutritional Milk Powder | 1,500.00 |
| G-5 | Mattresses, Mats, Carpets and Door Mats(Rubberized, Coir & Others). | 1,500.00 |
| G-6 | Building Materials such as Metal, Sand, Cement, Timber, Bricks, Iron, Roofing Sheets, Wiring Wires and Accessories, Electrical Bulbs, Part for Plumbing, Wash Basins, Water Taps, Fitting Items for Hospital Furniture & Office Equipments | 1,500.00 |
| G-7 | Plasticware, Aluminumware | 1,000.00 |
| G-8 | Sanitary Goods such as Soap, Dish wash liquid, Washing Powder, Toilet cleaning liquid, Methylated Spirits, Boxes of Matches, Blades, Batteries, Hand wash and Other General Store Items | 1,500.00 |
| G-9 | Accessories & Consumable of Vehicles | 2,500.00 |
| G-10 | All Linens and Curtain Material, Uniform Materials, Rexin, Mackintosh, Mosquito Nets | 1,500.00 |
| G-11 | Rubber Stamps, Date Stamps, Plastic Name Boards and Departmental identity Cards | 1,500.00 |
| G-12 | Drugs and Surgical Consumable Items | 1,500.00 |
| G-13 | Laboratory Consumable, Laboratory Chemical & Glassware | 1,500.00 |
| G-14 | Shoes and Surgical Shoes | 1,500.00 |
| G-15 | Paints Applying Materials, Thinner and Brushes | 1,500.00 |
| G-16 | Gas Cookers, Gas Burner Regulator, Burner Sparing, Cooking gas Cylinder and other Kitchen equipment | 1,500.00 |
| G-17 | Hospital Beds, Lockers, Trollies, IV Stands and Similar Equipment for Wards | 2,000.00 |
| G-18 | Air Conditioners, Refrigerators & Washing Machines | 2,000.00 |
| G-19 | Electrical Goods such as Televisions, Electrical Fans, Electrical Kettles and Torches, Etc. | 1,500.00 |
| G-20 | Supply of Foods for Official Ceremonies (Short eats, Tea, Lunch and Desserts etc. on buffet basis and Boxess). | 1,000.00 |
| | **SERVICES & REPAIRS** | |
| S-1 | Repairing, Welding, Painting and Polishing of Iron / Metal/ Wooden Furniture, Implements | 1,000.00 |
| S-2 | Maintenance and Repairing of Air Conditioners, Refrigerators, Coolers, Deep Freezers and Washing Machines | 1,000.00 |
| S-3 | Repairs and Services of Computer, Fax Machine, Printer, Roneo Machines, Sewing Machines, Photocopiers and Television, CCTV Camera Service & UPS | 1,000.00 |
| S-4 | Repairing of Electric Motors, Transformers, Generator and Electrical Equipment | 1,000.00 |
| S-5 | Repairing, Maintenance and Servicing Air Conditioned vaults of the Mortuary | 1,000.00 |
| S-6 | Repairing of Gas Burners, Gas Cookers, etc. | 1,000.00 |
| S-7 | Aluminum Fitting | 1,000.00 |
| S-8 | Servicing of Vehicles | 1,000.00 |
| S-9 | Repairing of Vehicles | 1,000.00 |
| S-10 | Printing Works | 1,000.00 |
| S-11 | Conducting of Hospital Doctors' & General Canteen Services on Rent Basis | 1,000.00 |
| S-12 | Internal Electrical supply & Electrical fixing work | 1,000.00 |
| S-13 | Repairing & Maintenance work of Hospital Sewerage System | 1,000.00 |
| S-14 | Computer Networking Services | 1,000.00 |
| S-15 | Removal of Unclaimed Bodies, Maternal Delivery Wastages and Operation Theater Wastages | 1,000.00 |
| S- 16 | Provision of Accommodation for Rent Basis | 1,000.00 |
| S- 17 | Private Laboratory Testing Services | 1,000.00 |
| | **PURCHASES** | |
| P-1 | Purchase of Discarded Items from the Hospital, Wooden & Iron Furniture, Glass, Plastic Containers, Saline Bottles, Coconut Shell, X-Ray Cards, Washed Discarded Liquid, Card Boards, Woods, Iron, Air Conditioners, Computers, Other Electrical Equipments & etc. | 1,000.00 |
| | **WORKS** | |
| W-1 | Construction, Reconstruction, Improvement & Repairs to Civil Engineering Works at Teaching Hospital. | 2,000.00 |

### ශික්ෂණ රෝහල - මඩකලපුව

### සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා අයදුම්පත - 2021

01. අයදුම්කරුගේ නම :
02. ව්‍යාපාරයේ නම හා ලිපිනය :
03. ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ අංකය හා දිනය ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ සහතික කළ පිටපතක් අමුණා එවිය යුතුය.
04. දුරකතන අංකය .................... ෆැක්ස් අංකය .................... ජංගම දුරකථන අංකය ....................
05. ලියාපදිංචිය බලාපොරොත්තු වන (භාණ්ඩ / සේවා / මිලදී ගැනීම් / වැඩ) අයිතම අංකය :

| Registration No. | | | | Money Order/ Receipt No. |
|---|---|---|---|---|
| Goods | Service | Discarded Item Purchased | Works | |
| G- | S- | P- | W- | |

මෙම ආයතනය වෙත භාණ්ඩ හා සේවා සැපයීමේදී මූල්‍ය පහසුකම් දීර්ඝ කිරීම සඳහා පහත කොන්දේසි හා නියමයන් යටතේ මා බැඳී සිටින බව මෙයින් සහතික කර සිටිමි.

දිනය : .................................. ..................................

කළමනාකාර අධ්‍යක්ෂ

**කොන්දේසි හා නියමයන්**

01. එක් එක් භාණ්ඩ හා සේවා අයිතම සඳහා ආපසු නොගෙවන ලියාපදිංචි ගාස්තුව වශයෙන් නියමිත මුදල, මඩකලපුව, ශික්ෂණ රෝහලේ, ගිණුම් ශාඛාවේ, මූල්‍ය සහකාර වෙත මුදලින් ගෙවා ලබාගත් ලදුපත හෝ මඩකලපුව, ශික්ෂණ රෝහලේ, අධ්‍යක්ෂක නමට ලබාගත් මුදල් ඇණවුම හෝ අයදුම්පත සමග ලැබීමට සැලැස්විය යුතුය.
02. චෙක්පත් භාරගනු නොලැබේ.
03. අයදුම්පත ඉහත සඳහන් ආදර්ශ අයදුම්පත පරිදි සකස් කරගත යුතුය. එක් එක් සැපයුම් / සේවා අයිතමය සඳහා වෙන් වෙන්ව සකස් කළ අයදුම්පත් 2020.11.09 දින හෝ ඊට පෙර ඉදිරිපත් කළ යුතුය.
04. සපයනු ලබන භාණ්ඩ සහ ලබාදෙන සේවා නියමිත පිරිවිතර, ප්‍රමිතීන් හා නියැදි හා අනුකූල විය යුතුය.
05. අදාළ ආයතනයට වලංගු ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයක් තිබිය යුතු (පිටපත අමුණා එවිය යුතුය) අතර එය අයදුම්කරන භාණ්ඩ හා සේවා ප්‍රභේදයන් යටතේ විය යුතුය.
06. ආයතනය / සංවිධාන එකම නියෝජිත හැටියට භාණ්ඩ හා සේවා සපයන්නේ නම් මූලිකයන්ගේ බලය පැවරූ ලිපිය ඉදිරිපත් කළ යුතුය.
07. අදාළ අයිතම (භාණ්ඩ / සේවා / වැඩ) සැපයීමේ අඩු තරමින් වසර 3 ක පළපුරුද්දක් සැපයුම්කරු සතුවිය යුතුය.
08. දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ වැට් (VAT) ලියාපදිංචි සහතිකය හෝ වැට් බද්දෙන් නිදහස් කිරීමේ සහතිකය අමුණා එවිය යුතුය.
09. සැපයුම් හා සේවා සඳහා ලියාපදිංචි සැපයුම්කරුවන් හැරුණු කොට වෙනත් අයගෙන් මිල ගණන් කැඳවීමේ අයිතිය ආයතන ප්‍රධානී සතුය.
10. ටෙන්ඩර් ක්‍රියාපටිපාටිය පරිදි භාණ්ඩ / සේවා සැපයීමට අසමත් වන සහ පිටපිට 03 වතාවකට වැඩි වතාවක් ටෙන්ඩරයට සහභාගිවීමට අසමත් වන ලියාපදිංචි සැපයුම්කරුවන් කිසිදු දැනුම් දීමකින් තොරව ලියාපදිංචි නාම ලැයිස්තුවෙන් කපා හරිනු ලැබේ.
11. වැඩි විස්තර පැහැදිලිකර ගැනීම් මඩකලපුව, ශික්ෂණ රෝහලේ ප්‍රධාන ගණකාධිකාරී වෙතින් දුරකථන අංක 065-2222261, 065-2222262 ඔස්සේ ලබාගත හැකිය.
12. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

**සභාපති,**
**ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව,**
**ශික්ෂණ රෝහල, මඩකලපුව.**

# කැලණිය විශ්වවිද්‍යාලය

| | | |
|---|---|---|
| **දිනය** | : | **2020 ඔක්තෝබර් 19** |
| **ණය අරමුදල් අංකය හා ශීර්ෂය** | : | ණය අරමුදල් අංක – 3698/3699 – විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය |
| **කොන්ත්‍රාත් අංකය හා ශීර්ෂය** | : | STHRD/KE-E9 : කැලණිය විශ්වවිද්‍යාලයේ, පරිගණක හා තාක්ෂණ පීඨය සඳහා පර්යේෂණ රසායනාගාර උපකරණ ප්‍රසම්පාදනය |
| **ලංසු භාර ගැනීමේ අවසාන දිනය** | : | **2020 නොවැම්බර් 18 දින 14.30 පැය** |

## ලංසු සඳහා ආරාධනයයි

01. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ආසියානු සංවර්ධන බැංකුව (ADB) වෙතින්, අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතියෙහි (STHR) ව්‍යාපෘතිය පිරිවැය සඳහා, ඇමරිකානු ඩොලර් මිලියන 145 කට සමාන මුදල් යෙදවීමක් සඳහා අයදුම්කොට ඇති අතර, ඉන් කොටසක්, ඉහත සඳහන් කොට ඇති කොන්ත්‍රාත්තුව යටතේ වන ගෙවීම් සඳහා යෙදවීමට අපේක්ෂිතය. ආසියානු සංවර්ධන බැංකුවේ සුදුසුකම්ලත් ප්‍රභව රටවල ලංසුකරුවන් සඳහා මෙම ලංසුකරණය විවෘතය.

02. ඒ අනුව, කැලණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතියෙහි (ගැණුම්කරු) නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙනුවෙන්, කැලණිය විශ්වවිද්‍යාලයේ ප්‍රධාන ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින්, **කැලණිය විශ්වවිද්‍යාලයේ පරිගණක හා තාක්ෂණ පීඨය සඳහා පර්යේෂණ විද්‍යාගාර උපකරණ ප්‍රසම්පාදනය –** STHRD/KE-E9 සඳහා සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ. මෙම ප්‍රසම්පාදනයට, පරිගණක හා තාක්ෂණ පීඨයේ යෝජිත පර්යේෂණ විද්‍යාගාරය සඳහා පහත සඳහන් ලොට් 5 හි විශේෂිතව සඳහන් පර්යේෂන විද්‍යාගාර ආශ්‍රිත උපකරණ, සපයා ගෙනැවිත් භාරදී, ස්ථාපිත කොට, ක්‍රියාත්මක කිරීම ඇතුළත් වේ.

LOT No. 1 : Optical Equipment
LOT No. 2 : Spectroscopy Equipment
LOT No. 3 : Analytical Equipment
LOT No. 4 : Sample Preparation Equipment
LOT No. 5 : Sample Handling Equipment

කොන්ත්‍රාත් ගිවිසුම් දින සිට දින 120 ක් ඇතුළත අදාළ භාණ්ඩ ගෙනැවිත් භාරදී ස්ථාපිත කිරීම් සම්පූර්ණ කළ යුතුය.

03. මෙම විවෘත තරගකාරී ලංසුකරණය, ආසියානු සංවර්ධන බැංකුව (ADB) භාණ්ඩ ප්‍රසම්පාදනය – තනි අදියර – තනි කවරය ක්‍රම වේදය යටතේ සිදු කරනු ලබන අතර, ලංසු ලේඛනයන්හි සඳහන් පරිදි සුදුසුකම් ලත් රටවල සියලුම ලංසුකරුවන්හට විවෘතය.

04. මෙම ලංසුකරණයට සහභාගී වීම සඳහා ලංසුකරුවන් සතුව පහත සඳහන් ප්‍රධාන සුදුසුකම් තිබිය යුතුය.

- පසුගිය වසර තුන තුළ ප්‍රධාන සැපයුම්කරු ලෙස, අවම වශයෙන් කොන්ත්‍රාත් දෙකක් එකම වටිනාකම, අවම වශයෙන්

ලොට් 1 – Optical Equipment සඳහා ශ්‍රී ලංකා රුපියල් මිලියන 3.6 ක්
ලොට් 2 – Spectroscopy Equipment සඳහා රුපියල් මිලියන 5.5 ක්
ලොට් 3 – Analytical Equipment සඳහා රුපියල් මිලියන 1.2 ක්
ලොට් 4 – Sample Preparation Equipment සඳහා රුපියල් මිලියන 5.1 ක්
හා ලොට් 5 – Sample Handling Equipment සඳහා රුපියල් මිලියන 9.5 ක් වශයෙන් සාර්ථකව සම්පූර්ණ කොට තිබිය යුතු අතර, ඒවා 6 කොටසෙහි විස්තර කොට ඇති අයුරු මෙම සැපයුම් විෂය පථයට ස්වභාවයෙන් හා සංකීර්ණතාවයෙන් සමාන විය යුතුය.

- පසුගිය වසර තුන තුළ සම්පූර්ණ කළ හෝ කෙරෙමින් පවත්නා කොන්ත්‍රාත් සඳහා ලංසුකරු වෙත ලැබුනු මුළු ගෙවීම් ලෙස ගණනය කළ වාර්ෂික පිරිවැටුමේ අවම සාමාන්‍යය වශයෙන්, ලොට් අංක 1 - Optical Equipment සඳහා ශ්‍රී ලංකා රුපියල් මිලියන 9 ක්ද, ලොට් අංක 2 - Spectroscopy Equipment සඳහා ශ්‍රී ලංකා රුපියල් මිලියන 14 ක්ද, ලොට් අංක 3 - Analytical Equipment සඳහා ශ්‍රී ලංකා රුපියල් මිලියන 3 ක්ද, ලොට් අංක 4 සඳහා – Sample Preparation Equipment සඳහා ශ්‍රී ලංකා රුපියල් මිලියන 13 ක්ද. ලොට් අංක 5 - Sample Handling Equipment සඳහා ශ්‍රී ලංකා රුපියල් මිලියන 24 ක්ද තිබිය යුතුය.

ලංසු තෝරා ගැනීම වඩාත් ප්‍රතිචාර දක්වූ ඇගැයුම් කළ ලංසු මුදල හා අවසන් භාණ්ඩවල කාර්ය සාධනය මත සිදු කෙරේ.

05. වැඩිදුර විස්තර ලබාගැනීමත්, ලංසු ලේඛන පරීක්ෂා කොට බැලීමත් සඳහා පහත සඳහන් අය ඇමතිය යුතුය.

**නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය,**
**ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය,**
**පරිගණක හා තාක්ෂණ පීඨය,**
**කොළඹ විශ්වවිද්‍යාලය,**
**407, නුවර පාර, කැලණිය,**
**ශ්‍රී ලංකාව.**

**දුරකථනය - +94(0)11 2984879**
**ෆැක්ස් : +94 11 2984879**
**ඊමේල් : dpd - sthrd@kln.ac.lk**

06. ආපසු ගෙවනු නොලබන ගාස්තු ශ්‍රී ලංකා රුපියල් 5,000.00 ක් මුදලින් හෝ කැලණිය විශ්වවිද්‍යාලය නමට බැංකු අණකරයක් මගින් ගෙවීමෙන් හා "STHRD/KE - E9 : **ශ්‍රී ලංකාවේ කැලණිය විශ්වවිද්‍යාලයේ පරිගණක හා තාක්ෂණ පීඨය සඳහා පර්යේෂණ විද්‍යාගාර උපකරණ ප්‍රසම්පාදනය සඳහා**" වන ලංසු ලේඛන ඉල්ලුම් කොට ඉහත ලිපිනයට ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන්, උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට, ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරනලද සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් මිලදී ගත හැක. අදාළ ලංසු ලේඛන, 2020 නොවැම්බර් 17 වන දින 15.00 පැය දක්වා නිකුත් කරනු ලැබේ. අස්ථානගත වීම් හේ ගෙනැවිත් භාර දීමේ ප්‍රමාදයන් සඳහා කිසිදු වගකීමක් භාර නොගැනේ.

07. මේ සම්බන්ධ පෙර – ලංසු හමුවක් 2020 ඔක්තෝබර් 29 වන දින 10.00 පැයට ශ්‍රී ලංකාවේ කැලණිය නුවර පාරේ, අංක 407, කැලණිය විශ්වවිද්‍යාලයේ පරිගණක හා තාක්ෂණ පීඨයේ අධ්‍යක්ෂ මණ්ඩල කාමරයේදී පැවැත්වීමට නියමිතය.

08. ඔබගේ ලංසු, 2020 නොවැම්බර් 18 වන දින 14.30 පැයට පෙර, ලංසු ලේඛනයන්හි විස්තර කොට ඇති පරිදි වූ ලංසු ඇපකරයක් සමග පහත සඳහන් ලිපිනයට ලැබීමට සැලැස්විය යුතුය.

**නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය,**
**ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය,**
**පරිගණක හා තාක්ෂණ පීඨය,**
**කැලණිය විශ්වවිද්‍යාලය,**
**407, නුවර පාර, කැලණිය.**

- සම්පූර්ණ කළ ලංසු, මුල් පිටපත හා අනුපිටපත ලෙසට පිටපත් දෙකක් වශයෙන් ඉදිරිපත් කළ යුතුය. එම පිටපත් දෙක වෙන් වශයෙන් මුද්‍රා තැබූ කවරවල බහා ඒවායේ මුල් පිටපත හා අනු පිටපත ලෙසට සටහන් කොට, එම කවර යළි මුද්‍රා තැබූ තනි කවරයක බහා එහි වම් ඉහළ කෙළවරෙහි "STHRD / KE - E 9 : **ශ්‍රී ලංකාවේ, කැලණිය විශ්වවිද්‍යාලයේ පරිගණක හා තාක්ෂණ පීඨය සඳහා පර්යේෂණ විද්‍යාගාර උපකරණ ප්‍රසම්පාදනය**" යනුවෙන් සඳහන් කළ යුතුය.

09. අදාළ භාරගැනීමේ කාලය අවසන් වූ වහාම පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයන්ගේ ඉදිරියේ ලැබී ඇති ලංසු විවෘත කරනු ලැබේ.

**සභාපති,**
**ප්‍රධාන ප්‍රසම්පාදන කමිටුව,**
**කැලණිය විශ්වවිද්‍යාලය,**
**දළුගම, කැලණිය,**
**ශ්‍රී ලංකාව.**
**දිනය 2020 ඔක්තෝබර් 19**

# මහරගම නගර සභාව

## භාණ්ඩ හා සේවා සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම - 2021

2021 වර්ෂය තුළ මහරගම නගර සභාවට අවශ්‍ය භාණ්ඩ හා සේවා සැපයීමට සැපයුම්කරුවන් සේවා සපයන්නන් ලියාපදිංචි කිරීම 2020.10.19 දින සිට 2020.11.09 දක්වා සතියේ දිනවල සිදු කරනු ලැබේ.

තමා විසින්ම පිළියෙළ කරගත් අයදුම්පතක් සමග නියමිත ගාස්තුව ගෙවීමෙන් ලියාපදිංචිය සිදුකරගත හැකි වන අතර, එම ගාස්තු චෙක්පත් මගින් ගෙවන්නේ නම් "**සභාපති, මහරගම නගර සභාව**" නමින් ලියා එවිය යුතුය. ඉල්ලුම්පත් හා චෙක්පත් එවීමේදී ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "**සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2021**" යනුවෙන් සඳහන් කර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

| අනු අංකය | භාණ්ඩ හා සේවා සැපයුම් අයිතම | ලියාපදිංචි ගාස්තුව (රුපියල්) |
|---|---|---|
| 01. | කාර්යාලීය ලිපිද්‍රව්‍ය සැපයීම | 1,500/- |
| 02. | ඔර්ජිනල් ටෝනර්, රිබන්, කාට්‍රිජ්, වර්ග සැපයීම | 1,500/- |
| 03. | පරිගණක ලදුපත් හා සියලු පරිගණක ලිපිද්‍රව්‍ය සැපයීම | 1,500/- |
| 04. | පරිගණක, මුද්‍රණ යන්ත්‍ර සැපයීම හා උපාංග සැපයීම | 1,500/- |
| 05. | පරිගණක යන්ත්‍ර හා මුද්‍රණ යන්ත්‍ර අලුත්වැඩියාව | 1,500/- |
| 06. | පරිගණක ජාලකරණය හා ජාල නඩත්තු කිරීම | 1,500/- |
| 07. | ඡායා පිටපත් යන්ත්‍ර, ඩුප්ලෝ යන්ත්‍ර, මුදල් ගණක යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර, ස්කෑනර් යන්ත්‍ර ඇතුළු සියලු කාර්යාලීය යන්ත්‍ර සැපයීම | 1,500/- |
| 08. | ඡායා පිටපත් යන්ත්‍ර ඩුප්ලෝ යන්ත්‍ර, මුදල් ගණක යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර, ස්කෑනර් යන්ත්‍ර ඇතුළු සියලු කාර්යාලීය යන්ත්‍ර සඳහා අමතර කොටස් සැපයීම හා නඩත්තු කිරීම. | 1,500/- |
| 09. | මුද්‍රිත ලේඛන, පොත් පත්, ලදු පොත්, මුද්‍රිත ලිපි ද්‍රව්‍ය, මුද්‍රණය කර සැපයීම | 1,500/- |
| 10. | කාර්යාල මේස පුටු, කබඩ් යනාදී සියලු භාණ්ඩ (ලී, වානේ, ප්ලාස්ටික්) සැපයීම | 1,500/- |
| 11. | කාර්යාල මේස, පුටු, කබඩ් යනාදී සියලු භාණ්ඩ (ලී, වානේ, ප්ලාස්ටික්) අලුත්වැඩියාව | 1,500/- |
| 12. | පොත් බඳින්නන් | 1,500/- |
| 13. | පාසැල් බෑග්, සපත්තු, මේස ආදිය සැපයීම | 1,500/- |
| 14. | ටී ෂර්ට්, බොටම්, නිල ඇඳුම් රෙදි වර්ග. ඇතුළුව නිම් ඇඳුම් හා රෙදි පිළි ද්‍රව්‍ය සැපයීම | 1,500/- |
| 15. | නිල හැඳුනුම්පත් සකස් කර සැපයීම | 1,500/- |
| 16. | තාර / කෝලාස් / ප්‍රිමික්ස් / කොන්ක්‍රීට් / රෙඩීමික්ස් ආදිය සැපයීම | 1,500/- |
| 17. | මාර්ග සඳහා අවශ්‍ය හියුම් පයිප්ප සහ කොන්ක්‍රීට් නිෂ්පාදන සැපයීම | 1,500/- |
| 18. | බොරළු සහිත පස් සැපයීම | 1,500/- |
| 19. | මාර්ග නඩත්තු හා ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය ද්‍රව්‍ය (1/4"x1/2" චිප්ස් ගල්, ගඟේ වැලි, මිශ්‍ර ගල් (ඒබීසී) කළු ගල් (6"x4", 3"x4", 1 1/2", 3/4", 1/2") | 1,500/- |
| 20. | විදුලි භාණ්ඩ හා උපකරණ සැපයීම (වීථි ආලෝක කිරීම හා ගෘහ) | 1,500/- |
| 21. | කාර්යාලීය විදුලි උපකරණ හා උපාංග සැපයීම | 1,500/- |
| 22. | සියලුම විදුලි උපකරණ මෝටර් අලුත්වැඩියාව | 1,500/- |
| 23. | සියලුම ගොඩනැගිලි ද්‍රව්‍ය, තීන්ත වර්ග. ජල නල උපාංග හා උපකරණ සැපයීම | 1,500/- |
| 24. | ජීඅයි බට / ගැල්වනයිස් පයිප්ප උපාංග හා සියලුම යකඩ වර්ග සැපයීම | 1,500/- |
| 25. | සෞඛ්‍ය උපකරණ (කොසු, ඉදල්, වේවැල් කූඩ, බාල්දි, ග්ලවුස්, ගම් බූට්ස්, කසළ කරත්ත, වැහි කබා, වාහන ආවරණ ආදී සියලුම සෞඛ්‍ය උපකරණ සැපයීම | 1,500/- |
| 26. | විෂබීජ නාශක (ෆයිනෝල්, විම්, සබන්, හාපික්, ලයිසෝල් වැනි) සියලුම සෞඛ්‍යාරක්ෂිත ද්‍රව්‍ය සැපයීම. | 1,500/- |
| 27. | දුර්ගන්ධ නාශක පරිසර හිතකාමී එන්සයිම | 1,500/- |
| 28. | වාහන බැටරි වර්ග / ටයර් / ටියුබ් / කොලර් / රිම් වර්ග සැපයීම (ට්‍රැක්ටර්, ටිපර්, කැබ්, මෝටර් ග්‍රේඩර්, ත්‍රී වීල්, ලෝඩර් ආදිය) | 1,500/- |
| 29. | ටයර් නැවත පිරවීම | 1,500/- |
| 30. | ටිපර් ට්‍රක්, ට්‍රැක්ටර්, ටේලර්, බැකෝ යන්ත්‍ර, ඇතුළු ඉදිකිරීම් සඳහා අවශ්‍ය උපකරණ යන්ත්‍ර සූත්‍ර ආදිය සැපයීම | 1,500/- |
| 31. | ලියවන පට්ටල් වැඩ | 1,500/- |
| 32. | හයිඩ්‍රොලික් හෝස් හා හෙඩ් අලුත්වැඩියා කිරීම | 1,500/- |
| 33. | ඉංජෙක්ටර් පොම්ප, ඉංජෙක්ටර් නොසල් අලුත්වැඩියා කිරීම | 1,500/- |
| 34. | වීල් එලයින්මන්ට් කිරීම | 1,500/- |
| 35. | වාහන අලුත්වැඩියා කටයුතු (මෝටර් රථ, කැබ්, ටිපර් ට්‍රක්, ට්‍රැක්ටර්, බැකෝ යන්ත්‍ර ආදී) එන්ජින් ඇතුලු සියලු අලුත්වැඩියා කිරීම | 1,500/- |
| 36. | වාහන විදුලි පද්ධති අලුත්වැඩියා කටයුතු (මෝටර් රථ, කැබ්, ටිපර් ට්‍රක්, ට්‍රැක්ටර්, බැකෝ යන්ත්‍ර ආදි) | 1,500/- |
| 37. | ත්‍රීවීල් අලුත්වැඩියා කටයුතු හා අමතර කොටස් සැපයීම | 1,500/- |
| 38. | වාහන අමතර කොටස් සැපයීම (මෝටර් රථ, කැබ්, ටිපර් ට්‍රක්, ට්‍රැක්ටර්, බැකෝ යන්ත්‍ර ආදී) | 1,500/- |
| 39. | ටිපර් ට්‍රක්, ට්‍රැක්ටර්, ටේලර්, බැකෝ යන්ත්‍ර, ලොරි, ත්‍රී වීල් කැබ් රථ ආදී සියලු වාහන සේවා කිරීම | 1,500/- |
| 40. | සියලුම වාහන ටින්කරින් කිරීම, පින්තාරු කිරීම, කුෂන් කිරීම, ත්‍රීවීල් සඳහා රෙක්සින් රෙදි ගැසීම | 1,500/- |
| 41. | කසළ හා පස් තල්ලුකර තුනී කිරීම සඳහා කැපිටලර් යන්ත්‍ර, බැකෝ යන්ත්‍ර, මාර්ග තලන යන්ත්‍ර, ටිපර් රථ කුලී පදනම මත සැපයීම | 1,500/- |
| 42. | ත්‍රීවීල්, කැබ් රථ, කාර්, වෑන් කුලී පදනම මත සැපයීම | 1,500/- |
| 43. | වායුසමීකරණ යන්ත්‍ර සැපයීම (ගොඩනැගිලි, මෝටර් රථ) | 1,500/- |
| 44. | වායුසමන යන්ත්‍ර හා ශීතකරණ අලුත්වැඩියාව | 1,500/- |
| 45. | විදුලි කාර්මික සේවා | 1,500/- |
| 46. | ඉලෙක්ට්‍රොනික් උපකරණ, ශබ්ද විකාශන යන්ත්‍ර ආදිය සැපයීම | 1,500/- |
| 47. | ඉලෙක්ට්‍රොනික් උපකරණ, ශබ්ද විකාශන යන්ත්‍ර, ජෙනරේටර් ආදිය කුලියට සැපයීම | 1,500/- |
| 48. | ආදහනාගාර නඩත්තු කටයුතු හා සේවා සැපයීම | 1,500/- |
| 49. | ලී වර්ග සැපයීම (දේශීය / විදේශීය) | 1,500/- |
| 50. | රබර් සීල් නිපදවීම | 1,500/- |
| 51. | නාම පුවරු සාද සැපයීම / බැනර් ඇඳීම, දැන්වීම් පුවරු ඇඳීම | 1,500/- |
| 52. | අංක තහඩු වර්ග (වරිපනම් / සත්ව / පාපැදි) | 1,500/- |
| 53. | ගස් හා අතු කැපීම සඳහා | 1,500/- |
| 54. | පාර්ටිෂන් කටයුතු සඳහා අවශ්‍ය ඇළුමිනියම් සහ අනෙකුත් උපාංග සැපයීම සහ සැකසීම | 1,500/- |
| 55. | සියලුම වර්ගයේ වෙල්ඩින් වැඩ | 1,500/- |
| 56. | පිසූ ආහාර සැපයීම (ආහාර, කෙටි ආහාර) | 1,500/- |
| 57. | නීතිඥ සේවා | 1,500/- |
| 58. | මිනින්දෝරු සේවා | 1,500/- |
| 59. | ව්‍යුහාත්මක සිවිල් / ඉලෙක්ට්‍රිකල් (විදුලි) ඉංජිනේරු උපදේශක සේවා | 1,500/- |
| | **සැපයීම** | |
| 60. | වරලත් වාස්තු විද්‍යාඥ උපදේශක සේවා | 1,500/- |
| 61. | කිලිටි රෙදි සේදීම | 1,500/- |
| 62. | තිර රෙදි සැපයීම | 1,500/- |
| 63. | ගෑස් / ඔක්ෂිජන් / ඇසටිලින් සැපයීම | 1,500/- |

කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම

01. රු. 100,000.00 දක්වා – රු. 1,500/-
02. රු. 100,000.00 වැඩි රු. 500,000.00 දක්වා – රු. 1,500/-
03. රු. 500,000.00 වැඩි රු. 1,000,000.00 දක්වා – රු. 1,500/-
04. රු. 1,000,000.00 වැඩි රු. 2,000,000.00 දක්වා – රු. 1,500/-
05. රු. 2,000,000.00 වැඩි – රු. 1,500/-

**අනෙකුත් කොන්දේසි :**

01. ඉහත අංක 01 සිට 62 දක්වා භාණ්ඩ හා සේවා වෙනුවෙන් ලියාපදිංචිවීම සඳහා එක් එක් භාණ්ඩයකට එක් අයදුම්පතක් බැගින් අදාළ ගාස්තු සමග ඉදිරිපත් කළ යුතුය.
02. සැපයුම් සඳහා සාමාන්‍යයෙන් ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවනු ලබන අතර, අවශ්‍ය අවස්ථාවන්හිදී බාහිර සැපයුම්කරුවන්ගෙන්ද මිල ගණන් කැඳවීමේ හා මිල දී ගැනීමේ අයිතිය සභාව සතු වේ.
03. මිල ගණන් සාමාන්‍යයෙන් මාස 06 ක කාලයක් තුළ වෙනස් නොකර ස්ථාවරව තැබිය යුතුය.
04. නිසි පරිදි මිල ගණන් ඉදිරිපත් කිරීමට සහ කලට වේලාවට භාණ්ඩ සැපයීමට අපොහොසත් වන හා ඇණවුමේ සඳහන් විස්තර හා ආදර්ශයට අනුව මනා තත්ත්වයෙන් යුතු භාණ්ඩ හා සැපයුම් පැහැර හරිනු ලබන සැපයුම්කරුවන්ගේ නම් ලියාපදිංචි ලේඛනයෙන් ඉවත්කර, අසාදුලේඛනගත කරනු ලැබේ.
05. භාණ්ඩ/සේවා හා කොන්ත්‍රාත් සැපයීමේදී රජයේ අනුමත බදු වර්ග / කොන්දේසිවලට හා සභාවේ නීතිරීති වලට යටත් විය යුතුය.
06. ලක්ෂ 05 ට වැඩි කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා 2020/2021 වර්ෂවලට අදාළ ඉක්ටැඩ්(ICTAD) සහතිකය ලද අය විය යුතුය. ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් බාහිරව කර්මාන්ත සඳහා ටෙන්ඩර් කැඳවීමේ අයිතිය සභාව සතුය.
07. යම් පැහැදිලි කර ගැනීමක් අවශ්‍යනම් දුරකථන අංක 0112850265 අමතා නගර සභා සැපයුම් අංශයෙන් ලබාගත හැකි වන අතර, maharagma.uc.gov.lk වෙබ් අඩවිය මගින් විස්තර ලබාගත හැකිය.

**ටිරාජ් ලක්රුවන් පියරත්න,**
**සභාපති,**
**මහරගම නගර සභාව**
**2020.10.16 දින මහරගම නගර සභා කාර්යාලයේ දීය.**

# ප්‍රසම්පාදන දැන්වීමයි

## සායන සංකීර්ණය සඳහා නව විදුලි සෝපානයක් සපයා සවි කිරීම

## ශික්ෂණ රෝහල කුරුණෑගල

කුරුණෑගල ශික්ෂණ රෝහලේ සායන සංකීර්ණය සඳහා 800KG ධාරිතාවයෙන් යුතු විදුලි සෝපානයක් සපයා සවි කිරීම සඳහා සුදුසුකම් ලත් ආයතනවලින් 2020.11.04 දින පෙ.ව. 10.00 දක්වා මිල ගණන් කැඳවනු ලැබේ. ටෙන්ඩර් විවෘතය එදින එම වේලාවට අධ්‍යක්ෂ නිල කාර්යාලයේදී සිදු කෙරෙන අතර, එම අවස්ථාවට ඔබට හෝ ඔබගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගී විය හැක.

2020.11.02 දින ප.ව. 3.00 දක්වා සතියේ රාජකාරී දිනයන් හිදී රෝහලේ ප්‍රධාන කාර්යාලයෙන් නොමිලේ ලංසු ලේඛන පරීක්ෂා කළ හැකි අතර, එදින එම වේලාව තෙක් පහත ලිපිලේඛන ඉදිරිපත් කර ලංසු ලේඛන ලබාගත හැකිවේ.

01. අධ්‍යක්ෂ, ශික්ෂණ රෝහල, කුරුණෑගල වෙත ඉදිරිපත් කරන ලිඛිත අයදුම්පතක්
02. ආපසු නොගෙවන රු. 2,500.00 ක මුදලක් රෝහලේ මුදල් අයකැමි වෙත ගෙවා ලබාගත් රිසිට්පත)
03. පොදු කොන්ත්‍රාත් පනතේ 8 වන ඡේදය යටතේ සමාගම් රෙජිස්ට්‍රාර් විසින් නිකුත් කරන ලද ලියාපදිංචි සහතිකය (ලංසු ලේඛන නිකුත් කිරීම සඳහා පමණක් සහතිකය සඳහා ගෙවීම් සිදු කළ ලදු පත පිළිගනු ලැබේ.

ටෙන්ඩර්පත් බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි **සායන සංකීර්ණය සඳහා නව විදුලි සෝපානයක් සපයා සවිකිරීම** යනුවෙන් පැහැදිලිව සටහන් කරන ලද ඔබගේ ටෙන්ඩර්පත **සභාපති, ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව, ශික්ෂණ රෝහල, කුරුණෑගල** ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ ප්‍රධාන ගණකාධිකාරී කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට ගෙනවිත් බහාලීමට හැකි අතර, මේ පිළිබඳ වැඩි විස්තර අවශ්‍ය වෙතොත් 037-2233906 මගින් 2800 අමතා ලබාගත හැක.

**සභාපති,**
**ප්‍රසම්පාදන කමිටුව,**
**ශික්ෂණ රෝහල, කුරුණෑගල.**

SBI

**ස්ටේට් බෑන්ක් ඔෆ් ඉන්ඩියා**
**16, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත, කොළඹ 01.**

## අත්හැර දැමූ දේපළ

1988 අංක 30 දරන සංශෝධිත බැංකු පනත ප්‍රකාරව ගණුදෙනුකරුවන් වෙත කෙරෙන නිවේදනයයි

1988 අංක 30 දරන සංශෝධිත බැංකු පනතෙහි 72-76 වගන්ති ප්‍රකාරව "අත්හැර දැමූ දේපල" ලෙසට වර්ගීකරණය කරන ලද ගණුදෙනුකරුවන්ගේ පහත සඳහන් ගිණුම්වලට අදාළ තොරතුරු පහතින් සඳහන් කොට ඇත.

**ජංගම ගිණුම් - සංවිධාන (ශ්‍රී ලංකා රුපියල්) "අත්හැර දැමූ දේපල" ලෙස වර්ගීකරණය කොට ඇත**

| අනු අංකය | ගණුදෙනුකරුගේ නාමය |
|---|---|
| 01 | ඒෂියා මෙටල් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| 02 | බෝරා ස්පෝට්ස් ක්ලබ් |
| 03 | ලංකා වර්ල්ඩ් ප්‍රයිවට් ලිමිටඩ් |
| 04 | සිනෙක්ස් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| 05 | එස්.කේ. වලවගේ එන්ටර්ප්‍රයිසස් |

**ජංගම ගිණුම් - පුද්ගලයන් (ශ්‍රී ලංකා රුපියල්) "අත්හැර දැමූ දේපල" ලෙස වර්ගීකරණය කොට ඇත**

| අනු අංකය | ගණුදෙනුකරුගේ නාමය |
|---|---|
| 01 | වෛද්‍ය එස්.ටී. සෙනෙවිරත්න |

**ඉතිරි කිරීමේ ගිණුම් - පුද්ගල (ශ්‍රී ලංකා රුපියල්) "අත්හැර දැමූ දේපල" ලෙස වර්ගීකරණය කොට ඇත**

| අනු අංකය | ගණුදෙනුකරුගේ නාමය |
|---|---|
| 01 | අශෝක් කුමාර් |
| 02 | ඩෙලිනා ජෙයල්ටා රාජා සෙබස්තියන් |
| 03 | Dr. A.V. මනිවාසගර් |
| 04 | ජී.එම්.එස්. ධර්මරත්න |
| 05 | එච්.පී.ජී.එන්. සත්කුමාර් |
| 06 | හේවාමාතරගේ මල්ෂා මධු සුරංගනී |
| 07 | ජනේන්ද්‍ර විනෝදි ජයවර්ධන |
| 08 | ජයසූරිය ආරච්චිලාගේ දෙන් චන්දන හේමසි |
| 09 | කේ. සිවලෝගනාදන් / ඩී. සිවලෝගනාදන් මිය |
| 10 | කමලම්බිගායි සන්දරම් |
| 11 | කුසුම් වීරතුංග |
| 12 | එම්.එම්. අමාලි ඉන්දිරා කුමාරිහාමි |
| 13 | මෙනාරියා කලු රාම් |
| 14 | එම් සන්කර් හා රමින් දිනුෂ් |
| 15 | එම්. සන්කර් හා සජුන් |
| 16 | එම්. සන්කර් හා උඩි |
| 17 | නඩරාජා ලක්ෂ්මන් |
| 18 | නේසරානි එම්. මනෝහාරි |
| 19 | පී. නවරත්නම් |
| 20 | රාකේෂ් කුමාර් මල්හොත්‍රා |
| 21 | විජේසුන්දරගේ පුෂ්පජිත් |

**ඉතිරි කිරීමේ ගිණුම් - පුද්ගල (ශ්‍රී ලංකා රුපියල්) "අත්හැර දැමූ දේපල" ලෙස වර්ගීකරණය කොට ඇත.**


| අනු අංකය | ගණුදෙනුකරුගේ නාමය |
|---|---|
| 01 | රාමනාදන් කුසල රාජා |
| 02 | දේවගැති ජෝන් ඩොමිනික් ගෝමස් |

යම් ගණුදෙනුකරුවකු හට, ඉහත සඳහන් ඉතිරිකිරීමේ හෝ ජංගම ගිණුම්, යම් තැන්පතු කිරීමක් හෝ ආපසු ගැනීමක් සිදු කොට හෝ "**ලිපිනය වෙනස් වීම්**" හේතුවෙන් සිදුවූ බවට දැනුම් දීමක් සිදු කොට හෝ බැංකුව වෙත ඉල්ලීම් ලිපියක් මගින් අදාළ ගිණුම යළි වර්ගීකරණයක් කොට ක්‍රියාකාරි බවට පත් කිරීමක් සිදු කොට හෝ යළි ක්‍රියාකාරී බවට පත්කර ගත හැක.

අදාළ ගිණුම්හිමියන් හෝ ඔවුන්ගේ නෛතික උරුමකරුවන් විසින් මෙම දැන්වීම පළවී දින හතක් (07) ඇතුළත, ස්ටේට් බෑන්ක් ඔෆ් ඉන්ඩියා බැංකුවේ කොළඹ ශාඛාව වෙත තමන්ගේ හිමිකම් (ඇතොත්) ලබාගැනීම සඳහා අමතන ලෙස ඉල්ලීමක් කෙරේ.

**ඇමතුම් අංක - 4446810 දිගුව - 20 හා 23**

**ස්ටේට් බෑන්ක් ඔෆ් ඉන්දියා - 1864 වසරේ සිට සේවය සපයයි**

දැන්වීම් කාර්යාල
ඔබගේ දැන්වීම් පළකරවා ගන්න පිවිසෙන්න

මාතර
නො 29, ප්‍රධාන බස් නැවතුම් පොළ උඩුමහල
041 223 5412
සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම
ඩී ආර් විජේවර්ධන මාවත, කොළඹ 10
1949

# ප්‍රසම්පාදන දැන්වීම

## කල්පිටිය ප්‍රාදේශීය සභාව

2021 වර්ෂයට කල්පිටිය ප්‍රාදේශීය සභාවේ වත්කම් බදු දීම සඳහා 2020.10.16 දින සිට 2020.11.05 දින ප.ව. 12.30 දක්වා මා විසින් ලංසු භාරගනු ලබන අතර, එදිනම ප.ව. 12.30 ට ලංසු විවෘත කරනු ලැබේ.

ලංසු ඉල්ලුම්පත්‍ර සහ බදු දෙනු ලබන සභා සතු දේපළ උප ලේඛනයක් 2020.10.16 දින සිට 2020.11.04 දින දක්වා කල්පිටියේ පිහිටි ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයෙන් සතියේ වැඩකරන දිනයන්හිදී පෙ.ව. 8.30 සිට ප.ව. 3.00 දක්වා කාලය තුළ ලබාගත හැක.

**කොන්දේසි :**

**2 වන මහල, "සෙත්සිරිපාය", බත්තරමුල්ල.**

# මොරටුව මහා නගර සභාව

## 2021 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම

මෙහි පහත සඳහන් ද්‍රව්‍ය හා සේවාවන් සඳහා බස්නාහිර පළාත තුළ ව්‍යාපාර කටයුතු කරන සැපයුම්කරුවන් ලියාපදංචි කිරීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් එවන ලිපි කවරයෙහි වම්පස ඉහළ කෙළවරේ "සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම 2021 වර්ෂය" යනුවෙන් පැහැදිලිව සඳහන් කර 2020.11.30 වන දින ප.ව. 3.00 ට හෝ ඊට පෙර **'නාගරික කොමසාරිස්, මොරටුව මහා නගර සභාව'** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනැවිත් භාරදිය හැකිය.

| අනු අංකය | ද්‍රව්‍ය හා උපකරණ |
|---|---|
| 1 | කාර්යාලයීය ලිපි ද්‍රව්‍ය (පරිගණක කඩදසි හා අභ්‍යාස පොත් ඇතුලුව) |
| 2 | මුද්‍රණ කටයුතු (මුද්‍රිත පෝරම සහ පොත්පත්,ලේඛන ආදිය) |
| 3 | පුස්තකාල පොත් , සඟරා , පුවත්පත් |
| 4 | රබර් මුද්‍ර ,දින මුද්‍ර |
| 5 | වාහන සහ සත්ත්ව බලපත්‍ර තහඩු |
| 6 | දැන්වීම් පුවරු, නාම පුවරු, කටවුට්, බැනර් , ස්ටිකර් |
| 7 | නිල ඇඳුම් සඳහා අවශ්‍ය රෙදි වර්ග |
| 8 | වැහි කබා, ගම් බූට්ස්, සපත්තු, ආරක්ෂිත සපත්තු, මේස් ආදිය |
| 9 | ටයර්, ටියුබ්, රිම්ටේප් |
| 10 | වාහන බැටරි |
| 11 | රථ වාහන අමතර කොටස් (කැබ්,ට්‍රැක්ටර්, බැකෝලෝඩර්, ස්කිඩ්ලෝඩර්, ත්‍රිරෝද රථ ඇතුලු සියලු වාහන වල අමතර කොටස් උපාංග ) |
| 12 | වාහන සඳහා ලිහිසි තෙල් සැපයීම |
| 13 | එල්.පී.ගෑස් |
| 14 | පවිත්‍රතා කටයුතු ආශ්‍රිත ද්‍රව්‍ය හා උපකරණ (ඉදල්, කොසු, බුරුසු, පාපිසි, වේවැල් කුඩ, ප්ලාස්ටික් කුණු කුඩ, විම්, හාපික්, සබන් වර්ග, පයිනෝල්, ලයිසෝල්, රබර් අත්වැසුම් හා ටෝච් බැටරි, පොලිතීන් මලු ආදිය) |
| 15 | රසායනාගාර හා සායනික උපකරණ හා ද්‍රව්‍ය |
| 16 | විෂබීජනාශක ද්‍රව්‍ය, මුඛ ආවරණ, අත්වැසුම් ආදිය |
| 17 | පැළ වර්ග , පොහොර , තෙල් ඇතුලු උද්‍යාන අලංකරණය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය |
| 18 | තණකොළ කපන යන්ත්‍ර හා උපාංග |
| 19 | කාර්යාල උපකරණ– ලී,වානේ, ප්ලාස්ටික් ගෘහ භාණ්ඩ (ලිපිගොනු රාක්ක, අල්මාරි, මේස, පුටු, කැබිනට් ආදිය) |
| 20 | කාර්යාල විදුලි උපකරණ (එකතු කිරීමේ යන්ත්‍ර, විදුලි පංකා සහ විදුලි කේතල ආදිය) |
| 21 | වායුසමීකරණ යන්ත්‍ර සැපයීම |
| 22 | පැමිණීම සටහන් කිරීමේ යන්ත්‍ර සහ C.C.T.V. යන්ත්‍ර සැපයීම හා සේවා සිදු කිරීම |
| 23 | පරිගණක හා ඒ ආශ්‍රිත උපාංග |
| 24 | මුද්‍රණ යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර සහ අනු පිටපත් යන්ත්‍ර |
| 25 | මුද්‍රණ යන්ත්‍ර සඳහා ටෝනර්, රිබන් |
| 26 | විදුලි සේවාවන්, සැපයීමට අවශ්‍ය උපාංග හා ද්‍රව්‍ය (වයර්, ස්විච්, බල්බ්, ප්ලග් ආදිය හා විථි පහන් උපකරණ) |
| 27 | සූර්යබල පද්ධති ස්ථාපනය හා නඩත්තුව |
| 28 | ගිනි නිවන උපකරණ කට්ටල, ගිනි නිවීම් ද්‍රව්‍ය, ගිනි නිවීම් ආරක්ෂිත ඇඳුම් |
| 29 | පෙර පාසල් උපකරණ හා සියළු වර්ගයේ ක්‍රීඩා උපකරණ |
| 30 | තීන්ත වර්ග හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය හා උපකරණ |
| 31 | සාමාන්‍ය ගබඩා ද්‍රව්‍ය (යකඩඇතුලු ගොඩනැගිලි ඉදිකිරීම් ද්‍රව්‍ය, ජී. අයි.පයිප්ප, සහ අමතර කොටස් ආදිය) |
| 32 | ගොඩනැගිලි ද්‍රව්‍ය (මැටි, ගඩොල්, වැලි, පස්, කලුගල්, බොරළු ඇතුලු මාර්ග නඩත්තුවට අදළ ද්‍රව්‍ය ආදිය) |
| 33 | හියුම් පයිප්ප සහ කොන්ක්‍රීට් කණු, මායිම් ගල්, ඉන්ටර්ලොක්, සිමෙන්ති බ්ලොක් ගල් කොන්ක්‍රීට් ආශ්‍රිත භාණ්ඩ සහ කොන්ක්‍රීට් මිශ්‍රණ |
| 34 | සිමෙන්ති |
| 35 | ටයිල්, ග්‍රැනයිට්, ටයිටේනියම් සහ ඒ ආශ්‍රිත ද්‍රව්‍ය |
| 36 | වීදුරු හා වීදුරු භාණ්ඩ, වීදුරු නිෂ්පාදන |
| 37 | තාර හා ප්‍රිමික්ස් |
| 38 | පි.වී.සි. උපකරණ, ජී.අයි. ජල නල උපාංග යනාදි භාණ්ඩ සහ අමතර කොටස්, ප්ලාස්ටික් ජල ටැංකි, සනීපාරක්ෂක අමතර කොටස්, කොම්පෝස්ට් බැරල් |
| 39 | දැව සැපයීම (ලෑලි, පරාල, රීප්ප ආදිය) |
| 40 | ගොඩනැගිලි ඉදිකිරීම් ආශ්‍රිත උපකරණ (ඉනිමං, ග්‍රිල්, හැමර්, බුරුසු වැනි) |
| | **සේවාවන්** |
| 42 | ඡායා පිටපත් කිරීම |
| 42 | වාහන සේවා කිරීම |
| 43 | වාහන, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ අලුත්වැඩියාව |
| 44 | ටයර් පිරවීම |
| 45 | පුටු විවීම, කුෂන් කිරීම හා අලුත්වැඩියාව |
| 46 | නිල ඇඳුම් මැසීම |
| 47 | වායු සමීකරණ යන්ත්‍ර අලුත්වැඩියාව හා නඩත්තු කටයුතු |
| 48 | විදුලි ජනන යන්ත්‍ර අළුත්වැඩියාව |
| 49 | පරිගණක යන්ත්‍ර , අලුත්වැඩියා කිරීම |
| 50 | පරිගණක මෘදුකාංග සකස් කර සැපයීම |
| 51 | පරිගණක ජාල ස්ථාපනය හා නඩත්තුව |
| 52 | මුද්‍රණ යන්ත්‍ර, ෆොටෝකොපි යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර, රෝනියෝ යන්ත්‍ර අලුත්වැඩියා කිරීම |
| 53 | අභ්‍යන්තර දුරකථන සහ දුරකථන මාර්ග අලුත්ඩැඩියා කිරීම |
| 54 | උත්සව භාණ්ඩ සහ උපකරණ ශබ්ද විකාශන පද්ධති සැපයීම – ආයතනය අවට සැපයුම්කරුවන් විය යුතුය |
| 55 | වාහන කුලියට සැපයීම, ට්‍රැක්ටර්, මගී ප්‍රවාහන, ටිපර් රථ, කොම්පැක්ටර් රථ, ගලී බවුසර්, ගස් කපන යන්ත්‍ර සහ හදිසි අවශ්‍යතාවයන් සඳහා අවශ්‍ය වන යන්ත්‍රෝපකරණ ආදිය |
| 56 | මගී ප්‍රවාහන, ඉදිකිරීම් ද්‍රව්‍ය ප්‍රවාහනය ඇතුලු ප්‍රවාහන සේවා සැපයීම |
| 57 | මෝටර් ග්‍රේඩර්, බැකෝ යන්ත්‍ර, මාර්ග නඩත්තු සඳහා අවශ්‍ය සේවා සැපයීම |
| 58 | ගස් කැපීම |
| 59 | ආදහනාගාර අලුත්වැඩියාව |
| 60 | පළිබෝධ මර්දනය (මීයන්, වේයන්, කැරපොත්තන් වැනි) |
| 61 | භාෂා පරිවර්තක සේවා සැපයීම |
| 62 | නීතිඥ සේවාවන් සැපයීම |
| 63 | බලයලත් මිනින්දෝරු සේවාවන් |
| 64 | පශු වෛද්‍ය සේවාවන් – සත්ව වන්ධ්‍යාකරණය ආදී |
| 65 | වරලත් විදුලි ඉංජිනේරු සේවාවන් (උපදේශන සේවාවන්) |

සභාව මගින් නිකුත් කරනු ලබන කොන්දේසි සහ නිර්ණායක සහිත විස්තර පත්‍රිකා හා අයදුම්පත **www.moratuwa.mc.gov.lk** වෙබ් අඩවියට පිවිස ලබාගත හැකි අතර **itu.moratuwamc@gmail.com** විද්යුත් තැපැල වෙත ඉල්ලීමක් කර ලබාගැනීම හෝ කාර්යාලයට පැමිණ නොමිලේ පරික්ෂා කර බලා ලබාගත හැකිය. එකී කොන්දේසි සපුරාලිය හැකි සැපයුම්කරුවන් පමණක් ලියාපදිංචිය සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. එක් භාණ්ඩ/ සේවා කාණ්ඩයක් සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ගාස්තුව රු. 1750.00 කි. එම ලියාපදිංචි ගාස්තු කාර්යාල දිනවල, පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා මෙම කාර්යාලයේ සරප් වෙත ගෙවා රිසිට්පතක් ලබා ගැනීමෙන් හෝ **'නාගරික කොමසාරිස්, මොරටුව මහා නගර සභාව'** යන නමට චෙක්පතක් එවීමෙන් ගෙවීම් කළ හැක.

**එස්.ඩී.තෙවරප්පෙරුම**
**නාගරික කොමසාරිස්**
**මොරටුව මහා නගර සභාව**

**2020.10.13**
**මොරටුව මහා නගර සභා කාර්යාලයේදීය.**
**දු.ක.011-2645251, 011-2645383**

### මොරටුව මහා නගර සභාවේ සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම-2021

**කොන්දේසි**

1. සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා වූ අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ 2020.11.30 දින ප.ව.3.00දක්වා පමණි.
2. ලියාපදිංචි වීම සඳහා සැපයුම්කරුවන් විසින් තමන් ලියාපදිංචි වීමට අපේක්ෂිත භාණ්ඩ/ සේවා කාණ්ඩ හා ඊට අදළ කාණ්ඩ අංකද සඳහන් කර නිසි පරිදි සම්පූර්ණ කළ අයදුම්පතක් ඉදිරිපත් කළ යුතුය.
3. ඉහත සඳහන් එක් කාණ්ඩයකට අදළව සැපයුම්කරුවකු ලෙස ලියාපදිංචි වීමට ගෙවිය යුතු ගාස්තුව රු. 1750.00 ක් වේ. කාණ්ඩ කිහිපයක් සඳහා ලියාපදිංචි වීමට අදහස් කරන්නේ නම් එක් කාණ්ඩයකට රු.1750.00 බැගින් වන පරිදි ගෙවිය යුතුවේ. එම මුදල කාර්යාල දිනවලදී, පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා මෙම කාර්යාලයේ සරප් වෙත ගෙවා රිසිට්පතක් ලබා ගැනීමෙන් හෝ **'නාගරික කොමසාරිස්, මොරටුව මහා නගර සභාව'** යන නමට චෙක්පතක් එවීමෙන් ගෙවීම් කළ හැක.
4. 2021 වර්ෂය තුළ ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් සාමාන්‍ය මිල ගණන් කැඳවීම් කරනු ලබන අතර, ඉදිරිපත් කරනු ලබන මිල ගණන් සාමාන්‍යයෙන් මාස හයක (06) කාලයක් තුළ වෙනස් නොකරන ස්ථාවර තත්වයක තබා ගැනීම කළ යුතුය. අවශ්‍ය යැයි හැගෙන අවස්ථාවලදී ලියාපදිංචි සැපයුම්කරුවන්ට පරිබාහිරව වෙනත් සැපයුම්කරුවන්ගෙන් භාණ්ඩ හා සේවාවන් සඳහා මිල ගණන් ලබා ගැනීම ඒ අනුව භාණ්ඩ හා සේවාවන් ලබාගැනීමේ අයිතිය සභාව සතුව පවතී.
5. සැපයුම්කරුවන් අප වෙනුවෙන් තොග තබාගත යුතු අතර මොරටුව මහා නගර සභාවේ ලියාපදිංචි වන විට දින 60ක ණය පහසුකම් ලබා දීමට සියළුම සැපයුම්කරුවන් එකඟතාවය පළ කළ යුතුය.
6. ඇණවුම් කරන භාණ්ඩ සභාවේ ගබඩාව වෙත ගෙනවිත් භාරදිය යුතුයි. ඒ සඳහා ගාස්තු ගෙවනු නොලැබේ.
7. 2021 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම පිළිබඳ අවසාන තීරණය ගැනීමේඅයිතිය සභාව සතුවේ.

**මොරටුව මහා නගර සභාවේ ලියාපදිංචි වන සැපයුම්කරුවන් සඳහා තිබිය යුතු නිර්නායක**

1. අයදුම්පත සමග ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක් ඉදිරිපත් කළ යුතුය.
2. එකතු කළ අගය මත බදු ගෙවීම් කරන්නේ නම් ලියාපදිංචි සහතිකයේ පිටපතක් ඉදිරිපත් කළ යුතුය.
3. වාහන අලුත්වැඩියා සම්බන්ධයෙන් බස්නාහිර පළාත් සභාවේ අනුමත මෝටර් ගරාජයක වීම විශේෂ සුදුසුකමක් වන අතර, රාජ්‍ය ආයතන පහකටවත් සේවා සපයා ඇති පළපුරුදු ආයතනයක් වීම.
4. මිල ගණන් කැඳවීම් සඳහා සමගාමී අවස්ථා 2කදී ප්‍රතිචාර නොදක්වන සැපයුම්කරුවන් වෙතින් තවදුරටත් මිළ ගණන් කැඳවීම් සිදුකරනු නොලැබේ.
5. ඇණවුම් කළ පසු භාණ්ඩ සැපයීමට අපොහොසත් වන සැපයුම්කරුවන් සහ නියමිත ප්‍රමිතියෙන් තොරව භාණ්ඩ හා සේවා සපයනු ලබන සැපයුම්කරුවන්ගේ ලියාපදිංචිය අවලංගු කොට අසාධු ලේඛනගත (Black List)කරනු ලැබේ.

**නාගරික කොමසාරිස්,**
**මහා නගර සභාව, මොරටුව.**

# ලුහුඬු දැන්වීම්




**රථවාහන**




**106 මෝටර් කාර් රථ**
විකිණීම

**WP KT** 8426 Micro Geely MX7 Car ඉහළම ඉල්ලුමට විකිණීමට ඇත. සෙන්කඩගල ෆිනෑන්ස් පීඑල්සී, මහනුවර, 0770107270, 0774789216, සඳුදා සිට සිකුරාදා දක්වා පමණක් අමතන්න. 064479




**113 සුසුකි කාර් රථ**
විකිණීම

**WP GF** 3353 SUZUKI Cultus Car ඉහළම ඉල්ලුමට විකිණීමට ඇත. සෙන්කඩගල ෆිනෑන්ස් පීඑල්සී, මහනුවර, 0770107270, 0774789216, සඳුදා සිට සිකුරාදා දක්වා පමණක් අමතන්න. 064481



**118 ජීප් හා පිකප් රථ**
විකිණීම

59- **2682** Toyota HI-Lux D/ Cab ඉහළම ඉල්ලුමට විකිණීමට ඇත. සෙන්කඩගල ෆිනෑන්ස් පීඑල්සී, මහනුවර, 0770107270, 0774789216, සඳුදා සිට සිකුරාදා දක්වා පමණක් අමතන්න. 064486



**119 බස් හා ලොරි රථ**
විකිණීම

**NP PU** - 3684 Mahindra Bolero Mani truck ඉහළම ඉල්ලුමට විකිණීමට ඇත. සෙන්කඩගල ෆිනෑන්ස් පීඑල්සී, මහනුවර, 0770107270, 0774789216, සඳුදා සිට සිකුරාදා දක්වා පමණක් අමතන්න. 064483

43-4416 **Isuzu** ELF Truck ඉහළම ඉල්ලුමට විකිණීමට ඇත. සෙන්කඩගල ෆිනෑන්ස් පීඑල්සී, මහනුවර, 0770107270, 0774789216, සඳුදා සිට සිකුරාදා දක්වා පමණක් අමතන්න. 064487




**122 යතුරු පැදි හා ත්‍රිරෝද රථ**
විකිණීම

**EP BIA** 6530 Ranomoto GN 125 ඉහළම ඉල්ලුමට විකිණීමට ඇත. සෙන්කඩගල ෆිනෑන්ස් පීඑල්සී, මහනුවර, 0770107270, 0774789216, සඳුදා සිට සිකුරාදා දක්වා පමණක් අමතන්න. 064485

**EP BIN** - 5015 Hero Passion Pro- ඉහළම ඉල්ලුමට විකිණීමට ඇත. සෙන්කඩගල ෆිනෑන්ස් පීඑල්සී, මහනුවර, 0770107270, 0774789216, සඳුදා සිට සිකුරාදා දක්වා පමණක් අමතන්න. 064484

**WP ABK** 9693 Piaggio Ape Three Wheeler ඉහළම ඉල්ලුමට විකිණීමට ඇත. සෙන්කඩගල ෆිනෑන්ස් පීඑල්සී, මහනුවර, 0770107270, 0774789216, සඳුදා සිට සිකුරාදා දක්වා පමණක් අමතන්න. 064482



**රැකී රක්ෂා**



**325 ඇබෑර්තු**
විවිධ

කාර්යාලයක පිරිසිදු කටයුතු කළ හැකි කාන්තාවක් නුගේගොඩ මහරගම අවටින් සොයයි. දවස් පඩි. 0773026680 064292



**නිවාස හා ඉඩම්**

**616 ගේ දෙර ඉඩකඩම් කොළඹ දිස්ත්‍රික්කය**
විකිණීමට

ජුබිලි කණුවේ නුගේගොඩ ඉඩමක් විකිණීමට තිබේ. පර්චස් 40.8 ක් පර්චසය ලක්ෂ 22 යි. 0714877913 064893


SUNDAY OBSERVER | තරුණී



මංගල යෝජනා
දශක ගණනාවක විශ්වසනීය සේවාව...
පුවත්පත් කිහිපයක දැරිය හැකි මිලකට

SUNDAY OBSERVER (වචන 15ක් සඳහා) රු. 560/- - වැඩි වන වචනයක් සඳහා රු. 23/-
සිළුමිණ (වචන 15ක් සඳහා) රු. 560/- - වැඩි වන වචනයක් සඳහා රු. 23/-

- ඔබ්සර්වර් පුවත්පතේ පළකරන මංගල යෝජනා දැන්වීම සිළුමිණ පුවත්පතේ පළකිරීම සඳහා අමතර රු. 200ක් පමණි.
- සිළුමිණ පුවත්පතේ පළකරන මංගල යෝජනා දැන්වීම තරුණී පුවත්පතේ පළකිරීම සඳහා අමතර රු. 300ක් පමණි.

චාමර - 0777 270 067 / අනූෂා - 0777 278 948

# ලංසු සඳහා ආරාධනයයි

## දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මාතර

### 2021 වර්ෂය සඳහා පවිත්‍රතා සේවා සහ ආරක්ෂක සේවා සැපයීම නුවෙන් මිල ගණන් කැඳවීම

2021.01.01 දින සිට 2021.12.31 දක්වා මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ මාතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 ක ආරක්ෂක සේවා හා පවිත්‍රතා සේවා සැපයීම සඳහා ඒ ඒ සේවාවන් වෙනුවෙන් රජයේ ලියාපදිංචි ආයතන වෙතින් මිල ගණන් කැඳවනු ලැබේ.

- 2020 නොවැම්බර් මස 11 දින පෙ.ව. 10.30 දක්වා මිල ගණන් කැඳවනු ලැබේ.
- පවිත්‍රතා සේවා සපයන්නන් රජයේ ලියාපදිංචි සේවාවන් සපයන්නන් විය යුතු අතර, ආරක්ෂක සේවා සපයන්නන් රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ලියාපදිංචි සේවා සපයන්නන් විය යුතුය. එම ලියාපදිංචිය 2021 වර්ෂය සඳහා වලංගුව පැවතීම අනිවාර්ය වේ.
- ලංසු ලියවිලි, 2020.10.19 දින සිට 2020.11.10 දින දක්වා පෙ.ව. 9.00 සිට ප.ව. 2.00 දක්වා මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී නොමිලේ පරීක්ෂා කළ හැක. මෙම කාර්යාලයෙන් නිකුත් කරන ලද ආකෘතිපත්‍රවල පමණක් ඔබගේ ලංසු මිල ගණන් ඉදිරිපත් කළ යුතු අතර, 2020.11.10 දින ප.ව. 2.00 දක්වා ආපසු නොගෙවන රු. 500.00 ක මුදලක් මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සරප් වෙත ගෙවා ලබාගත් රිසිට් පත ගිණුම් අංශය වෙත ඉදිරිපත් කිරීමෙන් ඉල්ලුම් පත්‍ර ලබාගත හැක.
- ඔබගේ ලංසු මිල ගණන් ඉදිරිපත් කිරීමට ප්‍රථම 2020.10.28 දින මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පැවැත්වෙන ආරක්ෂක සේවා හා පවිත්‍රතා සේවා සැපයීම පිළිබඳ පූර්ව උපදෙස් රැස්වීමට අනිවාර්යයෙන්ම සහභාගි විය යුතුය.
- ශ්‍රී ලංකාවේ මහ බැංකුව විසින් අනුමත ඕනෑම වාණිජ බැංකුවක් වෙතින් ලබාගත් පහත වගුවේ සඳහන් වටිනාකමින් යුතු ලංසු ඇපකරයක් හෝ එම වටිනාකම මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ගෙවීම් කර ලබාගනු ලබන රිසිට් පත ඔබගේ ලංසු ලේඛන සමග ඉදිරිපත් කළ යුතුය.

| ප්‍රසම්පාදන අංකය | සපයනු ලබන සේවාව | ලංසු ඇපකරයේ වටිනාකම (රු.) |
|---|---|---|
| P/20/20 | ආරක්ෂක සේවාව | 160,000.00 |
| P/20/21 | පවිත්‍රතා සේවාව | 150,000.00 |

- සම්පූර්ණ කරන ලද ලංසු මිල ගණන් ඔබ වෙත සපයා ඇති කවරයේම බහා 2020 නොවැම්බර් මස 11 වන දින පෙ. ව. 10.30 ට පෙර ලැබෙන සේ දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතර යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීමට හෝ දිස්ත්‍රික් ලේකම් නිල කාමරයේ තබා ඇති ගිණුම් අංශය යනුවෙන් සඳහන් කර ඇති ටෙන්ඩර් පෙට්ටියට ගෙනැවිත් බහාලීමට හැකිය. නියමිත වේලාවට පසුව ලැබෙන ලංසු ලේඛන ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- ලංසු භාරගන්නා වේලාව ඉකුත් වූ වහාම ලංසු මිල ගණන් විවෘත කිරීම ආරම්භ කරනු ලබන අතර, මෙම අවස්ථාවට ලංසුකරුවන්ට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයකුට සහභාගිවීමට අවස්ථාව සළසා දෙනු ඇත.
- ලංසු කැඳවීම පිළිබඳ අවසාන තීරණය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ප්‍රසම්පාදන කමිටුව සතුය.
- මේ පිළිබඳ වැඩි විස්තර කාර්යාලයීය දුරකථන අංක 041-2235913 ට ඇමතීමෙන් ලබාගත හැකිය.

**සභාපති,**
**දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ප්‍රසම්පාදන කමිටුව.**
**2020.10.19**

# වැලිගෙපොල ප්‍රාදේශීය සභාව

## 2021 වර්ෂයට
## සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම

මෙහි පහත සඳහන් භාණ්ඩ හා සේවාවන් සැපයීම සඳහා සැපයුම්කරුවන් ද, ඉදිකිරීම් කටයුතු සඳහා කොන්ත්‍රාත්කරුවන්ද ලියාපදිංචි කිරීම සඳහා මා විසින් 2020.12.31 දින දක්වා මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"සැපයුම්කරුවන් / කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම-2021"** යනුවෙන් පැහැදිලිව සටහන් කර ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

03. අයදුම්පත් එවීමේදී ඒ සමග ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක් ඉදිරිපත් කළ යුතුය.

04. ලියාපදිංචි කිරීමේ ගාස්තු ලේකම්, වැලිගෙපොල ප්‍රාදේශීය සභාව යන නමට ලියනු ලබන චෙක්පත් / මුදල් ඇණවුම්, හුණුවල, ඕපනායක යන ලිපිනයට එවිය යුතුය. මුදලින් ගෙවන්නේ නම්, අතින් ගෙනැවිත් භාර දිය හැකිය.

**01. ද්‍රව්‍ය සැපයීම (එක් අයිතමයක් සඳහා රු. 1,000.00 ක් අයකරනු ලැබේ)**

01. කාර්යාලයීය ලිපිද්‍රව්‍ය, පාරිභෝගික භාණ්ඩ, සනීපාරක්ෂක ද්‍රව්‍ය සැපයීම.
02. කාර්යාල යන්ත්‍ර සූත්‍ර, යතුරු ලියන, ඡායාපිටපත් යන්ත්‍ර
03 කාර්යාලයීය වානේ භාණ්ඩ / ලී බඩු උපකරණ සැපයීම.
04 පරිගණක යන්ත්‍ර (ආනයනික)
05. ඉදිකිරීම් ද්‍රව්‍ය (සිමෙන්ති, යකඩ, හුණු, ටයිල්, තීන්ත) ආදිය
06. ඉදිකිරීම් ද්‍රව්‍ය (ගල්,මැටල්, වැලි, ගඩොල්, බ්ලොක් ගල්, දැව, තාර, කෝලාස්) ආදිය.
07. වාහන සඳහා ටයර්, ටියුබ් හා බැටරි සැපයීම.
08. රබර් සීල්, දින මුද්‍රා, හා නාම පුවරු සැපයීම/ සැකසීම.
09. කාර්යාලයීය මුද්‍රණ කටයුතු කර සැපයීම.
10. පී.වී.සී. / ජී.අයි. / නල වර්ග හා උපාංග සැපයීම.
11. ජල මනු (මීටර්) සැපයීම.
12. පුස්තකාල පොත්
13. වාහන තහඩු හා වරිපනම් තහඩු සැපයීම
14. රථ වාහන අමතර කොටස් සැපයීම
15. හියුම් පයිප්ප, ළිං කටවල්, කම්බි කණු සැපයීම
16. රෙදි පිළි කාර්යාල තිර රෙදි සැපයීම.
17. සෞඛ්‍ය උපකරණ, කම්කරු මෙවලම් හා පිරිසිදු කිරීමේ උපකරණ
18. පෙර පාසල් උපකරණ ඩෙක්ස්, පුටු, බංකු
19. ඉදිකිරීම් කටයුතු සඳහා (ලොරි, ට්‍රැක්ටර්, ඩෝසර්, ලෝඩර්, රෝල යන්ත්‍ර) ආදිය
20. ආහාරපාන හා සංග්‍රහ සඳහා අවශ්‍ය උපාංග
21. කාර්යාලයීය බෑග් සහ සම්භාණ්ඩ සැපයීම.
22. වීථි පහන් උපකරණ හා ඉලෙක්ට්‍රිකල් උපකරණ සැපයීම.

**02. සේවාවන් (එක් අයිතමයක් සඳහා රු. 1,000.00 ක් අයකරනු ලැබේ)**

01. මෝටර් රථ කුෂන් වැඩ හා හුඩ් වැඩ.
02. මෝටර් රථ අලුත්වැඩියා කිරීම හා මෝටර් රථ තහඩු පින්තාරු වැඩ සිලින්ඩර්, බෝරින්, ක්‍රෑන්ක් කැපීම්, වීල් බැලන්සින්
03. වාහන සේවා (සර්විස්) කිරීම
04. කාර්යාලයීය යන්ත්‍ර සූත්‍ර අලුත්වැඩියා කිරීම හා සේවා කිරීම.
05. ලියවන පට්ටල් වැඩ, වෑල්ඩින් වැඩ, හයිඩ්‍රොලික් හෝස් අලුත්වැඩියාකිරීම
06. ගිනි නිවන උපකරණ සවි කිරීම හා නඩත්තුව
07. විදුලිය සම්බන්ධ සේවා සැපයීම.

**03. කොන්ත්‍රාත්කරුවන් (එක් අයිතමයක් සඳහා රු. 1,000.00 ක් අයකරනු ලැබේ)**

01. රු. 100,000/= දක්වා ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ලියාපදිංචි සුදුසුකම්ලත් එක් සමිතියක් වෙනුවෙන්
02. රු. 100,001/= සිට 500,000/- දක්වා බල ප්‍රදේශයේ ලියාපදිංචි සුදුසුකම්ලත් එක් සමිතියක් වෙනුවෙන්
03. රු. 500,001/= සිට ඉහළට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ලියාපදිංචි සුදුසුකම්ලත් එක් සමිතියක් වෙනුවෙන්

(එක් එක් අයිතමයක් වෙනුවෙන් වෙන වෙනම ගාස්තු ගෙවිය යුතුය)

**කොන්දේසි :**

1. ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන්, සාමාන්‍යයෙන් මිල ගණන් කැඳවනු ලබන අතර, ඔවුන් ඉදිරිපත් කරනු ලබන මිල ගණන් අඩු වශයෙන් මාස 03 ක කාලයක් තුළ වෙනස් නොකර ස්ථාවර තත්ත්වයක තබා ගත යුතුය.
2. අවශ්‍ය යැයි හැඟෙන අවස්ථාවන්හි දී වෙනත් සැපයුම්කරුවන්ගෙන් භාණ්ඩ ලබා ගැනීමේ අයිතිය සභාව සතුය.
3. මිල ගණන් ඉල්ලුම් කිරීමේ දී ඒවා ඉදිරිපත් නොකරන්නා වූද, ඇණවුම සඳහා නියමිත වේලාවට භාණ්ඩ / සේවා නොසපයන්නා වූද, සාම්පල් අනුව භාණ්ඩ නොසපයන්නා වූද, සැපයුම්කරුවන්ගේ නම් කිසි දැනුම් දීමකින් තොරව, ලියාපදිංචි ලේඛනයෙන් කපා හැරීමට කටයුතු කරනු ඇත.
4. ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගෙන් බාහිරව ද, කර්මාන්ත සඳහා ටෙන්ඩර් කැඳවීමේ අයිතිය සභාව සතුය.
5. කොන්ත්‍රාත්කරුවන් වශයෙන් ලියාපදිංචි වන අය තම සුදුසුකම් තහවුරු කිරීම සඳහා ලිඛිත සාක්ෂි ඉදිරිපත් කිරීම අත්‍යවශ්‍ය වේ.

**2020.10.13**
**වැලිගෙපොල ප්‍රාදේශීය සභා කාර්යාලයේදී.**
**හුණුවල, ඕපනායක.**

**කේ.ඕ. කැළුම් ප්‍රියංකර ජයසිංහ,**
**සභාපති,**
**වැලිගෙපොල ප්‍රාදේශීය සභාව.**

# වැවිලි අමාත්‍යාංශය

# පොල් වගාකිරීමේ මණ්ඩලය

## පවිත්‍රතා හා සනීපාරක්ෂක සේවාව සපයා ගැනීම සඳහා ලංසු කැඳවීම - 2021

**ප්‍රසම්පාදන අංකය : E/7/G/P/U/CLEANING SERVICE 2021**

01. පොල් වගාකිරීමේ මණ්ඩලයේ ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් ප්‍රධාන කාර්යාලයේ පවිත්‍රතා හා සනීපාරක්ෂක සේවා කටයුතු සඳහා පිළිගත් ආයතනවලින් ලංසුපත් කැඳවනු ලබයි.

02. ලංසු කැඳවීම ජාතික තරඟකාරී ලංසු ක්‍රමය (NCB) මගින් සිදු කරනු ලබයි.

03. අයදුම්කරුවන් පහත සුදුසුකම් සපුරා තිබිය යුතුය.

I. අයදුම්කරු විසින් වාර්ෂික පිරිවැටුම ඉදිරිපත් කළ යුතුයි.

II. දෛනිකව කාන්තා සේවිකාවන් තිදෙනෙකු සහ පිරිමි එක් සේවකයෙකු ද පූර්ණකාලීනව එක් වැඩ පරීක්ෂකවරයෙකු ද සේවයේ යෙදවිය යුතුය.

III. එම සේවක සේවිකාවන් වයස අවුරුදු 60 නොඉක්මවූ අය විය යුතු අතර, ඔවුන්ගේ සේවා පළපුරුද්ද වසර එකකට නොඅඩු විය යුතු සේම (සේවා සහතිකයක් මගින් සේවා පළපුරුද්ද සහතික සනාථ කළ යුතුය), අදාළ පවිත්‍රතා සේවාව සපයනු ලබන ආයතනය විසින් පුහුණු වැඩ සටහන් / කාර්යභාරය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා යොමු කර ඇත් ද යන වග ලිඛිතව සනාථ කළ යුතුය.

IV. ආයතනයේ ස්ථානීය පරීක්ෂාවක් සිදු කිරීමෙන් පසු මාසිකව පවිත්‍රතා කටයුතු වෙනුවෙන් යොදගැනීමට අපේක්ෂිත පවිත්‍රකාරක පිළිබඳ ලැයිස්තුවක් ලංසුපත් සමග ඉදිරිපත් කළ යුතු අතර, අදාළ පවිත්‍රකාරක වෙළෙඳ පොළේ පිළිගත් සන්නාම සහිත ඒවා විය යුතුය.

V. පිරිසිදු කිරීම සඳහා යොදගනු ලබන උපකරණ (උදා: මොප්, කොසු, ඉදල් හා බ්‍රෂ් වර්ග) අවම වශයෙන් තෙමසකට වරක් අලුතෙන් යෙදිය යුතුය.

VI. පිරිසිදු කිරීමේ කටයුතු සඳහා යොදගනු ලබන යන්ත්‍ර (උදා: පොලිෂර්, වැකුම් ක්ලීනර් ආදිය) පිළිබඳව තොරතුරු සනාථ කළ යුතුය.

04. මේ සඳහා උනන්දුවක් දක්වන සුදුසුකම් සහිත ලංසුකරුවන්ට පොල් වගාකිරීමේ මණ්ඩලයේ සැපයුම් නිලධාරී මගින් **වැඩිමනත් තොරතුරු 0112-193457 දුරකථන** මාර්ගය ඔස්සේ ලබාගත හැකි අතර, පහත දැක්වෙන ලිපිනයේදී **2020.10.19 දින සිට 2020.11.11 දින දක්වා**, සතියේ දිනයන්හි කාර්යාල වේලාව තුළදී **(පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා)** ලිඛිත ඉල්ලීමක් හා ව්‍යාපාර ලියාපදිංචි සහතිකයේ පිටපතක් ඉදිරිපත් කර ආපසු නොගෙවන **රු. 3000/- ක** මුදලක් බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 9/428 දරන ස්ථානයේ පිහිටි පොල් වගාකිරීමේ මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලයේ මුදල් අයකැමිට ගෙවීමෙන් අනතුරුව ලංසු ලේඛන **කට්ටල 02 ක්** ලබාගත හැකිය.

05. සියලුම ලංසු සමග ලංසුවේ වටිනාකමින් 1% ක වටිනාකමට නොඅඩු ශ්‍රී ලංකාවේ පිළිගත් ඕනෑම වාණිජ බැංකුවකින් ලබාගන්නා ලද ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කළ යුතුය.

06. සම්පූර්ණ කරන ලද ලංසු ලේඛන කට්ටල 02 **(මුල් පිටපත හා අනු පිටපත සලකුණු කර)** වෙන වෙනම ලිපි කවරවල බහා, අනතුරුව කට්ටල දෙකම එක් කවරයක බහා, එම කවරයේ ඉහළ වම් කෙළවරේ **"පවිත්‍රතා හා සනීපාරක්ෂක සේවා සැපයීම - 2020 සඳහා මිල ගණන්"** යනුවෙන් පැහැදිලිව සටහන් කර, මුද්‍රා තබා **2020.11.12 වන දින ප.ව. 2.30 ට පෙර** ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට, ලියාපදිංචි තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් මෙම කාර්යාලයේ තබා ඇති ලංසු පෙට්ටියට බහාලීමට කටයුතු කළ යුතුයි. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කෙරේ.

06. 2020.11.12 දින ප.ව. 2.30 ට ලංසු විවෘත කරන අතර, ලංසුකරුට හෝ නියෝජිතයෙකුට එම අවස්ථාවට සහභාගී විය හැකිය.

**සභාපති, ප්‍රසම්පාදන කමිටුව,**
**පොල් වගාකිරීමේ මණ්ඩලය,**
**9/428, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.**

**දුරකථන අංකය : 011-2193457, ෆැක්ස් : 011-2861332**

ඔබගේ සුහුඬු දැන්වීම් ලඟම සිටින අපගේ
පුවත්පත් නියෝජිත මහත්වරුන් වෙත භාරදෙන්න
සුහුඬු දැන්වීමක් සඳහා නවතම ගාස්තු...
රු. 300/- රු. 500/- රු. 650/-

කොළඹ දිස්ත්‍රික්කය
පුංචිබොරැල්ල 011 2 268 251
කොළඹ 071 0 748 900
කිරුළපන 071 5 439 396
මාකොල 078 5 200 648
ග්‍රෑන්ඩ්පාස් 071 2 321 968
වැල්ලවත්ත 071 7 182 900
කොල්ලුපිටිය 011 2 341 502
මට්ටක්කුලිය 011 2 520 602
බොරැල්ල 011 2 679 032
නාවින්න 071 4 252 138
මහරගම 011 2 896 373
කෝට්ටේ 077 9 878 933
කහතුඩුව 011 2 753 836
WATAPITA HOT LINE - 011 2 429 342
CLASSIFIEDS HOTLINE 011 2 445 445

# ජාතික සෞඛ්‍ය විද්‍යායතනය - කළුතර

## ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම් - 2020

## ලංසු සඳහා ආරාධනයයි

කළුතර ජාතික සෞඛ්‍ය විද්‍යායතනයේ ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත සඳහන් අලුත්වැඩියාව සිදු කිරීම සඳහා ලංසු කැඳවනු ලැබේ.


| අනු අංකය | කොන්ත්‍රාත් විස්තරය | ICTAD අවම ශ්‍රේණිය | මූලික පිරිවැය රුපියල් මිලියන | ලංසු සුරැකුම් වටිනාකම රුපියල් | කොන්ත්‍රාත් කාලය දින | නැවත නොගෙවන ලංසු ලියවිලි ගාස්තු රුපියල් |
|---|---|---|---|---|---|---|
| 01 | මහජන සෞඛ්‍ය කෞතුකාගාරය වැඩි දියුණු කිරීම (II අදියර) | C 8 or above | 2.5 Million | 50,000.00 | 42 Days | 3,300.00 |

ඉහත කාර්යයන් පිළිබඳ සියලු විස්තර ලංසු ලිපි ලේඛන සමග ලබාගත හැකිය.

2020.10.19 වන දින සිට 2020.11.06 දින දක්වා කාර්යාල වේලාවන් තුළදී (පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා) කළුතර ජාතික සෞඛ්‍ය විද්‍යායතනයේ කාර්යාලය වෙතින් ලංසු ලිපිලේඛන ලබාගත හැකිය. 2020.11.09 දින පෙ. ව. 10.30 ට ලංසු විවෘත කරනු ලැබේ.

දුරකථන අංක : 034-2222264 / 034-2222001 පාලන අංශයේ දිගුව : 237/333

**සභාපති,**
**ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව,**
**ජාතික සෞඛ්‍ය විද්‍යායතනය, කළුතර.**

BE BETTER INFORMED!

News you can trust now free on your mobile phone.
VISIT
apps.lakehouse.lk
DOWNLOAD TODAY!
AVAILABLE AT
LAKE HOUSE

# මිල ගණන් කැඳවීමයි

සී/ස ජයවර්ධනපුර විවිධ සේවා සමුපකාර සමිතියට අයත් පහත සඳහන් ස්ථාන බදුදීම සඳහා මිල ගණන් කැඳවනු ලබන අතර, මිල ගණන් කැඳවීමට අදාළ අයදුම්පත් හා වැඩි විස්තරය සමිති ප්‍රධාන කාර්යාලයෙන් සතියේ දිනවල පෙ.ව. 8.30 සිට ප.ව. 3.00 දක්වා කාලය තුළ ලබාගත හැකිවේ. රු. 500/- ක ගාස්තුවක් ගෙවා ටෙන්ඩර් අයදුම්පත් ලබාගත යුතුවේ. **2020.10.19 වන දින සිට 2020.10.29** දින දක්වා ටෙන්ඩර් භාරගන්නා අතර, එදිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් හෝ සමිති කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය හැකිවේ. අයදුම්පත් එවනු ලබන කවරයේ වම්පස ඉල්ලුම් කරනු ලබන ස්ථානය සමග **"ගොඩනැගිලි / ඉඩම් බදු ලබාගැනීම"** යනුවෙන් සඳහන් කර තිබිය යුතුය.

| | | ප්‍රමාණය | පිහිටීම | ගොඩනැගිලි / හිස්භූමි |
|---|---|---|---|---|
| 01. | ඇතුල්කෝට්ටේ | පර්චස් 62 | 857, ඇතුල්කෝට්ටේ | හිස්භූමිය |
| 02. | ඇතුල්කෝට්ටේ | වර්ග අඩි 264 | 857ඒ 1/2 ඇතුල්කෝට්ටේ | කඩ කාමරය |
| 03. | ඇතුල්කෝට්ටේ | වර්ග අඩි 1000 | 857ඒ ඇතුල්කෝට්ටේ | පහත මහල |
| 04. | ඇතුල්කෝට්ටේ | වර්ග අඩි 204 | 857 ඇතුල්කෝට්ටේ | කඩ කාමරය සහ හිස්භූමි කොටසක් |
| 05. | ඉහළ වැලිකඩ | වර්ග අඩි 580 | 97 මොරගස්මුල්ල | කඩ කාමරය 2 |
| 06. | ඉහළ වැලිකඩ | වර්ග අඩි 500 පමණ | 97 මොරගස්මුල්ල | කඩ කාමරය 2 |
| 07. | ඔබේසේකරපුර | වර්ග අඩි 1470 | 133 ඔබේසේකරපුර | ගොඩනැගිල්ල |
| 08. | නුගේගොඩ | වර්ග අඩි 1500 | 41 නාවල පාර, නුගේගොඩ | ගොඩනැගිල්ල |
| 09. | නාවල උතුර | වර්ග අඩි 156 | 467 නාවල පාර, නාවල | කඩ කාමරය |
| 10. | මිරිහාන උතුර | වර්ග අඩි 400 පමණ | 166, රජමහාවිහාර පාර, මිරිහාන | කඩ කාමරය |

**ලිපිනය :**

**සභාපති,**
**සී/ස ශ්‍රී ජයවර්ධනපුර වි.සේ.ස. සමිතිය,**
**අංක. 857, ඇතුල් කෝට්ටේ, ශ්‍රී ජයවර්ධනපුර.**
**දු.අ./ෆැක්ස් : 0112 863152**

# දැන්වීමයි

## උතුරු මැද පළාත් සභාවේ සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම

උතුරු මැද පළාත් සභාවේ 2021 වර්ෂය සඳහා සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම පිණිස අයදුම්පත් කැඳවනු ලැබේ.

- 2020.10.16 සිට 2020.11.17 වන දින දක්වා රාජකාරී දිනයන්හි දී පෙ.ව:9.00 සිට ප.ව. 3.00 දක්වා අයදුම්පත් නිකුත් කිරීම සහ,
- 2020.10.16 සිට 2020.11.19 වන දින දක්වා රාජකාරී දිනයන්හි දී පෙ.ව. 9.00 සිට ප.ව.3.00 දක්වා අයදුම්පත් භාර ගැනීම උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ දී සිදු කරනු ලැබේ.

➢ වැඩි විස්තර 025-2235471 දුරකථනයෙන් හා www.cs.nc.gov.lk මගින් ලබා ගත හැකිය.

**ප්‍රධාන ලේකම්,**
**උතුරු මැද පළාත.**

# රැකියා ඇබෑර්තු



## දැන්වීම් - පුරප්පාඩු

### සී/ස මොරගොල්ල ඒකාබද්ධ සණස සමිතිය
### මොරගොල්ල - හෙට්ටිපොළ
### කළමනාකරණ සහකාර තනතුර (1/2015 චක්‍රලේඛය)


සී/ස මොරගොල්ල ඒකා/ සණස සමිතියේ පුරප්පාඩු පවතින කළමනාකරණ සහකාර OL(1/2015) තනතුර සඳහා පඩු/ මැතිරවණ කොට්ඨාසයෙන් පහත සුදුසුකම් සපුරා ඇති ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත්‍ර කැඳවනු ලැබේ.

| | | |
|---|---|---|
| 1. තනතුර 1/2015 චක්‍රලේඛය | - | කළමනාකරණ සහකාර |
| 2. වැටුප් පරිමාණය | - | 1/2015 OL- 17500+225x10+270x10+ 320x10=25650/= |
| 3. වයස් සීමාව | - | අවු. 18 – 45 |
| 4. අධ්‍යාපන සුදුසුකම් | - | ගණිතය හා සිංහල භාෂාව ඇතුළුව සම්මාන 6ක් සහිතව අ.පො.ස. (සා. /පෙළ) විෂයන් 6 කින් සමත්වීම. |
| 5. වෙනත් සුදුසුකම් | - | පරිගණක පුහුණුව<br>සමුපකාර සංවිධානයක සාමාජික වී තිබීම.<br>සමුපකාර සාමාන්‍ය පෙළ සමත් වී තිබීම.<br>අ.පො.ස. (සා/ පෙළ) ඉංග්‍රීසි විෂය සමත්ව තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ. |

ඔබ විසින් පිළියෙල කරන ලද අයදුම්පත සමග සියලුම අධ්‍යාපන සහතිකවල පිටපත් ලියාපදිංචි තැපෑලෙන් **"ගරු සභාපති, සී/ස මොරගොල්ල ඒකාබද්ධ සණස සමිතිය, මොරගොල්ල, හෙට්ටිපොළ"** යන ලිපිනයට එවිය යුතු අතර, අයදුම්පත් භාරගන්නා අවසන් දිනය 2020.11.30 දින වේ.

**මෙයට - ගරු සභාපති,**
**R.M. ජයන්ත කුමාර.**

**සී/ස මොරගොල්ල ඒකාබද්ධ සණස සමිතිය,**
**මොරගොල්ල, හෙට්ටිපොළ.**




# කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

## දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය

## ව්‍යාපෘති කාර්ය මණ්ඩලය බඳවා ගැනීම

**PMU - සඳහා 'A' වර්ගීකරණයේ ප්‍රසම්පාදන නිලධාරිවරයකු (PS 6A) තනතුරු 01 ක් සඳහා බඳවා ගැනීම සඳහා 2020 ඔක්තෝබර් 10 දින "දිනමිණ" පුවත් පතෙහි පළ කරන ලද දැන්වීම නිවැරදි කිරීමයි.**

**අදාළ සුදුසුකම් පහත සඳහන් පරිදි නිවැරදි විය යුතුය :**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ (ව්‍යාපාර පරිපාලනය / මූල්‍ය / වාණිජ්‍ය / ආර්ථික විද්‍යාව / කළමනාකරණය / ගණකාධිකරණය හෝ සමාන) ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කිරීම

**හෝ**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධියට සමාන බවට පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ වෙනත් සුදුසුකම්

**හෝ**

පිළිගත් වෘත්තීය ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ ආශ්‍රිත සාමාජිකත්වය / සමාන වෘත්තීය සුදුසුකම්

**හෝ**

තෘතියක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ / වෘත්තීය පුහුණු ආයතනයකින් ලබාගත් තාක්ෂණ ක්ෂේත්‍රයේ තනතුරකට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් 7 තලයට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

**සහ**

අදාළ අවශ්‍ය විශේෂඥතා ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 03 ක පළපුරුද්ද

02. තෘතියක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ / වෘත්තීය පුහුණු ආයතනයකින් ලබාගත් තාක්ෂණ ක්ෂේත්‍රයේ තනතුරකට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් 6 තලයට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම,

**සහ**

අදාළ අවශ්‍ය විශේෂඥතා ක්ෂේත්‍රයේ (ප්‍රසම්පාදන) අවම වශයෙන් වසර 08 ක පළපුරුද්ද.

03. තෘතියක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කළ තාක්ෂණ ක්ෂේත්‍රයේ තනතුරකට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් 5 තලයට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම,

**සහ**

අදාළ අවශ්‍ය විශේෂඥතා ක්ෂේත්‍රයේ (ප්‍රසම්පාදන) අවම වශයෙන් වසර 13 ක පළපුරුද්ද.

- වාර්තා ලිවීමේ නිපුණතා හා ඉංග්‍රීසි භාෂා සාක්ෂරතාවය සතු අයහට ප්‍රමුඛතාව හිමි වේ.

# ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව

## පුරප්පාඩු

## "ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදනයේ කොටස්කරුවකු වීමට එක්වන්න"

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ පහත සඳහන් තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. තනතුරු නාමය - ජ්‍යෙෂ්ඨ ප්‍රතිපත්ති පර්යේෂණ නිලධාරී**
**සේවා ගණය - ජ්‍යෙෂ්ඨ අධ්‍යයන හා පර්යේෂණ සේවා**
**පුරප්පාඩු ගණන - 05**

**1.1 සුදුසුකම්**

**1.1.1 බාහිර අයදුම්කරුවන් (පහත සඳහන් 1 හෝ 2)**

1. විශ්විවද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් අධ්‍යාපන විද්‍යාව, සංඛ්‍යානය, කළමනාකරණය, සමාජ විද්‍යාව, ගණිතය, ආර්ථික විද්‍යාව, තොරතුරු තාක්ෂණය හෝ ජීව විද්‍යාව යන විෂය ක්ෂේත්‍රයකින් ලබාගත් විශේෂවේදී උපාධියක්

   **සමග**

   අදාළ ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම.

   **සහ**

   ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් වසර අටක (08) ක පර්යේෂණ පළපුරුද්දක් ලබා තිබීම.

2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් අධ්‍යාපන විද්‍යාව, සංඛ්‍යානය, කළමනාකරණය, සමාජ විද්‍යාව, ගණිතය, ආර්ථික විද්‍යාව, තොරතුරු තාක්ෂණය හෝ ජීව විද්‍යාව යන විෂය ක්ෂේත්‍රයකින් ලබාගත් විශේෂවේදී උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයක ආචාර්ය උපාධියක් (PhD)

   **සහ**

   ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් වසර පහ (05) ක පර්යේෂණ පළපුරුද්දක් ලබා තිබීම.

   අධ්‍යාපනවේදී උපාධිධාරීන් සඳහා ප්‍රමුඛතාව ලබා දෙනු ලැබේ.

**1.1.2 අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත සඳහන් 1,2 හෝ 3)**

1. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා වන ඉහත සඳහන් සුදුසුකම් සපුරා තිබීම.
2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් අධ්‍යාපන විද්‍යාව, සංඛ්‍යානය, කළමනාකරණය, සමාජ විද්‍යාව, ගණිතය, ආර්ථික විද්‍යාව, තොරතුරු තාක්ෂණය හෝ ජීව විද්‍යාව යන විෂය ක්ෂේත්‍රයකින් විශේෂවේදී / සාමාන්‍ය උපාධියක්

   **සමග**

   අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම.

   **සහ**

   "අධ්‍යයන / පර්යේෂණ සේවා ගණයේ (AR1) තනතුරක අවම වශයෙන් වසර අට (08) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

3. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් අධ්‍යාපන විද්‍යාව, සංඛ්‍යානය, කළමනාකරණය, සමාජ විද්‍යාව, ගණිතය, ආර්ථික විද්‍යාව, තොරතුරු තාක්ෂණය හෝ ජීව විද්‍යාව යන ක්ෂේත්‍රයකින් විශේෂවේදී / සාමාන්‍ය උපාධියක්

   **සමග**

   අදාළ ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධියක් (PhD) ලබා තිබීම

   **සහ**

   "අධ්‍යයන / පර්යේෂණ" සේවා ගණයේ (AR1) තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**1.2 වැටුප් කාණ්ඩය -** (AR 2)

**1.3 වැටුප් පරිමාණය -** AR 2-2016-76,200-10x2,000-96,200/-

| | | |
|---|---|---|
| **මාසික ජීවන වියදම් දීමනාව** | : | රු. 7,800/– |
| **මාසික දුරකථන දීමනාව** | : | රු. 4,000/– |
| **මාසික වෘත්තීය දීමනාව** | : | කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 05/2017 අනුව |
| **පර්යේෂණ දීමනා** | : | කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2014 අනුව |
| **වාහන බලපත්‍රය** | : | වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2016 අනුව |

**1.4 වයස -** අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වන විට, වයස අවුරුදු 30 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ)

**02. තනතුරු නාමය - ප්‍රතිපත්ති පර්යේෂණ නිලධාරී**
**සේවා ගණය - අධ්‍යයන හා පර්යේෂණ සේවා**
**පුරප්පාඩු ගණන - 02**

**2.1 සුදුසුකම්**

**2.1.1 බාහිර අයදුම්කරුවන්**

(අ) 1. විශ්විවද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් සංඛ්‍යානය, කළමනාකරණය, සමාජ විද්‍යාව හෝ ආර්ථික විද්‍යාව යන විෂය ක්ෂේත්‍රයකින් පළමු පන්තිය හෝ දෙවන පන්තිය (ඉහළ) සාමාර්ථයක් සහිතව සිව් අවුරුදු විශේෂ උපාධියක් ලබා තිබීම

**හෝ**

2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් දෙවන පන්තිය (පහළ) සාමාර්ථයක් සහිතව සංඛ්‍යානය, කළමනාකරණය, සමාජ විද්‍යාව හෝ ආර්ථික විද්‍යාව යන විෂය ක්ෂේත්‍රයකින් සිව් අවුරුදු විශේෂ උපාධියක් ලබා තිබීම සහ එක් අවුරුදු පශ්චාද් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව සමත් වී තිබීම

**හෝ**

3 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් සංඛ්‍යානය, කළමනාකරණය, සමාජ විද්‍යාව හෝ ආර්ථික විද්‍යාව යන විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් සහ දෑ අවුරුදු පර්යේෂණ පශ්චාද් උපාධියක් ලබා තිබීම.

(ආ) 1 පර්යේෂණ සහ සමීක්ෂණ ඉටු කිරීම පිළිබඳව ඇති පළපුරුද්ද විශේෂ සුදුසුකමක් වනු ඇත. ක්ෂේත්‍රයට අදාළව ඉටුකර ඇති අධ්‍යාපන, පර්යේෂණ හා සමීක්ෂණ සඳහා වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

**2.1.2 අභ්‍යන්තර අයදුම්කරුවන්**

1. විශ්විවද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් සංඛ්‍යානය, කළමනාකරණය, සමාජ විද්‍යාව හෝ ආර්ථික විද්‍යාව යන විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම.

   **සහ**

2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්විද්‍යාලයක පශ්චාද් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව සමත් වී තිබීම.

   **සහ**

3. ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ වැඩසටහන් නිලධාරී (ප්‍රතිපත්ති / සැලසුම්) (MA4) තනතුරේ II ශ්‍රේණියේ වසර 05කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**2.2 වැටුප් කාණ්ඩය -** (AR 1)

**2.3 වැටුප් පරිමාණය -** AR 1-2016-53,150-1,375x10-1,910x15-95,550/-

| | | |
|---|---|---|
| **මාසික ජීවන වියදම් දීමනාව** | : | රු. 7,800/– |
| **මාසික දුරකතන දීමනාව** | : | රු. 2,500/– |
| **මාසික වෘත්තීය දීමනාව** | : | කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 05/2017 අනුව |
| **පර්යේෂණ දීමනා** | : | කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2014 අනුව |
| **වාහන බලපත්‍රය** | : | වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2016 අනුව |

**2.4 වයස -** අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වන විට, වයස අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ)

**03. තනතුරු නාමය - වැඩසටහන් නිලධාරී (ප්‍රතිපත්ති / සැලසුම්)**
**වැඩසටහන් නිලධාරී (මුදල්)**
**සේවා ගණය - ක්‍රියාත්මක කිරීමේ / උපදේශන සේවාවන්**
**පුරප්පාඩු ගණන - වැඩසටහන් නිලධාරී (ප්‍රතිපත්ති / සැලුසම්) - 02**
**වැඩසටහන් නිලධාරී (මුදල්) - 01**

**3.1 සුදුසුකම්**

**3.1.1 බාහිර අයදුම්කරුවන්**

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් අධ්‍යාපන විද්‍යාව, කළමනාකරණ, තොරතුරු තාක්ෂණ, පරිගණක විද්‍යාව, ගණිතය, පුස්තකාල විද්‍යාව සංඛ්‍යානය හෝ සමාජ විද්‍යාව යන විෂයය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම.

(ආ) අතිරේක සුදුසුකම් – වැඩසටහන් නිලධාරී (ප්‍රතිපත්ති / සැලසුම්) තනතුර සඳහා

(i) පර්යේෂණ හා සමීක්ෂණ කිරීම පිළිබඳ පළපුරුද්ද

(ii) ව්‍යාපෘති හෝ වැඩසටහන් සඳහා වන පරිගණක මෘදුකාංග භාවිතය පිළිබඳ පළපුරුද්ද

**3.1.2 අභ්‍යන්තර අයදුම්කරුවන්**

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ කළමනාකරණ සේවා නිලධාරි (MA 1) I වන ශ්‍රේණියේ අවුරුදු 10 කට වැඩි සතුටුදායක සේවා කාලයක් සපුරා ඇති සේවකයින්

**3.2 වැටුප් කාණ්ඩය -** (MA-4)

**3.3 වැටුප් පරිමාණය -** MA 4-2016-37,910-755x10-930x15-1,135x5-65,145/-

**මාසික ජීවන වියදම් දීමනාව :** රු. 7,800/–

**3.4 වයස -** අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වන විට, වයස අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ)

**4. අවශ්‍ය වෙනත් සුදුසුකම් :**

සෑම අයදුම්කරුවෙක්ම,

4.1 ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

4.2 තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා අවශ්‍ය. කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

4.3 විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

4.4 ඉංග්‍රීසි භාෂාවෙන් කටයුතු කිරීමට හැකිවීම අමතර සුදුසුකමක් සේ සලකනු ලැබේ.

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට සෑම ආකාරයකින්ම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

**5. තෝරා ගැනීමේ ක්‍රමවේදය :**

සුදුසුකම් හා පළපුරුද්ද අනුව කෙටි ලැයිස්තුගත කරනු ලබන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයක් හා / හෝ ලිඛිත විභාගයක් සඳහා කැඳවනු ලැබේ.

**6. පත්වීමේ ස්වභාවය :**

මෙම තනතුරු ස්ථිරය. සේවක අර්ථ සාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම් සහිත වේ. පත්වීම ලැබූ දින සිට අවුරුදු 3 ක පරිවාස කාලයකට යටත් වේ. රජය විසින් පනවනු ලැබ ඇති සහ වරින් වර පනවනු ලබන පොදු නීති, කොන්දේසි සහ නියමයන්ට යටත්ය.

**7. අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :**

nec.gov.lk යන ආයතනික වෙබ් පිටුවේ **"පුවත් සහ සිද්ධි"** යටතේ ඇති ආදර්ශ අයදුම්පත අනුව සියලුම විස්තර ඇතුළත් කර සකසන ලද අයදුම්පත්, අධ්‍යාපන හා වෘත්තීය සහතිකවල පිටපත් ද සමග 2020 නොවැම්බර් 10 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් රැගෙනවිත් භාර දිය යුතුය.

අයදුම්පත බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය. අසම්පූර්ණ අයදුම්පත් හා නියමිත දිනට පසු ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රාජ්‍ය / සංස්ථා / ව්‍යවස්ථාපිත ආයතනවල අයදුම්කරුවන් තම අයදුම්පත ඔවුන්ගේ ආයතන ප්‍රධානී මගින් ඉදිරිපත් කළ යුතුය.

මෙම දැන්වීමට අනුව ඇබෑර්තු පිරවීමට, නොපිරවීමට හෝ ඇබෑර්තුවලින් කොටසක් පමණක් පිරවීමට සම්පූර්ණ බලතල ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව සතුවේ.

**සභාපති,**
**ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව,**
**නො. 126, නාවල පාර, නුගේගොඩ.**

**සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය**

## විජය කුමාරතුංග අනුස්මරණ රෝහල් ආපනශාලාව සඳහා මිල ගණන් කැඳවීමේ ටෙන්ඩරය 2021.01.01 සිට 2021.12.31 (දින දෙකත් ඇතුළත්ව) දක්වා

විජය කුමාරතුංග අනුස්මරණ රෝහල මගින් පවත්වා ගෙන යනු ලබන ආපනශාලාව සඳහා 2021 වර්ෂයට ටෙන්ඩර්පත් කැඳවීම සිදුකෙරේ.

| ලංසු ඇපකරය | ආපසු නොගෙවන තැන්පතුව | කාර්ය සාධන ඇපකරය | ලංසු විවෘත කිරීම |
|---|---|---|---|
| 4800.00 | 500.00 | වාර්ෂික කොන්ත්‍රාත් මුදලින් 10% | 2020.11.05 |

ටෙන්ඩර්පත් නිකුත් කිරීම 2020.10.19 වන දින ආරම්භ වී 2020.11.02 දින ප.ව. 3.00 ට අවසන් වේ. ටෙන්ඩර් පත්‍රිකා සතියේ වැඩ කරන දිනවල උදේ 9.00 සිට සවස 3.00 දක්වා රෝහල් ප්‍රසම්පාදන කමිටුව වෙත ලිඛිත ඉල්ලීමක් කර ආපසු නොගෙවන තැම්පත් මුදල වන රු. 500.00 ක් ගෙවා රෝහල් ගිණුම් අංශයෙන් ලබාගත හැක.

ටෙන්ඩර් පත්‍රිකාවේ ඇතුළත් ආහාර පාන සඳහා මිල ගණන් අනිවාර්යෙන් සඳහන් කළ යුතු වේ. **2020.11.05 දින පෙ.ව. 10.30** ට පෙර ලැබෙන සේ මුද්‍රා තබන ලද ඔබගේ ටෙන්ඩර්පත් ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ පැමිණ ඒ සඳහා අධ්‍යක්ෂ කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමිය හැක. ටෙන්ඩර්පත් එවන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ **"රෝහල් ආපනශාලාව සඳහා ටෙන්ඩරය 2021 වර්ෂය"** ලෙස සඳහන් කළ යුතුය.

ටෙන්ඩර්පත් විවෘත කිරීම 2020.11.05 දින පෙ.ව. 10.30 ට විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ අධ්‍යක්ෂ කාර්යාලයේදී සිදු කෙරේ. ප්‍රමාද වී ලැබෙන ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරන අතර, ටෙන්ඩර් පත් විවෘත කරනු ලබන වේලාවට අදාළ ඉල්ලුම්කරුට හෝ නියෝජිතයකුට සහභාගි විය හැක. වැඩිදුර තොරතුරු රෝහලේ පරිපාලන නිලධාරී, ගණකාධිකාරී වෙතින් පහත දුරකථන අංක ඔස්සේ විමසා ලබාගත හැකිය.

**දුරකථන : 011-2258862 - 4**

**සභාපති,**
**ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව,**
**විජය කුමාරතුංග අනුස්මරණ රෝහල,**
**සීදූව.**

2020.10.14

---

# NLDB

## ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය

## ප්‍රසම්පාදන දැන්වීමයි

### වෘත්තියෙහි නියැළි (කාර්යයෙහි නිරත) වරලත් ගණකාධිකාරී සමාගම් වෙතින් මිල ගණන් කැඳවනු ලැබේ

පහත සඳහන් පැවරුම ඉටුකිරීම සඳහා වෘත්තියෙහි / කාර්යයෙහි නියැළී වරලත් ගණකාධිකාරී සමාගම් / ආයතන වෙතින් මිල ගණන් කැඳවනු ලැබේ.

(අ) 2016/17 වර්ෂය සඳහා ආයතනික ආදායම් බදු ආගණනය කිරීම් සකස් කිරීම සහ ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත, ආදායම් බදු විස්තර වාර්තා ඉදිරිපත් කිරීම.

(ආ) 2020/2021 තක්සේරු වර්ෂය සිට වාර්ෂිකව බදු උපදේශන ගාස්තු සකස් කිරීම.

ඔබ විසින් ඉහත කාලසීමාවන් සඳහා මිල ගණන් ඉදිරිපත් කරනු ලබන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

ලංසු ලිපිලේඛන, ඒ සඳහා ඉල්ලීමේ ලිපියක් ඉදිරිපත් කිරීම මගින් 2020.11.04 වන දින දක්වා, පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා, රාජකාරී දිනවලදී කොළඹ 05, නාරාහේන්පිට, නාවල පාරේ, අංක 40 හි, ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය, මූල්‍ය අංශයෙන් ලබාගත හැක.

මුද්‍රා තබන ලද ඔබගේ මිල ගණන්, **2020 නොවැම්බර් මස 05 වන දින ප.ව. 2.30** ට හෝ ඊට පෙර ලැබෙනසේ, **කොළඹ 05 නාරාහේන්පිට, නාවල පාරේ, අංක 40 හි, ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය, (NLDB)** හි, ප්‍රධාන කාර්යාලය වෙත, යොමුකළ යුතුවන අතර, ටෙන්ඩර් 2020, **නොවැම්බර් මස 05 වන දින ප.ව. 2.30** ට විවෘත කරනු ලැබේ. කරුණාකර ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"ආයතනික ආදායම් බදු ගණනය කිරීම සඳහා ලංසු"** යනුවෙන් පැහැදිළිව සටහන් කරනු මැනවි.

ප්‍රසම්පාදනය පිළිබඳ විස්තර තොරතුරු මූල්‍ය අංශයෙන් ලබාගත හැකිවන අතර, වැඩිදුර තොරතුරු දූරකථන අංක 011-5235472 වෙතින් විමසා ලබාගත හැකිය.

**සභාපති,**
**ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය, (NLDB),**
**අංක 40, නාවල පාර,**
**කොළඹ 05.**

**දුරකථන : 011-2501701/2, 011-5746308.**

---

## ලංසු කැඳවීමයි

**ක්‍රීඩා යෞවන කටයුතු, ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය**

### දකුණු පළාත් සභාව

1. ගාල්ල, ලබුදූව දක්ෂිණපාය 3 වන මහලේ පිහිටි දකුණු පළාත් ක්‍රීඩා යෞවන කටයුතු, ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් යෝග්‍ය හා සුදුසුකම් ලත් ලංසුකරුවන්ගෙන් "හික්කඩුව - නාරිගම බහු කාර්ය සේවා මධ්‍යස්ථානයේ වහළ ඉදි කිරීම" ව්‍යාපෘතිය සඳහා මුද්‍රා තබන ලද ලංසුපත් භාරගනු ලැබේ.

   **ඇස්තමේන්තුගත මුදල - රු. මිලියන 8.6**
   **ස්ථානය - හික්කඩුව නාරිගම**
   **කොන්ත්‍රාත් කාලය - දින 90**

2. ජාතික කරගකාරී ලංසු ක්‍රමය යටතේ ලංසු කැඳවනු ලැබේ. මෙම ප්‍රසම්පාදනයේ ඇස්තමේන්තුගත මුදල රුපියල් මිලියන 50 ට අඩු බැවින් මුදල් අමාත්‍යාංශය නිකුත් කරන ලද රාජ්‍ය මූල්‍ය අංක 04/2016(ii) දරන 08/05/2019 දිනැති චක්‍රලේඛය අදාළ කරගනු ලැබේ.

3. කොන්ත්‍රාත් ප්‍රදානයට සුදුසුකම් ලැබීම සඳහා සාර්ථක ලංසුකරු අසාධු ලේඛනගත අයෙකු නොවිය යුතු අතර, ශ්‍රී ලංකා ඉදිකිරීම් අභ්‍යාස පුහුණු සංවර්ධන ආයතනයේ (CIDA) C7 ශ්‍රේණිය හෝ ඊට ඉහළ ශ්‍රේණියක ලියාපදිංචි වී තිබිය යුතුය.

4. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා අවශ්‍ය තාක්ෂණික හා මූල්‍ය සුදුසුකම් පිළිබඳ විස්තර ලංසු දත්ත(BIDDING DATA) වල ඇතුළත් කර ඇති අතර, කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා එම අවශ්‍යතාවන් සම්පූර්ණ කළ යුතු වේ.

5. මේ සම්බන්ධයෙන් අවශ්‍ය වැඩිදුර විස්තර ගාල්ල, ලබුදූව දක්ෂිණපාය 3වන මහලේ පිහිටි ක්‍රීඩා යෞවන කටයුතු, ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශයේ දූරකථන අංක 0914936740 හෝ 0914936710 අමතා ලබා ගත හැකි අතර, කාර්යාල වේලාවන් තුළ ලංසු ලිපි ලේඛන පරීක්ෂා කර බැලිය හැක.

6. ඉහත කර්මාන්තයට අදාළ ඉංග්‍රීසි භාෂාවෙන් පිළියෙළ කර ඇති ලංසු ලේඛන ලබුදූව දක්ෂිණපායේ පිහිටි ක්‍රීඩා යෞවන කටයුතු, ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් සහ ආපසු නොගෙවන රු.3,500.00 මුදලක් ගෙවීමෙන් 2020 ඔක්තෝම්බර් 19 සිට 2020 නොවැම්බර් 09දින තෙක් සතියේ දිනවල පෙ.ව 9.00 සිට ප.ව 3.00 දක්වා කාලය තුළදී ලබා ගත හැක.

7. ඉදිරිපත් කරනු ලබන ලංසු ලියකියවිලි මුල් පිටපත හා අනුපිටපත් වශයෙන් පිළියෙළ කර වෙන් වෙන් වශයෙන් කවරවල බහා මුද්‍රා තබා කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"නාරිගම බහු කාර්යය මධ්‍යස්ථානයේ වහළ ඉදි කිරීම"** යනුවෙන් සඳහන් කර නැවත එම කවර දෙක එක් කවරයක බහා මුද්‍රා තබා කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉහත පරිදි කර්මාන්තයේ නම සඳහන් කර **2020 නොවැම්බර් මස 10 ප.ව 3.00 ට හෝ ඊට පෙර** පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ අමාත්‍යාංශයේ ගිණුම් අංශයේ කබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීමෙන් ඉදිරිපත් කළ හැකි අතර, ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතිපෙ කරනු ලැබේ. ලංසු භාර ගැනීම අවසන් වූ වහාම ලංසුකරුවන් හෝ ඔහු විසින් බලය පවරන ලද නියෝජිතයින් ඉදිරියේදී ලංසුපත් විවෘත කරනු ලැබේ.

**ලිපිනය**

**ලේකම්**
**ක්‍රීඩා හා යෞවන කටයුතු, ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය, 3 වන මහළ, දක්ෂිණපාය, ලබුදූව, ගාල්ල.**
**දු.ක - 091-4936710, 091-4936740 ෆැක්ස් - 091- 2226428**

8. ලංසු දත්තවල සඳහන් පරිදි ඉදිරිපත් කරනු ලබන ලංසුපත් සමග ආපසු ගෙවනු ලබන ලංසු - සුරක්ෂණ ගාස්තුව වශයෙන් (BID SECURITY) රු. 86,000.00 වටිනා 2021.03.10 දින දක්වා වලංගු වන යේ ශ්‍රී ලංකා මහ බැංකුවේ බලපත්‍රලාභී වාණිජ බැංකුවකින් නිකුත් කරන ලද කොන්දේසි රහිත බැංකු ඇපකරයක් ලබා දී ඇති ආකෘති පත්‍රය අනුව ඉදිරිපත් කළ යුතුය.

9. ලංසුපත් 2021.02.10 දින දක්වා වලංගු විය යුතුය.

10. සෑම මිල ගණන් ඇතුළත් ලංසු පතකම ඒකක මිල ගණන් හා මුළු මුදල දැක්වෙන තීරය හා සාරාංශය (වට්ටම දැක්වෙන තීරයද ඇතුළත්ව) අවර්ණ (Transperant) සෙලෝටේප් කර ඉදිරිපත් කළ යුතුය.

11. පූර්ව ලංසු රැස්වීම 2020.11.02 දින පෙ.ව 10.00 ට ක්‍රීඩා යෞවන කටයුතු, ග්‍රාම සංවර්ධන අමාත්‍යාං ශය, 3 වන මහළ, දක්ෂිණපාය, ලබුදූව, ගාල්ල හිදී පැවැත්වේ .

12. මේ සම්බන්ධයෙන් අමාත්‍යාශ ප්‍රසම්පාදන කමිටු තීරණය අවසන් තීරණය වේ.

**රංජිත් යාපා**
**ලේකම් ක්‍රීඩා යෞවන කටයුතු,**
**ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය**
**3 වන මහළ දක්ෂිණ පාය, ලබුදූව ගාල්ල.**

---

Lanka Phosphate Limited

**කර්මාන්ත අමාත්‍යාංශය**

## ලංකා පොස්පේට් ලිමිටඩ්

## ටෙන්ඩර් කැඳවීමයි

**ටෙන්ඩර් අංකය : LPL/SUP/TEN/06/2020**

01. සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (කුඩා), ලංකා පොස්පේට් ලිමිටඩ්, එප්පාවල විසින් ලංකා අශෝක් ලේලන්ඩ් කොමට් ටිපර් රථය සඳහා ඉදිරිපස රියදුරු කැබිනය අලුතින් සවිකිරීම සඳහා 2020/11/03 දින ප.ව. 2.00 දක්වා මුද්‍රා තබන ලද ටෙන්ඩර් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. මේ සඳහා අදාළ ටෙන්ඩර් අයදුම්පත් ආපසු නොගෙවනු ලබන රු. 2,000/- ක ගාස්තුවක් මුදලින් ගෙවීමෙන් මුදල් කළමනාකාර, ලංකා පොස්පේට් ලිමිටඩ්, අංක 73 1/1, නව කැලණි පාලම පාර, කොළඹ 14 හෝ ගණකාධිකාරී, ලංකා පොස්පේට් ලිමිටඩ්, එප්පාවල යන ලිපිනයෙන් 2020/11/02 දින ප.ව. 3.00 දක්වා සතියේ වැඩ කරන දිනයන් හිදී ලබාගත හැක.

03. ටෙන්ඩර් අයදුම්කරුවන්ට 2020/11/02 දින ප.ව. 3.00 දක්වා සතියේ වැඩ කරන දිනයන්වල ලංකා පොස්පේට් ලිමිටඩ්, එප්පාවල ආයතනය වෙත පැමිණ අදාළ ටිපර් රථය පරීක්ෂා කර බැලිය හැකිය.

04. ටෙන්ඩර් අයදුම්පත් බහාලූ ලිපිකවරයේ ඉහළ වම් කෙළවරේ **"ලංකා අශෝක් ලේලන්ඩ් කොමට් ටිපර් රථයේ ඉදිරිපස රියදුරු කැබිනය අලුතින් සවිකිරීම සඳහා ටෙන්ඩරය"** ලෙස පැහැදිලිව සඳහන් කර සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (කුඩා), ලංකා පොස්පේට් ලිමිටඩ්, එප්පාවල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ එම ලිපිනයන්හි ඒ සඳහාම තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම සිදුකළ හැකිය.

05. ටෙන්ඩර් අයදුම්පත් භාරගන්නා වේලාව අවසන් වූ වහාම ටෙන්ඩර්පත් විවෘත කරන අතර, ටෙන්ඩර් අයදුම්කරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට ඒ සඳහා සහභාගි විය හැක.

06. ටෙන්ඩරය පිළිබඳ වැඩිදුර විස්තර සැපයුම් නිලධාරී, ලංකා පොස්පේට් ලිමිටඩ්, අංක 73 1/1, නව කැලණි පාලම පාර, කොළඹ 14 හෝ සැපයුම් නිලධාරී, ලංකා පොස්පේට් ලිමිටඩ්, එප්පාවල වෙතින් පහත දුරකථන අංක ඇමතීමෙන් ලබාගත හැකිය.

    (011-2459906-7, 025-2249121, 025-2249647)

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (කුඩා),**
**ලංකා පොස්පේට් ලිමිටඩ්,**
**එප්පාවල.**
**දිනය - 2020/10/19**

www.adz.lk
it's what you want

දිනමිණ වරුසිට
Sunday Observer
adz it's what you want
தினகரன் வாரமஞ்சரி THINAKARAN VAARAMANJARI

ඔබගේ ලුහුඬු දැන්වීම් ලඟම ඇති අපගේ ශාඛා කාර්යාලය වෙත භාරදෙන්න

එක් ලුහුඬු දැන්වීමක් සඳහා නවතම ගාස්තු පහත පරිදි වේ... (වචන 15ක් සඳහා)

| ඕනෑම එක් පුවත්පතක් සඳහා | ඕනෑම පුවත්පත් දෙකක් සඳහා | පුවත්පත් තුනම සඳහා |
|---|---|---|
| රු. 300/- * තිනකරන් වාරමන්ජරි හැර | රු. 500/- * තිනකරන් වාරමන්ජරි හැර | රු. 650/- |

අනුරාධපුර - TEL : 025 2222370 FAX : 025 2235411 / මහනුවර - TEL : 081 2234200 FAX : 081 2238910
කතරගම - TEL : 047 2235291 FAX : 047 2235291 / මරදාන - TEL : 011 2429336 FAX : 011 2429335
මාතර - TEL : 041 2235412 FAX : 041 2229728 / නුගේගොඩ - TEL : 011 2828114 FAX : 011 4300860 / යාපනය - TEL : 021 2225361 FAX : 021 2225361

2020 ඔක්තෝබර් 19 සඳුදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.